ශ්‍රී ලංකා මහ බැංකුව

# මෑතකාලීන ආර්ථික ප්‍රවණතා

## 2017 සුවිශේෂ සිදුවීම් සහ 2018 අපේක්ෂාවන්



2017 නොවැම්බර්

# මෑතකාලීන ආර්ථික ප්‍රවණතා

## 2017 සුවිශේෂ සිදුවීම් සහ
## 2018 අපේක්ෂාවන්


ශ්‍රී ලංකා මහ බැංකුව
2017 නොවැම්බර්

ප්‍රකාශනය: ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකා

මුද්‍රණය: සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම

ISBN 978 - 955 - 575 - 354 - 8

# මූලික ආර්ථික දර්ශක

# මූලික ආර්ථික දර්ශක

| | 2013 | 2014 | 2015 | 2016 (අ) | ප්‍රථම භාගය (අ) 2016 | ප්‍රථම භාගය (අ) 2017 |
|---|---|---|---|---|---|---|
| **ජනගහනය** | | | | | | |
| මැදි වසර ජනගහනය (පුද්ගලයන් දහස්) (ආ)(ඇ) | 20,585 (ඈ) | 20,771 (අ) | 20,966 (අ) | 21,203 | - | - |
| මැදි වසර ජනගහනයෙහි වර්ධන අනුපාතය (සියයට) (ආ) | 0.8 (ඈ) | 0.9 (අ) | 0.9 (අ) | 1.1 | - | - |
| ජනගහන ඝනත්වය (වර්ග කි.මී. ට පුද්ගලයන්) (ආ) | 328 (ඈ) | 331 (අ) | 334 (අ) | 338 | - | - |
| ශ්‍රම බලකාය (පුද්ගලයන් දහස්) (ඉ)(ඊ) | 8,034 | 8,049 | 8,214 | 8,311 | 8,256 | 8,551 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (සියයට) (ඉ)(ඊ) | 53.7 | 53.2 | 53.8 | 53.8 | 53.7 | 54.3 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) (ඉ)(ඊ) | 4.4 | 4.3 | 4.7 | 4.4 | 4.4 | 4.3 |
| **නිමැවුම (උ)** | | | | | | |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රු.බිලියන) | 9,592 | 10,361 (ඈ) | 10,952 (අ)(ඈ) | 11,839 | 5,761 (ඈ) | 6,342 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (රු.බිලියන) | 9,366 | 10,125 (ඈ) | 10,677 (අ)(ඈ)(ඌ) | 11,522 (ඌ) | 5,622 (ඈ)(එ) | 6,185 (එ) |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (එ.ජ.ඩොලර් බිලියන) | 74.3 | 79.4 (ඈ) | 80.6 (අ)(ඈ) | 81.3 | 39.9 (ඈ) | 41.9 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (එ.ජ.ඩොලර් බිලියන) | 72.5 | 77.6 (ඈ) | 78.5 (අ)(ඈ)(ඌ) | 79.1 (ඌ) | 38.9 (ඈ)(එ) | 40.8 (එ) |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (රු.) (ඒ) | 465,976 | 498,828 (ඈ) | 522,355 (අ)(ඈ) | 558,363 | - | - |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (රු.) (ඒ) | 454,993 | 487,462 (ඈ) | 509,251 (අ)(ඈ)(ඌ) | 543,410 (ඌ) | - | - |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ.ඩොලර්) (ඒ) | 3,609 | 3,821 (ඈ) | 3,843 (අ)(ඈ) | 3,835 | - | - |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ.ඩොලර්) (ඒ) | 3,524 | 3,734 (ඈ) | 3,746 (අ)(ඈ)(ඌ) | 3,732 (ඌ) | - | - |
| **මූර්ත නිමැවුම (වෙනස්වීමේ ප්‍රතිශතය) (උ)** | | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 3.4 | 5.0 (ඈ) | 4.8 (අ)(ඈ) | 4.4 (ඈ) | 3.7 (ඈ) | 3.9 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන ආර්ථික කටයුතු | | | | | | |
| කෘෂිකර්මය | 3.2 | 4.6 (ඈ) | 4.8 (අ)(ඈ) | -4.2 (ඈ) | -3.0 (ඈ) | -3.1 |
| කාර්මික | 4.1 | 4.7 (ඈ) | 2.1 (අ)(ඈ) | 6.7 (ඈ) | 5.8 (ඈ) | 5.8 |
| සේවා | 3.8 | 4.8 (ඈ) | 5.7 (අ)(ඈ) | 4.2 (ඈ) | 3.6 (ඈ) | 4.0 |
| දළ ජාතික ආදායම | 2.8 | 5.1 (ඈ) | 4.5 (අ)(ඈ) | 4.1 (ඈ) | 3.4 (ඈ) | 4.0 |
| **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (උ)** | | | | | | |
| පරිභෝජනය | 75.4 | 75.8 (ඈ) | 79.1 (අ)(ඈ) | 76.2 | 75.0 (ඈ) | 75.3 |
| පෞද්ගලික | 67.6 | 67.4 (ඈ) | 70.1 (අ)(ඈ) | 67.6 | 66.5 (ඈ) | 67.1 |
| රජය | 7.8 | 8.4 (ඈ) | 9.0 (අ)(ඈ) | 8.6 | 8.5 (ඈ) | 8.1 |
| ආයෝජනය | 33.2 | 32.3 (ඈ) | 28.4 (අ)(ඈ) | 31.5 | 32.2 (ඈ) | 32.8 |
| භාණ්ඩ සහ සේවා ශුද්ධ අපනයන | -8.6 | -8.1 (ඈ) | -7.5 (අ)(ඈ) | -7.6 | -7.2 (ඈ) | -8.0 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 20.3 | 21.1 (ඈ) | 21.0 (අ)(ඈ) | 21.4 | 21.6 (ඈ) | 21.5 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 28.9 | 29.2 (ඈ) | 28.5 (අ)(ඈ) | 29.1 | 28.8 (ඈ) | 29.6 |
| දේශීය ඉතිරිකිරීම් | 24.6 | 24.2 (ඈ) | 20.9 (අ)(ඈ) | 23.8 | - | - |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික සහ ද්විතීයික ආදායම | 5.2 | 5.6 (ඈ) | 5.2 (අ)(ඈ)(ඌ) | 5.3 (ඌ) | - | - |
| ජාතික ඉතිරිකිරීම් | 29.9 | 29.8 (ඈ) | 26.1 (අ)(ඈ)(ඌ) | 29.1 (ඌ) | - | - |
| **මිල සහ වැටුප් (වෙනස්වීමේ ප්‍රතිශතය)** | | | | | | |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | 3.8 | 4.0 | 3.1 | 6.1 |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | - | - | 4.2 | 4.2 | 6.4 | 6.3 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | 2.2 | 4.0 | 3.0 | 5.5 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | - | - | 4.6 | 4.5 | 5.5 | 6.1 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07 = 100) - වාර්ෂික සාමාන්‍යය | 6.9 | 3.3 | 0.9 | 3.7 | 2.2 | - |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07 = 100) - ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | 4.7 | 2.1 | 2.8 | 4.1 | 6.0 | - |
| නිෂ්පාදකයාගේ මිල දර්ශකය (2013 4 වන කාර්තුව = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | 3.6 | 1.7 | 1.7 | 10.6 |
| ද.දේ.නි. අවධමනකය (උ) | 6.2 | 2.9 (ඈ) | 0.8 (අ)(ඈ) | 3.6 | 3.8 (ඈ) | 5.9 |
| ද.ජා.ආ. අවධමනකය (උ) | 6.2 | 2.9 (ඈ) | 0.8 (අ)(ඈ) | 3.6 | 3.8 (ඈ) | 5.9 |
| සියලු පඩිපාලක සභාවල සේවකයන් සඳහා නාමික වැටුප් අනුපාත දර්ශකය (1978 දෙසැ = 100) | 5.7 | 3.7 | 2.9 | 0.0 | 0.0 | 0.0 |
| රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා නාමික වැටුප් අනුපාත දර්ශකය (2012 = 100) | 6.3 | 10.5 | 31.7 | 3.9 | 7.8 | 0.0 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා නාමික වැටුප් අනුපාත දර්ශකය (2012 = 100) | 9.8 | 7.6 | 7.3 | 7.9 | 6.6 | 9.3 |
| **විදේශ වෙළඳාම** | | | | | | |
| වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන) | -7,609 | -8,287 | -8,388 (ඈ) | -9,090 (ඈ) | -4,191 (ඈ) | -4,753 |
| අපනයන | 10,394 | 11,130 | 10,546 (ඈ) | 10,310 (ඈ) | 5,130 (ඈ) | 5,398 |
| ආනයන | 18,003 | 19,417 | 18,935 | 19,400 | 9,321 | 10,151 |
| වෙළඳ මිල අනුපාතය (වෙනස්වීමේ ප්‍රතිශතය) | 4.6 | 4.3 | 2.7 (ඈ) | 3.7 (ඈ) | 2.8 | -0.5 |
| අපනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | -0.3 | 2.7 | -9.4 (ඈ) | -1.5 (ඈ) | -4.7 | 0.1 |
| ආනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | -4.7 | -1.5 | -11.8 | -5.1 | -7.3 | 0.5 |
| අපනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | 6.7 | 4.3 | 4.6 | -0.7 | -1.1 (ඈ) | 5.1 |
| ආනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ ප්‍රතිශතය) | -1.5 | 9.5 | 10.6 | 7.9 | 5.4 | 8.3 |
| **විදේශ මූල්‍ය (එ.ජ.ඩොලර් මිලියන)** | | | | | | |
| සේවා හා ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ) | -572 | 72 | 312 | 695 | 343 | 369 |
| ජංගම පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 5,619 | 6,199 | 6,167 | 6,434 | 3,199 | 2,897 |
| ජංගම නිල සංක්‍රාම (ශුද්ධ) | 21 | 28 | 27 | 19 | 6 | 7 |
| ජංගම ගිණුමේ ශේෂය | -2,541 | -1,988 | -1,883 | -1,942 | -644 | -1,480 |
| සමස්ත ශේෂය | 985 | 1,369 | -1,489 | -500 | -1,186 | 1,563 |

(අ) තාවකාලික
(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව
(ඇ) 2012 ජන හා නිවාස සංගණනය මත පදනම්ව ඇත.
(ඈ) සංශෝධිත
(ඉ) ශ්‍රම බලකාය ගණනය කිරීමේදී වයස අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්භ ජනගහන කාණ්ඩය සලකා බලනු ලැබේ.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදි.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නව පදනම් වර්ෂය (2010) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත.
(ඌ) නවතම ගෙවුම් ශේෂ දත්ත මත පදනම්ව 2016 වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් දත්ත සංශෝධනය වේ.
(එ) නවතම ගෙවුම් ශේෂ දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඒ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.

# මූලික ආර්ථික දර්ශක (සම්බන්ධයි)

| | 2013 | 2014 | 2015 | 2016 (අ) | ප්‍රථම භාගය (අ) | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 | 2017 |
| ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (උ)(ඔ) | -3.4 | -2.5 | -2.3 | -2.4 | - | - |
| මුළු විදේශීය වත්කම් (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) (ඕ) | 5.7 | 6.1 | 5.9 | 5.2 | 4.7 | 5.4 |
| දළ නිල සංචිත (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) | 5.0 | 5.1 | 4.6 | 3.7 | 3.4 | 4.1 |
| සමස්ත ණය සේවා අනුපාතය (ක) | | | | | | |
| භාණ්ඩ හා සේවා අපනයනයේ ප්‍රතිශතයක් ලෙස | 26.8 | 20.8 | 27.3 | 25.0 | 26.4 | 31.7 |
| ජංගම ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස | 18.7 | 14.5 | 19.2 | 17.6 | 18.5 | 23.0 |
| මුළු විදේශීය ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (උ)(ඔ) | 53.7 | 54.1 | 55.7 | 57.3 | - | - |
| **විනිමය අනුපාතික** | | | | | | |
| වාර්ෂික සාමාන්‍යය | | | | | | |
| එ.ජ.ඩොලරයකට රුපියල් | 129.11 | 130.56 | 135.94 | 145.60 | 144.47 | 151.54 |
| වි.ගැ.හි. ඒකකයකට රුපියල් (ග) | 196.19 | 198.35 | 190.16 | 202.39 | 202.24 | 206.67 |
| නා.ස.වි.අ. (2010 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ච) | 91.39 | 91.99 | 96.61 | 92.46 | 92.67 | 89.91 |
| මූ.ස.වි.අ. (2010 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ච)(ජ)(ට) | 101.13 | 103.77 | 109.50 | 106.94 | 106.57 | 107.65 |
| වර්ෂය අවසානයේ දී | | | | | | |
| එ.ජ.ඩොලරයකට රුපියල් | 130.75 | 131.05 | 144.06 | 149.80 | 145.25 | 153.51 |
| වි.ගැ.හි. ඒකකයකට රුපියල් (ග) | 201.36 | 189.86 | 199.63 | 201.38 | 203.18 | 213.59 |
| **රාජ්‍ය මූල්‍ය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) (උ) (ඞ)** | | | | | | |
| ආදායම සහ ප්‍රදාන | 12.0 | 11.6 | 13.3 | 14.3 | 6.0 | 6.8 |
| ආදායම | 11.9 | 11.5 | 13.3 | 14.2 | 6.0 | 6.7 |
| ඉන්, බදු ආදායම | 10.5 | 10.1 | 12.4 | 12.4 | 5.6 | 6.3 |
| ප්‍රදාන | 0.2 | 0.1 | 0.1 | 0.1 | ... | ... |
| වියදම හා ශුද්ධ ණය දීම් | 17.4 | 17.3 | 20.9 | 19.7 | 8.7 | 9.3 |
| පුනරාවර්තන වියදම් | 12.6 | 12.8 | 15.5 | 14.8 | 6.8 | 7.1 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම | 4.8 | 4.6 | 5.4 | 4.9 | 1.9 | 2.2 |
| වර්තන ගිණුමේ අතිරික්තය (+) / හිඟය (–) | -0.7 | -1.2 | -2.3 | -0.6 | -0.8 | -0.3 |
| ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+) / හිඟය (–) | -0.8 | -1.5 | -2.9 | -0.2 | -0.3 | 0.1 |
| සමස්ත අයවැය අතිරික්තය (+) / හිඟය (–) | -5.4 | -5.7 | -7.6 | -5.4 | -2.7 | -2.6 |
| අයවැය හිඟය මූල්‍යනය | 5.4 | 5.7 | 7.6 | 5.4 | 2.7 | 2.6 |
| විදේශීය | 1.3 | 2.1 | 2.2 | 3.3 | -0.3 | 0.5 |
| දේශීය | 4.1 | 3.7 | 5.4 | 2.1 | 3.0 | 2.1 |
| මධ්‍යම රජයේ ණය | 70.8 | 71.3 | 77.6 | 79.3 | - | - |
| විදේශීය | 30.9 | 30.0 | 32.4 | 34.2 | - | - |
| දේශීය | 40.0 | 41.3 | 45.3 | 45.1 | - | - |
| **මුදල් සමස්ත (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස - සියයට)** | | | | | | |
| සංචිත මුදල් | 0.9 | 18.3 | 16.5 | 27.1 | 24.5 | 17.8 |
| පටු මුදල් ($M_1$) | 7.7 | 26.3 | 16.8 | 8.6 | 12.1 | 6.8 |
| පුළුල් මුදල් ($M_{2b}$) (ත) | 16.7 | 13.4 | 17.8 | 18.4 | 17.0 | 21.2 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් | -195.5 | 119.8 | -2071.2 | 22.4 | -139.4 | 50.0 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම් | 18.3 | 10.5 | 26.0 | 15.9 | 22.8 | 14.7 |
| බැංකු ක්‍රමය මගින් සපයන ලද දේශීය ණය | | | | | | |
| රජයට (ශුද්ධ) | 24.5 | 10.3 | 22.5 | 12.1 | 19.8 | 11.4 |
| රාජ්‍ය සංස්ථාවලට | 24.8 | 22.2 | 17.2 | -5.3 | 0.5 | 13.7 |
| පෞද්ගලික අංශයට | 7.5 | 8.8 | 25.1 | 21.9 | 28.2 | 18.6 |
| $M_{2b}$ සඳහා මුදල් ගුණකය (වර්ෂ අවසාන) | 7.00 | 6.71 | 6.78 | 6.31 | 6.40 | 6.59 |
| $M_{2b}$ හි සංසරණ ප්‍රවේගය (වර්ෂය සඳහා සාමාන්‍යය) (උ) | 2.99 | 2.85 (ඈ) | 2.62 (ඈ) | 2.40 (ඈ) | - | - |
| **පොලී අනුපාතික (වර්ෂ අවසානයේ දී වර්ෂයකට සියයට)** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) (ද) | 6.50 | 6.50 | 6.00 | 7.00 | 6.50 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) (ද) | 8.50 | 8.00 | 7.50 | 8.50 | 8.00 | 8.75 |
| මුදල් වෙළඳපොළ පොලී අනුපාතික | | | | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | 7.66 | 6.21 | 6.40 | 8.42 | 8.20 | 8.75 |
| භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික | | | | | | |
| දින 91 | 7.54 | 5.74 | 6.45 | 8.72 | 8.88 | 9.60 |
| දින 364 | 8.29 | 6.01 | 7.30 | 10.17 | 10.55 | 10.47 |
| තැන්පතු අනුපාතික | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 9.37 | 6.20 | 6.20 | 8.17 | 6.87 | 9.13 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය | 11.78 | 7.33 | 7.57 | 10.46 | 8.64 | 11.66 |
| ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය | 5.00 | 5.00 | 5.00 | 4.25 | 4.50 | 4.00 |
| ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ මාස 12 ස්ථාවර තැන්පතු අනුපාතිකය | 9.50 | 6.50 | 7.25 | 11.00 | 10.00 | 11.00 |
| ණය පොලී අනුපාතික | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය | 10.13 | 6.26 | 7.53 | 11.52 | 10.70 | 11.70 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 15.18 | 11.91 | 11.00 | 13.20 | 12.09 | 13.73 |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | | | | | |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 5,912.8 | 7,299.0 | 6,894.5 | 6,228.3 | 6,283.3 | 6,747.1 |
| S&P SL20 දර්ශකය (2004 දෙසැ. = 1,000) | 3,263.9 | 4,089.1 | 3,625.7 | 3,496.4 | 3,300.2 | 3,933.5 |
| අලෙවි කළ කොටස් වටිනාකම (රු. මිලියන) | 200,468 | 340,917 | 253,251 | 176,935 | 87,378 | 110,531 |
| ශුද්ධ විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 22,783 | 21,217 | -5,372 | 338 | -6,374 | 21,460 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,459.9 | 3,104.9 | 2,938.0 | 2,745.4 | 2,677.6 | 3,041.2 |

(ඔ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද ද.දේ.නි. මත පදනම් වේ.
(ඕ) විදේශීය සෘජු ආයෝජන සහ වෙළඳ ණය සහ අත්තිකාරම් ලෙස ලද විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ක) සමස්ත ණය සේවා අනුපාතය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) විදේශීය ණය සංඛ්‍යාන සංස්කරණය (2003) ට අනුරූප වන පරිදි, ආපසු ගෙවීම් ඇතුළත් වන ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත.
(ග) ජා.මූ.අ. ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)
(ච) විනිමය අනුපාතික, දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතික දර්ශකවල අගය ඉහළයෑම හෝ පහළයෑම මගින් සෘජුවම පිළිබිඹු වේ.
(ජ) මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිතා කර ඇත. මූ.ස.වි.අ. ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නාමික සඵල විනිමය අනුපාතිකයට (නා.ස.වි.අ.) ගැළපීම මගිනි.
(ට) කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2013 අනුව යාවත්කාලීන වීම සමඟ මූ.ස.වි.අ. නැවත ගණනය කර ඇත.
(ඞ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ නිකුත් කරන ලද 2014 සහ 2015 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ත) 2015 සහ 2016 වසරවල දත්ත සඳහා 2015 ඔක්තෝබර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව සමග ඒකාබද්ධ වූ ඩී.එෆ්.සී.සී. පී.එල්.සී. සමාගමේ වත්කම් හා වගකීම් ද ඇතුළත් වේ.
(ද) 2014 ජනවාරි 2 සිට ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස නම් කරන ලදී.

# පටුන


| පරිච්ඡේදය | | පිටුව |
|---|---|---|
| 1. | සමස්ත නිරීක්ෂණ | 1 |
| 2. | ජාතික නිෂ්පාදිතය සහ වියදම | 17 |
| 3. | ආර්ථික හා සමාජ යටිතල පහසුකම් | 35 |
| 4. | මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව | 51 |
| 5. | විදේශීය අංශයේ ප්‍රවණතා | 67 |
| 6. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු | 85 |
| 7. | මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය | 101 |
| 8. | මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව | 119 |
| පරිශිෂ්ටය 1 | - ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග | 145 |
| පරිශිෂ්ටය 2 | - සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය | 159 |
| 1 වන සංඛ්‍යා සටහන | - කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළඳපොළ මිල අනුව) | 161 |
| 2 වන සංඛ්‍යා සටහන | - කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) | 162 |
| 3 වන සංඛ්‍යා සටහන | - පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය මත වියදම | 163 |
| 4 වන සංඛ්‍යා සටහන | - ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල ප්‍රවණතා | 164 |
| 5 වන සංඛ්‍යා සටහන | - ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායයන්හි ආංශික විදේශීය සෘජු ආයෝජන | 165 |
| 6 වන සංඛ්‍යා සටහන | - ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | 166 |
| 7 වන සංඛ්‍යා සටහන | - පාරිභෝගික මිල දර්ශක - ජාතික පාරිභෝගික මිල දර්ශකය | 167 |
| 8 වන සංඛ්‍යා සටහන | - පාරිභෝගික මිල දර්ශක - කොළඹ පාරිභෝගික මිල දර්ශකය | 167 |
| 9 වන සංඛ්‍යා සටහන | - වැටුප් ප්‍රමාණ දර්ශක | 168 |
| 10 වන සංඛ්‍යා සටහන | - ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය | 168 |
| 11 වන සංඛ්‍යා සටහන | - විදේශ වෙළඳාමේ ප්‍රවණතා | 169 |
| 12 වන සංඛ්‍යා සටහන | - ගෙවුම් තුලනය | 170 |
| 13 වන සංඛ්‍යා සටහන | - අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 171 |
| 14 වන සංඛ්‍යා සටහන | - නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය | 172 |
| 15 වන සංඛ්‍යා සටහන | - විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් (විදේශීය මුදල් ඒකකයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින්) | 173 |
| 16 වන සංඛ්‍යා සටහන | - රාජ්‍ය මූල්‍ය කටයුතු | 174 |
| 17 වන සංඛ්‍යා සටහන | - මුදල් සමස්තවල ප්‍රවණතා සහ තුඩු දුන් සාධක | 175 |
| 18 වන සංඛ්‍යා සටහන | - වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් | 176 |
| 19 වන සංඛ්‍යා සටහන | - තෝරාගත් පොලී අනුපාතික | 177 |
| 20 වන සංඛ්‍යා සටහන | - බැංකු කටයුතුවල ව්‍යාප්තිය | 178 |
| 21 වන සංඛ්‍යා සටහන | - මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රවණතා | 178 |

# 1

# සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය, අහිතකර කාලගුණික තත්ත්වය විසින් ආර්ථිකය මත ඇතිකරන ලද දැඩි බලපෑම් හමුවේ වුවද, රාජ්‍ය මූල්‍ය හා මුදල් අධිකාරීන් විසින් අනුගමනය කරනු ලැබූ සාර්ව ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින් වසරේ පළමු මාස නවය තුළදී සාධනීය වර්ධනයක් පෙන්නුම් කළේය. 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේ පළමු භාගයේදී සියයට 3.9 කින් වර්ධනය විය. නියං හා ගංවතුර තත්ත්ව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික කටයුතුවලට බාධා ඇති කරමින් සමස්ත වර්ධනයට සෘණ දායකත්වයක් දැක්වූ අතර, එය අනිකුත් අංශ වෙතද බලපෑම් ඇති කළේය. කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීමෙහිලා කර්මාන්ත හා සේවා ආශ්‍රිත කටයුතු ධනාත්මකව දායක විය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් සඳහා ඉදිකිරීම් සහ පතල් හා කැණීම් අංශවල අඛණ්ඩ වර්ධනය ප්‍රධාන වශයෙන් බලපෑවේය. සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම, මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳ කටයුතු සහ ප්‍රවාහනය හේතු විය. ඉහළ යන ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් හමුවේ ආනයන වියදම් ඉහළ යෑම, සැපයුම් අංශය මත ඇතිවූ බාධා හේතුවෙන් දේශීය ආහාර නිෂ්පාදනවල මිල ගණන් ඉහළ යෑම හා කාලගුණික හේතු නිසා විපතට පත් ජනතාවට සහන සැපයීම සඳහා දැරීමට සිදුවූ පිරිවැය හේතුවෙන් අහිතකර කාලගුණ තත්ත්වය ආර්ථිකයේ අනෙකුත් අංශ වෙතද බලපෑමක් ඇති කළේය. ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය සඳහා ආයෝජන හා පරිභෝජන වියදම් යන දෙඅංශයෙහිම වර්ධනය දායක වූ අතර, ශුද්ධ අපනයන තවදුරටත් වර්ධන ප්‍රවණතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. මේ අතර, වසරේ පළමු භාගය තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම අනුව සැලකූ විට සේවා වියුක්තිය පහත වැටුණි. දේශීය සැපයුමට බාධා ඇති වීම, බදු සංශෝධන හා ආනයනික භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික මිල උද්ධමනය ඉහළ මට්ටමක පැවතුණද, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කිරීම හේතුවෙන් ඉල්ලුම තුළින් ඇති වන උද්ධමන පීඩනය හා උද්ධමන අපේක්ෂා පාලනය කළ හැකි විය. බැංකු පද්ධතිය තුළ විදේශීය හා දේශීය වත්කම් වර්ධනය වීම හේතුවෙන් පුළුල් මුදල් වර්ධනය ඉහළ මට්ටමක පැවතුණද, පෞද්ගලික අංශය සඳහා සපයන ලද ණය වර්ධනය ක්‍රමයෙන් අඩු විය. අපනයන ආදායම ඉහළ ගියද, අයහපත් කාලගුණික තත්ත්වය හමුවේ ආනයන සඳහා වියදම් ඉහළ යෑම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අඩු වීම හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ පැහැදිලි වර්ධනයක් අපේක්ෂිත පරිදි සිදු නොවූ නමුත්, විදේශීය ආයෝජකයන්ගේ ධනාත්මක ආකල්ප හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ගෙවුම් ශේෂයෙහි වර්ධනයක් ඇති කිරීමට හේතු විය. වසර තුළදී විදේශ විනිමය ලැබීම් වර්ධනය වීම, ජාත්‍යන්තර සංචිත ඉහළ නැංවීමට සහ වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට උපකාරී විය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය මූල්‍ය අංශයෙහි ආදායම් රැස් කිරීම මෙන්ම ප්‍රාථමික ගිණුමේ ශේෂය ද වර්ධනය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන්, අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ජනතාවට සහන සැපයීම සඳහා අතිරේක මූල්‍ය පිරිවැයක් දැරීමට සිදුවූ හෙයින් 2017 වර්ෂය සඳහා ඉලක්ක කළ මට්ටමට වඩා අයවැය හිඟයෙහි කිසියම් වෙනස්වීමක් සිදු විය හැකිය. මේ අතර, මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතිණ. එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එය ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීමටද උපකාරී විය. ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්තිය, වෙළඳපොළ පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ඉදිරි කාලය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂිතය. මෙම ප්‍රතිපත්තිවල දිගුකාලීන බව තහවුරු කිරීම උදෙසා ඒවා ආයතනගත කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදී ඇත. කෙසේ වුවද, වසර තුළ මෙතෙක් දක්නට ලද සාධනීය වර්ධනයන් මත පදනම්ව ආර්ථිකයේ අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීමට හැකියාව ලැබෙන පරිදි, විදේශ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම, ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ආර්ථිකයෙහි ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කර ගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තුළින් මෙම ක්‍රියාවලියට සහය දිය යුතුව ඇත.

# 1

## ආංශික වර්ධනයන්

### මූර්ත අංශය සහ උද්ධමනය


- **ශ්‍රී ලංකා ආර්ථිකය, 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී සියයට 3.9 කින් වර්ධනය විය.** පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේ පළමු භාගයේදී ද අහිතකර කාලගුණික තත්ත්ව ආර්ථික වර්ධනයට බාධා ඇති කළේය. ඒ අනුව, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගයෙහි වර්ධනය අඩු වූ අතර, එමගින් ආර්ථිකයේ අනෙකුත් අංශවලටද බලපෑමක් ඇති විය. වී, තෙල් සහිත පලතුරු භෝග (පොල්, තැඹිලි, කටු පොල්), එළවළු සහ ධාන්‍ය වර්ග (සහල් හැර) යන කෘෂිකාර්මික කටයුතුවලට කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වැඩි බලපෑමක් ඇති විය. කෙසේ වෙතත්, වසරේ පළමු භාගය තුළදී කර්මාන්ත හා සේවා කටයුතු ප්‍රසාරණය විය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය සඳහා ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල සිදු වූ අඛණ්ඩ වර්ධනය ප්‍රධාන වශයෙන්ම හේතු විය. මේ අතර, සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළඳ කටයුතු සහ ප්‍රවාහනය දායක විය. මේ අතර, වියදම් ප්‍රවේශය යටතේ කරන ලද ඇස්තමේන්තුවලට අනුව, 2017 වසරේ පළමු භාගය තුළදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රසාරණය සඳහා ආයෝජන හා පරිභෝජන වියදම් යන දෙඅංශයෙහි වර්ධනය හේතු විය. ශුද්ධ විදේශීය ඉල්ලුම වසරේ දෙවන කාර්තුව තුළ කිසියම් වර්ධනයක් පෙන්නුම් කරනු ලැබුවද, 2017 වසරේ පළමු කාර්තුව තුළදී ආර්ථික වර්ධනය මත අඛණ්ඩව අහිතකර ලෙස බලපෑවේය.

- **2016 වසරේ පළමු භාගය තුළදී සියයට 4.4 ක් වූ සේවා වියුක්ති අනුපාතය, 2017 වසරේ පළමු භාගයේදී සියයට 4.3 ක් දක්වා සුළු වශයෙන් අඩු විය.** කාන්තා සේවා වියුක්ති අනුපාතයෙහි ඉහළ යෑමක් වාර්තා වුවද පුරුෂ සේවා වියුක්ති අනුපාතයෙහි සිදු වූ අඩු වීම මෙම වර්ධනය සඳහා හේතු විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළදී තරුණ සහ අධ්‍යාපනික සුදුසුකම් ලත් පුද්ගලයන් අතර සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතුණි. සේවා වියුක්ති අනුපාතය අඩු වුවද, වසරේ පළමු භාගය තුළදී රැකියා විරහිත පුද්ගලයන් සංඛ්‍යාවෙහි සුළු වැඩිවීමක් සිදු විය. මේ අතර, 2016 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 53.7 හා සැසඳීමේදී සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 2017 වසරේ පළමු භාගයේදී සියයට 54.3 ක් දක්වා වර්ධනය විය. සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයෙහි මෙම ඉහළ යෑම සඳහා 2017 වසරේ පළමු භාගය තුළදී කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වයෙහි සිදු වූ වර්ධනය හේතු වූ අතර, පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය සුළු වශයෙන් අඩු විය. කෙසේ වෙතත්, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය තවදුරටත් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතින අතර, කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම තුළින් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීමට ඇති හැකියාව එමගින් අවධාරණය කෙරේ.

- **බදු සංශෝධන, රට තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් සැපයුම් තත්ත්වයේ ඇතිවූ අවහිරතා සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම් යනාදියෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2017 වසරේ මේ දක්වා කාලය තුළ පාරිභෝගික මිල උද්ධමනය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතුණි.** අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ ඇති වූ අවහිරතා සහ රජයේ බදු සංශෝධනවල බලපෑම හේතුවෙන් ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මෙන්ම, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) පදනම් කරගෙන මනිනු ලබන මතුපිට උද්ධමනය, 2017 වසරේ පළමු කාර්තුව තුළදී ඉහළ අගයක පැවතුණි. කෙසේ වුවද, සැපයුම් අංශයෙහි ඇති වූ වර්ධනය සහ රජය මගින් අත්‍යවශ්‍ය ආහාර අයිතම ආනයනය සඳහා පියවර ගැනීම හේතුවෙන් 2017 වසරේ දෙවන කාර්තුව තුළදී උද්ධමනයෙහි මන්දගාමී වීමක් දක්නට ලැබුණි. අඛණ්ඩව පැවති අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් මිල මට්ටම් ඉහළ යෑම හමුවේ ආහාර කාණ්ඩයෙහි උද්ධමනය තීව්‍ර ලෙස ඉහළ යෑම තුළින්, මෙම ප්‍රවණතාව 2017 අගෝස්තු මස සිට වෙනස් විය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ උද්ධමනය ඉහළ යෑම පිළිබිඹු කරමින්, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2017 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 8.6 ක් දක්වා ඉහළ ගිය අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනයද සියයට 7.1 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, මූලික උද්ධමනයෙහි වෙනස්වීම් කෙරෙහිද බදු සංශෝධන තුළින් යම් බලපෑමක් ඇති විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ඉල්ලුමෙන් ඇති වන උද්ධමන පීඩන බොහෝ දුරට අවම වීම පිළිබිඹු කරමින් මූලික උද්ධමනය සාමාන්‍ය වශයෙන් පහළ අගයක පැවතුණි. ඒ අනුව, ජා.පා.මි.ද. මත


**ශ්‍රී ලංකා ආර්ථිකය, කාලගුණය ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ වුවද වර්ධනය වූ අතර...**

### 1.1 රූප සටහන : කාර්තුමය මූර්ත ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)





**... ප්‍රධාන වශයෙන් ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් මතුපිට උද්ධමනය ඉහළ ගියේය.**

### 1.2 රූප සටහන : ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)





**අපනයන ඉහළ යෑම හමුවේ වුවද, අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ජංගම ගිණුමේ අපේක්ෂිත වර්ධනය මත බලපෑම් ඇති වූ අතර...**

### 1.3 රූප සටහන : වෙළඳ හිගය සහ ජංගම ගිණුමේ ශේෂය





**...අඛණ්ඩ විදේශ මූල්‍ය ලැබීම්, ගෙවුම් තුලනය වර්ධනය කිරීම සහ විදේශීය විනිමය සංචිත ඉහළ යෑම සඳහා උපකාරී විය.**

### 1.4 රූප සටහන : සමස්ත ශේෂය සහ දළ නිල සංචිත





**රජයේ ආදායම් රැස් කිරීම ඉහළ ගියද, විශේෂයෙන්ම ජනතාවට සහන සැලසීමේ කටයුතු හේතුවෙන් රජයේ වියදම්ද වැඩි වූ නමුත්...**

### 1.5 රූප සටහන : රාජ්‍ය ආදායම සහ වියදම





**...අභියෝග මධ්‍යයේ වුවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව ක්‍රියාත්මක විය.**

### 1.6 රූප සටහන : ප්‍රධාන අයවැය ශේෂ





**දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවති අතර...**

### 1.7 රූප සටහන : තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම




**...පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රසාරණය ක්‍රමයෙන් මන්දගාමී විය.**

### 1.8 රූප සටහන : වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය




**සමස්තයක් වශයෙන්, ඉදිරි කාලය තුළදී ආර්ථික වර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කරමින් මෙතෙක් අනුගමනය කරනු ලැබූ ස්ථායීකරණ ක්‍රියාමාර්ග සඳහා ආර්ථිකය මනාව ප්‍රතිචාර දැක්වීය.**

පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2016 අවසානයේ පැවති සියයට 6.7 සිට 2017 සැප්තැම්බර් මාසය අවසානයේදී සියයට 4.6 ක් දක්වා අඩු විය. කෙසේ වුවද, කො.පා.මි.ද. පාදක කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2016 වසර අවසානයේ පැවති සියයට 5.8 සිට 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 6.0 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

**විදේශීය අංශය**

- **විදේශීය අංශය තුළ, අපනයන ආදායම ක්‍රමයෙන් වර්ධනය වීම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළදී වෙළඳ හිඟයෙහි පුළුල් වීම මන්දගාමී විය.** පසුගිය දෙවසර තුළ පෙන්නුම් කළ මන්දගාමී ක්‍රියාකාරිත්වය වෙනස් කරමින් 2017 වසරේ මාර්තු මාසයේ පටන් අපනයන යථා තත්ත්වයට පත්වූ අතර, 2017 වසරේ පළමු මාස අට තුළ සමුච්චිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 7,413 ක් දක්වා ඉහළ ගියේය. ප්‍රධාන අපනයන වෙළඳපොළවල් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම, ජාත්‍යන්තර වෙළඳපොළවල වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, යුරෝපා සංගමය මගින් ලබා දෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු පහසුකම (ජී.එස්.පී. ප්ලස්) ප්‍රතිස්ථාපනය කිරීම, විදේශීය වෙළඳාම සඳහා පහසුකම් සපයන ආයතනවල සහයෝගයද සමඟින් හිතකර විදේශීය වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම සහ වඩාත් තරගකාරී විනිමය අනුපාතිකයක් පැවතීම අපනයන ආදායම ඉහළ යෑම සඳහා හේතු විය. ඒ අනුව, තේ, ඛනිජ තෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, කුළුබඩු, මුහුදු ආහාර සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනය කිරීමෙන් ලද ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, වසරේ පළමු භාගයේදී අපනයන ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම යම් ප්‍රමාණයකට අඩු විය. කෙසේ වුවද, යුරෝපා සංගමය මගින් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු පහසුකම යළි හිමිවීමත් සමඟ 2017 වසරේ ජූලි සහ අගෝස්තු මාසවලදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 9.6 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 13,599 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ආනයන වියදමෙහි ප්‍රසාරණය සඳහා ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය විශාල වශයෙන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. වියළි කාලගුණික තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස ජල විදුලි උත්පාදනය පහළ යෑමත් සමඟ දේශීය විදුලි උත්පාදන අංශයෙහි ඉන්ධන ඉල්ලුම ඉහළ යෑම, ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉන්ධන මිල ගණන් ඉහළ යෑමද ඉන්ධන වියදම කෙරෙහි බලපෑවේය. තවද, කාලගුණික තත්ත්වයන්ගෙන් බලපෑමට ලක්වූ දේශීය සැපයුමෙහි පවතින හිඟය සපුරාලීමට සහල් ආනයනය දිරිමත් කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2017 ජනවාරි මාසයේ සිට සහල් ආනයනය අඛණ්ඩව ඉහළ ගියේය. පෙර වසරේදී වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ඉවත් කිරීම මෙම වසර තුළ රත්‍රන් ආනයන පරිමාව ඉහළ යෑමට බලපෑවේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ, පෞද්ගලික රථවාහන, පොහොර සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම අඩු විය. මෙම ප්‍රවණතා සමඟ, 2017 වසරේ පළමු මාස අට තුළ වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 5,515 සිට එ.ජ.ඩොලර් මිලියන 6,186 ක් දක්වා පුළුල් විය.

- **වෙළඳ ගිණුමෙහි හිඟයට අමතරව, ප්‍රාථමික ආදායම් ගිණුමෙහි හිඟය පුළුල් වීම සහ සේවා ගිණුම සහ ද්විතීයික ආදායම් ගිණුම සඳහා වූ ලැබීම් මන්දගාමී වීම, 2017 වසරේ පළමු භාගය තුළදී ජංගම ගිණුමෙහි හිඟය පුළුල් වීම සඳහා හේතු විය.** ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු භාගයේදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය. 2017 වසරේ පළමු භාගයේදී සේවා ගිණුමෙහි අතිරික්තය සුළු වශයෙන් වර්ධනය වූ අතර ගුවන් යානා ධාවන පථය නැවත සකස් කිරීමේ කටයුතු නිසා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අර්ධ වශයෙන් වසා දැමීම සහ ඩෙංගු රෝග ව්‍යාප්තිය උත්සන්න වීමද හේතුවෙන් සංචාරක පැමිණීම් අඩු වීම තුළින් සංචාරක ඉපැයීම් පහළ යෑම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, ප්‍රතිනැව්ගත කිරීම් ඉහළ යෑමත් සමඟ ප්‍රවාහන සේවා අංශයෙහි ධනාත්මක වර්ධනයක් පැවතුණි. ඉන්ධන මිල ගණන්වල අඛණ්ඩ පහත වැටීම සහ භූ-දේශපාලනික අස්ථාවරත්වය හමුවේ මැද පෙරදිග රටවල පැවති මන්දගාමී ආර්ථික ක්‍රියාකාරීත්වය සහ

රාජ්‍ය ප්‍රතිපත්තීන්වල සිදුවූ වෙනස්කම් හේතුවෙන් සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහළ යෑම, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගයේදී ද්විතීයික ආදායම් ගිණුමෙහි අතිරික්තය අඩුවීම සඳහා හේතු විය. සංචාරක ඉපැයීම් සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අපේක්ෂිත මට්ටමට වඩා අඩු ක්‍රියාකාරීත්වය සහ වෙළඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟය පුළුල් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස, 2016 අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 644 ක හිඟය හා සැසඳීමේදී ජංගම ගිණුම 2017 වසරේ පළමු භාගයේදී එ.ජ. ඩොලර් මිලියන 1,480 ක සැලකිය යුතු හිඟයක් වාර්තා විය.

- **2017 වසරේ පළමු කාර්තුවේදී මූල්‍ය ගිණුම වෙතින් ඉහළ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වුවද, වසරේ දෙවන කාර්තුව තුළදී මූල්‍ය ගිණුම සඳහා සැලකිය යුතු ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.** රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශිකයන් සතු ආයෝජන ආපසු ගෙවීම් වසරේ පළමු කාර්තුවේදී මූල්‍ය ගිණුම තුළ වාර්තා වූ ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි දෙවන සමාලෝචනය සාර්ථකව අවසන් කිරීම සහ එක්සත් ජනපදයේ රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ඵලදා අනුපාතික ක්‍රමානුකූලව ස්ථාවරත්වයට පත්වීමත් සමඟ ආයෝජක විශ්වාසය ඉහළ යෑමත් සමඟින් වසරේ දෙවන කාර්තුවේදී මූල්‍ය ප්‍රවාහවල වෙනස්වීමක් දක්නට ලැබිණ. පළමු කාර්තුවේදී වාර්තා වූ ගෙවීම්වල බලපෑම අවම කරමින් දෙවන කාර්තුවේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත ලැබීම් ක්‍රමානුකූලව ඉහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැබීම් ඉහළ යෑම, විදේශීය සෘජු ආයෝජන ඉහළ යෑම, එකොළොස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම තුළින් වූ ලැබීම් සහ රජය විසින් ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමට අදාළ ලැබීම් තුළින් මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් විය. විදේශ අංශයෙහි ගිණුම්වල දක්නට ලැබූ මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2017 වසරේ ජුනි මස අවසානයේදී එ.ජ. ඩොලර් මිලියන 1,563 ක් වූ ගෙවුම් තුලනයෙහි සමස්ත අතිරික්තය, සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 2,027 ක් දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ හා සසඳන විට 2016 වසර අවසානය වන විට ගෙවුම් තුලනයෙහි එ.ජ. ඩොලර් මිලියන 500 ක හිඟයක් පැවතුණි.

- **දළ නිල සංචිත ප්‍රමාණය, 2016 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට 2017 සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.3 දක්වා වර්ධනය විය.** ප්‍රධාන වශයෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 1,161 ක් ශුද්ධ පදනම මත මිලදී ගැනීම, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළින් ලැබීම් මෙන්ම, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් තුළින් වූ ලැබීම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හරහා වූ ශුද්ධ ණය ගැනීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ තුන්වන වාරිකය ලැබීම හේතුවෙන් 2017 සැප්තැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළදී සිදු කරන ලද ප්‍රධාන ගෙවීම්වලට ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති විදේශීය විනිමය හුවමාරු ගිවිසුම පියවීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ සිදු කළ ආපසු ගෙවීම් සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත වූ ශුද්ධ ගෙවීම්ද ඇතුළුව විදේශ ණය සේවාකරණ ගෙවීම්ද ඇතුළත් විය. ඒ අනුව, 2017 සැප්තැම්බර් මස අවසානය වන විට පැවති දළ නිල සංචිත ප්‍රමාණය, ආනයන මාස 4.2 කට සමාන වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇත. වෙළඳපොළ වෙතින් සෘජු මිලදී ගැනීම් සහ කෙටිකාලීන වගකීම් අඩු කිරීම හරහා සංචිත ගොඩනගා ගැනීම මගින් සිදුවූ ජාත්‍යන්තර සංචිතවල ගුණාත්මක වර්ධනය නිරූපණය කරමින්, කෙටිකාලීන ණය සහ වගකීම් අනුව වන සංචිතවල ප්‍රමාණාත්මකභාවය 2016 වසර අවසානයේදී පැවති සියයට 52 සිට 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 62 දක්වා ඉහළ ගියේය.

- **විදේශීය වාතාවරණයෙහි සිදුවූ වර්ධනය හේතුවෙන් 2017 වසර තුළ වඩාත් වෙළඳපොළ පාදක කරගත් විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වූ අතර, ඒ යටතේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම, විදේශීය සංචිත ගොඩනැගීමේ අරමුණ පමණක් සහිතව විනිමය අනුපාතික මත අවම බලපෑමක් ඇති වන අයුරින් සිදු විය.** ආනයන වියදම්, ණය සේවාකරණ ගෙවීම් සහ විදේශ විනිමය මත පදනම් වූ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම යනාදී අඛණ්ඩ ගෙවීම් 2017 වසරේ පළමු කාර්තුව තුළදී රුපියල මත පීඩනයක් එල්ල කිරීමට හේතු විය. කෙසේ වෙතත්, ඉන් අනතුරුව, කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන

වැඩි වශයෙන් ලැබීම සහ අපනයන ආදායම් වැඩිවීම හේතුවෙන් මෙම තත්ත්වය වෙනස් විය. මෙම වෙනස් වීමත් සමග එතැන් සිට කාලපරිච්ඡේදය තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය ශුද්ධ පදනම මත අවශෝෂණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. මේ අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම ලබාගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ තෙවන වාරිකය ලැබීම හේතුවෙන් ආයෝජන විශ්වාසය වැඩිදියුණු වීමත් සමග 2017 මැයි මාසයේ සිට රුපියල අවප්‍රමාණය වීම සඳහා වූ පීඩනය තවදුරටත් ක්‍රමයෙන් අඩු විය. සමස්තයක් ලෙස, ශ්‍රී ලංකා රුපියල 2017 වසරේ සැප්තැම්බර් මස අග දක්වා කාලය තුළදී සියයට 2.2 කින් අවප්‍රමාණය විය. ඇතැම් ප්‍රධාන මුදල් වර්ග කිහිපයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදුවූ නාමික අවප්‍රමාණය පිළිබිඹු කරමින් මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක 2017 සැප්තැම්බර් මස අග දක්වා කාලය තුළදී අවප්‍රමාණය විය. විනිමය පැසෙහි අන්තර්ගත රටවල උද්ධමනයෙහි වෙනස්වීම්ද සැලකිල්ලට ගෙන ගණනය කරනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක මෙම කාලපරිච්ඡේදය තුළදී සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වුවද, 2010 වසරේ පැවති විදේශීය තරගකාරී මට්ටම ළඟා කර ගැනීම සඳහා රුපියල තවදුරටත් අවප්‍රමාණය වීමෙහි අවශ්‍යතාව පිළිබිඹු කරමින් එම දර්ශක අගයන් දර්ශකාංක 100 සීමාවට ඉහළින් පැවතුණි.

### රාජ්‍ය මූල්‍ය අංශය

- **රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සහ රාජ්‍ය ණය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා රජය 2017 වසර තුළදී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දුන්නේය.** ඒ අනුව, දැනට පවතින ආදායම් බදු ව්‍යුහය සරල කිරීම සහ තාර්කීකරණය කිරීම, බදු අත්හැරීම් ඉවත් කිරීම මගින් සෘජු බදු ආදායම පුළුල් කිරීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව 2017 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසින් දේශීය ආදායම් පනත් කෙටුම්පත සම්මත කරන ලදී. මේ සම්බන්ධයෙන් ගත් කල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) මගින් බදු ගෙවන්නන් හට බදු වර්ග කිහිපයක් සඳහා අන්තර්ජාලය ඔස්සේ බදු ගෙවීමේ හැකියාව ලබා දෙන ලදී. මීට අමතරව, විදේශ වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ජාතික තනි ප්‍රවේශ පද්ධතිය (NSWS) ස්ථාපිත කිරීමට මූලික පියවර ගෙන ඇති අතර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කර ඇති ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) 2017 අවසාන කාර්තුවේ සිට තෝරාගත් අමාත්‍යාංශ කිහිපයක් තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. පුනරාවර්තන වියදම් තාර්කීකරණය කිරීම සම්බන්ධයෙන් ගත් කල, රාජ්‍ය මූල්‍ය පාලනය සඳහා පාර්ලිමේන්තුවට ඇති හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව 2017 අයවැය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි, 2017 වසරේ පළමු සහ දෙවන කාර්තු සඳහා වන කාර්තුමය වියදම් සහ ආදායම් කාර්යසාධනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. තවද, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව සඳහා වන ජාතික නියෝජිතායතනය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කරන ලදී. රජය සතු වාණිජ ව්‍යවසායවල මූල්‍යමය ශක්තිය වැඩිදියුණු කිරීමටත්, එමඟින් දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමටත්, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමත් සඳහා රජය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසාය පාලනය සහ මූල්‍ය විනය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසාය පහක් සමඟ ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කළ අතර, රජය සතු තවත් වාණිජ ව්‍යවසාය දහයක් සමඟද ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කිරීමට අපේක්ෂිතය. රාජ්‍ය ණය කළමනාකරණ උපායමාර්ගය වැඩිදියුණු කිරීමට සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා වසර තුළදී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. පූර්වෝපායික ණය කළමනාකරණයක් සඳහා අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කිරීම සඳහා නව රාජ්‍ය වගකීම් කළමනාකරණ පනතක්ද මේ වන විට කෙටුම්පත් කෙරෙමින් පවතී.

- **අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් රජයට දැරීමට සිදු වූ සහන සැලසීමේ වියදම් හේතුකොට ගෙන වසර සඳහා වූ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉලක්ක වෙතින් අපගමනය වීමට ඉඩ ඇති නමුත්, 2017 වසර තුළදී රාජ්‍ය මූල්‍ය අංශයෙහි යම් වර්ධනයක් දක්නට ලැබුණි.** 2017 වසරේ පළමු මාස අට තුළදී, රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු

වර්ධනයක් වාර්තා කළ අතර, එය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 8.2 සිට සියයට 9.0 දක්වා ඉහළ ගියේය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ එකතු කළ අගය මත බද්ද, ඛනිජ තෙල් හා මෝටර් රථවාහන මත නිෂ්පාදන බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද වැනි භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම ඉහළ යෑමයි. ආර්ථික සේවා ගාස්තු ආදායම ඉහළ යෑම හේතුකොට ගෙන ආදායම් බදු ආදායමද ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී මද්‍යසාර, දුම්වැටි සහ දුම්කොළ මත සුරාබදු ආදායම් අඩු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මද්‍යසාර සහ දුම්වැටි අලෙවිය පහළ යෑමයි. බදු ඉතා ඉහළ මට්ටමක් දක්වා වැඩි කිරීම සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් වනු ඇත. පුනරාවර්තන වියදම් මෙන්ම රාජ්‍ය ආයෝජනද ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළදී මුළු වියදම සහ ශුද්ධ ණයදීම් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 12.2 සිට සියයට 13.0 දක්වා වැඩි වූ අතර, පුනරාවර්තන වියදම් මෙන්ම රාජ්‍ය ආයෝජන ද ඉහළ යෑම ඒ සඳහා හේතු විය. රාජ්‍ය ආදායමේ වැඩිවීමට වඩා රාජ්‍ය වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 3.9 සිට සියයට 4.0 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වර්තන ගිණුමේ මෙන්ම ප්‍රාථමික ගිණුමේද වර්ධනයක් දක්නට ලැබුණු අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ 2017 ජූනි මස 30 වැනි දිනට අදාළ ඉලක්කය ළඟාකර ගැනීමට හැකි විය.

- **2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 520.2 ක සමස්ත අයවැය හිඟය මූල්‍යනය කිරීමේදී දේශීය මූලාශ්‍ර මෙන්ම විදේශීය මූලාශ්‍රද ප්‍රයෝජනයට ගැනිණ.** කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදයේදී ශුද්ධ දේශීය මූල්‍යනය රුපියල් බිලියන 273.5 ක් වූ අතර එය පසුගිය වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 309.5 ට වඩා අඩු අගයකි. මේ අතර, ශුද්ධ විදේශීය මූල්‍යනය මෙම කාලපරිච්ඡේදය තුළදී 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 175.6 සිට රුපියල් බිලියන 246.7 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## මුදල් අංශය

- **උද්ධමනය හා මුදල් සමස්තවල ප්‍රවණතා සලකා බලා 2017 වසරේ මේ දක්වා කාලය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය.** අහිතකර උද්ධමන අපේක්ෂා ඉස්මතු වීම සහ මුදල් සැපයුමෙහි අධික ප්‍රසාරණය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේ මාර්තු මාසය තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 කින් ඉහළ නැංවීය. එතැන් සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම්

**සංඛ්‍යා සටහන 1.1**
**මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

| දිනය | ක්‍රියාමාර්ගය |
|---|---|
| 2013 මැයි 10 | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පදනම් අංක 50 කින්, පිළිවෙළින්, 7.00% සහ 9.00% දක්වා අඩු කරන ලදී. |
| 2013 ජූනි 26 | 2013 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රතිශතාංක 2 කින් 6% දක්වා අඩු කරන ලදී. |
| 2013 ඔක්තෝබර් 15 | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පදනම් අංක 50 කින්, පිළිවෙළින්, 6.50% සහ 8.50% දක්වා අඩු කරන ලදී. |
| 2014 ජනවාරි 02 | ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව ලෙස නම් කරන ලද අතර, මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස නම් කරන ලදී.<br>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින් 8.00% දක්වා අඩුකරන ලදී.<br>2014 පෙබරවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සුරැකුම් රහිතව සිදු කරන ලදී. |
| 2014 සැප්තැම්බර් 23 | විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගීවන්නන් සඳහා වන 6.50% ක් වූ නිත්‍ය තැන්පතු පහසුකම දිනදර්ශිත මසකට උපරිම අවස්ථා තුනක් දක්වා සීමා කරන ලදී. අවස්ථා තුන ඉක්මවා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කරන විවට වෙළඳපොළ කටයුතු සඳහා සහභාගීවන්නන් හට වාර්ෂිකව 5.00% ක් වූ විශේෂ පොලී අනුපාතිකයක් පනවන ලදී. |
| 2015 මාර්තු 02 | 5.00% විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය ඉවත් කරන ලදී. |
| 2015 අප්‍රේල් 15 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින්, පිළිවෙළින්, 6.00% සහ 7.50% දක්වා අඩු කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 03 | වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් තත්ත්ව අනුව විනිමය අනුපාතික තීරණය වීමට ඉඩ හරින ලදී. |
| 2015 දෙසැම්බර් 30 | 2016 ජනවාරි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ප්‍රතිශතාංක 1.50 කින් 7.50% දක්වා ඉහළ නංවන ලදී. |
| 2016 පෙබරවාරි 19 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින්, පිළිවෙළින්, 6.50% සහ 8.00% දක්වා ඉහළ නංවන ලදී. |
| 2016 ජූලි 28 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින්, පිළිවෙළින්, 7.00% සහ 8.50% දක්වා ඉහළ නංවන ලදී. |
| 2017 මාර්තු 24 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 කින්, පිළිවෙළින්, 7.25% සහ 8.75% දක්වා ඉහළ නංවන ලදී. |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි.

- **2017 වසරේ ජූලි මස මැද භාගයේ සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමඟ කෙටිකාලීන පොලී අනුපාතිකවල අඩු වීමක් දක්නට ලැබුණද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ රාජ්‍ය අයවැය සඳහා වූ ඉහළ මූල්‍යන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දක්වමින් 2017 වසරේ පළමු මාස නවය තුළ බොහොමයක් පොලී අනුපාතික ඉහළ ගියේය.** දැඩි මුදල් තත්ත්ව පිළිබිඹු කරමින්, 2017 වසරේ පළමු මාස හත තුළදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයෙහි පැවතුණි. කෙසේ වෙතත්, ජූලි මස මැද භාගයේ සිට වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑමත් සමඟ 2017 සැප්තැම්බර් මාසය අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යය දක්වා පහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්වීම්වලට අනුරූපව වෙනස් විය. වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින්, විශේෂයෙන්ම, 2017 වසරේ පළමු මාස හත තුළ වාණිජ බැංකුවල තැන්පතු පොලී අනුපාතික ඉහළ ගියේය. වාණිජ බැංකුවල ණය පොලී අනුපාතික ද තවදුරටත් ඉහළ ගොස් 2017 සැප්තැම්බර් අවසානය වන විට ඉහළ මට්ටම්වල ස්ථාවර විය. අරමුදල් සඳහා රජයේ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස හතර තුළ ඉහළ ගිය ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික, ඉන්පසුව, රජය වෙත ලැබුණු විදේශ අරමුදල් ප්‍රවාහ ඉහළ යෑම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තුන්වන වාරිකය ලැබීමත් සමඟ වෙළඳපොළ හිතකර අපේක්ෂා වර්ධනය වීම සහ රජයේ ආදායම් රැස් කිරීම ඉහළ යෑම හේතුවෙන් පහළ ගියේය. එසේම, වසරේ පළමු කාර්තුව තුළ දක්නට ලැබුණු ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් වී, ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතික, 2017 වසරේ අප්‍රේල් මාසයේ සිට අඩුවීමක් වාර්තා කළේය. මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, 2017 වසරේ පළමු මාස නවය තුළදී විශේෂයෙන්ම, ඵලදා වක්‍රයෙහි දිගුකාලීන අන්තයෙහි පහළට විතැන් වීමක් සහිතව ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික පහළ ගියේය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළදී සාංගමික ණය උපකරණ මත වූ පොලී අනුපාතික ඉහළ ගියේය. ජාත්‍යන්තර පොලී අනුපාතික වෙනස්වීම් හේතුවෙන්, වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික 2017 වසරේ පළමු මාස නවය තුළදී සුළු වශයෙන් ඉහළ ගියේය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) තවදුරටත් වර්ධනය විය.** 2016 වසර අවසානයේදී පැවති සියයට 18.4 හා සැසඳීමේදී පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2017 වසරේ අගෝස්තු මාසය අවසානයේදී සියයට 21.3 ක් විය. 2016 ජූලි මාසයේ සිට පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනයෙහි මන්දගාමී වීමක් දක්නට ලැබුණද, පෞද්ගලික අංශය, රජය සහ රාජ්‍ය ව්‍යවසාය වෙත සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා ශුද්ධ දේශීය වත්කම් සියයට 78 ක දායකත්වයක් සැපයීය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම මූලික වශයෙන් හේතුකොටගෙන 2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු පද්ධතියෙහි ශුද්ධ විදේශීය වත්කම් ද ඉහළ ගියේය.

- **මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ එහි ප්‍රතිඵල වශයෙන් ඉහළ ගිය වෙළඳපොළ පොලී අනුපාතික සඳහා ප්‍රතිචාර දක්වමින් 2017 වසරේ පළමු මාස අට තුළ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය මන්දගාමී විය.** 2016 ජූලි මාසයේදී වාර්තා වූ සියයට 28.5 ක උපරිමය සහ 2016 වසර අවසානයේ වාර්තා වූ සියයට 21.9 හා සැසඳීමේ දී, පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 18.0 ක් දක්වා මන්දගාමී විය. 2017 වසරේ පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළදී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාල පරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 456.3 හා සැසඳීමේදී රුපියල් බිලියන 404.6 ක් විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, 2017 වසරේ පළමු භාගය තුළදී ආර්ථිකයෙහි සියලු ප්‍රධාන අංශ සඳහා

සපයන ණය ප්‍රවාහ මන්දගාමී අනුපාතිකයකින් වුවද අඛණ්ඩව ඉහළ ගියේය. පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය වර්ධනය තවදුරටත් මන්දගාමී වී 2017 වසර අවසානය වන විට සියයට 15-16 අතර වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **2017 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය අංශය විසින් බැංකු අංශයෙන් ලබාගත් ණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි.** 2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය අඛණ්ඩව ඉහළ ගිය අතර, මේ සඳහා මුළුමනින්ම හේතු වූයේ වාණිජ බැංකු විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යෑමයි. 2017 වසරේ පළමු මාස අට තුළදී, වාණිජ බැංකු විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 384.9 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 119.5 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 178.4 හා සැසඳීමේදී 2017 පළමු මාස අට තුළ රුපියල් බිලියන 265.4 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2017 වසරේ පළමු මාස පහ තුළදී රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළද, ඉන්පසු එම ණය ප්‍රසාරණය මන්දගාමී විය. 2017 අගෝස්තු මස අග වනවිට රාජ්‍ය සංස්ථා විසින් ලබාගත් ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා වූ රුපියල් බිලියන 81.5 ක අඩු වීමට සාපේක්ෂව රුපියල් බිලියන 7.8 කින් ඉහළ ගියේය.

### මූල්‍ය අංශය

- **සියලුම ප්‍රධාන අංශවල ක්‍රියාකාරිත්වය යහපත් මට්ටමක පැවතීමත් සමඟ, 2017 වසරේ පළමු මාස අට තුළදී මූල්‍ය අංශය තවදුරටත් ප්‍රසාරණය විය.** ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් බැංකු පද්ධතිය තවදුරටත් වර්ධනය වූ අතර, එමගින් එම අංශයෙහි ස්ථාවරභාවය තහවුරු කෙරිණි. බැංකු පද්ධතියේ වත්කම් පදනම අඛණ්ඩව වර්ධනය වූ අතර, ඉහළ ණය වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස අක්‍රීය ණය අනුපාතය ඉහළ යෑම මගින් පිළිබිඹු වන පරිදි වත්කම්වල ගුණාත්මකභාවයෙහි සුළු හීනවීමක් දක්නට ලැබුණි. ප්‍රධාන වශයෙන්, ඉහළ ශුද්ධ පොලී ආදායම සහ ඉහළ ප්‍රත්‍යාගණන ලාභ හේතුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළදී මෙම අංශයෙහි ලාභදායීතාව වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළදී බැංකු අංශය සිය ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ක්‍රියාකාරී ලෙස පුළුල් කිරීම හරහා ආර්ථිකය තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ද අඛණ්ඩව දායක විය. එමෙන්ම, බාසල් III රාමුව ක්‍රියාත්මක කිරීම තුළින් බැංකු පද්ධතියෙහි ඔරොත්තු දීමේ හැකියාව වැඩි වනු ඇත. බැංකු නොවන මූල්‍ය ආයතනවල වත්කම් පදනම වර්ධනය වුවද, 2016 වසරේදී දක්නට ලැබුණු ක්‍රියාකාරීත්වයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම අංශයෙහි ණය සැපයුම අඩු වූ අතර, වත්කම්වල ගුණාත්මකභාවය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුණද යම් ගැටලුකාරී තත්ත්වයකට ලක්වූ බව දක්නට ලැබුණි. රක්ෂණ සහ විශ්‍රාම පාරිතෝෂික අරමුදල් වැනි මූල්‍ය අංශයෙහි අනෙකුත් උප අංශ ධනාත්මක ක්‍රියාකාරීත්වයක් වාර්තා කළ අතර, ඒකක භාර අංශයෙහි වර්ධනය අඩු විය. ප්‍රාග්ධන නියාමනය තවදුරටත් ශක්තිමත් වීම හමුවේ, 2017 වසරේ පළමු මාස අට තුළදී කොටස් තැරැව්කාර අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල නිරතවන මූල්‍ය ආයතනවල ක්‍රියාකාරකම් පුළුල් වූ අතර, නවතම කුටුම්බ ආදායම් සහ වියදම් සමීක්ෂණයට (2016 HIES) අනුව, ආදායම්, දරිද්‍රතාව සහ ගිණි සංගුණකයට අදාළව යහපත් ප්‍රවණතාවක් පෙන්නුම් කළද, ග්‍රාමීය දරිද්‍රතාව සහ ණයගැතිභාවය තවදුරටත් මූලික ගැටලුවක්ව පවතී. මේ අතර, වසර තුළදී දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් දක්නට ලැබිණි. 2017 වසරේ පළමු භාගයේදී සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ මධ්‍යස්ථ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. වසරේ මේ දක්වා කාලය තුළද දේශීය ආයෝජකයන්ගේ ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතුණද, කොටස් මිල දර්ශක, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ කොළඹ කොටස් වෙළඳපොළ ලද විදේශීය ලැබීම්වල යම් වර්ධනයක් දක්නට ලැබිණි. මෙම කාලපරිච්ඡේදය තුළදී ආයතන, සමාගම් සහ පුද්ගලයන්ගේ ගෙවීම් අවශ්‍යතා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ජාතික ගෙවීම් පද්ධතියෙහි කාර්යක්ෂමතාව සහ සුරක්ෂිතභාවය ඉහළ නැංවීමට තවදුරටත් කටයුතු කෙරිණි.

1

## ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය

- **ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2017 ඔක්තෝබර් මසදී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook-WEO) අනුව, 2016 වසරේ අග භාගයේ දක්නට ලැබුණු ලෝක ආර්ථික වර්ධනය, 2017 සහ 2018 වසරවල තවදුරටත් සවිමත් වෙතැයි අපේක්ෂිතය.** 2007 වසරේ ගෝලීය ආර්ථික අර්බුදයෙන් පසු ප්‍රථම වරට යුරෝපය, ජපානය සහ එක්සත් ජනපදය යන රටවල් සියල්ලෙහිම ආර්ථික වර්ධනයක් දක්නට ලැබෙන අතර නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථික වර්ධනයද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආයෝජන, වෙළඳ සහ කාර්මික නිෂ්පාදිතවල ඇති වන ඉහළ වර්ධනය සමඟ වැඩිදියුණු වන ව්‍යාපාර සහ පාරිභෝගික විශ්වාසය මෙම වර්ධනය සඳහා අනුබල සපයයි. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2017 වසර සඳහා ලෝක ආර්ථික වර්ධනය සියයට 3.6 ක් සහ 2018 වසර සඳහා සියයට 3.7 ක් ලෙස පුරෝකථනය කරයි. මීට පෙර සිදු කරන ලද පුරෝකථනවලට වඩා වැඩි ආර්ථික වර්ධනයක් පෙන්නුම් කරනු ලබන යූරෝ කලාපය, ජපානය සහ කැනඩාව විසින් 2017 සහ 2018 වසර තුළ දියුණු ආර්ථිකවල වර්ධන ප්‍රවණතාව ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය සඳහා වූ වර්ධන පුරෝකථන අගයන් අඩුකොට ඇත. මේ අතර, චීනය සහ වෙනත් නැඟී එන වෙළඳපොළ ආර්ථිකවල ශක්තිමත් වර්ධන අපේක්ෂා හේතුවෙන් 2017 සහ 2018 වසරවල නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකවල වර්ධනය ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. ප්‍රධාන වශයෙන්ම, දියුණු ආර්ථිකවල ඵලදායිතා වර්ධනය දුර්වල මට්ටමක පැවතීම සහ අහිතකර ජනගහන සාධක හේතුවෙන් මැදිකාලීන වර්ධන අපේක්ෂා යම් පමණකට සීමා වී පවතී.

- **නිෂ්පාදනය සහ වෙළඳාම යථා තත්ත්වයට පත්වීම සහ මූල්‍ය වෙළඳපොළ වර්ධනය හේතුවෙන් 2017 සහ 2018 වසරවල දියුණු ආර්ථික මධ්‍යස්ථ මට්ටමකින් අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෙම රටවල් 2017 සහ 2018 වසරවල, පිළිවෙළින්, සියයට 2.2 කින් සහ සියයට 2.0 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කොට ඇත. ලෝක වෙළඳාම සහ නිෂ්පාදනය වැඩි වේගයකින් වර්ධනය වීමත් සමඟ යුරෝ කලාපයේ සහ ජපානයේ ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යෑම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් මීට පෙර පුරෝකථනය කරන ලද වර්ධන අනුපාතික ඉහළ නංවා ඇත. කෙසේ වුවත්, එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය සඳහා වන ආර්ථික වර්ධන පුරෝකථන අඩුකොට ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තයක් වන එක්සත් ජනපදයෙහි ආර්ථික වර්ධනය මෙසේ පහළ අගයක් දක්වා සංශෝධනය කර තිබුණද, 2017 වසර සඳහා සියයට 2.2 කින්ද 2018 වසර සඳහා සියයට 2.3 කින්ද හිතකර ලෙස වර්ධනය වෙතැයි අපේක්ෂිතය. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන ගමනාන්තය වන එක්සත් රාජධානියෙහි ආර්ථික වර්ධනය 2017 සහ 2018 වසර සඳහා, පිළිවෙළින්, සියයට 1.7 ක් සහ සියයට 1.5 ක් ලෙස පුරෝකථනය කොට ඇත. යුරෝපා සංගමයෙන් එක්සත් රාජධානිය ඉවත්වීම සඳහා පැවැත්වූ ජනමත විචාරණයෙන් පශ්චාත් සමයෙහි ඇති වූ අවිනිශ්චිත වාතාවරණය හේතුවෙන් එක්සත් රාජධානිය සඳහා වූ ඉදිරි වර්ධන අපේක්ෂා අඩු මට්ටමක පවතී.

- **2016 වසරේදී දක්නට ලැබුණු මන්දගාමී ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත්වෙමින්, 2017 සහ 2018 වසරවලදී නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සහිත රටවල කැපී පෙනෙන වර්ධනයක් අපේක්ෂා කෙරේ.** මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම වර්ධනය ඉහළ නැංවීමට අදාළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ චීනය හා දියුණු රටවල පවතින වර්ධනයෙහි බලපෑම හේතු වනු ඇතැයි අපේක්ෂිතය. නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2016 වසර සඳහා ඇස්තමේන්තුගත වර්ධන අනුපාතික සියයට 4.3 සිට 2017 වසර සඳහා සියයට 4.6 ක් දක්වා සහ 2018 වසර සඳහා සියයට 4.9 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කාර්මික අංශයේ අතිරික්ත ධාරිතාව අඩු කිරීමේ අරමුණද සහිතව සැපයුම් අංශයෙහි සිදුකරනු ලබන ප්‍රතිසංස්කරණ හේතුවෙන් චීනයේ වාර්ෂික ආර්ථික වර්ධනය මැදිකාලීනව සියයට 6.0 ට වඩා ඉහළ අගයක අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂිතය. 2016 වසරේදී ආරම්භ කරනු ලැබූ ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමේ වැඩසටහනෙහි දිගුකාලීන බලපෑම් සහ 2017 වසරේ ජූලි මාසයේදී ජාතික භාණ්ඩ හා සේවා බද්දක් පැනවීමේ බලපෑම පිළිබිඹු කරමින් 2017 වසරේදී ඉන්දියාවේ ආර්ථික වර්ධනය සියයට 6.7 ක් දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කොට

ඇත. මෙම බලපෑම් කෙටි කාලීන වනු ඇතැයිද 2018 වසරේ සිට ආර්ථික වර්ධනය වේගවත් වනු ඇතැයිද අපේක්ෂා කෙරේ. චීනය සහ යුරෝපය වෙතින් පවතින විදේශීය ඉල්ලුම හේතුවෙන් 2017 සහ 2018 වසරවලදී ආසියානු-5 (ASEAN-5) රටවල ආර්ථික වර්ධනය සියයට 5.2 ක් ලෙස අඛණ්ඩව පවතී යැයි අපේක්ෂා කෙරේ.

- **ශක්තිමත් ලෙස හා දිගුකාලීන වශයෙන් ආර්ථිකය යථා තත්ත්වයට පැමිණීමෙහිලා බලපානු ලබන නොයෙක් අස්ථාවර හා අවදානම් සාධක ලෝක වර්ධන පුරෝකථන කෙරෙහි බලපෑම් ඇති කරනු ඇති නමුත්, වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වීම සහ පාරිභෝගික හා ව්‍යාපාර පිළිබඳ විශ්වසනීයත්වය සවිමත් වීම සමඟ එම අවදානම් තත්ත්වය පහව යනු ඇත.** එක්සත් ජනපදයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල ඇති අවිනිශ්චිතතා ලෝක ආර්ථික වර්ධනය මත බාධා ඇති කළ හැකි අතර, එය වත්කම්වල මිල ගණන් හා ගෝලීය මූල්‍ය වෙළඳපොළෙහි ස්ථාවරත්වයට බලපෑම් ඇති කළ හැකිය. ඇමෙරිකා එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම තුළින් ගෝලීය මූල්‍ය තත්ත්වයද දැඩි විය හැකිය. එම වර්ධනයන් හේතුවෙන් නැඟී එන ආර්ථික වෙතින් ආයෝජන ඉවත් කරගැනීමක් සිදු වීමට ඉඩ ඇත. සංවර්ධිත ආර්ථිකවල අඛණ්ඩව අඩු උද්ධමන මට්ටමක් පැවතීම හේතුවෙන් පූර්ණ සේවා නියුක්ති මට්ටමක් හා උපරිම නිෂ්පාදන මට්ටමක් අත්පත් කර ගැනීම කෙරෙහි බලපෑම් ඇති වනු ඇති අතර, එය නැඟී එන ආර්ථික මත අහිතකර බලපෑම් ඇති කරනු ඇත. වෙළඳාම මත පනවන සීමා හේතුවෙන් එම තත්ත්වය තවත් තීව්‍ර වනු ඇත. චීනයේ ඉහළ ණය වර්ධනය කෙරෙහි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි අවධානය යොමු වී ඇති අතර, ක්ෂණික වෙළඳපොළ හැඩගැස්මකට ඉඩ නොදී එයට ප්‍රතිචාර වශයෙන් පූර්වගාමී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට චීන බලධාරීන් විසින් ක්‍රියා නොකළහොත් එමගින් වෙළඳ හා භාණ්ඩ මිල සම්ප්‍රේෂණ මාර්ග තුළින් ලෝක ආර්ථිකයට අහිතකර බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, භූ-දේශපාලනික අවිනිශ්චිතතා හා ත්‍රස්තවාදය වැනි ආර්ථික නොවන සාධක මෙන්ම අයහපත් කාලගුණික තත්ත්වද ලෝක ආර්ථික වර්ධන අපේක්ෂා මත බාධා ඇති කළ හැකිය.

- **2016 වසරේ සිට ඉහළ ගිය දියුණු රටවල උද්ධමනය 2017 හා 2018 වසරවලදී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත අතර, නැඟී එන වෙළඳපොළ හා සංවර්ධනය වන ආර්ථිකවල උද්ධමනය බොහෝ විට ස්ථාවර මට්ටමක පවතිනු ඇත.** 2016 වසරේදී දියුණු රටවල පාරිභෝගික මිල උද්ධමනයෙහි සාමාන්‍ය අගය සියයට 0.8 ක් වූ අතර, අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවති ඛනිජ තෙල් මිල ගණන්වල බලපෑම පිළිබිඹු කරමින්, වසර ආරම්භයේදී අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වේගයකින් වුවද 2017 හා 2018 වර්ෂවලදී උද්ධමනය සියයට 1.7 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. සියලුම දියුණු ආර්ථිකවල මතුපිට උද්ධමනය, විශේෂයෙන්ම, 2016 වසරේදී අවධමනකාරී තත්ත්වයක් පැවතුණ ජපානය වැනි රටවල පවා, 2017 වසරේදී ධන අගයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂිතය. අනෙක් අතට, නැඟී එන වෙළඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින රටවල

**1.2 සංඛ්‍යා සටහන**

**තෝරාගත් මහ බැංකුවල ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම්**

කාලපරිච්ඡේදය අවසානයේදී සියයට

| රට | ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | 2014 | 2015 | 2016 | 2017 සැප්. |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 6.50 | 6.00 | 7.00 | 7.25 |
| | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.00 | 7.50 | 8.50 | 8.75 |
| නැඟී එන ආර්ථික | | | | | |
| ඉන්දියාව | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 8.00 | 6.75 | 6.25 | 6.00 |
| මලයාසියාව | එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය | 3.25 | 3.25 | 3.00 | 3.00 |
| තායිලන්තය | එක්දින ද්විපාර්ශ්වික ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 2.00 | 1.50 | 1.50 | 1.50 |
| චීනය | එක් අවුරුදු යුවාන් ණයදීමේ අනුපාතිකය | 5.60 | 4.35 | 4.35 | 4.35 |
| දියුණු ආර්ථික | | | | | |
| එක්සත් ජනපදය | ෆෙඩරල් අරමුදල් අනුපාතිකය | 0 - 0.25 | 0.25 - 0.50 | 0.50 - 0.75 | 1.00 - 1.25 |
| එක්සත් රාජධානිය | බැංකු අනුපාතිකය | 0.50 | 0.50 | 0.25 | 0.25 |
| යුරෝ කලාපය | ප්‍රතිමූල්‍යන අනුපාතිකය | 0.05 | 0.05 | 0.00 | 0.00 |
| ජපානය | එක්දින ඒක්ෂණ අනුපාතිකය | 0.00 | 0.00 | -0.10 | -0.10 |
| කැනඩාව | එක්දින අනුපාතිකය | 1.00 | 0.50 | 0.50 | 1.00 |
| ඕස්ට්‍රේලියාව | මුදල් අනුපාතිකය | 2.50 | 2.00 | 1.50 | 1.50 |
| ස්වීඩනය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 0.00 | -0.35 | -0.50 | -0.50 |

මූලය: අදාළ මහ බැංකුවල වෙබ් අඩවි

පාරිභෝගික මිල උද්ධමනය මැදිකාලීනව ස්ථාවර වෙමින් 2017 වසරේදී සියයට 4.2 ක් හා 2018 වසරේදී සියයට 4.4 ක් වනු ඇතැයි පුරෝකථනය කොට ඇත. කෙසේ වෙතත්, නැගී එන ආර්ථික රැසක උද්ධමනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ඛනිජ තෙල් අපනයන කරනු ලබන රටවල සංවිධානය (ඔපෙක් රටවල්) හා රුසියාවේ සැපයුම් සීමා කිරීම් සහ ඛනිජ තෙල් තොග පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑමේ නැඹුරුවක් පවතී. කෙසේ වුවත්, ලෝක ඛනිජ තෙල් මිලෙහි සාමාන්‍යය 2017 වසරේදී බැරලයක් සඳහා එ.ජ. ඩොලර් 50.28 ක් හා 2018 වසරේදී බැරලයක් සඳහා එ.ජ. ඩොලර් 50.17 ක් වනු ඇති බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පුරෝකථනය කර ඇත.

- **අසමාන වූ ආර්ථික ප්‍රවණතා හමුවේ දියුණු රටවල මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය එකිනෙකට වෙනස් විය.** මෙම වෙනස්කම් පිළිබිඹු කරමින්, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් සාමාන්‍යකරණය කරනු ලැබූ අතර, එංගලන්ත මහ බැංකුව සහ යුරෝපා මහ බැංකුව තවදුරටත් ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව සිය ශේෂ පත්‍රයේ විශාලත්වය ඉදිරි කාලසීමාව තුළදී සැලකිය යුතු ලෙස අඩු කිරීමට අරමුණු කර ඇති අතර, 2017 වසරේ මෙතෙක් අවස්ථා දෙකකදී ෆෙඩරල් අරමුදල් අනුපාතිකය ඉහළ නංවනු ලැබීය. දශක හතරක කාලයක් තුළ වාර්තා වූ අවම විරැකියා මට්ටම එක්සත් රාජධානිය විසින් මේ වන විට අත්දකින අතර, එංගලන්ත මහ බැංකුවේ ඉලක්කගත අගයට වඩා උද්ධමනය ඉහළ අගයක පවතින නමුත්, යුරෝපා සංගමයෙන් ඉවත් වීමට තීරණය කිරීමත් සමඟ ඇති වූ අවිනිශ්චිතතාව ඉහළ යෑම හමුවේ එක්සත් රාජධානිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමෙන් වැළකී සිටී. කෙසේ වුවත්, මුදල් ප්‍රතිපත්ති සානුබල කිහිපයක් ඉවත් කිරීම හරහා ඉදිරි කාලය තුළදී උද්ධමනය තිරසාර මට්ටමක් තෙක් අඩු කර ගැනීමට එංගලන්ත මහ බැංකුව අපේක්ෂා කරයි. මේ අතර, යුරෝ කලාපයෙහි ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම පිළිබඳ සලකා බලමින්, යුරෝපීය මහ බැංකුව, එහි වත්කම් මිලට ගැනීමේ වැඩපිළිවෙළ වඩාත් ගැළපෙන අයුරින් වෙනස් කිරීමට තීරණය කර ඇත. මේ අතර, සියයට 2 ක උද්ධමන ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින් ජපාන මහ බැංකුව සිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක මුදල් ලිහිල්කරණ ක්‍රියාවලිය නොවෙනස්ව පවත්වා ගෙන ගියේය. තවද, ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම සහ දිගුකාලීනව උද්ධමන ඉලක්කය සපුරා ගැනීම සඳහා ඕස්ට්‍රේලියානු සංචිත බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගෙන යනු ලැබීය.

- **සංකීර්ණ ලෝක ආර්ථික වාතාවරණය හේතුවෙන් නැගී එන වෙළඳපොළ ආර්ථිකවල මුදල් ප්‍රතිපත්ති ස්ථාවරද එකිනෙකට වෙනස් ස්වරූපයක් පෙන්නුම් කළේය.** ආර්ථික වර්ධනයට පහසුකම් සැපයීම සඳහා ඇතැම් නැගී එන ආර්ථික විසින් සිය මුදල් ප්‍රතිපත්ති ලිහිල් කරනු ලැබීය. ආර්ථික වර්ධනයට සහාය දෙන අතර සියයට +2 හා -2 ක පරාසයක් තුළ සියයට 4 ක් වූ උද්ධමන මට්ටමක් මැදිකාලීනව ළඟා කර ගැනීමේ අරමුණ අනුව ඉන්දීය සංචිත බැංකුව, 2017 අගෝස්තු මාසයේදී ද්‍රවශීලතා ගැළපුම් පහසුකම යටතේ සිය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 6.0 දක්වා පදනම් අංක 25 කින් අඩු කළේය. චිලී මහ බැංකුවද 2017 පළමු භාගයේදී සිය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 2.50 තෙක් පදනම් අංක 100 කින් අවස්ථා තුනකදී අඩු කළේය. මේ අතර, මුදලේ අගය අවප්‍රමාණය වීම, ප්‍රාග්ධන ගලායෑම් සහ උද්ධමන පීඩනය වැනි ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා ඇතැම් නැගී එන වෙළඳපොළ ආර්ථික සිය මුදල් ප්‍රතිපත්ති ක්‍රමයෙන් දැඩි කර ඇත. උද්ධමන පීඩනය අවම කිරීම සඳහා මෙක්සිකෝ මහ බැංකුව සිය පදනම් අනුපාතිකය 2017 වසරේ අවස්ථා කිහිපයකදී පදනම් අංක 125 කින් සියයට 7.0 දක්වා ඉහළ නංවන ලදී. තවද, තුර්කි මහ බැංකුව, 2017 ජනවාරි මාසයේදී සිය එක්දින ණය අනුපාතිකය සියයට 9.25 ක් දක්වා පදනම් අංක 75 කින් ඉහළ නංවන ලද අතර, නියමිත වෙන්දේසි කාලසීමාවලින් පසුව ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා පැමිණෙන බැංකු සඳහා නියමිත ණය අනුපාතිකය 2017 මාර්තු සහ අප්‍රේල් මාසවලදී, පිළිවෙළින්, පදනම් අංක 75 කින් සහ 50 කින් සියයට 12.25 දක්වා ඉහළ නංවන ලදී. මේ අතර, පැහැදිලි ඉදිරි දැක්ම සහ අපේක්ෂිත මට්ටමට වඩා වේගවත් වූ ආර්ථික වර්ධනය සැලකිල්ලට ගනිමින් තායිලන්ත මහ බැංකුව 2017 වසරේදී සිය ප්‍රතිපත්ති අනුපාතික සියයට 1.50 ක මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කර ඇත. ඉහළ දේශීය ඉල්ලුම සහ අපනයනවල ඉහළ යෑම හමුවේ 2017 පළමු අර්ධය තුළදී යහපත් ආර්ථික ප්‍රවණතාවක් පැවතීම හේතුවෙන් මලයාසියානු මහ බැංකුව සිය එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය සියයට 3.0 ක මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කළේය.

## අපේක්ෂිත වර්ධනයන්

- **දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යුහාත්මක වෙනස්කම්, වැඩි දියුණු වෙමින් පවතින සාර්ව ආර්ථික ස්ථායිතාව සහ අඛණ්ඩ ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය මැදිකාලීනව ක්‍රමානුකූල ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කෙසේ වෙතත්, ආර්ථික වර්ධන වේගය වසරේ ප්‍රථම භාගයට වඩා යහපත් වනු ඇතැයි අපේක්ෂිත නමුත්, අයහපත් කාලගුණික තත්ත්ව නිසා ඇතිවූ බලපෑම් හේතුවෙන් 2017 වසරේ දෙවන භාගයේදී ද පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2017 වසරේ මූර්ත ආර්ථික වර්ධන වේගය 2016 වසරේදී වාර්තා වූ සියයට 4.4 ක වර්ධනයට සාපේක්ෂව වාර්ෂික පදනමින් සියයට 4.0 - 4.5 ත් අතර මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, හිතකර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන රජයේ උපායමාර්ග සාක්ෂාත් කර ගැනීමට හැකි වීම මෙන්ම, එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය හා විදේශීය ආයෝජන ඉහළ යෑම හේතුවෙන් ආර්ථික වර්ධනය ඉදිරියේදී වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂිතය. ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග, වෙළඳපොළ පදනම් කරගත් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය සහ උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීම තුළින් සාර්ව ආර්ථික පරිසරය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, අපනයන පාදක කරගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් ලෙස මෙරට සංවර්ධනය කිරීම තුළින් ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන පියවර මගින් ආර්ථික කටයුතු සඳහා විශාල අනුබලයක් සැපයෙනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික කටයුතු යාන්ත්‍රීකරණය කිරීම තුළින් නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කර ගැනීම, ශ්‍රම බලකායේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම හා ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම යනාදිය මෙන්ම වෙළඳ ගිවිසුම් හා ගෝලීය නිෂ්පාදන ජාලවලට ඒකාබද්ධ වීම තුළින් ජාත්‍යන්තර සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම මීට අයත් වේ. තාක්ෂණික දැනුම ලබා ගැනීමට මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ වෙත වන ප්‍රවේශය වැඩිදියුණු කිරීමට පහසුකම් සලසන විදේශීය සෘජු ආයෝජන ඉහළ නැංවීමද ඇතුළත්ව පෞද්ගලික අංශයේ සක්‍රිය දායකත්වය ඔස්සේ මෙම අපේක්ෂිත වර්ධනය ළඟාකර ගත යුතුව ඇත. වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත කටයුතු සම්බන්ධයෙන් මෙරට භූගෝලීය පිහිටීමෙහි වැදගත්කම උපයෝජනයට ගත හැකි වන පරිදි ප්‍රතිපත්ති සැකසීම රටේ ඉදිරි ආර්ථික වර්ධනය සඳහා උපකාරී වනු ඇත. කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගරය, බස්නාහිර කලාපීය මහානගර සංවර්ධන ව්‍යාපෘතිය සහ විශේෂ ආර්ථික කලාප පිහිටුවීම වැනි ප්‍රධාන සංවර්ධන කටයුතු, අනාගතයේදී ආර්ථික කටයුතුවල පුළුල් වීම සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී විය හැකි ක්‍රියාමාර්ග අතුරින් කිහිපයක් වේ. මෙම අපේක්ෂිත වර්ධනය සමඟ, වසර 2020 වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ක්‍රමානුකූලව සියයට 7.0 දක්වා වැඩිදියුණු වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

- **2017 වසරේදී ජංගම ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් වීමට ඉඩ ඇතත් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මැදිකාලීනව ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ප්‍රධාන වශයෙන්, අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ඉන්ධන හා ආහාර ආනයන අවශ්‍යතාව ඉහළ යෑම හේතුවෙන් වෙළඳ ගිණුමෙහි වර්ධන වේගය අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීම හේතුවෙන් 2017 වසරේදී ජංගම ගිණුමෙහි වර්ධනය පුරෝකථනය කරනු ලැබූ මට්ටමට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ නමුත්, භාණ්ඩ හා සේවා වෙළඳාමෙහි අපේක්ෂිත වර්ධනය හේතුවෙන් විදේශීය අංශයේ ජංගම ගිණුමද වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළවල් වන ඇමරිකා එක්සත් ජනපදය හා යූරෝ කලාපයේ වර්ධනයද ඇතුළුව ජාත්‍යන්තර වෙළඳ කටයුතු ප්‍රසාරණය වීම, යුරෝපා සංගමය මගින් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණය පිළිබඳ පොදු ක්‍රමය නැවත හිමිවීම, ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් හරහා වෙළඳ සබඳතා ඉහළ නංවා ගැනීමට ඇති අපේක්ෂාව, ශක්තිමත් ආයතනික සහාය සහ අපනයන පාදක කරගත් කර්මාන්ත සඳහා වන දේශීය හා විදේශීය ආයෝජන ඉහළ නැංවීමට හේතුවන තිරසාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යනාදිය තුළින් මැදිකාලීනව අපනයන පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපේක්ෂිත ආර්ථික වර්ධනය හා සමගාමීව ඉදිරි කාලපරිච්ඡේදයේදී ආයෝජන හා අන්තර්භාණ්ඩ ආනයනද ඉහළ යනු ඇති අතර, එමඟින් ආනයන වියදමද ඉහළ යනු ඇත. කෙසේ නමුත්, අපනයන ආදායමේ වර්ධනයට වඩා ආනයන වියදමේ වර්ධනය අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, වෙළඳ ගිණුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සඳහා එය හේතු වනු ඇත. සංචාරක, ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර

වෙත පැවරීම යන අංශවල ධනාත්මක වර්ධනය සමග සේවා ගිණුමෙහි වර්ධනීය තත්ත්වය තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ නමුත්, දේශීය හා විදේශීය සාධකවල බලපෑම හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මැදිකාලීන වශයෙන් දැනට පවතින මට්ටමෙහිම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ විදේශීය සෘජු ආයෝජන ලැබීම් මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා වන ණය ලැබීම්ද හේතුවෙන් මූල්‍ය ගිණුම ශක්තිමත් වනු ඇත. රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සඳහා සහාය වීමට සහ ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම අඛණ්ඩව පවත්වා ගැනීම ඉතා වැදගත් දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය මෙරටට ලැබෙන විදේශීය ආයෝජන ඉහළ නැංවීමට හේතුවනු ඇත. ජාත්‍යන්තර පොලී අනුපාතික ඉහළ යෑමේ වාතාවරණයක් තුළ මෙන්ම ඉදිරි කාලපරිච්ඡේදයේදී සිදුකිරීමට නියමිත රජයේ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳව සැලකීමේදී, විදේශීය මූල්‍යනය සඳහා සුපරීක්ෂාකාරී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව, ණය නොවන විදේශීය ලැබීම් ආකර්ෂණය කර ගැනීම මෙන්ම විශේෂයෙන්ම වගකීම් කළමනාකරණය කිරීම සඳහා රජය විසින් පූර්වෝපාය ක්‍රියාමාර්ග ගැනීම, මැදිකාලීනව විදේශීය අංශය මුහුණ පා ඇති අවදානම් ලිහිල් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

- **මැදිකාලීන වශයෙන් රාජ්‍ය මූල්‍ය අංශය වැඩිදියුණු කර ගැනීමේ අරමුණ සහිතව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියට අදාළව රාජ්‍ය වියදම තාර්කිකරණය කරමින් රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා රජය විසින් වැදගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දී ඇත.** ඒ අනුව, දැනට සිදු කෙරෙමින් පවතින ඩිජිටල්කරණ කටයුතු හා සමගාමීව නව දේශීය ආදායම් පනත මගින් දැනට පවතින ආදායම් බදු ව්‍යුහය සරල කිරීම හා තාර්කිකරණය කිරීම, බදු නිදහස් කිරීම ඉවත් කිරීම මගින් සෘජු බදු ආදායම පුළුල් කිරීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලාංකික බදු පද්ධතිය සඳහා අන්තර්ජාතික වශයෙන් පිළිගත් පරිචයන් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. තවද, කාර්තුමය වියදම් සහ ආදායම් කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම මගින් රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමට පාර්ලිමේන්තුවට ඇති හැකියාව ශක්තිමත් කෙරෙනු ඇත. මීට අමතරව, රාජ්‍ය වාණිජ ව්‍යවසායවල මූල්‍යමය ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීමට සහ එමගින් ඒවායේ දිගුකාලීන ස්ථාවරත්වය තහවුරු කිරීමේ අරමුණින් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා රජය පියවර ගණනාවක් ගනු ලැබීය. මෙම ප්‍රවණතා සමග, 2020 වසර වන විට බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16 ක් පමණ දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂිත අතර, මැදිකාලීනව රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5-6 අතර ප්‍රමාණයක පවත්වා ගනු ඇතැයිද අපේක්ෂා කෙරේ. ඒ සමගම, ප්‍රාථමික ගිණුමේ සහ වර්තන ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින්, අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 දක්වා අඩු කරගැනීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය ණය මැදිකාලීනව තිරසාර මට්ටමකට අඩු කරගැනීමටද අපේක්ෂා කෙරේ.

- **නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත මැදි කාලීනව නැඹුරුවීමේ අරමුණ සහිතව වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ඇත.** අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ආයතනික හා තාක්ෂණික ශක්‍යතාව වර්ධනය කිරීම, මහ බැංකුවේ ස්වාධීනත්වය හා මහ බැංකුව කෙරෙහි ඇති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ශක්තිමත් කිරීමද ඇතුළුව මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය ඉහළ නැංවීම, විනිමය අනුපාතික වඩාත් නම්‍යශීලී ලෙස පවත්වා ගෙන යෑමට අවස්ථාව සලසා දීම, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ මහජනතාව හා පාර්ශවකරුවන් දැනුම්වත් කිරීම යනාදිය මෙම ක්‍රියාවලියෙහි ප්‍රධාන පියවර අතර වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත නැඹුරු වීමට අදාළ පූර්ව අවශ්‍යතා ගණනාවක් සපුරා ඇති පසුබිමක මෙම වැඩපිළිවෙළ මැදිකාලීන වශයෙන් සුමට ලෙස සංක්‍රමණය වීම සඳහා රජයේ සහායද ඇතිව පෙරදැක්මක් ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. සැපයුම් අංශයේ අවහිරතා සහ බදු වෙනස් කිරීම් හේතුවෙන් මෑතකාලීනව උද්ධමනය ඉහළ ගොස් ඇතත්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වේ නම් උද්ධමනය මැදිකාලීනව මැදි තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, රජය විසින් සුදුසු පූර්වෝපායික ක්‍රියාමාර්ග තුළින් මිල ගණන්වල උච්චාවචන පාලනය නොකළහොත්, පරිභෝජන භාණ්ඩ පැස තුළ ආහාර අයිතම සහ ආනයනික භාණ්ඩ විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් දේශීය ආර්ථිකය තුළ සැපයුමෙන් හටගන්නා අවහිරතා සහ ජාත්‍යන්තර වෙළඳපොළ

භාණ්ඩ මිල ගණන්වල විචලන හමුවේ උද්ධමනය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමට අපහසු වනු ඇත. මුදල් සමස්ත පිළිබඳව සැලකීමේදී, ආර්ථික වර්ධනයට මග පාදනු ලබන පෞද්ගලික අංශයට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ප්‍රමාණවත් පරිදි ණය සැපයුමක් පවත්වා ගැනීමත් සමගම, දැනට ඉහළ මට්ටමේ පවතින මුදල් ප්‍රසාරණය 2018 වසරේ සිට සාමාන්‍ය මට්ටමකට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **වසරේ පළමු කාර්තු තුන තුළ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මුදල්, විදේශීය සහ රාජ්‍ය මූල්‍ය අංශවල වර්ධනයන් පිළිබඳ සැලකීමේදී සාර්ව ආර්ථික ස්ථායීතාව ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය වෙමින් පවතින බව තහවුරු වන අතර, මැදිකාලීනව ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටම කරා ළඟා කර ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත.** මූර්ත අංශය ස්ථායී වීමත් සමග උද්ධමනය සියයට 4-6 දක්වා වූ ඉලක්කගත පරාසයක පවත්වාගෙන යෑමට අවශ්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීමට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම මැදිහත් වීමක් සහිතව වෙළඳපොළ සාධක මගින් තීරණය කෙරෙනු ලබන තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑමට කටයුතු කරනු ඇත. ආර්ථිකය ස්වයංක්‍රීයව ස්ථායී වීම සඳහා විනිමය අනුපාතිකය හේතුවන අතර, ණය නොවන විදේශීය ලැබීම් අපේක්ෂිත පරිදි ගලා ඒම හේතුවෙන් ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් සහිතව විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ආදායම් ලැබීම් වර්ධනය කිරීම, බදු පරිපාලනය හා අනුකූලතාව, රජයේ වියදම තාර්කිකරණය කිරීම සහ රාජ්‍ය මූල්‍ය වගකීම් ඉදිරි දැක්මක් සහිතව සක්‍රීය ලෙස කළමනාකරණය කිරීම මෙන්ම රාජ්‍ය වාණිජ ව්‍යවසායවල ශක්‍යතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම රාජ්‍යමූල්‍ය වර්ධනයට අත්‍යවශ්‍ය වේ. මේ අතර, ජාත්‍යන්තර ආර්ථික තත්ත්වය යහපත් වීම සහ ගෝලීය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව පුළුල් වීමෙහි ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා විවිධ රටවල් අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගනු ලැබූ ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට අදාළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම කඩිනම් කළ යුතුය. මේ අනුව, ශ්‍රී ලංකාව පොහොසත් රටක් බවට පත් කිරීමේදී රටෙහි කාර්යක්ෂමතාව සහ තරගකාරිත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් මැදි හා දිගුකාලීන දැක්මක් සහිත ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම මේ සඳහා අත්‍යවශ්‍ය වේ.

# 2

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

*2017 වසරේ පළමු භාගය තුළදී ශ්‍රී ලංකා ආර්ථිකය, 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.9 කින් වර්ධනය විය. කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල වර්ධනයට ඉදිකිරීම් කටයුතුවල සාධනීය වර්ධනය මූලික වශයෙන් හේතු වූ අතර සේවා ආශ්‍රිත කටයුතුවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳාමෙහි වර්ධනය හේතු විය. කෙසේ වුවද, වසරේ පළමු භාගයේදී පැවැති දැඩි නියං සහිත කාලගුණික තත්ත්වය කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය පහළ යෑම කෙරෙහි මෙන්ම කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල වර්ධනය පහළ යෑමටද හේතු වූ අතර එමගින් සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති විය. විදේශීය අංශය සැලකීමේදී, ඇතැම් ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික වර්ධනයන් තවදුරටත් මන්දගාමීව පැවැතීම විදේශ ඉල්ලුම දුර්වල වීමට හේතු විය. ආර්ථිකය පිළිබඳ ඉදිරි දර්ශක හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර මතය පිළිබඳ සමීක්ෂණවලින් පෙන්නුම් කර ඇති පරිදි වසරේ ඉදිරි කාලපරිච්ඡේදය තුළදී ආර්ථික කටයුතුවල යහපත් වර්ධනයක් අපේක්ෂා කෙරේ. මේ සඳහා ඉදිකිරීම් කටයුතුවල වර්ධනය ප්‍රමුඛව කර්මාන්ත කටයුතු ප්‍රධාන වශයෙන් දායක වනු ඇත. තවද, ප්‍රධාන වශයෙන් වෙළඳාම් හා මූල්‍ය සේවා ආශ්‍රිත කටයුතුවල වර්ධනය හේතුවෙන් සේවා කටයුතුද සමස්ත ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට දායක වනු ඇත. මේ අතරතුරදී, විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණ පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) හා අනෙකුත් වෙළඳ ගිවිසුම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත මෙන්ම විදේශ වෙළඳ කටයුතුද වර්ධනය වනු ඇත. අහිතකර කාලගුණික තත්ත්ව අඛණ්ඩව පැවැතීම මෙන්ම අපේක්ෂිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමේ හැකියාවද මෙම අපේක්ෂිත ඉදිරි ආර්ථික වර්ධන වේගය අඩාල වීම කෙරෙහි බලපෑ හැකි අවදානම් තත්ත්ව ලෙස පවතී.*

## 2017 වසරේ ප්‍රවණතා

### නිෂ්පාදිතය


- **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී සියයට 3.9 කින් වර්ධනය විය.** මේ සඳහා ප්‍රධාන වශයෙන්ම කර්මාන්ත සහ සේවා කටයුතුවල වර්ධනය දායක වූ අතර කෘෂිකාර්මික කටයුතුවල පසුබෑමක් දක්නට ලැබුණි. මෙහිදී, කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය ප්‍රධාන වශයෙන්ම ඉදිකිරීම් හා කැණීම් ආශ්‍රිත කටයුතුවල සිදුවූ ඉහළ වර්ධනය හේතුවෙන් 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 5.8 කින් වර්ධනය විය. සේවා කටයුතුවල එකතු කළ අගය වසරේ පළමු භාගය තුළදී සියයට 4.0 කින් වර්ධනය විය. මේ සඳහා මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය, සෞඛ්‍යය හා වෙනත් පෞද්ගලික සේවා ආශ්‍රිත කටයුතුවල ඉහළ වර්ධනය හේතු විය. කෙසේ වුවද, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය 2017 වසරේ පළමු භාගයේදී සියයට 3.1 කින් පහත වැටුණි. මේ සඳහා වී, තෙල් සහිත පළතුරු භෝග (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව), එළවළු හා වෙනත් ධාන්‍ය වගා කිරීමේ කටයුතුවල පහත වැටීම හේතු විය. මේ අතර, භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු වලින් ඒ සඳහා වන සහනාධාර අඩුකළ විට ලැබෙන අගය 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 3.0 කින් වර්ධනය විය.

- **ශ්‍රී ලංකා ආර්ථිකය 2016 වසරේදී අත්කර ගත් සියයට 4.4 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී සියයට 4.5 ක පමණ වර්ධනයක් ළඟා කර ගනු ඇතැයි පුරෝකථනය කෙරේ.** මෙම වාර්ෂික වර්ධනය අත්කර ගැනීම සඳහා කර්මාන්ත හා සේවා කටයුතු ඉහළ දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කරන අතර අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල දායකත්වය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසරේ දෙවන භාගය තුළදී කර්මාන්ත කටයුතුවල වර්ධනයට දායක වෙමින් ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් බලාපොරොත්තු වේ. මේ අතර, මූල්‍ය සේවා කටයුතු සහ තොග හා සිල්ලර වෙළඳ කටයුතුවල වර්ධනය සමස්ත සේවා කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වනු ඇත. කෙසේ වුවද, යල කන්නයේ වගා කටයුතු බහුලව සිදු කරන ප්‍රදේශවලට අඛණ්ඩව බලපා ඇති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් වී, එළවළු, තෙල් සහිත පළතුරු භෝග (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) හා වෙනත් ධාන්‍ය ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය තවදුරටත් අයහපත්ව පැවතීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **2017 වසරේදී ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටීමේ අවදානමක් ඇති කළ හැකි අභ්‍යන්තර මෙන්ම බාහිර ප්‍රවණතාද පවතී.** අඛණ්ඩව පවත්නා ඇඩි නියගයේ ප්‍රතිඵලයක් වශයෙන් වාරි ජලාශවල (වැව්) ජල මට්ටම අඩුවීමත් සමග 2017 යල කන්නයේ වගා කෙරෙන ඉඩම් ප්‍රමාණය සීමා විය. තවද, මෝසම් වැසි අපේක්ෂිත පරිදි නොලැබුණහොත් 2017/18 මහ කන්නයටද ඉන් අහිතකර බලපෑමක් ඇති විය හැකිය. අයහපත් කාලගුණික තත්ත්වය නිසා කෘෂිකාර්මික කටයුතු කෙරෙහි වූ අහිතකර බලපෑම විශේෂයෙන් ආහාර සැකසීම ආශ්‍රිත නිෂ්පාදන කටයුතුද ඇතුළත්ව අනෙකුත් ආර්ථික කටයුතුවලටද පැතිරී යා හැකිය. මේ අතර, ඛනිජ තෙල් ඇතුළුව භාණ්ඩ මිල තවදුරටත් ඉහළ යෑම, විදුලිය ජනනය කිරීම, ප්‍රවාහනය වැනි ආර්ථික කටයුතුවලට මෙන්ම ආනයනික යෙදවුම් භාවිතයෙන් කෙරෙන නිෂ්පාදන කර්මාන්ත කටයුතු කෙරෙහිද අහිතකර ලෙස බලපෑ හැකිය. තවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවලට සමගාමීව මේ වසරේ රජයේ පරිභෝජන මෙන්ම ආයෝජන වියදම්ද සීමාවීමට ඉඩ ඇති අතර, එය ආර්ථිකයේ සමස්ත ඉල්ලුම අඩු වීම කෙරෙහි බලපෑ

**2.1 රූප සටහන**

**කාර්තුමය ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

හැකිය. ගෝලීය ඉල්ලුමේ කිසියම් පහත වැටීමක් වුවහොත්, ගෝලීය වෙළඳපොළට ප්‍රවේශවීමට ලත් නව අවස්ථාවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීම තවදුරටත් ප්‍රමාද විය හැකිය. එක්සත් ජනපද වෙළඳ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල අස්ථාවරභාවය මෙන්ම මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණයද චීන ආර්ථිකයේ සිදුවන ආර්ථිකමය පරිවර්තන හා මැදපෙරදිග කලාපයේ අඛණ්ඩව පවතින භූ-දේශපාලනික අවිනිශ්චිතතා අපනයන ඉල්ලුම කෙරෙහි බලපෑ හැකිය.

## ආර්ථික කටයුතුවල වර්ධනය

### කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය

- **කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.0 ක පහත වැටීමට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 3.1 කින් පහත වැටුණි.** වී, තෙල් සහිත පළතුරු භෝග (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව), එළවළු, වෙනත් ධාන්‍ය වර්ග, රබර්, සහ උක්වගාව, දුම්කොළ වගාව හා වෙනත් බහු වාර්ෂික නොවන භෝග වගා කටයුතුවල දක්නට ලැබුණු පහත වැටීම කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය පහත හෙළීමට හේතු විය. කෙසේ වුවද, ධීවර කටයුතු, සත්ත්ව නිෂ්පාදන, වන වගාව, පළතුරු භෝග වගාව, කුළුබඩු වගාව, තේ වගාව, අනෙකුත් බහු වාර්ෂික භෝග වගාවන් සහ පැළ බෝකිරීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මකව දායක විය.

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: කෘෂිකර්මය

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

- **කෘෂිකාර්මික හා ධීවර කටයුතුවල නිමැවුම, එය මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකයට අනුව, 2017 පළමු භාගයේදී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ සියයට 3.4 ක පහළ යෑමට සාපේක්ෂව, සියයට 11.5 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.** 2017 පළමු භාගයේදී, තේ, ධීවර හා පශු සම්පත් උප අංශ හැර අනෙකුත් සියලුම උප අංශවල පහළ යෑමක් වාර්තා විය. වී උප අංශය සියයට 51.1 කින් පහළ යෑමට, ප්‍රධාන වශයෙන්, පැවති අහිතකර කාලගුණික තත්ත්වය හා අස්වනු නෙළා ගන්නා ලද භූමි ප්‍රමාණය පහළ යෑම හේතු විය. මේ අතර තේ උප අංශය, ඉහළ ගිය නිෂ්පාදනයට අනුරූපව සියයට 0.8 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේ වෙතත්, පෙර වසර හා සැසඳීමේදී රබර්, පොල් හා අනෙකුත් භෝග උප අංශවල පහළ යෑමක් දැකිය හැකි වූ අතර, පශු සම්පත් උප අංශය එයට අදාළ සියලුම උප අංශවල ඉහළ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් සියයට 11.3 ක වර්ධනයක් වාර්තා කළේය. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ සැලකිය යුතු ඉහළ යෑම සමඟ ධීවර කටයුතුවල වර්ධනයක් සිදු විය.

### වී

- **දැනට පවත්නා තොරතුරුවලට අනුව 2016 වසරට සාපේක්ෂව මෙම වසර තුළදී වී නිෂ්පාදනය සියයට 46 කින් පමණ සැලකිය යුතු ලෙස පහළ යනු ඇතැයි ඇස්තමේන්තු කෙරේ.** 2016/17 මහ කන්නයේදී සහ 2017 යල කන්නයේදී පැවති අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන්, මෙට්‍රික් ටොන් මිලියන 2.4 ක මට්ටමේ අඩු වී නිෂ්පාදනයක් මෙම වසරේදී වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එය පසුගිය දශකය තුළ වාර්තා වූ අවම වාර්ෂික වී නිෂ්පාදනය වනු ඇත. ප්‍රධාන වශයෙන් වී වගා කරන ප්‍රදේශවල පැවති වියළි කාලගුණික තත්ත්වය

**2.1 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක**
**(2007 - 2010 = 100)**

| අයිතමය | 2016 පළමු භාගය (අ) | 2017 පළමු භාගය (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2015/16 (අ) | 2016/17 (ආ) |
| **කෘෂිකාර්මික සහ මත්ස්‍ය** | **133.6** | **118.1** | **-3.4** | **-11.5** |
| **1. කෘෂිකර්මය** | **131.5** | **111.0** | **-2.6** | **-15.5** |
| 1.1 කෘෂිකාර්මික භෝග | 128.6 | 103.3 | -2.6 | -19.7 |
| වී | 155.2 | 75.9 | 0.9 | -51.1 |
| තේ | 99.0 | 99.8 | -10.6 | 0.8 |
| රබර් | 71.4 | 67.2 | - 4.9 | -5.9 |
| පොල් | 104.8 | 91.0 | -1.1 | -13.2 |
| වෙනත් භෝග | 154.0 | 143.4 | -1.2 | -6.9 |
| එළවළු | 157.9 | 154.2 | - 4.1 | -2.3 |
| පළතුරු | 145.8 | 149.2 | - 4.6 | 2.3 |
| වෙනත් ක්ෂේත්‍ර භෝග | 167.8 | 146.6 | -3.5 | -12.6 |
| 1.2 පශු සම්පත් | 153.2 | 170.5 | -3.3 | 11.3 |
| **2. මත්ස්‍ය** | **143.4** | **151.6** | **-6.6** | **5.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2

2016/17 මහ කන්නයේ වී නිෂ්පාදනයට දැඩි ලෙස බලපෑවේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දක්වන පරිදි, 2016/17 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.42 ක් දක්වා සියයට 51.1 කින් අඩු වීමට මෙම තත්ත්වය හේතු වී ඇත. මේ අතර, පසුගිය මහ කන්නය හා සැසඳීමේදී මෙවර වපුරන ලද දළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 531,440 ක් දක්වා සියයට 29.7 කින් අඩු විය. 2016/17 මහ කන්නයේ දිවයින පුරා අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණය කෙරෙහිද පැවති නියං තත්ත්වය බලපෑමක් ඇති කළ අතර, 2015/16 මහ කන්නය හා සැසඳීමේදී, අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 371,339 ක් දක්වා සියයට 44.4 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, එක්රැස් කර ගන්නා ලද ජලය මගින් වගා කෙරෙන 2017 යල කන්නයේ වී නිෂ්පාදනය, පසුගිය යල කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 1.02 දක්වා සියයට 32.2 කින් පහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. දිවයින පුරා පැතිර පැවති නියං තත්ත්වය සහ තෙත් කලාපය තුළ වරින්වර ඇති වූ ගංවතුර තත්ත්වය මෙලෙස යල කන්නයේ වී නිෂ්පාදනය අඩු වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. 2017 යල කන්නයේ ඇස්තමේන්තුගත වපුරන ලද දළ බිම් ප්‍රමාණය පසුගිය යල කන්නයට සාපේක්ෂව හෙක්ටයාර 269,596 ක් දක්වා සියයට 30.0 කින් අඩු විය. මේ අතර, අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණයද පසුගිය යල කන්නය හා සැසඳීමේදී හෙක්ටයාර 229,929 ක් දක්වා සියයට 33.1 කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **දැනට පවතින වී තොගවලින් සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.5 ක් පමණ ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2017 වසර සඳහා සහල් මෙට්‍රික් ටොන් 800,000 ක පමණ හිඟයක් පවතිනු ඇත.** අඩු මට්ටමේ අස්වනු සහ අඩු වන සහල් තොග හේතුවෙන් දේශීය වෙළඳපොළ මිල ගණන් ඉහළ යෑම නිසා සහල් ආනයන දිරිගැන්වීම සඳහා රජය විසින් පියවර ගැනීම අවශ්‍ය විය. ඒ අනුව, 2016 වසරේ පළමු භාගය තුළදී ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 15,231 ට සාපේක්ෂව 2017 පළමු භාගය තුළදී එ.ජ. ඩොලර් මිලියන 131.8 ක වියදමින් සහල් මෙට්‍රික් ටොන් 337,769 ක් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලදී. මේ අතර, වෙළඳපොළෙහි පවතින සහල් මිල මත වන පීඩනය අවම කිරීමේ අරමුණින් වී අලෙවි මණ්ඩලය සතු වී තොග යෝග්‍ය පරිදි වෙළඳපොළට මුදා හැරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණි. ඒ අනුව වී අලෙවි මණ්ඩලයෙන් මිලදී ගන්නා ලද වී සහල් කර ලක් සතොස ජාලය හරහා අලෙවි කරන ලදී.

- **2016/17 මහ කන්නයේ වී තොග වෙළඳපොළට ලැබීමත් සමග විවෘත වෙළඳපොළෙහි වී මිල ගණන් 2017 පළමු කාර්තුවේදී අඩු වන මට්ටමක පැවතියද ඉන් පසුව සැපයුම අඩුවීම හේතුවෙන් වී මිල ගණන් ඉහළ ගියේය.** 2016 වසරේ පළමු භාගය හා සැසඳීමේදී, 2017 වසරේ පළමු භාගයේදී සම්බා වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 48.10 ක් ලෙස සියයට 26.6 කින් ඉහළ ගියේය. මේ අතර 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස හය තුළද නාඩු වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 48.33 ක් දක්වා සියයට 51.1 කින් ඉහළ ගියේය. වී සැපයුම අඩු වීම හේතුවෙන් සහල්වල සිල්ලර මිල ගණන් ඉහළ ගිය අතර, සහල් මිල ස්ථාවර මට්ටමකට ගෙන ඒම සඳහා රජය විසින් නොයෙකුත් පියවර ගන්නා ලදී. 2017 අගෝස්තු 16 වැනිදාට ප්‍රථම සහල් සඳහා උපරිම සිල්ලර මිලක් හඳුන්වා දීම, සහල් ආනයනය මගින් සහල් සැපයුම වැඩි කිරීම සහ ආනයනය කෙරෙන සහල් සඳහා පනවන ලද බදු අඩු කිරීම මෙම පියවර අතර විය. 2017 වසරේ පළමු භාගයේදී සම්බා සහල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 95.21 ක් වූ අතර එය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 1.8 ක සුළු වර්ධනයකි. පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය

**2.2 රූප සටහන**
**වී නිෂ්පාදනය**





මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

හා සැසඳීමේදී නාඩු සහල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 87.03 ක් දක්වා සියයට 11.9 කින් ඉහළ ගියේය.

### තේ

- **පහත් බිම්වල වගා කරන ලද තේ නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන් වසරේ පළමු භාගය තුළදී තේ නිෂ්පාදනය සුළු වශයෙන් වර්ධනය විය.** 2017 වසරේ පළමු මාස හය තුළ තේ නිෂ්පාදනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී, කිලෝග්‍රෑම් මිලියන 155.5 ක් දක්වා සියයට 0.8 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. 2017 පළමු භාගයේදී සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 62.0 ක් වන පහතරට තේ නිෂ්පාදනය, කිලෝග්‍රෑම් මිලියන 95.9 ක් දක්වා සියයට 2.6 කින් ඉහළ ගිය අතර, උඩරට සහ මැදරට තේ නිෂ්පාදනය, පිළිවෙළින්, කිලෝග්‍රෑම් මිලියන 35.5 ක් සහ කිලෝග්‍රෑම් මිලියන 24.1 ක් දක්වා සියයට 2.4 කින් සහ සියයට 1.1 කින් අඩු විය. සමස්ත තේ නිෂ්පාදනයට කුඩා තේ වතු අංශය දක්වන දායකත්වය 2016 වසරේ පළමු භාගයේ පැවති සියයට 60.0 ක සිට 2017 වසරේ පළමු භාගයේදී සියයට 74.4 ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑම් සමග විශේෂයෙන්ම, 2017 වසරේ මැයි මාසය තුළ ඇති වූ දැඩි ගංවතුර තත්ත්ව නිසා සිදු වූ හානිය සහ අඩු ඵලදාව හේතුවෙන් 2017 වසරේ පළමු භාගය අවසානයේදී කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනයෙහි අඩු වීමක් දක්නට ලැබුණි.

**2.3 රූප සටහන**
**තේ නිෂ්පාදනය**




මූලය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

- **ලෝක තේ නිෂ්පාදනයෙහි 2016 වසරේ සිට පැවතුණු සැලකිය යුතු පහළ වැටීම 2017 වසරේ පළමු භාගය දක්වා ද පැවතීම හේතුවෙන් තේ සඳහා වූ ජාත්‍යන්තර මිල ගණන් 2017 වසරේ පළමු භාගයේදී සැලකිය යුතු මට්ටමින් ඉහළ ගියේය.** 2016 සැප්තැම්බර් මාසයේ සිට කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2017 වසරේ පළමු භාගය තුළදී කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් 421.41 ට සාපේක්ෂව රුපියල් 618.33 ක් දක්වා, සියයට 46.7 කින් ඉහළ ගියේය. තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිලෙහි ඉහළම වැඩි වීම මැදරට තේ (සියයට 50.1 කින්) වාර්තා කළ අතර, පහතරට තේ මිල සියයට 47.7 කින් ද උඩරට තේ මිල සියයට 47.2 කින් ද ඉහළ ගියේය. 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී තේ කිලෝග්‍රෑමයකට රුපියල් 609.88 ක් වූ අපනයන මිල (නැ.වි.ස.) 2017 වසරේ පළමු භාගයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 796.34 ක් දක්වා සියයට 30.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, කුඩා තේ වතු හිමියන්ට තේ දලු කිලෝග්‍රෑමයක් සඳහා ලැබුණු සාමාන්‍ය මිල 2016 වසරේ පළමු භාගයේදී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 62.20 ක සිට 2017 වසරේ පළමු භාගයේදී කිලෝග්‍රෑමයකට රුපියල් 89.98 ක් දක්වා ඉහළ ගියේය.

### රබර්

- **අයහපත් කාලගුණික තත්ත්ව 2017 වසරේ පළමු භාගයේ රබර් නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේය.** 2017 වසරේ පළමු භාගය තුළදී රබර් නිෂ්පාදනය 2016 වසරේ පළමු භාගය හා සැසඳීමේදී කිලෝග්‍රෑම් මිලියන 45.1 ක් දක්වා සියයට 5.9 කින් පහළ ගියේය. සමස්ත රබර් නිෂ්පාදනයට ඉහළම දායකත්වය දක්වන ෂීට් රබර් නිෂ්පාදනය, කිලෝග්‍රෑම් මිලියන 22.5 ක් දක්වා සියයට 5.9 කින් පහළ ගිය අතර, ක්‍රේප් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 6.8 ක් දක්වා සියයට 11.9 කින් අඩු විය. මේ අතර කේන්ද්‍රාපසරණය කරන ලද රබර් කිරි සහ අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනයද 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී කිලෝග්‍රෑම් මිලියන 15.7 ක් දක්වා සියයට 2.9 කින් පහළ ගියේය. වැවිලි අංශයට බරපතල හානි සිදු කරමින් සාම්ප්‍රදායිකව රබර් වගා කෙරෙන ප්‍රදේශවලට 2017 මැයි මාසයේදී ඇති වූ දැඩි ගංවතුර තත්ත්වය, රබර් නිෂ්පාදනය පහළ යෑමට යම් තරමකට බලපෑවේය. ගංවතුර හේතුවෙන් බස්නාහිර සහ

2

දකුණු පළාත්වල සැලකිය යුතු රබර් වතු ප්‍රමාණයක ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් අඩාළ වූ අතර, නාය යෑම් හේතුවෙන් ඇතැම් රබර් කර්මාන්තශාලා වෙත ළඟා වීම පවා දුෂ්කර විය. කෙසේ වෙතත්, වෙළඳපොළෙහි පවතින ඉහළ මිල ගණන් හේතුවෙන් 2017 වසරේ රබර් නිෂ්පාදනය 2016 වසරට වඩා ඉහළ මට්ටමකට ළඟා වීමට ඉඩ ඇත.

- **2017 වසරේ පළමු භාගයේදී ස්වාභාවික රබර් සඳහා වූ ඉහළ ඉල්ලුම මධ්‍යයේ ලෝක වෙළඳපොළෙහි රබර් මිල ගණන් ඉහළ යෑමත් සමඟ දේශීය වෙළඳපොළ මිල ගණන්වලද ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි.** හිතකර ලෝක ඉල්ලුම සමග ස්වාභාවික රබර් සඳහා ප්‍රධාන වෙළඳපොළවල් වෙතින් තිබූ ඉහළ ඉල්ලුම හේතුවෙන් නොම්මර 1 දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් (RSS1) සහ ලේටෙක්ස් රබර් මිල ගණන් ඉහළ ගියේය. 2017 වසරේ පළමු භාගයේදී කොළඹ රබර් වෙන්දේසියේ දුම් ගැසූ දාර සහිත ෂීට් රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 331.65 ක් දක්වා සියයට 44.5 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, ක්‍රේප් රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල රුපියල් 312.10 ක් දක්වා සියයට 11.2 කින් ඉහළ ගියේය. ලොව වැඩියෙන්ම රබර් පරිභෝජනය කරනු ලබන රට වන චීනයේ රබර් තොග ක්‍රමයෙන් පහළ යෑම හේතුවෙන් චීනය විසින් රබර් ආනයනය කිරීම ඉහළ නංවන ලදී. මැදිකාලීනව දේශීය රබර් සඳහා වන ඉල්ලුම ඉහළ යෑමට ඉඩ ඇති බව පෙන්නුම් කෙරෙන අතර, එය දේශීය රබර් කර්මාන්තයේ ප්‍රවර්ධනයට රුකුලක් වනු ඇත.

## පොල්

- **පෙර වසරේදී පැවති පොල් නිෂ්පාදනය පහළ යාමේ ප්‍රවණතාව 2017 පළමු භාගය තුළදීද දක්නට ලැබුණි.** 2017 වසරේ පළමු භාගය තුළදී පොල් නිෂ්පාදනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ ගෙඩි මිලියන 1,483.8 ට සාපේක්ෂව, ගෙඩි මිලියන 1,289.0 ක් දක්වා පහළ ගියේය. 2016 වසරේ පැවති නියං තත්ත්වය මගින් පසුකාලීනව ඇති කරන ලද අහිතකර බලපෑම මෙම නිෂ්පාදනය පහළ යෑමට ප්‍රධාන වශයෙන්ම හේතු විය. මේ අතර, පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශවල පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් මයිටා උවදුර පහසුවෙන් පැතිර යෑමද, පොල් නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළදී පහළ ගිය පොල් නිෂ්පාදනය හේතුවෙන්, 2017 වසරේ පළමු භාගයේදී පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන තුනෙන්ම සිදු කළ අපනයන සැලකිය යුතු ලෙස පහළ ගියේය. දිසිදි පොල් නිෂ්පාදනය, 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ මෙට්‍රික් ටොන් 24,361 ක සිට 2017 වසරේ පළමු භාගයේදී මෙට්‍රික් ටොන් 16,444 ක් දක්වා සියයට 32.5 කින් පහළ ගියේය. 2016 වසරේදී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළ පොල් තෙල් නිෂ්පාදනය, අඩු පොල් නිෂ්පාදනය නිසා ඉහළ ගිය පොල් මිල ගණන් හේතුවෙන් 2017 වසරේ පළමු භාගයේදී තවදුරටත් පහළ ගියේය. ඒ අනුව, පොල් තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 9,689 ක් දක්වා සියයට 61.2 කින් පහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී කොප්පරා හා නැවුම් පොල් ගෙඩි අපනයන, පිළිවෙළින්, සියයට 52.9 කින් හා සියයට 20.9 කින් පහළ ගියේය. කෙසේ වෙතත්, සමස්ත පොල් නිෂ්පාදනයෙන් සියයට 2 ක පමණ ප්‍රමාණයක් භාවිත කරන පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි හා දියර පොල් කිරි නිෂ්පාදනය, දේශීය පරිභෝජන රටාවේ හා සාම්ප්‍රදායික අපනයන ව්‍යුහයේ වෙනස්වීම් පිළිබිඹු කරමින් පෙර වසර හා සැසඳීමේදී සියයට 1.2 කින් වර්ධනය විය.

- **පොල් නිෂ්පාදනය පහළ යෑමත් සමඟ දේශීය වෙළඳපොළ තුළ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල සාමාන්‍ය මිල ගණන් 2017 වසරේ පළමු භාගය තුළදී ඉහළ මට්ටමක පැවතිණි.** පොල් නිෂ්පාදනයේ පහළ වැටීමත් සමඟ පොල් ගෙඩියක සාමාන්‍ය තොග මිල රුපියල් 55.80 ක් දක්වා සියයට 71.7 කින් ඉහළ ගිය අතර, ඊට අනුරූපව පොල් ගෙඩියක සිල්ලර මිලද රුපියල් 61.71 ක් දක්වා සියයට 32.8 කින් ඉහළ ගියේය. 2016 වසරේ පළමු භාගය හා සැසඳීමේදී දිසිදි පොල් කිලෝග්‍රෑමයක හා මිලි ලීටර 750 ක පොල්තෙල් බෝතලයක දේශීය වෙළඳපොළ සාමාන්‍ය මිල ගණන්, පිළිවෙළින්, සියයට 55.7 කින් හා සියයට 44.4 කින් ඉහළ ගියේය. මේ අතර, දිසිදි පොල් කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) රුපියල් 318.18 ක් දක්වා සියයට 31.6 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රමාණවත් පොල් ගෙඩි තොග නොපැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලෝක වෙළඳපොළ තුළ පැවති ඉහළ මිල ගණන්වල ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි විය. තවද, පොල් තෙල් හා කොප්පරා අපනයන මිල ගණන්ද රුපියල් අගය අනුව, පිළිවෙළින්, සියයට 8.2 කින් හා 34.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොළෙහි පොල්තෙල් මිල ගණන් ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් රජය විසින් 2017 පෙබරවාරි 23

වැනිදා සිට බලපැවැත්වෙන පරිදි ආහාරයට ගන්නා තෙල් වර්ග මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 20.00 කින් අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පාම් තෙල් ආනයනය ඉහළ ගිය අතර, 2017 වසරේ පළමු භාගය තුළදී පාම් තෙල් ආනයනය මෙට්‍රික් ටොන් 91,497 ක් දක්වා සියයට 23.7 කින් ඉහළ ගියේය. මේ අතර, පර්යේෂණ කටයුතු සඳහා පොල් තොගයක් ආනයනය කිරීමටද රජය විසින් අනුමැතිය ලබා දෙන ලදී. පොල් සඳහා නිෂ්පාදකයන්ට ඉහළ මිලක් ලැබීම හා පොල් අංශය නැවත නගාසිටුවීම සඳහා ලබා දෙන ලද සහාය මගින්, පොහොර භාවිතය වැඩි කිරීම හා වැඩිදියුණු කළමනාකරණ ක්‍රම ඔස්සේ ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට ගොවීන් දිරිමත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය අනාගත පොල් නිෂ්පාදනය කෙරෙහි හිතකර අයුරින් බලපානු ඇත.

### වෙනත් ක්ෂේත්‍ර භෝග

- **2016/17 මහ කන්නය ආරම්භයේදී පැවති අයහපත් කාලගුණික තත්ත්වයෙහි බලපෑම හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර භෝග සියල්ලෙහිම පාහේ නිෂ්පාදනය පහත වැටුණි.** ඒ අනුව, පසුගිය මහ කන්නය හා සැසඳීමේදී 2016/17 මහ කන්නයේ වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 317,647 ක් දක්වා සියයට 20.9 ක අඩු වීමක් වාර්තා කළ අතර, වගා කළ බිම් ප්‍රමාණයද හෙක්ටයාර 87,004 ක් දක්වා සියයට 25.0 කින් අඩු විය. කෙසේ වෙතත්, පසුගිය මහ කන්නය හා සැසඳීමේදී 2016/17 මහ කන්නයේදී සෝගම්, සෝයා බෝංචි සහ මෙනේරි නිෂ්පාදනයේ ඉහළ යෑමක් වාර්තා විය. මේ අතර, කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති වූ බාධා හේතුවෙන් 2017 යල කන්නයේ වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කිරීම ප්‍රමාද වූ අතර, 2016 යල කන්නයට සාපේක්ෂව වගා කළ බිම් ප්‍රමාණයද සැලකිය යුතු ලෙස පහළ ගියේය.

### එළවළු

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු අනුව, 2016 වසරේ පළමු භාගය හා සැසඳීමේදී, 2017 වසරේ පළමු භාගයේ එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 950,467 ක් දක්වා සියයට 3 කින් පමණ ඉහළ ගියේය.** කෙසේ වෙතත්, 2016/17 මහ කන්නයේ උඩරට එළවළු නිෂ්පාදනය අයහපත් කාලගුණික තත්ත්වයන්ගෙන් ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් පහළ ගියේය. එසේ වුවත්, වැටකොළු, බණ්ඩක්කා, කරවිල, වට්ටක්කා, මෑ, දඹල සහ වටානා යන පහතරට එළවළු නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඊසාන දිග මෝසම් වැසි ලැබීම ප්‍රමාද වීම හේතුවෙන්, විශේෂයෙන්ම උඩරට ප්‍රදේශවල මහ කන්නයේ වගා කටයුතු ඇරඹීම ප්‍රමාද විය. මේ අතර, මහ කන්නයේ අස්වනු නෙළීම උපරිම අයුරින් සිදු වීම තුළින් වෙළඳපොළ සැපයුම් තත්ත්ව ඉහළ ගිය ජනවාරි මාසය සඳහා හැරුණුකොට, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළදී උඩරට හා පහතරට එළවළු දෙවර්ගයේම මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි. තවද, දැඩි වර්ෂාපතනයෙන් ඇති වූ ගංවතුර හා නායයෑම් තත්ත්ව හේතුවෙන් වෙළඳපොළ එළවළු සැපයුමට ඇති වූ බාධා නිසා ජුනි මාසයේදී එළවළු මිල තියුණු ලෙස ඉහළ ගියේය. ඉන් අනතුරුව අස්වනු නොලැබෙන කාලය එළඹීමත් සමඟ මිල ගණන් අඛණ්ඩවම ඉහළ මට්ටමක පැවතිණි. සාමාන්‍ය පරිභෝජන ඉල්ලුමට අමතරව අපනයන වෙළඳපොළ වෙතින්ද එළවළු සඳහා ඉහළ ඉල්ලුමක් පැවතිණි. 2017 පළමු භාගයේදී එළවළු අපනයනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 10,887 ක් දක්වා සියයට 2.4 කින් ඉහළ ගියේය.

### සීනි

- **2016 වසරේ අනුරූප කාලය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගයේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 14,654 ක් දක්වා සියයට 36.8 කින් පහළ ගියේය.** මෙම නිෂ්පාදනයේ අඩු වීම, අඹරන ලද උක් දඬු ප්‍රමාණයේ පහළ යෑම හා සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය[1] පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. සෙවනගල කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය සියයට 39.7 කින් පහළ ගිය අතර, පැල්වත්ත හා ගල්ඔය කර්මාන්තශාලාවවලින් සිදු කළ නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 39.1 කින් හා සියයට 29.0 කින් පහළ ගියේය. වරින්වර ලද අඩු වර්ෂාව සහ අවිනිශ්චිත කාලගුණික තත්ත්වය සමඟ 2016 පළමු භාගයේදී සෙවනගල, පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවල අනපේක්ෂිත වියළි කාලගුණික තත්ත්වයක් පැවතුණි. අයහපත් කාලගුණික තත්ත්වය නිසා වියළි පාරිසරික තත්ත්ව මගින් ඇති කෙරෙන පීඩාවන් ඉහළ ගොස් උක් වගාවේ වර්ධනයට බාධා එල්ල වූ අතර, ඒ හේතුවෙන් සීනි

---

1 සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය $= \frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක් දඬු ප්‍රමාණය}} \times 100$

2

ලබා ගැනීමේ ප්‍රතිශතය පහළ ගියේය. කර්මාන්තශාලා තුනෙහිම අඹරන ලද මුළු උක් දඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 217,264 ක් දක්වා සියයට 29.6 කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම පැල්වත්ත හා සෙවනගල කර්මාන්තශාලාවල සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය අඩු වීම හේතුවෙන් සමස්ත සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය 2016 වසරේ පළමු භාගයේ පැවති සියයට 7.7 ක සිට මෙම වසරේ පළමු භාගය තුළදී සියයට 6.7 ක් දක්වා පහළ ගියේය. 2016 වසරේ අනුරූප කාලය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගයේ සීනි ආනයනයද මෙට්‍රික් ටොන් 265,384 ක් දක්වා සියයට 8.9 කින් පහළ ගියේය. 2017 වසරේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 61,000 ක් දක්වා සියයට 13.5 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ජාතික අවශ්‍යතාවයෙන් සියයට 9 ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. මේ අතර, කන්තලේ සීනි කර්මාන්තශාලාව යළි ඇරඹීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නව ආයෝජකයෙකු සමඟ ගිවිසුමකට එළැඹිණි. එලෙස ප්‍රතිව්‍යුහගත කන්තලේ සීනි කර්මාන්තශාලාව මගින් දිනකට උක් මෙට්‍රික් ටොන් 4,000 ක් නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කිරීමෙන් වසරකට සීනි මෙට්‍රික් ටොන් 72,000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරෙන අතර, උක් රොඩු දහනයෙන් විදුලිය නිපදවීමට හා කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීමටද අපේක්ෂා කරනු ලබයි.

## ධීවර

- **2017 වසරේ පළමු භාගයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 252,940 ක් දක්වා සියයට 5.7 කින් ඉහළ ගියේය.** සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 90 කට (මෙට්‍රික් ටොන් 227,890) දායක වන මුහුදු මත්ස්‍ය නිෂ්පාදන අංශය සියයට 4.8 කින් වර්ධනය විය. ශ්‍රී ලංකා මත්ස්‍ය අපනයන සඳහා යුරෝපා සංගමය විසින් පනවා තිබූ තහනම 2016 වසරේ ජුනි මාසයේදී ඉවත් කිරීමද මුහුදු මත්ස්‍ය අංශයේ වාර්තා වූ මෙම වර්ධනයට යම් තරමකට හේතු විය. තවද, එම තහනම ඉවත් කර ගැනීම සඳහා ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් සමුද්‍රීය සම්පත් අධික වශයෙන් උපයෝජනය සීමා කිරීම ඔස්සේ එම අංශයේ දිගුකාලීන තිරසාර පැවැත්ම තහවුරු කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 2017 මැයි මාසයේදී බටහිර හා දකුණු වෙරළාශ්‍රිත ප්‍රදේශයන්ට බලපෑ අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන දින ගණන අඩු වීම මුහුදු මත්ස්‍ය නිෂ්පාදන අංශයේ වර්ධනයට බලපෑමක් ඇති කළේය. මේ අතර, මිරිදිය හා ජලජීවී වගා අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය 2017 වසරේ පළමු භාගය තුළදී මෙට්‍රික් ටොන් 25,050 දක්වා සියයට 15.0 කින් ඉහළ ගියේය. ප්‍රජා සහභාගිත්වය සහිතව අභ්‍යන්තර ජලාශවල ධීවර කළමනාකරණ කටයුතු දියුණු කිරීම, ප්‍රජා මූලිකත්වයෙන් කුඩා මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම හා නොමිලේ මත්ස්‍ය පැටවුන් බෙදා දීම මිරිදිය හා ජලජීවී වගා අංශයේ මෙම නිෂ්පාදනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය.

## පශු සම්පත්

- **2017 වසරේ පළමු භාගයේදී පශු සම්පත් අංශයේ සතුටුදායක ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව 2017 වසරේ පළමු භාගයේ කිරි නිෂ්පාදනය, 2016 වසරේ පළමු භාගය හා සැසඳීමේදී ලීටර මිලියන 222.3 ක් දක්වා සියයට 13.5 කින් ඉහළ ගියේය. සමස්ත කිරි නිෂ්පාදනයෙන් සියයට 83 ක් පමණ වන එළකිරි නිෂ්පාදනය ලීටර මිලියන 185.5 ක් දක්වා සියයට 13.6 කින් ඉහළ ගිය අතර, මී කිරි නිෂ්පාදනය ලීටර මිලියන 36.8 ක් දක්වා සියයට 13.1 කින් ඉහළ ගියේය. මේ අතර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරෝකථනවලට අනුව 2017 වසරේ කිරි නිෂ්පාදනය ලීටර මිලියන 490 ක් දක්වා සියයට 8.0 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එය දේශීය ඉල්ලුමෙන් සියයට 63 ක් පමණ සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත. මේ අතර, 2016 වසරේදී බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය මාපිය සතුන් (Layer Parent) ආනයනය කිරීම ඉහළ යෑම හේතුකොටගෙන කිකිළි පැටවුන් සහ බිත්තර නිෂ්පාදනය වැඩි වූ අතර, 2017 වසරේ පළමු භාගයේදී බිත්තර නිෂ්පාදනය මිලියන 1,233.5 ක් දක්වා සියයට 9.4 ක ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු භාගය තුළදී බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය මාපිය සතුන් ආනයනය 2016 වසරේ පළමු භාගයේ වාර්තා කළ 66,597 හා සැසඳීමේදී 53,146 ක් දක්වා අඩු විය. මේ අතර, 2017 වසරේ පළමු භාගය තුළදී කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 93,000 ක් දක්වා සියයට 15.1 කින් වර්ධනය විය. 2017 වසරේ පළමු භාගයේදී ඌරු මස් නිෂ්පාදනය සියයට 11.3 කින් ඉහළ ගිය

අතර, හරක් මස් නිෂ්පාදනය සියයට 4.4 කින් පහළ ගියේය. දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ මිල අඩු වීම මුල්කොට ගෙන කුකුළු මස් නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැය මෙම කාලපරිච්ඡේදය තුළදී අඩු විය. පක්ෂීන් අපනයනය කරන රටවල පැවති කුරුලු උණ රෝගය හේතුවෙන්, බ්‍රොයිලර් සතුන් නිපදවීම සඳහා අවශ්‍ය මාපිය සතුන් (Broiler Parent) ආනයනය සියයට 42.7 කින් අඩු විය. කෙසේ වෙතත්, 2016 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී මස් පිණිස බ්‍රොයිලර් සතුන් ලබා ගැනීම සඳහා අවශ්‍ය මාපිය සතුන් දේශීය වශයෙන් නිපදවීම සියයට 7.0 කින් ඉහළ ගියේය.

## කර්මාන්ත

- **කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතුකළ අගය 2016 වසරේ පළමු භාගය තුළ මෙන්ම 2017 වසරේ පළමු භාගය තුළදී ද සියයට 5.8 කින් වර්ධනය විය.** ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව වර්ධනය වීම මෙන්ම පතල් හා කැණීම් ආශ්‍රිත කටයුතු සැලකිය යුතු ලෙස වර්ධනය වීමද කර්මාන්ත කටයුතුවල වර්ධනය සඳහා විශාල වශයෙන් දායක විය. මේ අතර, නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත කටයුතු 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද ධනාත්මක දායකත්වයක් දක්වන ලදී. මේ අතර, මළාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම ආශ්‍රිත කටයුතු සහ ජලය රැස්කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීමේ කටයුතු වසරේ පළමු භාගය තුළදී සැලකිය යුතු ලෙස වර්ධනය විය. එසේ වුවද, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම ආශ්‍රිත කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී සුළු වර්ධනයක් පෙන්වන ලදී.

- **ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ලෙස ඉහළ යෑම කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල වර්ධනයට වැඩි දායකත්වයක් දක්වන ලදී.** මෙහිදී ඉදිකිරීම් කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 13.5 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 12.8 කින් වර්ධනය විය. ඉදිකිරීම් කටයුතුවල ඇති වූ මෙම වර්ධනය, පතල් හා කැණීම් කටයුතුවල වර්ධනය කෙරෙහිද යහපත් දායකත්වයක් දක්වන ලදී. ඒ අනුව, පතල් හා කැණීම් කටයුතු 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 18.1 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතුවල ප්‍රධානතම උප අංශය වන නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 2.2 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 0.9 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු මන්දගාමී වර්ධනය කෙරෙහි මූලික වශයෙන්ම ආහාර, බීම වර්ග හා දුම්කොළ නිෂ්පාදන සහ අඟුරු හා පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී, පිළිවෙළින්, සියයට 1.1 කින් සහ සියයට 15.2 කින් පහත වැටීම හේතු විය. කෙසේ වුවද, මෙම ප්‍රධාන උප ආර්ථික කටයුතුවල ඍණාත්මක බලපෑම අභිභවා සමස්ත නිෂ්පාදන කර්මාන්තයෙහි ධනාත්මක වර්ධනයක් වාර්තා කිරීමට ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදනය, රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදනය, ගෘහභාණ්ඩ නිෂ්පාදනය, යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය සහ රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදනවල ධනාත්මක වර්ධනය ප්‍රධාන වශයෙන්ම දායක විය. ඒ අනුව, 2017 වසරේ පළමු භාගය තුළදී ගෘහභාණ්ඩ නිෂ්පාදනය 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව ඉහළ ගිය අතර ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදනය සහ රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදනය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ ඍණාත්මක වර්ධනයට සාපේක්ෂව යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කර්මාන්ත ආශ්‍රිත අනෙකුත් ආර්ථික කටයුතු සලකා බැලීමේදී මළාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 21.0 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 10.7 කින් වර්ධනය විය. මේ අතර, ජලය රැස්කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීමේ කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.8 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 13.3 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයුම් කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 8.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 1.2 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.

2

## නිෂ්පාදන ප්‍රවණතා සහ ආයතනික සහාය: නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්

### කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය[2]


- **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය, 2016 පළමු භාගයේදී පෙන්නුම් කළ සියයට 2.3 ක පසුබෑම හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 1.8 කින් අඩු විය.** අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නිෂ්පාදනයෙහි සිදු වූ බාධා සමඟ ඵලදායීතාව හා තරගකාරිත්වය වැඩිදියුණු කළ නොහැකි මට්ටමක පැවතීම, නිෂ්පාදන හා වෙළඳපොළ විවිධාංගීකරණය අඩු මට්ටමක පැවතීම, ශ්‍රම හිඟය සහ සමහර මිල අඩු කරන ලද ආනයනික භාණ්ඩවලින් තරගකාරිත්වයක් ඇති වීම මෙම පසුබෑම කෙරෙහි දායක විය. මේ අතර, ණය පිරිවැය ඉහළ යෑම හා අධිප්‍රමාණය වූ විනිමය අනුපාතිකයද නව ආයෝජන අධෛර්යවත් වීම කෙරෙහි යම් ප්‍රමාණයකට හේතු වූවා යැයි සැලකිය හැකිය. මේ නිසා 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ ඇඟලුම්, පාන වර්ග, දුම්කොළ නිෂ්පාදිත, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදිත, පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත සහ මූලික ලෝහ නිෂ්පාදිත යන ප්‍රධාන උප අංශවල ක්‍රියාකාරිත්වය පහත වැටිණි. කෙසේ වෙතත්, ආහාර නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත, ගෘහ භාණ්ඩ හැර, දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදිත හා විදුලි උපකරණ නිෂ්පාදනවල මධ්‍යස්ථ වැඩි වීමක් වාර්තා විය.

- **2017 වසරේ පළමු භාගය තුළදී, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන ආහාර නිෂ්පාදිත උප අංශය, 2016 පළමු භාගයට සාපේක්ෂව සියයට 2.6 ක වර්ධනයක් වාර්තා කළේය.** 2017 මැයි මාසයේ පැවති ගංවතුර තත්ත්වය සහ එමගින් නිෂ්පාදන, සැපයුම් හා බෙදා හැරීමේ පද්ධතිවලට ඇති වූ අවහිරතා හා සේවකයින් සේවයට වාර්තා කිරීම අඩු වීම මෙම උප අංශය කෙරෙහි විශාල වශයෙන් බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සකස් කළ ආහාර, මාගරින්, කොකෝවා, චොකලට් හා රසකැවිලි නිෂ්පාදිත, පිෂ්ඨමය නිෂ්පාදිත, බේකරි නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර යන වර්ගවල නිමැවුමෙහි වැඩි වීමක් වාර්තා විය. එනමුත්, අයහපත් කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස කර්මාන්තශාලා ආශ්‍රිතව තේ නිෂ්පාදනය කිරීමෙහි පහළ යෑමක් වාර්තා විය.

- **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ දෙවන විශාලතම උප අංශය වන ඇඟලුම් උප අංශය, 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 5.4 ක පහළ යෑමක් වාර්තා කරමින් පසුබෑමක් පෙන්නුම් කළේය.** එක්සත් ජනපදය හා යුරෝපා සංගමය වැනි ශ්‍රී ලාංකික ඇඟලුම් අපනයන සඳහා වූ සාම්ප්‍රදායික ගමනාන්ත වෙතින් තෝරා ගත් ඇඟලුම් සඳහා වූ ඉල්ලුම පහළ යෑම මෙම උප අංශයේ පසුබෑමට හේතු විය. කෙසේ වෙතත්, විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) නැවත ස්ථාපනය කිරීම සහ ඇඟලුම් කර්මාන්තය විසින් මිල අධික ඇඟලුම් කාණ්ඩය තුළ සිය තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ තරගකාරී ක්‍රමෝපායන්ගේ ප්‍රතිඵල ලෙස අපනයන පරිමාව ඉහළ ගොස් වසරේ දෙවන භාගය තුළදී ඇඟලුම් උප අංශය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**2.4 රූප සටහන**


**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය**




මූලය : ශ්‍රී ලංකා මහා බැංකුව

2 මෙම දර්ශකයේ බර තැබීම් 2010 වසර පදනම් වර්ෂය ලෙස සැලකිල්ලට ගෙන සිදු කර ඇත. ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණයේ (ISIC) 4 වෙනි සංශෝධනයට අනුව කර්මාන්ත වර්ගීකරණය කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 පදනම් වර්ෂය වශයෙන් ගෙන කාර්මික නිෂ්පාදන දර්ශකය සම්පාදනය කරන අතර, මෙම දර්ශකය ජාතික ගිණුම් සම්පාදනය සඳහාද භාවිත කිරීම ආරම්භ කොට ඇත. ඒ අනුව, ඉදිරි "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා" වාර්තාවලදී කර්මාන්ත අංශයේ විශ්ලේෂණය කාර්මික නිෂ්පාදන දර්ශකය යොදා ගෙන සිදු කරනු ඇත.

**2.5 රූප සටහන**
**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතිය - 2017 පළමු භාගය**



මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

- **2017 වසරේ පළමු භාගය තුළදී රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශය, 2016 වසරේ පළමු භාගය සමග සැසඳීමේදී සියයට 4.9 කින් වර්ධනය විය.** ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය සහ බ්‍රසීලය වැනි ජාත්‍යන්තර වෙළඳපොළවල් සහ දේශීය වෙළඳපොළ සඳහා නිපදවනු ලබන වායු ටයර් සහ ඝන ටයර් නිෂ්පාදනය ඉහළ යෑම මෙම වර්ධනයට දායක විය. කාර්මික හා වෛද්‍ය කටයුතු සඳහා වන අත්වැසුම් සඳහා වූ අපනයන ඉල්ලුමද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

- **දුම්කොළ නිෂ්පාදිත උප අංශය 2017 වසරේ පළමු භාගය තුළදී 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව සියයට 29.3 කින් පහළ ගියේය.** 2015 වසරේ අග භාගයේදී සුරා බදු වැඩි කිරීම හා 2016 වසර තුළදී දුම්වැටි මිල තවදුරටත් ඉහළ නැංවීම හේතුවෙන් ඉහළ ගිය දුම්වැටි මිල නිසා පාරිභෝගික ඉල්ලුම පහළ යෑම මේ සඳහා මූලික වශයෙන් බලපාන ලදී.

- **පාන වර්ග උප අංශය 2017 පළමු භාගයේදී 2016 පළමු භාගයට සාපේක්ෂව සියයට 14.7 ක පසුබෑමක් වාර්තා කළේය.** මද්‍යසාර, මෝල්ට් අඩංගු පාන වර්ග සහ සිසිල් බීම නිෂ්පාදන පරිමාව අඩු වීම මෙම උප අංශයෙහි නිමැවුම පහළ යෑමට දායක විය. මුසු කිරීම සඳහා යොදා ගන්නා මත්පැන් ආනයන මත වූ ආනයන බදු වැඩි කිරීම හා වැට් බදු පැනවීම මද්‍යසාර නිෂ්පාදනයට අහිතකර ලෙස බලපාන ලදී. කෙසේ වෙතත්, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ප්‍රදේශවලට බෝතල් කළ පානීය ජලය බෙදා හැරීම ඉහළ යෑම හේතුවෙන් ලවණ අඩංගු ජලය සහ බෝතල් කළ පානීය ජලය නිපදවීම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

- **අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත උප අංශය 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 4.7 කින් වර්ධනය විය.** සිමෙන්ති නිෂ්පාදනය ඉහළ යෑම මෙම ඉහළ ක්‍රියාකාරිත්වයට බලපෑ ප්‍රධානතම සාධකය විය. වැලි කැණීම් පිළිබඳ නව රෙගුලාසි මෙන්ම ගංවතුරෙන් හානි වූ පෙදෙස්වල කැණීම් කටයුතු අඩාල වීම හේතුවෙන් සෙවිලි උළු සහ සැකසූ කොන්ක්‍රීට් නිෂ්පාදිත සැලකිය යුතු මට්ටමකින් පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළදී පෝසිලේන් හා පිඟන් මැටි නිෂ්පාදිතවල නිමැවුම පහළ ගියේය. ආසියානු තරගකරුවන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ පවතින ඉහළ නිෂ්පාදන පිරිවැය, දේශීය හා විදේශීය වෙළඳපොළ තුළදී ශ්‍රී ලාංකික පෝසිලේන් හා පිඟන් මැටි නිෂ්පාදිතවල තරගකාරිත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. නිෂ්පාදන ධාරිතාව ඉහළ යෑම හේතුවෙන් වීදුරු භාණ්ඩ නිෂ්පාදනය ඉහළ ගියේය.

- **තීන්ත වර්ග, වාර්නිෂ්, මුද්‍රණ තීන්ත, සබන් සහ සේදුම්කාරක නිමැවුම් ඉහළ යෑම හේතුවෙන් රසායන ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත උප අංශය 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 24.2 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය.** මේ අතර, නව පොහොර සහනාධාර ක්‍රමය යටතේ ඇතැම් භෝග කාණ්ඩ සඳහා වූ පොහොර නිෂ්පාදනය වැඩිවී ඇත. කෙසේ වෙතත්, නියං තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අඩු වීම ඇතැම් පොහොර වර්ග සඳහා වූ ඉල්ලුම අඩු කිරීමට හේතු විය. තවද, ප්‍රධාන වශයෙන් නැව් තැනීම හා අලුත්වැඩියා කිරීම් අයත් වන යන්ත්‍රෝපකරණ සහ උපකරණ හැර, සකස් කළ ලෝහ නිෂ්පාදිත උප අංශය 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 33.4 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය.

- **විදුලි උපකරණ උප අංශය 2017 වසරේ පළමු භාගය තුළදී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.4 ක වර්ධනයක් පෙන්නුම් කළේය.** විද්‍යුත් පරිණාමක නිෂ්පාදනය සුළු වශයෙන් පහළ යෑමක් පෙන්නුම් කළ අතර වයර්, කේබල් සහ දෘශ්‍ය ඒකලන (Optical Isolators) නිෂ්පාදනය ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළදී විද්‍යුත් කෝෂ

නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා වූ අතර, විද්‍යුත් කෝෂ තුළ අඩංගු විෂද්‍රව්‍ය සහ ඝන ලෝහ ද්‍රව්‍ය මගින් ජලය හා පස දූෂණය වන බැවින් පාවිච්චි කළ විද්‍යුත් කෝෂ ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාව තුළ කඩිනමින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දිය හැකිය.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පිරිපහදු කරනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් මුළුමනින්ම සමන්විත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත උප අංශය 2016 වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී පෙන් වූ ධනාත්මක ක්‍රියාකාරිත්වය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 16.4 ක පසුබෑමක් පෙන්නුම් කළේය.** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් බොරතෙල් ආනයනය අඩු වීම හා පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය වැඩි වීම මෙන්ම නඩත්තු කිරීම් සඳහා නිෂ්පාදනාගාර තාවකාලිකව වසා දැමීම මෙම තත්ත්වයට හේතු විය.

- **2017 වර්ෂයේ පළමු භාගය තුළදී රෙදිපිළි උප අංශය සියයට 3.3 ක වර්ධනයක් වාර්තා කළේය.** අපනයන වෙළඳපොළ සඳහා භාවිත කෙරෙන ගොතන ලද රෙදිපිළිවලින් සැකසූ ඇඟලුම් නිෂ්පාදිත ප්‍රමාණය ඉහළ යෑම මෙම වර්ධනය සඳහා මූලික විය.

- **සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදිත උප අංශය 2016 වර්ෂයේදී නැවත යථා තත්ත්වයට පත් වීමේ සලකුණු පෙන්නුම් කළද, 2017 වර්ෂයේ පළමු භාගයේදී සියයට 3.2 කින් පහළ ගියේය.** සකස් කළ සම් හා පාවහන් නිෂ්පාදනය සැලකිය යුතු මට්ටමකින් අඩු විය. ගෝලීය තරගකාරිත්වයට මුහුණ දීම අවශ්‍ය වුවද, අඩු මිලකින් යුත් ආනයනික භාණ්ඩ ශ්‍රී ලාංකික වෙළඳපොළේ ප්‍රපාතනය කිරීම අවම කිරීම තුළින් දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ සඳහා ගුණාත්මක භාණ්ඩ නිපදවීම ඉහළ නැංවීම සඳහා දේශීය කර්මාන්තවලට සහාය දීම වැදගත් වේ.

- **නිෂ්පාදන අංශයට සහාය දක්වනු ලබන රාජ්‍ය අංශයේ ආයතන, නිමැවුම සහ ඵලදායීතාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය දැනට පවත්නා කාර්මික ජනපද 32 තුළ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගත් අතර, ආහාර නිෂ්පාදන කර්මාන්තය නංවාලීම පිණිස ප්‍රතීතනය කළ ආහාර පර්යේෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. මේ අතර, ජාතික ව්‍යාපාර නාම ලේඛනය සහ වෙළඳ පැමිණිලි මෙහෙයවීමේ කාර්යාලය පිහිටුවීම සඳහාද මූලික පියවර ගන්නා ලදී. ප්‍රදේශයේ ක්ෂුද්‍ර හා සුළු කර්මාන්ත අංශයට සහ උපාධිධාරීන්ගේ නව ව්‍යාපාරවලට එම ආයතන ස්වයං තිරසාරභාවයට ළඟා වනතුරු සහාය දීමේ අරමුණින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය වයඹ විශ්වවිද්‍යාලයේ සහයෝගය ඇතිව මාකඳුර ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද පෙරවැඩුම් තාක්ෂණික පැවරුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කළේය. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදලක් (Venture Capital Fund) පිහිටුවීමට මූලික පියවර ගන්නා ලදී. කාර්මික තාක්ෂණික ආයතනය සහ ජාතික විද්‍යා පදනම විසින් තාක්ෂණික පර්යේෂණ සහ කර්මාන්ත ආයතන සඳහා තාක්ෂණික දැනුම ලබා දීම ආශ්‍රිත කටයුතු සිදු කළ අතර නව නිෂ්පාදිත බිහි කිරීමට මෙන්ම දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගන්නා කර්මාන්තවලට සහාය දීමට ද විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන හා ඉදිකිරීම් කර්මාන්ත ආශ්‍රිතව පවත්නා දැඩි ශ්‍රම හිඟය විසඳීම සඳහා විවිධ පියවර ගන්නා ලදී. ශ්‍රී ලංකා කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්ගේ වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සහ ශ්‍රී ලංකා වෙළඳ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් නිෂ්පාදන ක්ෂේත්‍රයට දිරි දීම පිණිස ආර්ථික කටයුතු, වෙළඳාම, අපනයන, නවෝත්පාදන සහ කුසලතා සංවර්ධනය වැනි ක්ෂේත්‍රවලට අදාළ විවිධ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. නිෂ්පාදිත අපනයන ප්‍රවර්ධනය කිරීම පිණිස ජාතික අපනයන උපායමාර්ගය සකස් කිරීම සහ ඊට අදාළ සියලු පාර්ශ්වයන්ට තාක්ෂණික සහාය ලබා දීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සම්මන්ත්‍රණයක් පැවැත්වීය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් 2017 වසරේ පළමු මාස හය තුළදී ගනු ලැබූ පියවර අතරට "අපනයනකරුවන් දෙදහසකගේ සංවර්ධන වැඩසටහන", විසිතුරු මත්ස්‍ය වෙළඳ සම්මේලනය, පාවහන් නිෂ්පාදකයන් සඳහා නිෂ්පාදන සංවර්ධන වැඩසටහන, රබර් භාණ්ඩ නිෂ්පාදකයන් සඳහා තාක්ෂණික පුහුණුව හා ක්ෂේත්‍රය පිළිබඳ

දැනුම්වත් කිරීමේ වැඩසටහන සහ මෙරටට පැමිණි සහ විදේශයන් වෙත ගිය අන්තර්ජාතික වෙළඳ දූත මණ්ඩල සඳහා පහසුකම් සැලසීම වැනි කටයුතු අයත් විය. ඇඟලුම් නිෂ්පාදනය සඳහා සහාය සැපයීම පිණිස, ඒකාබද්ධ ඇඟලුම් සංගමය හා ශ්‍රී ලංකා ඇඟලුම් හා රෙදිපිළි ආයතනය මගින් ත්‍රිමාන මුද්‍රණය සහ බහුකාර්ය යන්ත්‍රෝපකරණ හැසිරවීම පිළිබඳව කුඩා පරිමාණ ඇඟලුම් නිෂ්පාදකයන් සඳහා පුහුණු පහසුකම් සපයන ලදී.

### සේවා

- **සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 4.0 කින් වර්ධනය විය.** මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල අඛණ්ඩ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ප්‍රවාහන සේවා, සෞඛ්‍ය සේවා, වෙනත් පෞද්ගලික සේවා, දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතු, අධ්‍යාපනය, නවාතැන් සැපයීම ආශ්‍රිත සේවා, රක්ෂණය ආශ්‍රිත කටයුතු සහ විදුලි සංදේශ සේවා මෙම වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් දක්වන ලදී. එනමුත්, රාජ්‍ය පරිපාලනය, වෘත්තීයමය සේවාවන් සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී පහත වැටීම, සේවා කටයුතුවල වර්ධනය සඳහා යම් ඍණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

### වෙළඳාම, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා

- **තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය හා ගබඩාකරණය සහ නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවා 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 2.4 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 3.4 කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා සියලුම උප ආර්ථික කටයුතුවල ධනාත්මක දායකත්වය හේතු විය. තොග හා සිල්ලර වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 1.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී අඛණ්ඩව සියයට 4.2 කින් වර්ධනය වීම මේ සඳහා වැඩි වශයෙන් දායක විය. තවද, ප්‍රවාහන සේවා හා ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 2.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 2.3 ක වර්ධනයක් වාර්තා කරන ලදී. එමෙන්ම, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවා ආශ්‍රිත කටයුතු සහ තැපැල් හා කුරියර් සේවා ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ, පිළිවෙළින්, සියයට 3.7 ක හා සියයට 7.3 ක වර්ධනයන්ට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී, පිළිවෙළින්, සියයට 3.5 කින් හා සියයට 6.0 කින් වර්ධනය විය.

2

### තොරතුරු සහ සන්නිවේදනය

- **තොරතුරු සහ සන්නිවේදන කටයුතු 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 10.8 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 6.3 කින් වර්ධනය විය.** මේ සඳහා විදුලි සංදේශ සේවාවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 12.1 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 7.9 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන්ම දායක විය. තවද, පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත සේවාවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 6.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 3.3 කින් තවදුරටත් ඉහළ යමින් මෙම අංශයෙහි සමස්ත වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් දක්වන ලදී. එසේ වුවත්, 2016 වසරේ පළමු භාගය තුළදී සියයට 12.4 කින් වර්ධනය වූ ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 0.7 කින් සුළු වශයෙන් පහත වැටුණි.

### මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම

- **මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 8.4 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී සියයට 9.4 කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා 2016 වසරේ පළමු භාගය තුළදී සියයට 14.5 කින් වර්ධනය වූ මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා සහ ඒ ආශ්‍රිත වෙනත් සේවා 2017 වසරේ පළමු භාගය තුළදී ද සියයට 15.8 කින් තවදුරටත් වර්ධනය වීම ප්‍රධාන

වශයෙන් දායක විය. මේ අතර, නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 2.5 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 2.7 කින් වර්ධනය විය. තවද, රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 8.7 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 6.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

### වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා

- **වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවාවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 0.9 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 1.6 කින් වර්ධනය විය.** මේ සඳහා 2016 වසරේ පළමු භාගයේදී සියයට 1.8 ක වර්ධනයක් වාර්තා කළ වෙනත් පෞද්ගලික සේවා මෙම වසරේ පළමු භාගය තුළදී සියයට 2.0 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් දායක විය. එසේ වුවද, වෘත්තීයමය සේවා 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 3.9 ක පහත වැටීමට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදීද තවදුරටත් සියයට 0.8 ක පහත වැටීමක් වාර්තා කරමින් මෙම උපආර්ථික කටයුතුවල සමස්ත වර්ධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

### රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- **රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවාවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.4 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 0.8 ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී.** රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව හා සමාජ ආරක්ෂණය ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී සියයට 4.8 කින් පහත වැටීම, මෙම මන්දගාමිත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, සෞඛ්‍යය, නේවාසික රැකවරණ සේවා හා සමාජ සේවා 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 3.1 ක පහත වැටීමට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 12.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, අධ්‍යාපන සේවාවල එකතු කළ අගය 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 5.1 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී සියයට 4.3 කින් වර්ධනය විය.

## වියදම

- **ආර්ථිකයේ දේශීය ඉල්ලුම පිළිබිඹු කරන පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.) 2016 වසරේ පළමු භාගයේදී වාර්තා කළ සියයට 7.3 ක නාමික වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී සියයට 10.9 කින් නාමිකව වර්ධනය විය.** මේ සඳහා ආයෝජන මෙන්ම පරිභෝජන වියදම්වල ඉහළ වර්ධනය දායක විය. ඒ අනුව, 2016 වසරේ පළමු භාගයේදී නාමික වශයෙන් සියයට 12.5 කින් වර්ධනය වූ ආයෝජන වියදම, 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 12.0 කින් වර්ධනය වූ අතර, 2016 වසරේ පළමු භාගය තුළදී නාමික වශයෙන් සියයට 5.2 කින් වර්ධනය වූ පරිභෝජන වියදම, මෙම වසරේ එම කාලපරිච්ඡේදය තුළදී සියයට 10.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, 2016 වසරේ පළමු භාගය තුළදී නාමික වශයෙන් සියයට 2.8 ක පහත වැටීමක් වාර්තා කළ ශුද්ධ විදේශීය ඉල්ලුම මෙම වසරේ එම කාලපරිච්ඡේදය තුළදී සියයට 22.7 ක සැලකිය යුතු ලෙස පහත වැටීමක් වාර්තා කරන ලදී. අපනයනවල දක්නට ලැබුණු වර්ධනයට සාපේක්ෂව ආනයනවල දක්නට ලැබුණු ඉහළ වර්ධනය මෙලෙස ශුද්ධ විදේශීය ඉල්ලුම පහත වැටීම සඳහා හේතු විය. මේ අනුව, දේශීය සහ විදේශීය ඉල්ලුමෙන් සමන්විත වන ද.දේ.නි., 2016 වසරේ පළමු භාගයේදී නාමික වශයෙන් වාර්තා කළ සියයට 7.6 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 10.1 කින් වර්ධනය විය.

- **ද.දේ.වි., 2016 වසරේදී නාමික වශයෙන් වාර්තා කළ සියයට 8.2 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 13,850 ක් දක්වා සියයට 8.7 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** ආයෝජන කටයුතුවල වර්ධනය මෙන්ම පරිභෝජන වියදමෙහි මෙම වසර තුළදී අපේක්ෂිත ඉහළ යෑමද ද.දේ.වි. හි මෙම වර්ධනය

කෙරෙහි ආයක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරේදී වාර්තා කළ සියයට 9.6 ක පහත වැටීමට සාපේක්ෂව අඩු වේගයකින් එනම් සියයට 8.3 කින් 2017 වසර තුළදී පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මේ අනුව, පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2016 වසරේදී වාර්තා කළ සියයට 8.1 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී රුපියල් බිලියන 12,871 ක් දක්වා සියයට 8.7 ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

## පරිභෝජනය

- **සමස්ත ඉල්ලුම සඳහා වැඩිම දායකත්වය සපයන පරිභෝජන වියදම නාමික වශයෙන් 2016 වසරේදී වාර්තා කළ සියයට 4.1 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී සියයට 7.9 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** පසුගිය වසරේදී යම් මන්දගාමීත්වයක් පෙන්නුම් කළ පෞද්ගලික පරිභෝජන වියදම 2017 වසරේ පළමු භාගය තුළදී වාර්තා කළ යහපත් ප්‍රවණතාව වසර පුරාම අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, පෞද්ගලික පරිභෝජන වියදම නාමික වශයෙන් 2016 වසරේදී වාර්තා කළ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේදී සියයට 8.3 ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අනුමත අයවැය ඇස්තමේන්තු සහ 2017 වසරේ පළමු භාගය තුළදී දක්නට ලැබුණු ප්‍රවණතා සැලකීමේදී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවට අදාළ පියවරවලට අනුකූලව රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම අඩු වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය.


## ආයෝජනය

- **ආයෝජන වියදම, නාමික වශයෙන් 2016 වසර තුළදී වාර්තා කළ සියයට 19.6 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසර තුළදී සියයට 10.6 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ.** මේ සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රධානතම දායකත්වය දක්වනු ඇති අතර රාජ්‍ය අංශයේ ආයෝජන කටයුතු අඩු වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. 2017 වසරේ මුල් මාස 6 ක කාලය තුළදී සිමෙන්ති උපයෝජ්‍යතාවයේ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයේ දක්නට ලැබුණු ඉහළ වර්ධනය තුළින්ද පිළිබිඹු වූ පරිදි ඉදිකිරීම් කටයුතුවල ඉහළ වර්ධනයක් වාර්තා විය. තවද, ඉදිකිරීම් කටයුතුවල වියදම් දර්ශකය වසරේ පළමු භාගය තුළදී පෙන්නුම් කළ ධනාත්මක වර්ධනය තුළින්ද ඉදිකිරීම් කටයුතුවල නාමික වශයෙන් වූ අඛණ්ඩ වර්ධනය පෙන්නුම් කරයි. මේ අතර, පෞද්ගලික නිවාස මිලදී ගැනීම්/ඉදිකිරීම්/අලුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික අංශය වෙත වාණිජ බැංකුවලින් ලබා දෙන ලද ණය ප්‍රමාණය 2017 වසරේ ජුනි මස අවසානය වන විට පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, වසරේ මුල් භාගය තුළදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ අනෙකුත් ආයෝජන භාණ්ඩද ඇතුළත් සමස්ත ආයෝජන භාණ්ඩ ආනයන වෙළඳ දර්ශකය පරිමා මෙන්ම වටිනාකම අනුවද යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. ආයෝජන කටයුතුවල වර්ධනයට දායක වෙමින් මෙම හිතකර ප්‍රවණතාව වසරේ ඉදිරි කාලය තුළද පවතිනු ඇතැයි අපේක්ෂිතය. ඒ අනුව, ආයෝජන වියදම ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේදී වාර්තා කළ සියයට 31.5 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 32.0 ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘතිවලට ලැබුණු ණයද ඇතුළුව ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපෘති සඳහා ලද ඍජු විදේශ ආයෝජන සියයට 81.0 ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2016 වසරේ පළමු භාගයේ ලද එ.ජ. ඩොලර් මිලියන 332.2 හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගයේදී එ.ජ. ඩොලර් මිලියන 601.3 ක අගයක් වාර්තා කළේය.** යටිතල පහසුකම් ව්‍යාපෘති, සේවා සහ නිෂ්පාදන කර්මාන්තවලට අදාළව වූ විදේශීය ඍජු ආයෝජන ගලාඒම්, අනුපිළිවෙළින්, සියයට 138.2, සියයට 15.1 හා සියයට 93.8 කින් වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළ වූ විදේශීය ඍජු ආයෝජන ලැබීම්වලින් බහුතරය යටිතල පහසුකම් සම්බන්ධ ව්‍යාපෘති සඳහා යොමු වූ අතර, එය මුළු විදේශීය ඍජු ආයෝජනවලින් සියයට 46 ක් (එ.ජ. ඩොලර් මිලියන 276.6 ක්) විය. 2017 වසරේ පළමු භාගය තුළදී නිෂ්පාදන අංශය සඳහා වූ විදේශීය ඍජු ආයෝජන, සමස්ත විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 31 ක් (එ.ජ. ඩොලර් මිලියන 185.6 ක්) පමණ නියෝජනය කරන ලද අතර සේවා අංශය සඳහා වූ විදේශීය ඍජු ආයෝජන, සමස්තයෙන් සියයට 23 ක් (එ.ජ. ඩොලර් මිලියන 138.5 ක්) නියෝජනය කළේය.

2

**2.6 රූප සටහන**
**ආයෝජන සහ ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලද අගයයන්.

## ඉතුරුම්

- **ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් පෙර වසරට සාපේක්ෂව 2017 වසරේදී වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර ජාතික ඉතුරුම් පෙර වසරේදී පැවැති මට්ටමට වඩා සුළු වශයෙන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම් 2016 වසරේදී පැවැති සියයට 23.8 ක අගයට සාපේක්ෂව 2017 වසරේදී සියයට 24.4 ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2017 වසර තුළදී දේශීය ඉතුරුම්වල අපේක්ෂිත වර්ධනය සඳහා දායක වෙමින් රජයේ නිර්-ඉතුරුම් පහත යනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, පෙර වසරට සාපේක්ෂව 2017 වසර තුළදී රුපියල් වටිනාකම අනුව, ශුද්ධ ප්‍රාථමික ආදායම අඩු වේගයකින් පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ප්‍රධාන වශයෙන් සේවක ප්‍රේෂණවල අඩු වර්ධනය හේතුවෙන් ශුද්ධ වර්තන සංක්‍රාම අඩු වේගයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, ජාතික ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේදී වාර්තා කළ සියයට 29.1 ට සාපේක්ෂව 2017 වසරේදී සියයට 29.0 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

## අපේක්ෂිත වර්ධනයන්

- **මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ සිදු කරන ලද පුරෝකථනවලට අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේදී මූර්ත වශයෙන් සියයට 6.0 කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෙම ආර්ථික වර්ධනය කෙරෙහි සියලු ප්‍රධාන ආර්ථික කටයුතු ධනාත්මක දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ආයෝජන වාතාවරණයෙහි අපේක්ෂිත හිතකර වර්ධනය දේශීය මෙන්ම විදේශීය පෞද්ගලික ආයෝජන ඉහළ නැංවීමට දායක වනු ඇත.

- **2017 වසරේ ඇතිවූ අයහපත් කාලගුණික තත්ත්වයෙහි බලපෑමෙන් පසු දේශීය හා විදේශීය හිතකර සාධක මධ්‍යයේ 2018 වසරේදී කෘෂිකාර්මික අංශය යම් තරමකට යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඉහළ ජාත්‍යන්තර මිල ගණන් හමුවේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීමට දේශීය තේ නිෂ්පාදකයන් දිරිමත් වීම සමඟ තේ කර්මාන්තය වර්ධනය වීමේ ප්‍රවණතාවක් අපේක්ෂිතය. කෙසේ වෙතත්, උපයා ගත හැකි ලාභය අඩු කරමින් තේ නිෂ්පාදනය සඳහා වූ පිරිවැයෙහි ඉහළ යෑමක් අපේක්ෂා කෙරෙන අතර, හෙක්ටයාරයකින් ලැබෙන තේ ඵලදාව අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අඩුවෙමින් පවත්නා ලෝක රබර් තොග හමුවේ රබර් අපනයනය සඳහා වන ඉල්ලුම වැඩි වීම 2018 වසරේදී දේශීය රබර් කර්මාන්තයට හිතකර ලෙස බලපානු ඇත. කෙසේ වෙතත්, සාම්ප්‍රදායික ලෙස රබර් වගා කෙරෙන ප්‍රදේශවලට ලැබෙන අධික වර්ෂාපතනය හේතුවෙන් රබර් කිරි කැපීමේ කටයුතුවලට සිදු වන බාධකවලට පිළියම් යෙදීම සඳහා සකස් කෙරුණු රබර් අංශයේ ප්‍රමුඛතා පදනමින් සකස් කරන ලද ප්‍රධාන සැලැස්මට අනුව රබර් කර්මාන්තයේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම පිණිස රබර් වගා කිරීම සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලටද ව්‍යාප්ත කිරීම ඉතා වැදගත් වේ. 2016 වසරේ දෙවන භාගයේ සිට පැවති නියං තත්ත්වය හේතුවෙන් 2017 වසරේ පොල් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ ගියද, මෙම වසරේ කඩින් කඩ ලද වර්ෂාපතනය මගින් පොල් හට ගැනීම උත්තේජනය කිරීම නිසා 2017 වසර හා සැසඳීමේදී 2018 වසරේ පොල් නිෂ්පාදනය ඉහළ යනු ඇත. යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය මත පැනවූ තහනම ඉවත් කිරීමත් සමඟ ධීවර අංශයේ ක්‍රියාකාරිත්වය 2018 වසරේදී තවදුරටත් වර්ධනය වනු ඇත. 2017 වසරේ අභ්‍යන්තර ජලාශ කළමනාකරණය සඳහා යොදා ගත් දියුණු පිළිවෙත් හේතුවෙන් මිරිදිය හා ජලජීවී වගා අංශයේ නිෂ්පාදනය ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. පශු සම්පත් අංශයේ ප්‍රමුඛතා හඳුනා ගෙන සකස් කරන ලද ප්‍රධාන සැලැස්ම ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයන් තුළින් කිරි නිෂ්පාදන සහ කුකුළු මස් හා බිත්තර නිෂ්පාදන අංශ 2018 වසරේදී ඉහළ නිෂ්පාදන මට්ටමක් අත්පත් කර ගනු ඇත. පසුගිය

වසර කිහිපය තුළදී ඉහළ යන ප්‍රවණතාවක් පිළිබිඹු කළ දේශීය කිරි නිෂ්පාදනය, 2018 වසරේදී දේශීය අවශ්‍යතාවයෙන් සියයට 60.0 ක් සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇත.

- **කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතු 2018 වසරේදීද අඛණ්ඩව යහපත් වර්ධනයක් පෙන්නුම් කරනු ඇත.** සාර්ව ආර්ථික තත්ත්වය වැඩිදියුණු වීම, විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජය ගනු ලබන ප්‍රයත්න හා විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයේ (ජී.එස්.පී. ප්ලස්) හිතකර බලපෑම තුළින් කර්මාන්ත අංශය කෙරෙහි නිෂ්පාදන අංශයේ දායකත්වය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජී.එස්.පී ප්ලස් සහනය නැවත ස්ථාපනය කිරීම ඇඟලුම් අපනයන වැඩි වීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂිතය. මීට අමතරව, කාර්මික ප්‍රදේශ (Industrial Corridors) හා ප්‍රවාහන හා ගබඩා සැපයුම් පහසුකම් සංවර්ධනය, විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ කාර්මික සංවර්ධනය සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීම සඳහා උපකාරී වේ යැයි අපේක්ෂා කෙරේ. බදුකරණය, ඉඩම් පරිපාලනය, කම්කරු රෙගුලාසි පිළිබඳ හිතකර සහ ස්ථාවර ප්‍රතිපත්ති සමග, ඩිජිටල්කරණයේ වර්ධනය සහ රජය මගින් ලබා දෙනු ලබන අනෙකුත් දිරිගැන්වීම් ඉහත සංවර්ධන කටයුතු සඳහා සහාය වනු ඇතැයි බලාපොරොත්තු වේ. මීට අමතරව, රජය විසින් හඳුන්වා දෙනු ලැබූ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අරමුදල් යෝජනා ක්‍රම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හට ප්‍රතිලාභ ලැබේ යැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර අගය දාම සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වැදගත් වුවත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල වර්ධනය සහතික කිරීම සඳහා සඳහා සැලසුම් කර ඇති ප්‍රපාතන - විරෝධී ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගත යුතුව ඇත. නිෂ්පාදන අංශය, ඉහළ තාක්ෂණික උපයෝජන තුළින් ඉහළ එකතු කළ අගයක් සහිත භාණ්ඩ නිපදවන අංශයක් වශයෙන් දියුණු කිරීමේ අවශ්‍යතාව තවත් ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවක් වේ. මේ අතර නේවාසික සහ ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා පවතින ඉල්ලුම සපුරාලමින් පෞද්ගලික අංශය ඉදිකිරීම් කටයුතුවලට ප්‍රධාන වශයෙන් දායක වනු ඇතැයි අපේක්ෂා කරන අතර, විශේෂයෙන්ම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය තුළින් අත්‍යවශ්‍ය අංශවල යටිතල පහසුකම් සංවර්ධනය ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු සඳහා රාජ්‍ය අංශය දායකත්වය දක්වනු ඇත. කෙසේ වුවද, නිෂ්පාදනය ඉහළ නැංවීමට බාධක වන පුහුණු සහ නුපුහුණු ශ්‍රම හිඟය, ශ්‍රම බලකායේ නිපුණතා අවශ්‍යතා සමග නොගැළපීම සහ ශ්‍රම පිරිවැය හා උපයෝගිතා සේවා සඳහා වන පිරිවැය ඉහළ යෑම කර්මාන්ත ආශ්‍රිත ආර්ථික කටයුතුවල උපරිම මට්ටමට ළඟා වීම සඳහා විසඳා ගත යුතු ගැටලු ලෙස හඳුනා ගෙන ඇත.

- **සේවා ආශ්‍රිත සියලුම ප්‍රධාන ආර්ථික කටයුතුවල දායකත්වයෙන් සේවා කටයුතු 2018 වසරේදීද ඉහළ වර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෙම වර්ධනය කෙරෙහි සාම්ප්‍රදායික සේවා වන තොග හා සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහන කටයුතු මෙන්ම ගෝලීය ප්‍රවණතා සමගම වර්ධනය වන වඩාත් නවීන සේවා වන මූල්‍ය හා වෘත්තීයමය සේවා, පරිගණක වැඩසටහන්, විදුලි සංදේශ සහ පෞද්ගලික සේවා වැනි ආර්ථික කටයුතුද දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහිදී අනෙකුත් ආර්ථික කටයුතුවල එකතු කළ අගය ඉහළ යෑම කෙරෙහි දායක වන ප්‍රවාහන, මූල්‍ය සේවා, සන්නිවේදනය ආදී සේවා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වඩාත් පුළුල් ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. පවතින මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම මෙන්ම වඩාත් දියුණු පොදු ප්‍රවාහන සේවා සැපයීම තුළින්ද ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීමේ හැකියාව පවතී. තවද, සේවා අපනයන තුළින් සේවා කටයුතුවල වර්ධනය කෙරෙහි දායකවීම සඳහා වෘත්තීයමය සේවාවන්ට ඉහළ හැකියාවක් පවතී. මෙවැනි සේවා අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා දේශීය සහ විදේශීය ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමට සමත් උපායමාර්ග, ආයතනික සහය මෙන්ම දිරි ගන්වන සුලු වාතාවරණයද අත්‍යවශ්‍ය වේ. මෙහිදී අධ්‍යාපනික ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම මෙන්ම නව නිපැයුම්, පර්යේෂණ හා සංවර්ධන සහ අනෙකුත් තාක්ෂණික වැඩි දියුණු කිරීම් ආශ්‍රිත ආයෝජන වර්ධනය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම තුළින්ද සේවා ප්‍රවර්ධනය සඳහා තවදුරටත් පහසුකම් සලසනු ඇත. මේ අතර, සංචාරක කටයුතු ආශ්‍රිත සේවා තුළින්ද සේවා කටයුතුවල වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහෙයින් සාම්ප්‍රදායික සංචාරක කටයුතු මෙන්ම වෛද්‍ය ප්‍රතිකාර අරමුණු කරගත් සංචාරක ව්‍යාපාරය වැනි අඩු ඉල්ලුම් මිල නම්‍යතාවක් සහිත විශේෂිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා අලෙවිකරණ උපායමාර්ග දියුණු කිරීම කෙරෙහි ප්‍රතිපත්තිමය අවධානය යොමු කළ යුතුය. නුදුරු

අනාගතයේදී ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා දායක වීමේ හැකියාව පවතින සේවා සහ කර්මාන්ත මූලික කර ගත් ආර්ථික කටයුතු වර්තමානයේදී පුහුණු සහ නුපුහුණු ශ්‍රමික හිඟයකට මුහුණ පා ඇති අතර එය 2020 වන විටදී තවදුරටත් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම නිසා, වෙළඳපොළ බලාපොරොත්තු වන කුසලතා සහිත ශ්‍රමිකයන් නොමැති වීම ආශ්‍රිත ගැටලු විසඳීමට සහ දේශීය මෙන්ම විදේශීය ශ්‍රම නිපුණතා අවශ්‍යතා සපුරාලන දැනුම් මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම සඳහා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගීතාවයෙන් වෙළඳපොළ අවශ්‍යතාවට සරිලන පරිදි පුහුණු කිරීම් සිදු කරන මධ්‍යස්ථාන පිහිටුවීමද ඉතා වැදගත් වේ.

- **2018 වසරේදී ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ආයෝජන කටයුතුවල දායකත්වයෙන් අඛණ්ඩ ධනාත්මක වර්ධනය පවත්වා ගනිමින් සමස්ත ආයෝජන කටයුතු ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 32.5 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමට හේතුවන රාජ්‍ය ප්‍රතිපත්තිවල වර්ධනයත් සමග මෙලෙස පෞද්ගලික අංශයේ ආයෝජනවල ඉහළ යෑමක් අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම මහල් නිවාස සහ වාණිජමය ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවලට අදාළ පෞද්ගලික අංශයේ ආයෝජන කටයුතු මෙම වර්ධනය සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ආර්ථික වර්ධනය සඳහා පහසුකම් සලසන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වැනි ඉලක්කගත ව්‍යාපෘති සඳහා වන ආයෝජන හේතුවෙන් රාජ්‍ය අංශයේ ආයෝජනද මධ්‍යස්ථ වේගයකින් වර්ධනය වනු ඇත.

- **ඉහළ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමෙහිලා ආර්ථිකයේ ඉතුරුම් යහපත් මට්ටමක පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.** මෙහිදී, පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ඉතුරුම්ද වර්ධනය වීම අවශ්‍යය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වන රජයේ අඛණ්ඩ කැපවීම මෙන්ම ධනාත්මක මූර්ත පොලී අනුපාතික ද දේශීය ඉතුරුම් වර්ධනයට දායක වනු ඇත. මේ අතර, දේශීය ආයෝජන මෙන්ම විදේශ සෘජු ආයෝජන සඳහා ද පහසුකම් සලසමින් සුදුසු සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම ආර්ථිකයේ ඉතුරුම්-ආයෝජන පරතරය අඩු කිරීමට හේතුවනු ඇත.

# 3

## ආර්ථික හා සමාජ යටිතල පහසුකම්


ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික අංශය දායක කරගැනීමේ වැදගත්කම හඳුනාගන්නා අතරම, 2017 වසරේ පළමු භාගය තුළදී මෙම අත්‍යවශ්‍ය පහසුකම්වල ගුණාත්මක හා ප්‍රමාණාත්මක වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය භාවිත කිරීමට රජය කටයුතු කළේය. විදුලි සංදේශ, මාර්ග සංවර්ධන, ප්‍රවාහන සහ වරාය යන අංශවල මෙන්ම අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සැපයුම වැනි සමාජ යටිතල පහසුකම්වලද අඛණ්ඩ ප්‍රගතියක් දැකිය හැකි විය. ඇඩි නියං තත්ත්වය මධ්‍යයේ වුවද, මෙම කාලය තුළදී තාප විදුලිබල ජනනය ඔස්සේ ඉහළ විදුලිබල ඉල්ලුම සපුරාලීමට රටට හැකි විය. තිරසාර බලශක්ති ප්‍රතිපත්තියක් තුළින් බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් යුතුව ඉදිරි විසි වසරක කාලය සඳහා වන දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති සැලසුමක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. පළාත් අතර භෞතික සම්බන්ධතාවයෙහි තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, අධිවේගී මාර්ග හා මහාමාර්ග, සහ ඒකාබද්ධ මාර්ග වැඩසටහන වැනි මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ සංවර්ධන කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. අයහපත් නිවාස තත්ත්ව හා කසළ එක්රැස්වීම වැනි ශීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් ඇතිවන ගැටලු සඳහා විසඳුම් සෙවීමේ අරමුණද සහිතව බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලැස්ම යටතේ වන කටයුතුද මෙම කාලය තුළදී ක්‍රියාත්මක කෙරිණි. සමාජ යටිතල පහසුකම් සම්බන්ධයෙන් සැලකීමේදී, අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීම සහ දිවයින පුරා සිටින සියලුම සිසුන්ට අධ්‍යාපනය සඳහා සම අවස්ථා හිමිකරදීම ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. සෞඛ්‍ය අංශයේද භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම කාලය තුළදී ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයම විසින් සපයනු ලබන සමාජ යටිතල පහසුකම් උසස් ප්‍රමිතියකින් යුතු බව සහතික කිරීම, පොදු ජනතාවගේ යහ පැවැත්ම ඉහළ නැංවීමට සහ සමස්ත ආර්ථික සංවර්ධනයට අත්‍යවශ්‍ය වේ. එබැවින්, අනාගත අභියෝගවලට මුහුණ දීමට සැලසුම් කරන අතරම, විශේෂයෙන්ම, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල තත්ත්වය සහතික කිරීමේ යාන්ත්‍රණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කළ යුතුය. ජනගහනය වියපත්වීම හා බැඳුණු සෞඛ්‍ය වියදම ඉහළ යෑම සහ විශේෂයෙන්ම, විද්‍යාව, තාක්ෂණවේදය, ඉංජිනේරු විද්‍යාව හා ගණිතය යන විෂය ක්ෂේත්‍ර සඳහා වූ අධ්‍යාපනික ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම සඳහා වන වියදම් ඉහළ නැංවීම මෙන්ම, පුහුණු කටයුතු හා නිපුණතා සම්බන්ධ තෘතීයික අධ්‍යාපනය පුළුල් කිරීමේ අවශ්‍යතාව යන කරුණු සම්බන්ධයෙන් සැලකීමේදී, රජයේ අයවැය සීමා හේතුවෙන් ඉදිරි වසරවලදී ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය තවදුරටත් දිරිගැන්වීම අත්‍යවශ්‍ය වනු ඇත. මේ සම්බන්ධයෙන් සැලකීමේදී, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා එවැනි සේවා සැපයීම දිරි ගන්වනු ලබන පරිසරයක් නිර්මාණය කිරීමටද කඩිනම් පියවර ගත යුතුය.

## ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

### විදුලිබලය

- **සමස්ත විදුලිබල උත්පාදනය 2016 වසරේ අනුරූප කාලයේදී වාර්තා කළ ගිගාවොට් පැය (ගි.වො.පැ.) 8,141 ට සාපේක්ෂව 2017 වසරේ මුල් මාස හත තුළදී ගි.වො.පැ. 8,374 ක් දක්වා සියයට 2.9 කින් ඉහළ ගියේය.** වසරේ පළමු භාගය තුළදී පැවති නියං තත්ත්වය හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති වූ අතර, 2016 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ මුල් මාස හත තුළදී ජල විදුලිබල උත්පාදනය (සුළු පරිමාණ ජල විදුලිබලය රහිතව) ගි.වො.පැ. 1,243 ක් දක්වා සියයට 48.5 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, ජල විදුලිබල උත්පාදනය පහළ යෑමට ප්‍රතිචාර වශයෙන් තාප විදුලිබල උත්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵල ලෙස, 2017 වසරේ මුල් මාස හත තුළදී ද්‍රව ඉන්ධන විදුලිබල උත්පාදනය සහ ගල්අඟුරු විදුලිබල උත්පාදනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, ගි.වො.පැ. 3,122 ක් සහ 3,325 ක් දක්වා සියයට 40.0 කින් සහ සියයට 18.5 කින් ඉහළ ගියේය. මේ අතර, 2017 වසරේ මුල් මාස හත තුළදී සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 684 ක් දක්වා 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.2 කින් අඩු විය. නියං කාලගුණික තත්ත්වය හේතුවෙන් සුළු පරිමාණ ජල විදුලි බලාගාරවල විදුලිබල උත්පාදනය අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී රටේ සමස්ත විදුලිබල උත්පාදනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) දැක්වූ දායකත්වය සියයට 72.9 ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් විසින් උත්පාදනය කරන ලදී. සමස්ත විදුලිබල උත්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය 2016 වසරේ පළමු මාස හත තුළදී වාර්තා වූ සියයට 9.7 ට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස හත තුළදී සියයට 7.4 ක් දක්වා අඩු විය.

**රූප සටහන 3.1**
**විදුලිබල උත්පාදන සංයුතිය (ජනවාරි - ජූලි)**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

- **2017 වසරේ පළමු මාස හත තුළදී සමස්ත විදුලිබල අලෙවිය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ ගි.වො.පැ. 7,349 ට සාපේක්ෂව ගි.වො.පැ. 7,756 ක් දක්වා සියයට 5.5 කින් ඉහළ ගියේය.** සමස්ත විදුලිබල අලෙවියෙන්, පිළිවෙළින්, සියයට 29.8 ක් හා සියයට 20.8 ක් පරිභෝජනය කරන ලද කර්මාන්ත හා පොදු කාර්ය අංශවලින් ඇති වූ ඉල්ලුම විදුලිබල ඉල්ලුමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2017 වසරේ පළමු මාස හත තුළදී සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 32.6 ක් පරිභෝජනය කෙරුණු ගෘහස්ථ අංශයෙහි විදුලිබල පරිභෝජනයද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. තවද, 2017 වසරේ ජූනි මස අවසානය වන විට රටේ විදුලිබල ප්‍රවේශය සියයට 99.43 ක් දක්වා ඉහළ ගියේය.

- **රට තුළ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කළේය.** 'සූර්ය බල සංග්‍රාමය' වැඩසටහන මගින් වසර 2020 වන විට පියැසි මත මෙගාවොට් 200 ක සූර්ය බල උත්පාදන ව්‍යාපෘති ස්ථාපිත කිරීම සහ ඒ තුළින් නිවාස දශලක්ෂයක පියැසි සූර්ය බලය උත්පාදනය කරන බලාගාර බවට පරිවර්තනය කිරීම අරමුණු කරයි. මීට අමතරව, මෙම වැඩසටහන යටතේ මෙගාවොට් 1

**3.1 සංඛ්‍යා සටහන**

**විදුලිබල අලෙවිය**

| අයිතමය | 2015 | 2016 (අ) | 2016 ජන-ජූලි | 2017 ජන-ජූලි (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| ලං.වි.ම. මුළු අලෙවිය (ගිගාවොට් පැය) | 11,786 | 12,785 | 7,349 | 7,756 | 5.5 |
| ගෘහස්ථ | 3,876 | 4,198 | 2,431 | 2,542 | 4.6 |
| ආගමික | 67 | 74 | 42 | 45 | 6.5 |
| කර්මාන්ත | 3,608 | 3,864 | 2,190 | 2,311 | 5.5 |
| පොදු සේවා | 2,324 | 2,579 | 1,489 | 1,617 | 8.5 |
| රාජ්‍ය | 152 | 160 | 94 | 99 | 5.5 |
| හෝටල් | 205 | 247 | 140 | 153 | 8.9 |
| ලංකා විදුලි සමාගමට අලෙවිය | 1,446 | 1,553 | 899 | 927 | 3.1 |
| විදි ආලෝක කිරීම | 108 | 109 | 63 | 63 | -0.7 |


මූලය : ලංකා විදුලිබල මණ්ඩලය

(අ) තාවකාලික

බැගින් වූ සූර්ය බල ව්‍යාපෘති මගින් සමස්තයක් ලෙස මෙගාවොට් 60 ක් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කෙරෙනු ඇත. මෙම කුඩා පරිමාණ විදුලිබල ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් තෝරා ගැනීමට අවශ්‍ය තරගකාරී ලංසු තැබීමේ සහ ඇගයීමේ ක්‍රියාවලි මේ වනවිට සිදු කෙරෙමින් පවතී. 2016 වසරේ සැප්තැම්බර් මාසයේදී සූර්ය බල සංග්‍රාමය වැඩසටහන ආරම්භ කිරීමේ පටන් 2017 වසරේ ජූනි මස අවසානය වන විට ශුද්ධ මනුකරණය, ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් යන සැලසුම් යටතේ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 16.3 ක් එක් කරමින් පාරිභෝගිකයන් 2,038 දෙනෙකු විසින් පියැසි මත සූර්ය බල උත්පාදනය ආරම්භ කර ඇත. තවද, වසර 2019 දී මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේන හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද යන ප්‍රදේශවල මෙගාවොට් 10 ක සූර්ය බලශක්ති උද්‍යාන දෙකක විදුලිබල උත්පාදනය ආරම්භ කිරීමට නියමිතය. මේ අතර, වසර 2020 දී කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනරින් ප්‍රදේශයේ මෙගාවොට් 100 ක සූර්ය බලශක්ති උද්‍යානයක්

**රූප සටහන 3.2**

**නව විදුලිබල සම්බන්ධතා සහ විදුලිබල ප්‍රවේශය**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

ආරම්භ කිරීමට නියමිත අතර, වසර 2020 දී විදුලිබල උත්පාදනය ආරම්භ කිරීමට අපේක්ෂිත මෙගාවොට් 100 ක සූර්ය බලශක්ති උද්‍යානයක් මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ඉදි කෙරෙමින් පවතී. තවද, මන්නාරම දූපතේ මෙගාවොට් 300 ක සුළං බලශක්ති උද්‍යානයක් ඉදිකිරීමටද අපේක්ෂිත අතර, ආරම්භයේදී මෙහි මෙගාවොට් 100 ක සුළං විදුලි බලාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මේ අතර, රටේ බලශක්ති සුරක්ෂිතතාව සහ අඛණ්ඩ විදුලි සැපයුම සහතික කිරීමේ දැක්ම සහිතව 2018-2037 කාලය සඳහා ලං.වි.ම.යේ අවම පිරිවැයක් සහිත දිගුකාලීන විදුලි උත්පාදන ව්‍යාප්ති සැලැස්ම (Least Cost Long-Term Generation Expansion Plan) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. මෙම අනුමත කරන ලද විදුලිබල උත්පාදන සැලැස්ම මගින් ඉදිරි විසි වසරක කාලය තුළදී මෙගාවොට් 242 ක ප්‍රධාන ජල විදුලි බලාගාර, මෙගාවොට් 215 ක කුඩා ජල විදුලි බලාගාර, මෙගාවොට් 1,389 ක සූර්ය බලාගාර, මෙගාවොට් 1,205 ක සුළං බලාගාර, මෙගාවොට් 85 ක ජෛව ස්කන්ධ බලාගාර, මෙගාවොට් 4,800 ක ස්වාභාවික වායු බලාගාර, මෙගාවොට් 320 ක දැවි තෙල් බලාගාර සහ මෙගාවොට් 105 ක ගෑස් ටර්බයින බලාගාර ලං.වි.ම.යේ විදුලිබල උත්පාදන පද්ධතියට එක් කිරීමට නිර්දේශිතය. වසර 2030 වන විට පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් රටේ බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 70 ක් උත්පාදනය කිරීමේ රජයේ ප්‍රතිපත්ති ඉලක්කය හා මෙම අනුමත කළ සැලැස්ම අනුකූල වේ.

## ඛනිජ තෙල්

- 2017 වසරේ පළමු මාස පහ තුළදී ජාත්‍යන්තර වෙළඳපොළේ දක්නට ලැබුණු බොරතෙල් (බ්‍රෙන්ට්) මිල ගණන්වල පහළ යෑමේ ප්‍රවණතාව ජූනි මස මැද සිට වෙනස් වූ අතර, ඒ හේතුවෙන් 2016 වසරේ

3

**අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු කාර්තු තුන තුළදී බොරතෙල් මිල ගණන්වල සාමාන්‍යය ඉහළ මට්ටමක පැවතිණි.** 2016 වසරේ දෙසැම්බර් මාසයේදී ඛනිජ තෙල් අපනයන රටවල සංවිධානය (ඔපෙක්) 2017 වසරේ ජනවාරි මස පටන් හය මසක කාලයක් සඳහා බොරතෙල් නිෂ්පාදනය සීමා කිරීමට එකඟ විය. මේ අතර, රුසියාව ඇතුළු ඔපෙක් නොවන සාමාජිකයෝද සිය නිෂ්පාදන අඩු කරනු ලබන බව නිවේදනය කළහ. ජාත්‍යන්තර වෙළඳපොළේ අතිරික්ත සැපයුම් තත්ත්වය පාලනය කිරීම සඳහා 2017 වසරේ මැයි මාසයේදී ඔපෙක් සංවිධානයේ සාමාජිකයන් මෙන්ම, රුසියාව හා වෙනිසියුලාව වැනි ඔපෙක් සංවිධානයට අයත් නොවන රටවල් කිහිපයක්ද 2018 වසරේ මාර්තු මාසය දක්වා සිය නිෂ්පාදන සීමා කිරීමට තීරණය කළහ. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු භාගය තුළදී ඇමරිකා එක්සත් ජනපදයෙහි දෛනික තෙල් නිෂ්පාදන සාමාන්‍යය 2016 වසර මැද පැවති මට්ටමට සාපේක්ෂව සියයට 4 කට වඩා වැඩි අගයක් ගත් අතර, ඔපෙක් සංවිධානයේ නිෂ්පාදන සීමා කිරීම හමුවේ වුවද බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් ඇති වීමට එය හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මාසික සාමාන්‍ය මිල 2017 වසරේ ජනවාරි මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 55.67 ක සිට 2017 වසරේ ජූනි මාසයේදී එ.ජ. ඩොලර් 47.71 ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ ඛනිජ තෙල් කැණීම් කටයුතු මන්දගාමී වීම හා ගෝලීය ඉල්ලුම ශක්තිමත් වනු ඇති බවට පැවති අපේක්ෂා හේතුවෙන් 2017 වසරේ ජූනි මස මැද සිට මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවක් දැකිය හැකි විය. කෙසේ වෙතත්, හාර්වි සුළි කුණාටුව හේතුවෙන් එක්සත් ජනපදයේ ගල්ෆ් වෙරළ තීරයේ පිහිටි ප්‍රධාන පිරිපහදුවලට හානි සිදුවීම සහ මෙම සියවසේ ප්‍රබලතම කුණාටුවලින් එකක් වන අර්මා සුළි කුණාටුව පිළිබඳව පැවති අවිනිශ්චිතතා හේතුවෙන් අගෝස්තු මස අවසානයේදී අනපේක්ෂිත ලෙස බොරතෙල් මිල ගණන් තාවකාලිකව පහළ ගියේය. එම පිරිපහදු ක්‍රමයෙන් නැවත මෙහෙයුම් ආරම්භ කිරීමත් සමඟ බොරතෙල් මිල ගණන් ඉහළ යෑම ආරම්භ වූ අතර, ඔපෙක් සංවිධානය විසින් වසර 2018 සඳහා ඉහළ ඉල්ලුමක් පුරෝකථනය කිරීමද මෙම මිල ඉහළ යෑම කෙරෙහි හේතු විය. ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන රටවලට අනුව ජාත්‍යන්තර වෙළඳපොළෙහි බොරතෙල් මිල ගණන් නැවතත් සමතුලිත වෙමින් පැවතුණි. මෙම තත්ත්වය නිරූපණය කරමින් 2017 වසරේ සැප්තැම්බර් මස

**රූප සටහන 3.3**
**ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල හා ලං.ඛ.නී.සං. විසින් ආනයනය කළ බොරතෙල් මිල**




මූලයන් : බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

අවසානයේදී බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල 2015 වසරේ ජූලි මාසයේ සිට වාර්තා කළ ඉහළම අගය වන එ.ජ. ඩොලර් 59.14 වාර්තා කළේය. ඒ අනුව, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් 43.08 ට සාපේක්ෂව 2017 වසරේ මුල් මාස නවය තුළදී එ.ජ. ඩොලර් 52.60 ක් දක්වා සියයට 22.1 කින් ඉහළ ගියේය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2017 වසරේ පළමු මාස නවය තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් 43.72 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් 54.81 ක් දක්වා සියයට 25.4 කින් ඉහළ ගියේය.

- **ප්‍රධාන වශයෙන් විදුලිබල උත්පාදන අංශයෙන් ඇති වූ ඉල්ලුම හේතුකොටගෙන 2017 වසරේ පළමු මාස අට තුළදී දේශීය ඛනිජ තෙල් අලෙවිය ඉහළ ගියේය.** 2016 වසරේ මැද සිට රට තුළ පැවති නියං තත්ත්වය සහ නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරයෙහි මෙහෙයුම් කටයුතුවලට නිරන්තරයෙන් බාධා ඇති වීම හේතු කරගෙන ද්‍රව ඉන්ධන භාවිතයෙන් තාප විදුලිබල උත්පාදනය මත දැඩි ලෙස යැපීමට සිදු විය. මේ අනුව, පෙර වසරේ අනුරූප කාල පරාසය හා සැසඳීමේදී 2017 වසරේ පළමු මාස අට තුළදී බලශක්ති උත්පාදන අංශය සඳහා වූ ඛනිජ තෙල් අලෙවිය සියයට 40.4 කින් ඉහළ ගියේය. තවද, 2017 වසරේ පළමු මාස අට තුළදී රටේ මුළු ඛනිජ තෙල් පරිභෝජනයෙන් සියයට 61.4 ක් පරිභෝජනය කළ ප්‍රවාහන අංශය සඳහා වූ දේශීය ඛනිජ තෙල් අලෙවිය 2016 වසරේ

අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.6 කින් ඉහළ යෑමට ප්‍රවාහන අංශය වෙතින් පෙට්‍රල් සහ ඩීසල් යන ඉන්ධන සඳහා පැවති ඉහළ ඉල්ලුම හේතු විය. තවද, ප්‍රධාන වශයෙන් බලශක්ති උත්පාදන අංශය සඳහා භාවිතයට ගන්නා නිෂ්පාදනයක් වන දැවි තෙල් අලෙවිය මෙම කාලපරිච්ඡේදයේදී සියයට 42.6 කින් ඉහළ ගියේය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළදී දේශීය භූමිතෙල් අලෙවිය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 9.7 කින් ඉහළ ගියේය.

### මාර්ග සංවර්ධනය

- **2017 වසරේ පළමු භාගය තුළදී, මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ හා නඩත්තු කිරීමේ කටයුතුවල අඛණ්ඩව නිරත විය.** ඒ අනුව, මෙම කාලය තුළදී මහාමාර්ග සහ පාලම් නඩත්තු කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මා.සං.අ. විසින් වැය කරන ලද සම්පූර්ණ මුදල රුපියල් බිලියන 48.8 ක් විය. මෙය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී මා.සං.අ. විසින් වැය කළ රුපියල් බිලියන 38.4 ට සාපේක්ෂව සියයට 27.1 ක වර්ධනයකි. 2017 වසරේ පළමු භාගය තුළදී අධිවේගී මාර්ගද ඇතුළුව කිලෝමීටර 12,380 ක සම්පූර්ණ දිගකින් යුතු ජාතික මහාමාර්ග මෙන්ම පාලම් 4,662 කට ආසන්න සංඛ්‍යාවක්ද මා.සං.අ. විසින් නඩත්තු කරන ලදී.

- **මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් පෙර වසරවලදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 2017 වසරේ පළමු භාගය තුළදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය.** පසුගාමී පළාත්වල ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ආර්ථික සහ සමාජ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ආධාර වන සහ පහසුකම් සලසන මහාමාර්ග පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇති ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (i-Road) ද මෙයට ඇතුළත් වේ. මේ අතර, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) සහාය සහිතව, මාර්ග තදබදය අවම කිරීමට සහ එමගින් කොළඹ නගරයේ ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමට අදාළ මූලික කටයුතුද මෙම කාලය තුළදී ක්‍රියාත්මක කෙරිණි. කොළඹ ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය යටතේ කොට්ටාව-තලගල මාර්ගය සහ කෝට්ටේ-බෝපේ මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘති දෙකක් 2017 වසරේ පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. මේ අතර, 2017 ජූනි මස අවසානය වන විට පොල්ගහවෙල, ගණේමුල්ල සහ රාජගිරිය ගුවන් පාලම්වල ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 93.5 ක් විය. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත මාර්ග සම්බන්ධතාවක් සහිතව මාතර සිට හම්බන්තොට දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු 2017 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, පොතුහැර-ගලගෙදර මාර්ග සම්බන්ධතාවද සහිතව කඩවත සිට දඹුල්ල දක්වා වූ මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිරිකිරීම් කටයුතුද 2017 වසරේ පළමු භාගයේදී අඛණ්ඩව සිදු කෙරිණි. තවද, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගයට සම්බන්ධතාවක් සහිතව කඩවත හුවමාරුව සහ කෙරවලපිටිය හුවමාරුව සම්බන්ධ කරමින් ඉදිවන පිටත වටරවුම් මහාමාර්ගයේ තුන්වන අදියර 2017 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම පිටත වටරවුම් මහාමාර්ගයේ ඉදිකිරීම් අවසන් වීම තුළින් කොළඹ නාගරික ප්‍රදේශය තුළ රථවාහන තදබදය ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සමගම, 2017 වසරේ පළමු භාගය තුළදී ඇතැම් මාර්ග සහ පාලම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීමද අඛණ්ඩව සිදු විය.

- **ප්‍රධාන නගරවල රථවාහන තදබදය අඩු කිරීම සහ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා පියවර ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.** කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (KOICA) මූල්‍යාධාර සහිතව කොළඹ නාගරික කලාපය තුළ දියුණු රථවාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ව්‍යාපෘතියක් දැනට සිදු කෙරෙමින් පවතී. රථවාහන තදබදය ලිහිල් කිරීම, මාර්ග ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීම තුළින් කොළඹ නාගරික කලාපය තුළ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අනුබල දීම ඉලක්ක කරමින්, දියුණු රථවාහන කළමනාකරණ විශේෂාංගවලින් සමන්විත මධ්‍යගත රථවාහන පාලන පද්ධතියක් ගොඩනැගීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. තවද, කිලෝමීටර 211.4 ක ප්‍රමාණයක් ආවරණය කරමින්, පදිකයින්ට ආලෝක සංඥා ක්‍රියා කරවිය හැකි පදික මාරු පිහිටුවිය හැකි ස්ථාන 79 ක් හඳුනාගෙන ඇති අතර, එහි මූලික සැලසුම මේ වනවිට අවසන් කර ඇත.

3

### මාර්ගස්ථ මගී ප්‍රවාහනය

- **පොදු මාර්ගස්ථ මගී ප්‍රවාහනය 2017 වසරේ පළමු භාගයේදී පසුබෑමක් පෙන්නුම් කළේය.** 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි (ශ්‍රී ලං.ග.ම.) මුළු ධාවන කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර මිලියන 219.4 ක් දක්වා සියයට 1.6 කින් අඩු වූ අතර, මුළු මගී කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර මිලියන 7,737 ක් දක්වා සියයට 0.4 ක සුළු පහළ යෑමක් වාර්තා කළේය. 2017 වසරේ ජූනි මස අවසානය වන විට ශ්‍රී ලං.ග.ම. සතු මුළු බස් රථ ප්‍රමාණය 7,608 ක් වූ අතර, මෙම කාලය තුළදී දිනකට ධාවනය කරන ලද බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය බස් රථ 5,219 ක් දක්වා 87 කින් අඩු විය. මේ අතර, 2016 වසරේ අනුරූප කාලය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී පෞද්ගලික අංශය සතු බස් රථ සංඛ්‍යාව 19,917 ක් දක්වා සියයට 2.0 කින් පහළ ගිය අතර, ධාවනය කරන ලද බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය 17,728 ක් දක්වා සියයට 3.4 කින් පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළදී පෞද්ගලික අංශයේ බස් රථ ධාවන කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර මිලියන 523.1 ක් දක්වා සියයට 3.6 කින් අඩු වූ අතර, මගී කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර මිලියන 26,345.5 ක් දක්වා සියයට 3.5 ක අඩු වීමක් පෙන්නුම් කළේය. දෙවන කාර්තුවේ අවසන් භාගයේදී රටේ ප්‍රදේශ රැසක පැවති ගංවතුර තත්ත්වය ශ්‍රී ලං.ග.ම. සහ පෞද්ගලික යන දෙඅංශයේම බස් රථ මෙහෙයුම් අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේය. මේ අතර, වාර්ෂික ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය යටතේ 2017 ජූලි 1 දින සිට බලපැවැත්වෙන පරිදි බස් ගාස්තු සංශෝධනය කරන ලදී. ඒ අනුව, අවම බස් ගාස්තුව රුපියල් 9.00 ක සිට රුපියල් 10.00 ක් දක්වා ඉහළ නංවන ලද අතර, අනෙකුත් ගාස්තු සියයට 6.28 ක සාමාන්‍යයකින් ඉහළ නංවන ලදී.

- **2017 වසරේ පළමු භාගයේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව මාර්ගස්ථ මගී ප්‍රවාහන ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2017 වසර සඳහා රුපියල් මිලියන 690 ක අයවැයක් යටතේ සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය යන ප්‍රධාන සේවා ක්‍රියාත්මක කළේය. පාසල් සිසුන් නියමිත වේලාවට පාසලට පැමිණීම සහ ආරක්ෂිතව ආපසු නිවෙස් කරා යෑම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගත් ‘සිසු සැරිය’ ව්‍යාපෘතිය යටතේ 2017 වසරේ පළමු භාගයේදී නව බස් රථ සේවා 45 ක් ආරම්භ කරන ලදී. ග්‍රාමීය ප්‍රදේශවල සාපේක්ෂව ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන ගමන්මාර්ගවල ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ‘ගැමි සැරිය’ බස් සේවය අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2017 වසරේ පළමු භාගය තුළදී ‘ගැමි සැරිය’ ව්‍යාපෘතිය යටතේ නව සේවා 11 ක් ආරම්භ කර ඇත. ‘නිසි සැරිය’ ව්‍යාපෘතිය යටතේ 2017 වසරේදී නව බස් රථ සේවා 35 ක් ආරම්භ කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව සැලසුම් කරමින් සිටියි. 2017 වසරේ පළමු භාගය තුළදී ආර්ථිකමය වශයෙන් ලාභදායී නොවන මාර්ගවල මෙහෙයුම් පවත්වාගෙන යෑමට සහ සහනදායී මිලට වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින්, පිළිවෙළින්, රුපියල් බිලියන 2.9 ක් සහ රුපියල් බිලියන 2.5 ක් සහනාධාර වශයෙන් ශ්‍රී ලං.ග.ම. වෙත ලබාදී ඇත.

- **2017 වසරේ පළමු මාස නවය තුළදී රථවාහන නව ලියාපදිංචිය පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව පහළ ගියේය.** ප්‍රධාන වශයෙන් මෝටර් රථ, ත්‍රිරෝද රථ සහ ද්විත්ව කාර්ය වාහන යන කාණ්ඩ යටතේ රථවාහන ලියාපදිංචිය අඩු වීමක් දක්නට ලැබුණි. 2017 වසරේ මුල් මස නවය තුළ රථවාහන ලියාපදිංචිය අඩු

**3.2 සංඛ්‍යා සටහන**

**රථවාහන නව ලියාපදිංචිය**

| අයිතමය | 2015 | 2016 (අ) | 2016 ජන-සැප් | 2017 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| රථවාහන නව ලියාපදිංචි කිරීම | 668,907 | 493,328 | 355,155 | 342,215 | -3.6 |
| බස් රථ | 4,140 | 2,685 | 2,011 | 2,356 | 17.2 |
| මෝටර් රථ | 105,628 | 45,172 | 33,198 | 29,684 | -10.6 |
| එන්ජින් ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ | 60,641 | 24,593 | 17,256 | 14,806 | -14.2 |
| ත්‍රිරෝද රථ | 129,547 | 56,945 | 40,314 | 17,519 | -56.5 |
| ද්විත්ව කාර්ය වාහන | 39,456 | 26,887 | 19,336 | 12,613 | -34.8 |
| යතුරු පැදි | 370,889 | 340,129 | 245,350 | 262,012 | 6.8 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 7,142 | 7,563 | 5,326 | 8,503 | 59.7 |
| ඉඩම් වාහන | 12,105 | 13,947 | 9,620 | 9,528 | -1.0 |

මූලය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

වීම සඳහා ආනයන බදු ඉහළ යෑම, එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම, දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම සහ ඇතැම් කාණ්ඩවල රථවාහන මිලදී ගැනීම සඳහා ණය ගැනීම අධෛර්යවත් කිරීමට සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති දැඩි කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

## දුම්රිය ප්‍රවාහනය

- **ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) විසින් සපයනු ලබන මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා යන දෙඅංශයම 2017 වසරේ පළමු භාගය තුළදී පුළුල් විය.** 2016 වසරේ අනුරූප කාලය හා සැසඳීමේදී 2017 වසරේ පළමු භාගය තුළදී දුම්රිය මගී කිලෝමීටර ප්‍රමාණය කිලෝමීටර බිලියන 3.6 ක් දක්වා සියයට 1.5 කින් ඉහළ ගියේය. තවද, 2017 වසරේ පළමු භාගය තුළදී භාණ්ඩ මෙට්‍රික් ටොන් කිලෝමීටර ප්‍රමාණය මිලියන 70.6 ක් දක්වා සියයට 4.9 ක වර්ධනයක් වාර්තා කළ අතර, ගල්අඟුරු, ඛනිජ තෙල් හා සිමෙන්ති ප්‍රවාහන කටයුතු ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලං.දු.සේ. විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව, මගී දුම්රිය මැදිරි 200 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීමටද පියවර ගෙන ඇත. ඉන්දියානු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන දුම්රිය එන්ජින් හා මැදිරි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම, 2017 වසරේ පළමු භාගයේදී ශ්‍රී ලං.දු.සේ. මගින් සිදු කළ තවත් ප්‍රධාන ව්‍යාපෘතියක් විය. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආයකත්වය යටතේ සිදු කරන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනය 2017 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, වේයන්ගොඩ සිට පානදුර දක්වා දුම්රිය විදුලිකරණ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයද මෙම කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක විය.

## සිවිල් ගුවන් සේවය

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම මධ්‍යයේ වුවද, 2017 වසරේ පළමු භාගය තුළදී සිවිල් ගුවන් සේවා අංශය සුළු වර්ධනයක් පෙන්නුම් කළේය.** ගුවන්යානා ධාවන පථය යළි ඇතිරීම සඳහා මෙම වසරේ ජනවාරි සිට අප්‍රේල් මස මුල දක්වා කාලය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දිවා කාලයේදී වසා තැබුවද, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී එම ගුවන් තොටුපොළ මගින් හසුරුවන ලද ගුවන් මගීන් සංඛ්‍යාව මිලියන 4.5 ක් දක්වා සියයට 0.5 ක සුළු වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු භාගය තුළදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ උපයෝගී කර ගනු ලැබූ වෙනත් ගුවන්යානා අතර මාරුවන මගීන් සංඛ්‍යාව මිලියන 0.6 ක් දක්වා පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.6 ක පහළ යෑමක් පිළිබිඹු කළේය. මේ අතර, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විසින් හසුරුවන ලද මුළු ගුවන් භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 121,816 ක් දක්වා සියයට 10.0 කින් අඩු වූ අතර, මින් මෙට්‍රික් ටොන් 74,182 ක් අපනයන භාණ්ඩද, මෙට්‍රික් ටොන් 47,633 ක් ආනයන භාණ්ඩද විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වසා තැබීම හේතුවෙන්, එම ගුවන් තොටුපොළ වෙතින් පිටත් වූ මුළු ගුවන්යානා සංඛ්‍යාව 2016 වසරේ පළමු භාගයේදී වාර්තා වූ 16,670 ක සිට 2017 වසරේ පළමු භාගයේදී 15,037 ක් දක්වා සියයට 9.8 කින් පහළ ගියේය. කෙසේ වුවද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තාවකාලිකව වසා තැබීමත් සමඟ මෙම කාලය තුළදී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙතින් පිටත් වූ ගුවන්යානා සංඛ්‍යාව 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා වූ 670 ට සාපේක්ෂව 980 ක් ලෙස වාර්තා විය. මේ අතර, පසුගිය වසරේ මෙම කාලපරිච්ඡේදයේදී වාර්තා වූ මගීන් 1,652 ට සාපේක්ෂව මෙම කාලය තුළදී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ භාවිතා කළ මගීන් සංඛ්‍යාව 52,905 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2017 වසරේ පළමු භාගය තුළදී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විසින් හසුරුවන ලද මුළු ගුවන් භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 60 ක් විය. මේ අතර, අභ්‍යන්තර ගුවන් ගමන් සේවාවලට අදාළ මගී කිලෝමීටර ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ කිලෝමීටර මිලියන 1.94 ක සිට 2017 වසරේ පළමු භාගයේදී කිලෝමීටර මිලියන 2.32 ක් දක්වා සියයට 19.6 කින් ඉහළ ගියේය.

- **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් මගීන් හැසිරවීමේ ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2017 වසරේදී තවදුරටත් ක්‍රියාත්මක විය.** දැනට පවතින පර්යන්තය මගින් වාර්ෂිකව මගීන් මිලියන 6 ක් හැසිරවිය හැකි අතර, 2016 වසරේදී සියයට 56 ක අධි භාවිතයක්

පෙන්නුම් කරමින් එමගින් මගීන් මිලියන 9.3 ක් පමණ හසුරුවන ලදී. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි දැනට පවතින අධි භාවිතය රටේ සංචාරක අංශය වැඩිදියුණු කිරීම සඳහා බාධකයක්ව පවතී. 2017 වසරේ පළමු භාගයේදී මෙම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය පැකේජ දෙකක් යටතේ ක්‍රියාත්මක විය. මගී පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා ඒ ආශ්‍රිත කටයුතුවලට අදාළ වන පළමු පැකේජය සඳහා ඉදිරිපත් වූ මූල්‍ය ලංසු මේ වනවිට අධ්‍යයනය කෙරෙමින් පවතී. මීට අමතරව, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ සහාය සහිතව පැමිණීමේ හා පිටවීමේ ප්‍රවේශ සිරස්ව ස්ථර දෙකකට වෙන් වන පරිදි බහු මහල් පර්යන්තයක් ඉදිකිරීම සඳහා වූ තාක්ෂණික යෝජනාව අවසන් කර ඇත. දෙවන පර්යන්තයට පිටතින් දූරස්ථ ගගනාංගනය හා ගුවන්යානා බැහැරුම් පථ සහ ඒ ආශ්‍රිත ඉදිකිරීම් කටයුතුවලට අදාළ දෙවන පැකේජය 2017 වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදී. තවද, ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමට සහ එය ලබන පාඩු අවම කර ගැනීමට රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් පිහිටුවීම සඳහා සුදුසු ආයෝජකයෙකු සම්බන්ධ කර ගැනීමේ ක්‍රියාවලියක රජය නිරතව සිටියි.

## වරාය සේවා

- **ප්‍රධාන වශයෙන්, කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයෙහි වාණිජ මෙහෙයුම් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස නවය තුළදී වරාය අංශයෙහි ක්‍රියාකාරිත්වය වැඩිදියුණු විය.** 2017 වසරේ පළමු මාස නවය තුළදී, කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය මගින් මෙහෙයවන ලද මුළු බහලු ප්‍රමාණය, පිළිවෙළින්, අඩි විස්සට සමාන බහලු ඒකක 1,742,889 ක් සහ අඩි විස්සට සමාන බහලු ඒකක 1,330,863 ක් වශයෙන්, පිළිවෙළින්, සියයට 19.2 කින් සහ සියයට 12.1 කින් වර්ධනය විය. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (ශ්‍රී ලං.ව.අ.) පූර්ණ හිමිකාරිත්වය යටතේ පවතින ජය බහලු පර්යන්තය සහ යුනිටි බහලු පර්යන්තය මගින් මෙහෙයවන ලද බහලු ප්‍රමාණයෙහි අඛණ්ඩ පහළ යෑමක් වාර්තා වූ අතර, පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස නවය තුළදී අඩි විස්සට සමාන බහලු ඒකක 1,471,679 ක් දක්වා සියයට 8.4 ක අඩු වීමක් වාර්තා විය. 2017 වසරේ සැප්තැම්බර් මස අවසානයේදී ශ්‍රී ලං.ව.අ., කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය විසින් මෙහෙයවන ලද සමස්ත බහලු ප්‍රමාණයේ සංයුතිය, පිළිවෙළින්, සියයට 32.4 ක්, සියයට 38.3 ක් සහ සියයට 29.3 ක් විය. ශ්‍රී ලං.ව.අ. සතු පර්යන්තවල දුර්වල ක්‍රියාකාරිත්වයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය තුළ අතිවිශාල බහලු නෞකා හැසිරවීමට ඇති හැකියාවයි. මේ අතර, 2017 වසරේ පළමු මාස නවය තුළදී කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය මගින් මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 20.7 කින් සහ සියයට 12.5 කින් වර්ධනය වූ අතර, ශ්‍රී ලං.ව.අ. සතු පර්යන්ත මගින් මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය සියයට 3.3 ක පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, 2017 වසරේ මුල් මාස නවය තුළදී හම්බන්තොට වරායේ මුළු රථවාහන මෙහෙයවීම් ප්‍රමාණය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 39.3 කින් පසුබෑමට ලක්ව ඇත. තවද, 2017 වසරේ මුල් මාස නවය තුළදී හම්බන්තොට වරාය මගින් දේශීය භාවිතය සඳහා ආනයනය කරන ලද රථවාහන මෙහෙයවීම් ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 38.0 කින් ඉහළ

### 3.3 සංඛ්‍යා සටහන
### වරාය සේවා ක්‍රියාකාරිත්වය


| අයිතමය | 2016 ජන-සැප් | 2017 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) | 64,502 | 69,337 | 7.5 |
| බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) | 4,255 | 4,545 | 6.8 |
| බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය (TEUs '000) | 3,304 | 3,523 | 6.6 |

(අ) තාවකාලික

TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක

මූලය : ශ්‍රී ලංකා වරාය අධිකාරිය

### රූප සටහන 3.4
### බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය




මූලයන්: ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගිය අතර, වාහන ප්‍රතිනැව්ගත කිරීම් සියයට 54.5 කින් පසුබෑමට ලක් විය. මෙම කාලය තුළදී කොළඹ වරාය මගින් දේශීය භාවිතය සඳහා ආනයනය කරන ලද රථවාහන මෙහෙයවීම් ප්‍රමාණය සියයට 52.0 ක පහළ යෑමක් වාර්තා කළ අතර, එමගින් මෙරට රථවාහන ආනයනවල සමස්ත පහළ යෑම පිළිබිඹු විය.

- **2017 වසරේ පළමු භාගය තුළදී කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව සිදු කිරීමට පියවර ගනු ලැබීය.** 2017 වසරේ පළමු භාගය තුළදී කොළඹ වරායෙහි පර්යන්තවල මෙහෙයුම් කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් යුතුව එහි අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ කටයුතු අදියර කිහිපයක් යටතේ සිදු කෙරිණි. 2017 වසරේ ජුනි මස අවසානය වන විට, පාලම් දෙකක් පුළුල් කිරීමද ඇතුළත්ව මෙම ව්‍යාපෘතියේ මුළු මූල්‍යමය ප්‍රගතිය රුපියල් මිලියන 795 ක් විය. මේ අතර, 2017 වසරේ ජූලි මාසයේදී හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් ශ්‍රී ලං.ව.අ., ශ්‍රී ලංකා රජය, China Merchant Port Holdings Company Ltd., Hambantota International Port Group (Pvt.) Ltd. සහ Hambantota International Port Services (Pvt.) Ltd. අතර රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් සඳහා වන අනුග්‍රාහක ගිවිසුමක් අත්සන් කරන ලදී.

## විදුලි සංදේශ සේවා

- **දුරකථන ඝනත්වය ඉහළ යෑම සහ අන්තර්ජාල සේවාවල සිදුවූ ශීඝ්‍ර වර්ධනයද සමගින් 2017 වසරේ පළමු භාගය තුළදී විදුලි සංදේශ අංශය ඉහළ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී, 2017 වසරේ පළමු භාගය තුළදී ජංගම දුරකථන සම්බන්ධතා ප්‍රමාණය ඉහළ ගිය අතර, රැහැන් සහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාවද සියයට 2.7 ක වර්ධනයක් වාර්තා කළේය. ජංගම දුරකථන සම්බන්ධතා ප්‍රමාණය ඉහළ යෑමත් සමග රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා අඛණ්ඩව පහළ ගිය අතර, 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 7.9 ක අඩු වීමක් වාර්තා කළේය. 2017 වසරේ ජුනි මස අවසානය වන විට ස්ථාවර දුරකථන ඝනත්වය (පුද්ගලයන් 100 කට ඇති සම්බන්ධතා ප්‍රමාණය) සහ ජංගම දුරකථන ඝනත්වය, පිළිවෙළින්, 11.7 ක් සහ 131.3 ක් විය. අන්තර්ජාල ඝනත්වය (පුද්ගලයන් 100 කට ඇති සම්බන්ධතා ප්‍රමාණය) 2016 වසරේ ජුනි මස අවසානය වන විට වාර්තා වූ 20.0 ට සාපේක්ෂව 2017 වසරේ ජුනි මස අවසානය වන විට 25.6 ක් දක්වා ඉහළ ගියේය. 2017 වසරේ ජුනි මස අවසානය වන විට, පෙර වසරේ ජුනි මස අවසානයට සාපේක්ෂව සියයට 37.5 ක ඉහළ යෑමක් වාර්තා කළ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතාවල ඉහළ වර්ධනය, අන්තර්ජාල සම්බන්ධතාවල සිදු වූ ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජංගම අන්තර්ජාල සම්බන්ධතා ප්‍රමාණය, 2016 වසරේ ජුනි මස අවසානයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම යටතේ වාර්තා කළ සියයට 8.5 ක වර්ධනය හා සැසඳීමේදී 2017 වසරේ ජුනි මස අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින් සියයට 27.7 කින් ඉහළ ගියේය.

- **ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සියලු පාර්ශ්වකරුවන්ගේ උපදෙස් සහිතව ජාතික බ්‍රෝඩ්බෑන්ඩ් ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතුවල නිරතව සිටියි.** රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජය තුළ බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ව්‍යාප්තිය හා භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම්


### 3.4 සංඛ්‍යා සටහන
### විදුලි සංදේශ සේවා

| ග්‍රාහක සංඛ්‍යාව | 2016 ජූනි අවසානය | 2017 ජූනි අවසානය (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ස්ථාවර දුරකථන ('000) | 2,597 | 2,514 | -3.2 |
| ජංගම දුරකථන ('000) | 24,696 | 28,113 | 13.8 |
| අන්තර්ජාල සම්බන්ධතා ('000) (ආ) | 4,232 | 5,479 | 29.5 |
| මුළු දුරකථන ඝනත්වය | 128.72 | 143.02 | 11.1 |
| ජංගම දුරකථන ඝනත්වය | 116.47 | 131.28 | 12.7 |

මූලයන් : ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව

### රූප සටහන 3.5
### දුරකථන සම්බන්ධතා (ස්ථාවර හා ජංගම) සහ අන්තර්ජාල සම්බන්ධතා




මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ශ්‍රී ලංකා මහ බැංකුව

සැපයීම සඳහා උසස් මට්ටමේ වැඩපිළිවෙළක් සකස් කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. තවද, ආර්ථිකය ඩිජිටල්කරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියට සමගාමීව ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කරන අතර, කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය විසින් නව ව්‍යාපෘති කිහිපයක්ද ආරම්භ කර ඇත. 2007 සිට 2013 දක්වා ක්‍රියාත්මක කරන ලද 'ලංකා රාජ්‍ය ජාලය 1.0' මගින් පිරිවැය ඵලදායී සහ සුරක්ෂිත ජාලයක් යටතේ රාජ්‍ය ආයතන 514 ක් සම්බන්ධ කර ඇත. එම වැඩසටහන ඉදිරියට ගෙනයමින්, රාජ්‍ය ආයතන 860 ක් සම්බන්ධ කර එම ආයතනවලට මධ්‍යගත ලෙස අන්තර්ජාල, විද්‍යුත් තැපැල් හා වීඩියෝ සම්මන්ත්‍රණ සේවා සැපයීමේ අරමුණින් 2017 වසරේ පළමු භාගය තුළදී 'ලංකා රාජ්‍ය ජාලය 2.0' හි පළමු අදියර ආරම්භ කෙරිණ. සපයනු ලබන රාජ්‍ය විද්‍යුත් සේවා සංඛ්‍යාව ඉහළ නැංවීමට මෙන්ම, රජයේ දත්ත හුවමාරු කර ගැනීමට විශ්වසනීය හා සුරක්ෂිත සම්බන්ධතාවක් ලබාදීමටද මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිතය. තවද, නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ ව්‍යවසායකත්වය දිරිගැන්වීමේ අරමුණින්, 2017 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අන්තර්ජාල සේවා සැපයුම මත පනවා තිබූ සියයට 10 ක විදුලි සංදේශ බද්ද ඉවත් කිරීමට රජය කටයුතු කළේය. රූපවාහිනී හා ගුවන්විදුලි සම්ප්‍රේෂණය සඳහා සත්කාරකත්වය සැපයීමට සහ විදුලි සංදේශ ජාලවලට කේන්ද්‍රස්ථානයක් ලබාදීම සඳහා 2012 වසරේදී ආරම්භ කරන ලද නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවති අතර, එය 2018 වසරේ මාර්තු මාසයේදී නිම කිරීමට අපේක්ෂිතය.

## නාගරික සංවර්ධනය

- **ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය විචිත්‍රවත්, ජීවත් වීමට වඩා සුදුසු, සියලු පහසුකම්වලින් සමන්විත නගර කලාපයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් 2016 වසරේදී රජය විසින් දියත් කරන ලද බස්නාහිර කලාපීය මහානගර ව්‍යාපෘතිය 2017 වසරේ පළමු භාගය තුළදීද ක්‍රියාත්මක වෙමින් පැවතුණි.** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය සහිතව, ප්‍රධාන මාවත්වලට ඉහළින් දිවෙන රටේ ප්‍රථම සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතිය පිහිටුවීම සඳහා මූලික පියවර ගන්නා ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 187.5 ක් වන අතර, ව්‍යාපෘතිය 2021 වසරේදී නිම කිරීමට නියමිතය. 2017 වසරේ ජූනි මස අවසානය වන විට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් භූලක්ෂණ හා භූවිද්‍යාත්මක සමීක්ෂණ අවසන් කර ඇති අතර, පාරිසරික බලපෑම් ඇගයීම් සමීක්ෂණය ක්‍රියාත්මක වෙමින් පැවතුණි. තවද, කොළඹ රථවාහන තදබදය අවම කිරීමේ හා පොදු ප්‍රවාහනයෙහි ප්‍රමිතීන් උසස් කිරීමේ අරමුණින්, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලං.ග.ම., ශ්‍රී ලංකා පොලීසිය, මොරටුව විශ්වවිද්‍යාලය, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සහ කොළඹ නගර සභාව වැනි පාර්ශ්වකරුවන් හා එක්ව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය 2017 වසරේදී තෝරාගත් මාර්ග කොටස්වල බස් ප්‍රමුඛතා මංතීරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය.

- **නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන මට්ටම් ඉහළ නැංවීමේ අරමුණින්, 2017 වසරේ පළමු භාගය තුළදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් 'සුබිත පුරවර' (දෙවන අදියර) සහ නගර සංවර්ධනය හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ඇතුළු නව ව්‍යාපෘති 108 ක් ආරම්භ කරන ලදී.** මීට අමතරව, 2017 වසරේදී අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, මෙම ව්‍යාපෘතිය වසර 2021 වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. ගංවතුර අවදානම අවම කර ගැනීම සඳහා අධික වැසි ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කළ පොදු ප්‍රවාහන යටිතල පහසුකම්, කාර්යක්ෂම ගමනාගමන පද්ධති හා ගුණාත්මක පොදු අවකාශ මගින් ප්‍රවේශය හා විකල්ප ගමනාගමන මාධ්‍ය සංවර්ධනය, සහ නාගරික හා සංස්කෘතික උරුම කළමනාකරණය ශක්තිමත් කිරීම තුළින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආකර්ෂණීයත්වය රැකගැනීම හා වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ක්‍රමෝපායික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර සහිතව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නගර වැඩිදියුණු කිරීම, ඓතිහාසික උරුම සංරක්ෂණය හා පරිසර සංරක්ෂණය යන අංගවලින් සමන්විත, ත්‍රිකුණාමල ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2017 වසරේ දෙවන භාගය තුළදී ආරම්භ කිරීමට අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇත. මේ අතර, 2017 වසරේ පළමු භාගය තුළදී මහනුවර, ගාල්ල හා යාපනයේ ක්‍රමෝපායික නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 2018-2020 කාලපරිච්ඡේදයේදී මුළු

රටම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ව්‍යාපෘති 200 ක් පමණ දැනටමත් හඳුනා ගෙන ඇත.

- **2017 වසරේ පළමු භාගය තුළදී කොළඹ මූල්‍ය නගර (වරාය නගරය) සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතුණි.** 2017 වසරේ ජූලි මස අවසානයේදී, මුහුදු වැලි ඉවත් කර භූමිය ගොඩ කිරීමේ වැඩ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 32 ක් පමණ වූ අතර, විදේශීය සෘජු ආයෝජන මගින් මූල්‍යනය කරනු ලබන කළුගල් සැපයීම, පස සම්පීඩනය කිරීම සහ වෙරළබඩ දියකඩන ඉදිකිරීම යන කටයුතුවල ප්‍රගතිය, පිළිවෙළින්, සියයට 22 ක්, සියයට 15 ක් හා සියයට 15 ක් විය. වැලි ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරන ලද 2016 වසරේ සැප්තැම්බර් මස සිට මේ දක්වා මුහුදු වැලි ඝන මීටර් මිලියන 21 ක් පමණ ඉවත් කර ඇත. මුහුදු පතුල ගොඩ කිරීමේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසු අවුරුදු 20 ක් ඇතුළත මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් හා සංවර්ධන වැඩකටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

## සමාජ යටිතල පහසුකම් සංවර්ධනය

### අධ්‍යාපනය

- **2017 වසරේ පළමු භාගය තුළදී සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා රජය පියවර රැසක් ක්‍රියාත්මක කළේය.** 2017 වසරේ ජූනි මාසය අවසානය වන විට වයස අවුරුදු 5-14 අතර වයස් සීමාවේ (1-9 ශ්‍රේණි) සිසුන්ගේ පාසල්වලට ඇතුළත් වීමේ ශුද්ධ අනුපාතය සියයට 97.35 ක් විය. පිරිමි හා ගැහැනු සිසුන්ගේ ශුද්ධ ඇතුළත් වීමේ අනුපාත, පිළිවෙළින්, සියයට 98.38 ක් සහ සියයට 96.31 ක් විය. 2017 වසරේ පළමු භාගය තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල සහ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මගින් ගුරුවරු 9,600 ක් පමණ ඇගයීමට ලක් කර ඇත. තවද, රජය විසින් 2017 වසරේදී 'ළඟම පාසල හොඳම පාසල' වැඩසටහන යටතේ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දළ වශයෙන් රුපියල් බිලියන 25.8 ක් පමණ වෙන් කර ඇත. මෙම වැඩසටහන යටතේ, පළාත් පාසල් 7,887 ක සහ ජාතික පාසල් 280 ක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 13,087 ක් ආරම්භ කරන ලද අතර, 2017 වසරේ ජූනි මස අවසානය වන විට එයින් කාර්ය 5,030 ක් අවසන් කර ඇත. මීට අමතරව, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි වාර්ෂික අයවැය වෙන් කිරීම් යටතේ පාසල් 451 ක, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 19 ක, ගුරු පුහුණු විද්‍යාල 7 ක සහ ගුරු පුහුණු මධ්‍යස්ථාන හා පිරිවෙන් 75 ක යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙමින් පවතී. උසස් පෙළ සඳහා නව විෂය ධාරා හඳුන්වා දීම තුළින් 'වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනයක්' ලබාදීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය 2017 වසරේ සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරිණි. මෙම නියමු ව්‍යාපෘතිය ආරම්භයේදී ජාතික පාසල් 42 ක ක්‍රියාත්මක කෙරෙන අතර, එම නව ප්‍රතිසංස්කරණ වසර 2019 දී සියලුම පාසල්වලට හඳුන්වා දීමට නියමිතය. මෙයට අමතරව, පාසල් 150 ක 'ස්මාර්ට්' උපාංග සහිත ඩිජිටල් පංති කාමර 300 ක් ස්ථාපිත කිරීමටද රජය සැලසුම් කර ඇත. මේ වසර අවසානය වන විට ඩිජිටල් පංති කාමර 50 ක් පිහිටුවීම සඳහා අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී ආරම්භ කෙරිණි. පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල හරහා රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය කිරීමේ කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදීද ක්‍රියාත්මක විය.

- **2017 වසරේ පළමු භාගය තුළදී මෙරට විශ්වවිද්‍යාල අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා රජය විවිධ පියවර ගෙන ඇත.** 2017 වසර තුළදී අයදුම්පත් පිරික්සීමේ කාලය අඩු කිරීමට සහ කඩඉම් ලකුණු නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා අන්තර්ජාලය භාවිතයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්ය කරන ලදී. ඒ අනුව, ආරම්භයේදී දුෂ්කරතා පැවතියද පෙර අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව මාස තුනකට පෙර 2016/2017 අධ්‍යයන වර්ෂයට අදාළ විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් ලකුණු 2017 වසරේ ජූනි මාසයේදී නිකුත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හැකි විය. පරිගණකගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය තුළින් පුරප්පාඩු පිරවීම සඳහා ගතවන කාලය අඩුවී ඇති අතර, ඒ අනුව 2017 වසරේ ඔක්තෝබර් මාසයේ සිට 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා වන අධ්‍යයන සැසිවාර එකවර ආරම්භ කිරීමට සියලු විශ්වවිද්‍යාලවලට හැකි වනු ඇත. මේ අතර, සාමාන්‍ය බඳවාගැනීම් යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මෙම අධ්‍යයන වර්ෂය තුළ සිසුන් 29,696 ක් තෝරාගෙන ඇත. 2017 වසරේ පළමු භාගය තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව

උපාධි පාඨමාලා හතරක් සහ නව පශ්චාත් උපාධි පාඨමාලා 12 ක් සඳහා අනුමැතිය ලබාදී ඇත. තවද, මෙම කාලය තුළදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පීඨ දෙකක්, අධ්‍යයනාංශ 20 ක් සහ පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවීමටද අනුමැතිය ලබාදී ඇත. මීට අමතරව, විශ්වවිද්‍යාලවලට ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැපයීම, කළමනාකරණ නායකත්වය සඳහා කාන්තාවන් තුළ ශක්‍යතා සංවර්ධනය, ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘති ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම සහ විශ්වවිද්‍යාල පරිසරය තුළ ස්ත්‍රී-පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, මර්දනය හා වෙනස් ලෙස සැලකීම අවම කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානතාව හා සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය ස්ථාපනය කර ඇත. තවද, විශ්වවිද්‍යාල තුළ නවක වධය, ලිංගිකත්වය සහ ස්ත්‍රී-පුරුෂ භාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් නවක වධ පැමිණිලි යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

- **රාජ්‍ය අංශය හා සමගාමීව පෞද්ගලික අංශයද අඛණ්ඩව තෘතීයික අධ්‍යාපනය සැපයීමේ නිරත විය.** 2017 වසරේ ජූනි මස අවසානය වන විට දේශීය වශයෙන් පිළිගත් උපාධි 95 ක් ප්‍රදානය කරනු ලබන 'උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන' ලෙස පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 15 ක් ක්‍රියාත්මක විය. 2017 වසරේ පළමු භාගයේදී රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දෙකක් මගින් ප්‍රදානය කරනු ලබන ප්‍රථම උපාධි වැඩසටහන් දෙකක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ප්‍රතීතනය (accreditation) කර ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාල මෙන්ම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් ලබා දෙන පාඨමාලාවල තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය නියාමනය කිරීමට ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා උසස් අධ්‍යාපනය හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් මූලික පියවර ගෙන ඇති අතර, එයට අදාළ පනත මේ වනවිට කෙටුම්පත් කෙරෙමින් පවතී.

- **2017 වසරේ ජූනි මස අවසානය වනවිට කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශය යටතේ ලියාපදිංචි වී ඇති ආයතන සංඛ්‍යාව 740 ක් වූ අතර, රාජ්‍ය ආයතන 142 ක් සහ පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන 598 ක් එයට ඇතුළත් විය.** 2017 වසරේ පළමු භාගයේදී මෙම ආයතන මගින් පිළිගත් කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා 1,950 ක් පිරිනමා ඇති අතර, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික පත්‍ර 17,491 ක් නිකුත් කර ඇත. පුහුණුවන්නන්ගේ නිපුණතා, ජාතික නිපුණතා සම්මතවලට අනුකූලව ඇති බව සහතික කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් මෙම කාලපරිච්ඡේදය තුළදී ඇගයීම් අධීක්ෂණ වැඩසටහනක් හඳුන්වාදී ඇත.

- **දකුණු ආසියාතික තාක්ෂණ සහ වෛද්‍ය ආයතනය (සයිටම්) මගින් සපයනු ලබන වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධව පවතින ගැටලුව හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතියට සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට බරපතල බාධා ඇතිවී ඇත.** 2017 වසරේ ජනවාරි මාසයේ සිට සයිටම් ආයතනයට එරෙහිව ආරම්භ වූ ශිෂ්‍ය සංගම් ක්‍රියාමාර්ග හේතුවෙන් සියලු රාජ්‍ය විශ්වවිද්‍යාලවල වෛද්‍ය සිසුහු දේශන, නිබන්ධන සහ සායනික පුහුණුව සඳහා සහභාගී වීමෙන් වැළකී සිටිති. සයිටම් ආයතනය හා සම්බන්ධ ගැටලුව නිරාකරණය කිරීම සඳහා ජනාධිපති කොමිසමක් පත් කරන ලද අතර, යෝජිත ස්වාධීන තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන අධිකාරිය කඩිනමින් ස්ථාපිත කිරීම නිර්දේශ කරමින් එම කොමිසම විසින් රජය වෙත අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ උපදෙස් හා සහයෝගය සහිතව ස්වාධීන තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන අධිකාරිය විසින් ප්‍රතීතන කටයුතු සඳහා වෛද්‍ය උපාධි පාඨමාලා ඇගයීමට ලක් කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත්, මෙම ගැටලුව නොවිසඳී තවදුරටත් පවතින අතර, ඒ හේතුවෙන් රජයේ වෛද්‍ය පීඨවල වෛද්‍ය සිසුන්ට උපාධි ප්‍රදානය කිරීමේ කටයුතු සහ නව සිසුන් ඇතුළත් කර ගැනීම සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇත. එබැවින්, මහජනතාවට පිළිගත හැකි තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණයක් තුළ පෞද්ගලික අංශය විසින් වෛද්‍ය අධ්‍යාපනය ඇතුළු උසස් අධ්‍යාපනය සැපයීමට හැකිවන පරිදි මෙම ගැටලුව සඳහා කඩිනම් ප්‍රායෝගික විසඳුමක් ලබාදීම අවශ්‍ය වේ.

### සෞඛ්‍යය

- **සෞඛ්‍ය අංශයෙහි භෞතික හා මානව සම්පත් සවිමත් කිරීම සඳහා 2017 වසරේ පළමු භාගය තුළදීද රජය අඛණ්ඩව කටයුතු කළේය.** 2017 වසරේ ජූනි

මස අවසානය වන විට පුද්ගලයන් 1,041 කට එක් වෛද්‍යවරයෙක් සහ පුද්ගලයන් 642 කට එක් හෙද සේවකයෙක් බැගින් වූ පරිදි සුදුසුකම්ලත් වෛද්‍යවරු 20,575 ක් සහ සුදුසුකම්ලත් හෙද සේවකයෝ 33,363 ක් රජයේ රෝහල්වල සේවය කළහ. තවද, පුද්ගලයන් 1,000 කට ඇඳන් 3.6 ක් වන ලෙස ඇඳන් 76,829 ක් රජයේ රෝහල්වල පැවතුණි. මේ අතර, 2017 වසරේ ජූනි මස අවසානය වන විට ඇඳන් 5,114 කින් සමන්විත රජයේ ආයුර්වේද රෝහල් 100 ක් පැවති අතර, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු 23,180 ක් වූහ. සෞඛ්‍ය අංශයෙහි භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2017 වසරේ පළමු භාගය තුළදී ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ද සොයිසා මාතෘ රෝහලේ නොමේරූ ළදරු ඒකකය සහ රාගම ශික්ෂණ රෝහලේ හදිසි අනතුරු වාට්ටු සංකීර්ණය පුළුල් කිරීමේ කටයුතු 2017 වසර තුළදී අවසන් කිරීමට අපේක්ෂිතය. තවද, හම්බන්තොට හා නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල්වල සහ කරාපිටිය මාතෘ රෝහලේ සංවර්ධන ව්‍යාපෘතිද 2017 වසරේ පළමු භාගය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජාතික රුධිර පාරවිලයන සේවාව යටතේ ක්‍රියාත්මක වන පර්යන්ත ලේ බැංකු 17 ක ඉදිකිරීමේ හා වැඩිදියුණු කිරීමේ කටයුතු 2017 වසරේ පළමු භාගය තුළදී නිම කරන ලදී. ජාතික රෝහලේ බාහිර රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සංවර්ධන කටයුතු 2017 වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ කෙරිණි. මෙයට අමතරව, තෙලිපලෙයි, මහනුවර සහ මාතර ප්‍රදේශවල පිළිකා රෝහල් තුනක් ඉදිකිරීමට යෝජිතව ඇත. තවද, මඩකලපුව, හම්බන්තොට, ත්‍රිකුණාමලය හා යාපනය රෝහල්වල වකුගඩු ඒකක පිහිටුවීමට මෙන්ම, නිදන්ගත වකුගඩු රෝගය පැතිර පවතින ප්‍රදේශවල ඇති රෝහල් 38 ක රුධිර කාන්දුකරණ සේවාවලට සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටද සැලසුම් කරමින් සිටියි. 2017 ඔක්තෝබර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය 'සුව සැරිය' පදනම පිහිටුවීමට හා '1990 ගිලන්රථ සේවය' දිවයිනේ සියලු පළාත්වලට ව්‍යාප්ත කිරීමට තීරණය කළේය.

- **ඩෙංගු වසංගතය තවදුරටත් බරපතල පොදු සෞඛ්‍ය ගැටලුවක් ලෙස පවතින අතර, 2017 වසරේදී මෙරට දරුණුතම ඩෙංගු වසංගත තත්ත්වය වාර්තා විය.** 2017 වසරේ ජනවාරි සිට අගෝස්තු මස අවසානය දක්වා ඩෙංගු රෝගීන් 149,126 ක් වාර්තා වී ඇති අතර, එය පුද්ගලයන් 100,000 කට රෝගීන් 696 කට සමාන වේ. 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පුද්ගලයන් 100,000 කට වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 186 ක් විය. ඩෙංගු රෝග ව්‍යාප්තියෙන් සියයට 40 කට අධික ප්‍රමාණයක් බස්නාහිර පළාතෙන් වාර්තා වූ අතර, කොළඹ, ගම්පහ, මහනුවර, රත්නපුරය, කුරුණෑගල, කළුතර, කෑගල්ල, මාතර, ගාල්ල, පුත්තලම, ත්‍රිකුණාමලය සහ මඩකලපුව වඩාත් බලපෑමට ලක්වූ ප්‍රදේශ විය. වසරේ මැයි මාසයේදී අධික මෝසම් වැසි ලැබීම, වැසි ජලයෙන් තෙත්වූ කසළ පවිත්‍ර නොකිරීම, ජලය රැඳී පවතින ස්ථාන සහ මදුරු කීටයන් බෝවිය හැකි වෙනත් ස්ථාන පැවතීම වැනි කරුණු නාගරික හා තදාසන්න ප්‍රදේශවල මෙම වසංගතය වැඩි වශයෙන් ව්‍යාප්ත වීමට හේතු විය. 2017 වසරේ පළමු මාස අට තුළදී, සියයට 0.26 ක මරණ අනුපාතයක් නිරූපණය කරමින් ඩෙංගු රෝගය ආශ්‍රිත මරණ 389 ක් වාර්තා වූ අතර, 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ ඩෙංගු මරණ අනුපාතය 0.17 ක් විය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වසංගත රෝග පාලනය, පූර්ව රෝග විනිශ්චය සහ පූර්වගාමී රෝග කළමනාකරණය තුළින් ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරීම හා පාලනය කිරීම සඳහා විවිධ පියවර ගත්තේය. සන්නද්ධ හමුදාව, පොලීසිය මෙන්ම සෞඛ්‍ය සේවාවල නියුතු පුද්ගලයන් යොදා ගනිමින් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, ආගමික ස්ථාන, පාසල් හා උසස් අධ්‍යාපන ආයතන, නිවාස, ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙන ස්ථාන, ධීවර වරායන් හා ධීවර බෝට්ටු ආදිය ඉලක්ක කරගත් මහා පරිමාණ පරිශ්‍ර පරීක්ෂා කිරීමේ වැඩසටහන් මාලාවක් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. තවද, ඩෙංගු රෝග කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා රටපුරා රෝහල් රැසක දැඩි උපස්ථාන ඒකක (High Dependency Unit) පහසුකම් ස්ථාපිත කරන ලද අතර, අනෙකුත් පහසුකම්ද දියුණු කරන ලදී. දිවයිනේ පළාත් හතරක් ආවරණය වන පරිදි තෝරාගත් රෝහල් 10 ක දැඩි උපස්ථාන ඒකක පිහිටුවීම සඳහා රුපියල් මිලියන 68 ක් වෙන්කරන ලදී. මෙයට අමතරව, මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ක්ෂේත්‍ර සහායකයින් 500 දෙනෙකු 2017 වසරේ පළමු භාගය තුළදී බඳවා ගන්නා ලද අතර, ඉදිරියේදී අදියර කිහිපයක් යටතේ තවත් සහායකයින් 1,000 දෙනෙකු බඳවා ගැනීමට නියමිතව ඇත.

- **සෞඛ්‍ය සේවා සැපයීමේදී පෞද්ගලික අංශය සැලකිය යුතු කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කළේය.** 2017 වසරේ පළමු භාගය අවසානය වන විට, ඇඳන්


430 කින් සමන්විත ආයුර්වේද රෝහල් 20 ක්ද ඇතුළත්ව, ඇඳන් 6,196 කින් යුතු ලියාපදිංචි කළ පෞද්ගලික රෝහල් 198 ක් ක්‍රියාත්මක විය. තවද, 2017 වසරේ ජූලි මස අවසානය වන විට ලියාපදිංචි කළ වෛද්‍ය හා විශේෂඥ වෛද්‍ය මධ්‍යස්ථාන 110 ක්, ලියාපදිංචි කළ වෛද්‍ය රසායනාගාර 292 ක්, පූර්ණ කාලීන හා අර්ධ කාලීන වෛද්‍ය මධ්‍යස්ථාන 190 ක් රට පුරා ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

3

- **ගෘහ ඒකක ආදායම සහ ජීවන තත්ත්වයෙහි වර්ධනය පිළිබිඹු කරමින් සමස්ත දරිද්‍රතා මට්ටම සැලකිය යුතු ලෙස අඩුවී ඇති නමුත්, දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රදේශ පැවතීම සහ ආදායම් බෙදී යෑමේ විෂමතාව තවදුරටත් ප්‍රධාන සමාජමය ගැටලු ලෙස පවතී.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද 2016 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් මනිනු ලබන දරිද්‍රතා මට්ටම, 2012/13 වසරේදී පැවති සියයට 6.7 සිට සියයට 4.1 ක් දක්වා අඩු වී ඇත. නාගරික, ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතා මට්ටම්වල විෂමතා අඛණ්ඩව පැවතියද, 2012/13 වසරට සාපේක්ෂව 2016 වසරේදී යම් සතුටුදායක වර්ධනයක් වාර්තා විය. මේ අනුව, නාගරික, ග්‍රාමීය සහ වතු අංශවල ජනගහන දරිද්‍රතා දර්ශක 2012/13 වසරේ පැවති සියයට 2.1, සියයට 7.6 සහ සියයට 10.9 ට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 1.9, සියයට 4.3 සහ සියයට 8.8 දක්වා වර්ධනය වී ඇත. තවද, දිස්ත්‍රික් මට්ටමින් සලකා බැලීමේදී, කොළඹ දිස්ත්‍රික්කය අඛණ්ඩව අවම දරිද්‍රතා මට්ටම වාර්තා කර ඇති අතර, 2016 වසරේ ඉහළම ජනගහන දරිද්‍රතා දර්ශකය කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. දිළිඳු පුද්ගල සංඛ්‍යාව සම්බන්ධයෙන් ගත් කල, මහනුවර (සියයට 9.1), රත්නපුර (සියයට 8.6), කෑගල්ල (සියයට 7.2), මඩකලපුව (සියයට 7.2) සහ බදුල්ල (සියයට 6.7) යන දිස්ත්‍රික්ක රටේ සමස්ත දිළිඳු ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයකට හිමිකම් කියයි. මේ අතර, ගෘහ ඒකක ආදායම මත පදනම් වූ 'ගිනි' සංගුණකය මගින් මනිනු ලබන ආදායම් බෙදී යෑමේ විෂමතාව 2012/13 වසරවලදී වාර්තා වූ 0.48 සිට 2016 වසරේදී 0.45 ක් දක්වා අඩු විය. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පවතින ඉහළ ආදායම් විෂමතාව පිළිබිඹු කරමින් නාගරික, ග්‍රාමීය හා වතු අංශවල 'ගිනි' සංගුණක, පිළිවෙළින්, 0.48 ක්, 0.44 ක් හා 0.36 ක්

**රූප සටහන 3.6**
**ජනගහන දරිද්‍රතා දර්ශකය**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

යන අගයන්හි පැවතුණි. 2016 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව, රටේ ජනගහනයෙන් දිළිඳුම සියයට 20 සහ ධනවත්ම සියයට 20 ලබන ආදායම සමස්ත ආදායමෙන්, පිළිවෙළින්, සියයට 4.8 ක් හා සියයට 50.8 ක් වීම තුළින් රට තුළ ආදායම් බෙදී යෑමේ විෂමතාවයෙහි පවතින බරපතල බව පිළිබිඹු වේ.

- **රජය විසින් අඩු ආදායම්ලාභී සහ ආර්ථිකමය අපහසුතා සහිත පවුල්වල ජීවනෝපාය සඳහා සහාය දැක්වීමේ අරමුණින් සමාජ ආරක්ෂණ වැඩසටහන් 2017 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** 2017 වසරේ පළමු භාගය තුළදී සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ රුපියල් බිලියන 19.9 ක් වැය කර ඇති අතර, සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ ප්‍රතිලාභීන් 76,011 ක් සඳහා රුපියල් මිලියන 382 ක් ප්‍රදානය කර ඇත. තවද, 2017 වසරේ පළමු භාගය තුළදී සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් රුපියල් බිලියන 23.6 ක වටිනාකමින් යුතු ණය පහසුකම් 239,226 ක් ලබාදී ඇත. මෙයට අමතරව, මෙම කාලය තුළදී රුපියල් බිලියන 1.4 ක පිරිවැයක් දරමින් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබාදීම අඛණ්ඩව සිදු කරන ලදී. අඩු බර දරු උපත් සංඛ්‍යාව අවම කිරීම සහ ගැබිණි මව්වරුන්ගේ හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. එමෙන්ම, සිවිල් සංවිධාන, පෞද්ගලික අංශය සහ බහුපාර්ශ්වීය ආයතනවල සහායද ඇතිව ස්වාභාවික විපත් හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා රජය ක්‍රියාමාර්ග රැසක් අනුගමනය කළේය.

**රූප සටහන 3.7**
**සමෘද්ධි / දිවිනැගුම සුභසාධන වැඩසටහනේ ක්‍රියාකාරිත්වය**




මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

- **දරිද්‍රතාව තුරන් කිරීම, කුසගින්න පිටුදැකීම හා ස්ත්‍රී/පුරුෂ සමානාත්මතාව සහතික කිරීම යන තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට සමගාමීව රජය 2017 වසර 'දරිද්‍රතාව තුරන් කිරීමේ වසර' ලෙස ප්‍රකාශයට පත් කළේය.** වසර 2030 වන විට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ අරමුණින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි සවිබල ගැන්වීමේ සැලැස්මක් සකස් කරන ලදී. ඒ අනුව, සවිබල ගැන්වීම සඳහා ඉහළ ශක්‍යතාවක් ඇතැයි හඳුනාගෙන ඇති පවුල්වලින් සියයට 10 ක්, එනම් පවුල් 125,385 ක්, සවිබල ගැන්වීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. ජීවනෝපාය සංවර්ධනය, අලෙවිකරණ ප්‍රවර්ධනය සහ ආදර්ශ ගම්මාන වැඩසටහන් හරහා මෙන්ම දිළිඳු පවුල් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම තුළින් මෙය සිදු කිරීමට නියමිතය. මෙම සවිබල ගැන්වීමේ උපායමාර්ගය අධ්‍යාපනය, ව්‍යවසායකත්වය සහ සේවා නියුක්තිය තුළින් සිදු වනු ඇත. ඉහත ඉලක්කය සපුරාගැනීම සඳහා, සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකින්ම පවුල් නවයක් තෝරා ගැනීම සඳහා සමෘද්ධි නිලධාරීහු කටයුතු කරමින් සිටිති.

## අපේක්ෂිත වර්ධනයන්

- **බලශක්ති අංශය සඳහා කල්පවත්නා විසඳුම් අවශ්‍ය බව අවධාරණය කරමින් මැදිකාලීනව විදුලිබල ඉල්ලුමෙහි අඛණ්ඩ වර්ධන ප්‍රවණතාවක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2017 වසරේ පළමු භාගය තුළ පැවති අඩු ජල විදුලිබල උත්පාදනය සහ ඉහළ දුව ඉන්ධන විදුලිබල උත්පාදනය හේතුවෙන් ලං.වි.ම.යේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස පිරිහීමට ලක්විය. එබැවින්, නිරතුරුව ඇතිවන අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් විදුලිබල උත්පාදනය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් තුළින් මෙරට විදුලිබල සංයුතිය විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාව මෙන්ම, අනාගත විදුලිබල ඉල්ලුම සපුරාලීම සඳහා විදුලිබල උත්පාදන ධාරිතාව පුළුල් කිරීමේ අවශ්‍යතාවද ඉස්මතු කෙරේ.

- **රජය විසින් නුදුරු අනාගතයේදී මහජන උපයෝගීතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල නියම කිරීමේ ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** විශේෂයෙන්ම, ලං.ඛ.තී.සං. මුහුණ දෙන අලාභ හා බැඳුණු රාජ්‍ය මූල්‍ය වියදම් වෙනුවට, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මිල ගණන්වල සිදුවන විචලනවලට සෘජුව අනුගත වීමට දේශීය පාරිභෝගිකයන් පෙළඹෙන පරිදි දේශීය ඛනිජ තෙල් මිල ගණන් සඳහා පිරිවැය පිළිබිඹු වන මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියට සමගාමීව රාජ්‍ය වාණිජ ව්‍යවසායවල මූල්‍ය ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා හම්බන්තොට වරාය, ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වැනි තෝරාගත් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියක රජය නිරතව සිටියි.** මෙම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව මගින් රජයේ අයවැය මත ඇති කරනු ලබන බලපෑම අවම කිරීම, රජයේ අසම්භාව්‍ය බැරකම් අඩු කිරීම සහ එම ආයතනවල මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙන්ම, මෙරටට අත්‍යවශ්‍ය වන ණය නොවන විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සිදු කෙරෙනු ඇත. 2017 වසරේ පළමු භාගය තුළදී 'ආයතනික අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශන' අත්සන් කරන ලද ප්‍රධාන රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් පහට අමතරව, විශාලත්වය සහ උපායමාර්ගික වැදගත්කම පදනම් කර ගනිමින් තෝරාගත් තවත් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් 10 ක් සඳහා මෙම ආයතනික අභිප්‍රාය පිළිබඳ ප්‍රකාශන හඳුන්වා දීමට රජය සැලසුම් කරමින් සිටියි. මෙම ප්‍රකාශන මගින් දිගුකාලීනව රාජ්‍ය වාණිජ ව්‍යවසායවල විනිවිදභාවය, වගවීම, කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය හා මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3

- **සියලුම සිසුන් සඳහා වසර 13 ක පාසල් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් ඉහළ-ද්විතීයික අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියක රජය නිරතව සිටියි.** ඒ අනුව, නව සාමාන්‍ය හා ව්‍යවහාරික විෂයයන්ගෙන් සමන්විත විවිධාංගීකරණය කළ විෂය ධාරාවක් උසස් පෙළ සඳහා හඳුන්වා දෙනු ඇත. මෙම නව විෂය ධාරාව මගින් අ.පො.ස සාමාන්‍ය පෙළ අසමත් සිසුන්ට සිය අනාගතය සාර්ථක කර ගැනීම සඳහා උසස් පෙළ හැදෑරීමට සහ වෘත්තීය අධ්‍යාපනයක් ලැබීමට අවස්ථාව සැලසෙනු ඇත. සියලුම සිසුන් සඳහා වසර 13 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට ඉඩප්‍රස්ථා සලසන අතරම, පාසල් අධ්‍යාපනය, ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ සිසුන්ගේ අපේක්ෂා අතර ඇති නොගැළපීම සඳහා පිළියම් සලසා දීමටද මෙම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය මගින් අපේක්ෂා කෙරේ.

# 4

## මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.,2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.,2013=100) මගින් මනිනු ලබන පොදු මිල මට්ටම වසරේ පළමු මාස නවය තුළ දී මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශක දෙකෙහි ම විචලන, සැපයුම් අංශයෙහි සිදු වූ දැඩි බාධාවීම්වලට භාජනය වූ ආහාර කාණ්ඩයෙහි මිල විචලනවලට බොහෝ සෙයින් අනුරූප විය. මේ අතර, කො.පා.මි. දර්ශකයෙහි සහ ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම මගින් මනිනු ලබන උද්ධමනය සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මිශ්‍ර විචලන පෙන්නුම් කළේය. 2016 වසරේ සිදු වූ බදු සංශෝධනවල ප්‍රතිඵලයක් ලෙස දර්ශකවල සිදු වූ සැලකිය යුතු උච්චාවචනවලින් ඇති වූ පදනම් බලපෑම පොදු මිල මට්ටමෙහි සහ උද්ධමනයෙහි සිදු වූ මෙම විචලනවලට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආහාර නොවන කාණ්ඩයෙහි මිල ගණන්වල සාපේක්ෂව අඩු විචලන පෙන්නුම් කරමින් මූලික ජා.පා.මි. දර්ශකයෙහි සහ මූලික කො.පා.මි. දර්ශකයෙහි විචලන මගින් පෙන්නුම් කරන යටිදැරි උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත අඩු වන උපනතියක් අනුගමනය කළේය. තවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත නිෂ්පාදක මිල උද්ධමනය, කෘෂිකාර්මික උප දර්ශකයෙහි ඉහළ ගිය උපනතිය අනුගමනය කරමින් වසරේ පළමු මාස අට තුළ දී ඉහළ අගයක් වාර්තා කරන ලදී. මේ අතර නාමික වැටුප්, උද්ධමනයට සාපේක්ෂ ව අඩු වේගයකින් වර්ධනය වූ අතර, එය 2017 වසරේ පළමු භාගය තුළ දී සමස්ත මූර්ත වැටුප්හි පහළ යෑමට හේතු විය. මෙමගින් නුදුරු අනාගතයේ දී වැටුප් ඉහළ යෑමට බලපෑ හැකි පීඩන සහ ශ්‍රම ඵලදායිතාවෙහි පහළ යෑමට ඇති හැකියාව නිරූපණය කරයි. සේවා නියුක්ති අංශය ගත් කල 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය ඉහළ ගිය අතර සේවා වියුක්ති අනුපාතිකය පහළ ගියේ ආර්ථිකයෙහි ශ්‍රමය අන්තර්ග්‍රහණය කර ගැනීමට ඇති හැකියාවෙහි ඉහළ යෑම පෙන්නුම් කරමින් ය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයෙහි ඉහළ යෑමට මුළුමනින්ම හේතු වූයේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයෙහි සිදු වූ ඉහළ යෑමයි. නුපුහුණු ශ්‍රම කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්වීම් අඩු කිරීම සඳහා වූ රජයේ අඛණ්ඩ ප්‍රතිපත්ති ප්‍රයත්නවල ප්‍රතිඵලයක් වශයෙන් සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ රැකියා ගමනාන්තවල පවතින භූ-දේශපාලනික ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් විදේශ රැකියා සඳහා පිටත්වීම් පහළ ගියේය. මේ අතර, කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන පෞද්ගලික කර්මාන්තවල ඇති වූ අඩු වැඩ වර්ජන සංඛ්‍යාව මගින් කම්කරු සබඳතා වර්ධනය වී ඇති බව පිළිබිඹු වුවද මෑත කාලයේ රාජ්‍ය සේවා අඩාල වීම් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. 2017 වසරේ පළමු කාර්තුව තුළ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන අංශ තුනෙහි ම ශ්‍රම ඵලදායිතාව පහළ යෑම හේතුවෙන් ආර්ථිකයෙහි සමස්ත ශ්‍රම ඵලදායිතාව පහළ වැටිණි.

4

## 2017 වසරේ ප්‍රවණතා

### මිල


#### ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.)

- **සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ගණනය කරනු ලබන ජා.පා.මි.ද. (2013=100) හි විචලනය මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ මිශ්‍ර විචලන දක්වමින් සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී.** 2017 ජනවාරි මාසයේ දී දර්ශක අංක 119.3 ක් වූ ජා.පා.මි.ද. 2017 ජූනි මාසයේ දී, වසරේ වාර්තාගත වැඩිම අගය වූ දර්ශක අංක 123.4 ක් දක්වා ඉහළ ගිය අතර, 2017 සැප්තැම්බර් මාසයේ දී එය නැවතත් දර්ශක අංක 123.3 ක් ලෙස වාර්තා විය. සලකනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ජා.පා.මි.ද. බොහෝදුරට ආහාර උප කාණ්ඩයෙහි මිල විචලන වලට අනුරූපව වෙනස් වූ අතර, ආහාර නොවන උප කාණ්ඩයේ පෙන්නුම් කළ ඉහළ යන නැඹුරුව ද, ජා.පා.මි.ද. ඉහළ යෑමට දායක විය.

- **2017 පළමු මාස නවය තුළ දී, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීම මගින් මනිනු ලබන උද්ධමනය සමස්තයක් වශයෙන් මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පිළිබිඹු කළේය.** ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වසරේ පළමු මාස තුන තුළ දී ඉහළ ගිය නමුත් වසර මැද වන විට නැවතත් පහත වැටුණි. කෙසේ වෙතත්, 2017 සැප්තැම්බර් මස වන විට එය නැවතත් ඉහළ ගොස් මැද තනි අගයකට (සියයට 5 ට) වඩා ඉහළ මට්ටමක රැඳුණි. පළමු මාස දෙක තුළ දී ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි ඉහළ යෑම සඳහා එම දර්ශකයෙහි මාසික ඉහළ යෑම මෙන්ම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පදනම් බලපෑම ද හේතු විය. කෙසේ වෙතත්, 2017 මාර්තු සහ ජූනි මස අතර කාලය තුළ ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි විචලනය කෙරෙහි පසුගිය වසරේ පදනම් බලපෑම සම්පූර්ණයෙන් ම හේතු විය. 2017 ජූලි මස දී මාසික උද්ධමනයේ පහළ යෑම, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2017 ජූනි මස පැවති අගයේ ම පවත්වා ගැනීමට උපකාරී විය. මේ අතර, 2017 අගෝස්තු මාසයේ දී මාසික උද්ධමනය අඩුවීමක් තිබියදී ත්, 2016 වසරේ අගෝස්තු මාසයේ පැවති අඩු පදනම් බලපෑම හේතුවෙන්, 2017 අගෝස්තු මාසයේ ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. 2017 සැප්තැම්බර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි මාසික ඉහළ යෑම සමග වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ජා.පා.මි.ද. මගින් මනිනු ලබන උද්ධමනය තවදුරටත් ඉහළ ගියේය. මේ අතර, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, 2017 ජනවාරි මාසයේ දී සියයට 4.6 සිට 2017 සැප්තැම්බර් මස දී සියයට 6.8 ක් දක්වා ක්‍රමයෙන් වැඩි විය.

**4.1 රූප සටහන**


**මතුපිට උද්ධමනයේ විචලන (2016-2017) ජා.පා.මි.ද. (2013=100)**




#### කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.)

- **කොළඹ දිස්ත්‍රික්කයෙහි නාගරික ප්‍රදේශවල මිල ප්‍රවණතා මනිනු ලබන කො.පා.මි.ද. (2013=100), 2017 පළමු මාස නවය තුළ දී මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** 2017 ජනවාරි මාසයේ දී දර්ශක අංක 116.1 ක් වූ කො.පා.මි.ද., 2017 ජූනි මාසයේ දී, වසර තුළ වාර්තා වූ උපරිම අගය වන දර්ශක අංක 120.1 ක් වූ අතර 2017 සැප්තැම්බර් මාසයේ දී එය දර්ශක අංක 119.7 ක් ලෙස වාර්තා විය. සලකනු ලබන කාලපරිච්ඡේදයේ දී කො.පා.මි. දර්ශකයෙහි විචලන සඳහා ආහාර කාණ්ඩයේ විචලනයන් ප්‍රධාන වශයෙන් ම දායක විය. කො.පා.මි. දර්ශකයෙහි ආහාර නොවන කාණ්ඩයට වැඩි බරක් තිබුණ ද, දර්ශකයෙහි විචලන සඳහා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය අවම මට්ටමක පැවතුණි. කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ද ජා.පා.මි. දර්ශකයෙහි උද්ධමනයට සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින් මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. ඒ අනුව කො.පා.මි. දර්ශකයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය

4.2 රූප සටහන
**මතුපිට උද්ධමනයේ විචලන (2016-2017) කො.පා.මි.ද. (2013=100)**




2017 ජනවාරි මස දී සියයට 5.5 සිට 2017 මාර්තු මාසයේ දී සියයට 7.3 දක්වා ඉහළ ගොස් එතැන් සිට 2017 ජුනි මාසය දක්වා ක්‍රමයෙන් අඩු විය. 2017 ජූලි මාසයේ ආහාර කාණ්ඩයෙහි මිල පහළ යෑම හා 2016 ජූලි මාසයේ පැවති ඉහළ පදනම් බලපෑම මධ්‍යයේ, කො.පා.මි. දර්ශකයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2017 ජූලි මාසයේ දී සියයට 4.8 දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය. කෙසේ වෙතත්, 2017 අගෝස්තු මාසයේ දර්ශකයේ මාසික පහත වැටීම මධ්‍යයේ වුවද, 2016 අගෝස්තු මාසයේ පැවති පහළ පදනම් බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස කො.පා.මි. දර්ශකයෙහි උද්ධමනය සියයට 6.0 දක්වා ඉහළ යන ලදී. 2017 සැප්තැම්බර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි උද්ධමනය සියයට 7.1 දක්වා තවදුරටත් ඉහළ යෑම සඳහා පහළ පදනම් බලපෑම හා ආහාරවල මිල ගණන් ඉහළ යෑම හේතුවිය. මේ අතර, කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2017 ජනවාරි මාසයේ දී පැවති සියයට 4.3 සිට 2017 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.8 දක්වා ඉහළ ගියේය.

### ආහාර කාණ්ඩයේ මිල විචලන

- **2017 පළමු මාස නවය තුළ දී ආහාර කාණ්ඩයේ මිල ගණන් මිශ්‍ර විචලන සහිතව ඉහළ යෑම සඳහා නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල[1] සැපයුම් තත්ත්වයන්ගේ ඇති වූ වෙනස්කම් හේතු විය.** පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2017 මුල් මාස නවය තුළ දී නියඟය නිසා සිදු වූ සැපයුම අඩාලවීම් හේතුවෙන් සමස්තයක් ලෙස සහල්වල සාමාන්‍ය මිල වැඩි වේගයකින් ඉහළ ගියේය. තවද, නැවුම් මත්ස්‍ය මිල ද පෙර වසරේ මුල් මාස නවය හා සැසඳීමේ දී, 2017 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වැඩි වේගයකින් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ අයහපත් කාලගුණ තත්ත්ව නිසා 2017 ජුනි මාසයේ දි සිදු වූ තියුණු මිල ඉහළ යෑමයි. අඛණ්ඩව බලපැවැත්වූ නියං තත්ත්ව හේතුවෙන් පොල් නිෂ්පාදනයේ සිදු වූ අඩු වීම, 2016 සැප්තැම්බර් මස සිට පොල් මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2017 පළමු මාස නවය තුළ දී පොල් මිල ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, එළවළු මිල ගණන් ඉහළ යන නැඹුරුවක් පැවතිය ද, 2017 පළමු මාස නවයෙහි පැවති සාමාන්‍ය මිල ගණන්, 2016 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී පැවැති මිල ගණන්වලට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. එසේ වුවත්, අර්තාපල්, රතුළූණු සහ ලොකු ළූණුවල මිල ගණන් 2016 පළමු මාස නවය හා සැසඳීමේ දී 2017 අනුරූප කාලපරිච්ඡේදයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී. සලකා බලන කාලපරිච්ඡේදයේ දී පොදු මිල මට්ටමෙහි සැලකිය යුතු ඉහළ පීඩනයක් ඇති කිරීමට නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑමේ නැඹුරුව බලපාන ලදී.

- **ප්‍රධාන ආනයනික ආහාර අයිතමවල දේශීය මිල ගණන් 2016 පළමු මාස නවය හා සැසඳීමේ දී 2017 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී අඩු වේගයකින් වර්ධනය විය.** සීනි මිල සුළු වශයෙන් ඉහළ ගිය අතර 2016 මුල් මාස නවය හා සැසඳීමේ දී 2017 පළමු මාස නවය තුළ දී කිරිගු පිටි සහ පරිප්පු මිල ගණන් පහළ ගියේය. සහල් මිල ගණන් ඉහළ යෑම පාලනය කිරීම සහ දේශීය සැපයුම් අංශයේ පහළ යෑම් අනුපූරණය කර ගැනීම සඳහා ආනයනික සහල් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවස්ථා කිහිපයක දී පහත දමන ලදී. මීට අමතරව, වෙළඳපොළ තුළ ඇති විය හැකි මිල පීඩන පාලනය කිරීම සඳහා සහල්, පරිප්පු, වියළි හාල්මැස්සන්, සීනි සහ අර්තාපල් ඇතුළු සමහර ආහාර වර්ග මත උපරිම සිල්ලර මිලක් පනවන ලදී. කෙසේ වුවද, සහල් මත පනවන ලද උපරිම සිල්ලර මිල 2017 අගෝස්තු මාසයේ දී ඉවත් කෙරිණි.

[1] සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පළතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

4

- **ජා.පා.මි.ද. හා කො.පා.මි.ද. යන දර්ශක දෙකෙහිම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර උද්ධමනය මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී.** වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ජා.පා.මි.ද. ආහාර උද්ධමනය 2017 ජනවාරි සිට 2017 පෙබරවාරි දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් පදනම් බලපෑමත්, ආහාර කාණ්ඩයේ අයිතමයන්ගේ මාසික මිල ගණන් ඉහළ යෑමත් දායක විය. ඉන්පසුව, 2017 මාර්තු මාසයේ ආහාර මිල ගණන් පහළ ගිය ද, පසුගිය වර්ෂයේ පහළ පදනම් බලපෑම හේතුවෙන් 2017 මාර්තු මාසයේ ජා.පා.මි.ද. ආහාර උද්ධමනය ඉහළ ගියේය. ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2017 අප්‍රේල් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි ආහාර උද්ධමනය ඉහළ ගියේය. එසේ වුවත්, 2017 මැයි සහ 2017 ජූනි මාසවල දී ආහාර මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය ද පදනම් බලපෑම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත ජා.පා.මි. දර්ශකයෙහි ආහාර උද්ධමනය පහළ ගියේය. යහපත් සැපයුම් තත්ත්ව හේතුවෙන් 2017 ජූලි මාසයේ දී ආහාර මිල ගණන් අඩු වූ අතර, ලක්ෂ්‍යමය පදනම මත ආහාර කාණ්ඩයේ උද්ධමනය තවදුරටත් අඩු විය. කෙසේ වුවත්, 2017 අගෝස්තු මාසය තුළ මාසික අඩු වීම මධ්‍යයේ වුවද ආහාර කාණ්ඩයේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යෑමට 2016 අනුරූප කාලපරිච්ඡේදයේ පහළ පදනම් බලපෑම හේතු විය. ආහාර කාණ්ඩයේ උද්ධමනය 2017 සැප්තැම්බර් මාසයේ දී තවදුරටත්, ඉහළ යෑමට පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පදනම් බලපෑම සහ ආහාර මිල ගණන්වල මාසික ඉහළ යෑම ද හේතු විය. ලක්ෂ්‍යමය පදනම මත කො.පා.මි. දර්ශකයෙහි ආහාර උද්ධමනය ද අනුරූප කාලපරිච්ඡේදය තුළ දී මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්වීය. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී වාර්ෂික සාමාන්‍ය ආහාර උද්ධමනය ඉහළ යන නැඹුරුවක් පෙන්වීය.


### ආහාර නොවන කාණ්ඩයේ මිල විචලන

- **ආහාර නොවන කාණ්ඩයේ මිල විචලන සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** සියලුම ආහාර නොවන උප කාණ්ඩ මෙම ඉහළ යෑම කෙරෙහි දායක විය. පරිපාලිත මිල ගණන් සැලකූ විට, 2017 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස් ගාස්තු සියයට 6.28 කින් ඉහළ නංවන ලද අතර කිලෝග්‍රෑම් 12.5 ක එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල 2017 සැප්තැම්බර් 26 දින සිට රුපියල් 110 කින් ඉහළ නංවන ලදී. මෙම වර්ධනයන් ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් ඇති කරන ලදී. කෙසේ වුවද, ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. යන දර්ශක දෙකෙහිම ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය, මිශ්‍ර විචලන සහිතව පහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී. මේ සඳහා 2016 වර්ෂයේ දී හඳුන්වාදුන් බදු සංශෝධන හේතුවෙන් ඇති වූ පදනම් බලපෑම ඉවහල් වී තිබේ. ජා.පා.මි. දර්ශකයෙහි ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය මිශ්‍ර විචලන සහිතව ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලද අතර කො.පා.මි. දර්ශකයෙහි ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ක්‍රමයෙන් වැඩිවන නැඹුරුවක් පෙන්වන ලදී.


### මූලික උද්ධමනය

- **ජා.පා.මි.ද. (2013=100) හා කො.පා.මි.ද. (2013=100) මගින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සමස්තයක් ලෙස පහළ යන ප්‍රවණතාවක් පිළිබිඹු කරන ලදී.** මූලික උද්ධමනයේ පහත වැටීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 වසරේ මුල් කාලයේ සිට ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය දායක වී තිබේ. තවදුරටත්, ජා.පා.මි. මූලික දර්ශකයෙහි සහ කො.පා.මි. මූලික දර්ශකයෙහි මෙම කාලය තුළ වාර්තා වූ ඉහළ යන ප්‍රවණතාව මධ්‍යයේ වුවද, මූලික උද්ධමනය පහළ යෑම කෙරෙහි 2016 වර්ෂය තුළ දී රාජ්‍ය බදු ව්‍යුහයට හඳුන්වා දුන් වෙනස්කම් හේතුවෙන් ඇති වූ පදනම් බලපෑම

**4.3 රූප සටහන**
**මූලික උද්ධමනයේ විචලන (2016-2017) ජා.පා.මි.ද. (2013=100)**



**4.4 රූප සටහන**
**මූලික උද්ධමනයේ විචලන (2016-2017) කො.පා.මි.ද. (2013=100)**




දායක විය. මේ අනුව, ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2017 ජනවාරි මාසයේ පැවති සියයට 7.1 සිට 2017 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.6 ක් දක්වා මිශ්‍ර විචලන දක්වමින් පහත වැටුණි. මේ අතර, ජා.පා.මි.ද. මගින් වාර්ෂික සාමාන්‍ය පදනම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය මේ කාලය තුළ දී මිශ්‍ර විචලන සහිතව 2017 ජනවාරි මාසයේ දී පැවති සියයට 6.2 සිට 2017 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.7 ක් දක්වා අඩු විය. මේ අතර, කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරනු ලබන මූලික උද්ධමනය, 2017 ජනවාරි මාසයේ පැවති සියයට 7.0 සිට 2017 සැප්තැම්බර් මස දී සියයට 6.0 ක් දක්වා මිශ්‍ර විචලන සහිතව අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය පදනම මත ගණනය කරනු ලන මූලික උද්ධමනය 2017 ජනවාරි මස දී සියයට 4.7 සිට 2017 සැප්තැම්බර් මස දී සියයට 5.8 ක් දක්වා ඉහළ ගියේය.

### නිෂ්පාදක මිල උද්ධමනය

- **නිෂ්පාදක මිල උද්ධමනය 2017 වසරේ පළමු මාස අට තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.** නිෂ්පාදක මිල උද්ධමනය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.,2013 සිව්වන කාර්තුව = 100) හි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීම් මගින් මනිනු ලබයි. කෘෂිකාර්මික, විදුලිය හා ජලය (උපයෝගිතා) යන උප දර්ශකවල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරන ලද උද්ධමනය මෙම කාලය තුළ මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරන ලද නිෂ්පාදක මිල උද්ධමනය මෙම කාලය තුළ කෘෂිකාර්මික උප දර්ශකයෙහි උද්ධමනය අනුව බොහෝ දුරට විචලනය වූ අතර පාරිභෝගික මිල උද්ධමනය ද මේ ප්‍රවණතාව ම අනුගමනය කරන ලදී. මේ අතර, නිෂ්පාදන උප දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවක් වසරේ පළමු මාස අට තුළ දී පෙන්නුම් කරන ලදී.

### මිල ගණන් මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම


- **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන් කිහිපයක සෘජු බලපෑම සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී පාරිභෝගික මිල ගණන් මත දක්නට ලැබිණි.** 2016 මැයි මස සිට එකතු කළ අගය මත අය කරනු ලබන බදු (VAT) අනුපාතයේ ඇති වූ වෙනස්කම් පාරිභෝගික මිල දර්ශකයෙහි ඉහළ හා පහළ විචලන සඳහා හේතු විය. 2016 දී එකතු කළ අගය මත බදු අනුපාතයේ සිදු කළ වෙනස්කම් පදනම් බලපෑම හරහා 2017 පාරිභෝගික මිල උද්ධමනයට බලපා තිබේ. තවදුරටත්, ආහාර උප කාණ්ඩයට සැපයුම් අංශයෙන් සිදු වූ අහිතකර බලපෑම තුලනය කර ගැනීම සඳහා සහල් ද ඇතුළත් තෝරාගත් ප්‍රධාන ආහාර වර්ග කිහිපයක් මත උපරිම සිල්ලර මිලක් පනවන ලදී. කෙසේ වෙතත්, උපරිම සිල්ලර මිල ගණන් පැනවීම හේතුවෙන් වෙළඳපොළ මිල ගණන්වල සිදු වූ වෙනස්වීම ඉතා සුළු බව නිරීක්ෂණය විය. මේ අතර සහල් මත පැනවූ උපරිම සිල්ලර මිල 2017 අගෝස්තු මස දී ඉවත් කරන ලදී. තවදුරටත්, සැපයුම් අංශයෙන් ඇති කරන ලද අහිතකර බලපෑම තුලනය කර ගැනීම සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බදු, අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලදී.

### උද්ධමන අපේක්ෂා


- **මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි ඇති වූ වෙනස්කම් කෙරෙහි උද්ධමන අපේක්ෂා ප්‍රතිචාර දක්වන අතර, එය ඇතැම් අවස්ථාවල දී කාල පමාවක් සහිතව සිදුවේ.** 2017 වසරේ ආරම්භයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා ව්‍යාපාර අංශයෙහි උද්ධමන අපේක්ෂා වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඉන්පසු 2017 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති

4

**4.5 රූප සටහන**
**ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා**




**4.6 රූප සටහන**
**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල විචලන**




පොලී අනුපාත වෙනස් කිරීමෙන් ඇති වූ බලපෑම සමග ජූනි මාසයේ දී හැර අනෙකුත් මාසවල දී උද්ධමන අපේක්ෂාවල ස්ථාවර බවක් දක්නට ලැබුණි. සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන්ට ආහාර අයිතමවල මිල ගණන්වල ඉහළ යෑම වැඩි වශයෙන් දැනීම හේතුවෙන් 2017 සැප්තැම්බර් මාසයේ දී උද්ධමන අපේක්ෂා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, 2017 වසරේ සලකා බලන කාලය තුළ දී ව්‍යාපාර අංශයෙහි කෙටි කාලීන සහ දිගු කාලීන උද්ධමන අපේක්ෂාවල පරතරය අඩු විය.

### වැටුප්

- **උද්ධමනයට වඩා අඩු වේගයකින් නාමික වැටුප් වර්ධනය වීම හේතුවෙන් මූර්ත වැටුප් අඩුවන ප්‍රවණතාවක් පෙන්නුම් කිරීමත් සමග ආර්ථිකයෙහි වැටුප් පීඩනයක් ඇති බව හැඟවෙන ලක්ෂණ වැටුප් දර්ශක මගින් පෙන්නුම් කරන ලදී.** උද්ධමනයේ ඉහළ යෑම හිලව් කිරීම ප්‍රමාණවත් තරම් නාමික වැටුප් වර්ධනයක් විශේෂයෙන්ම 2017 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ දී රාජ්‍ය සහ විධිමත් පෞද්ගලික අංශවල සිදු වී නොමැති බව මින් පිළිබිඹු වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස නුදුරු අනාගතයේ දී වැටුප් පීඩන ඉහළ යෑම තුළින් ශ්‍රම ඵලදායිතාව පහළ යෑම සිදු විය හැකිය.


- **රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2017 පළමු මාස හත තුළ දී නොවෙනස් ව පැවතුණි.** කෙසේ වුව ද එම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය අංශයේ සේවකයන් සියයට 6.9 ක මූර්ත වැටුප් අඩුවීමක් අත්දකින ලදී. මෙම ප්‍රවණතාව 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය අංශයේ නාමික සහ මූර්ත වැටුප් පිළිවෙළින් සියයට 6.7 කින් සහ සියයට 2.9 කින් වර්ධනය වීමෙන් අනතුරුව දක්නට ලැබිණි.

- **පඩි පාලක සභා විසින් වැටුප් පාලනය කරනු ලබන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර් = 100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2017 පළමු මාස හත තුළ දී සුළු වශයෙන් ඉහළ ගියේය.** මෙම කාලපරිච්ඡේදය තුළ දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි ප්‍රතිශතික වර්ධනය ඉතා අවම මට්ටමක පැවතීම හේතුවෙන් විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ද සියයට 5.6 කින් පහළ ගියේය.

- **අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012 =100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2016 පළමු මාස හත තුළ දී වාර්තා කළ සියයට 6.8 ක වර්ධනයට සාපේක්ෂව 2017 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 9.3 කින් වර්ධනය විය.** 2017 පළමු මාස හත තුළ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන අංශ තුනෙහි ම නාමික වැටුප් පිළිවෙළින් සියයට 9.3 කින්, සියයට 10.5 කින් සහ සියයට 8.1 කින් ඉහළ ගියේය. මේ අතර, 2017 පළමු මාස හත තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් සියයට 1.8 කින් ඉහළ ගියේය. 2017 පළමු මාස හත තුළ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ක්‍රියාකාරකම්වල නියුතු සේවකයන්ගේ මූර්ත වැටුප්, පිළිවෙළින්, සියයට 1.8 කින්, සියයට 2.9 කින් සහ සියයට 0.7 කින් වර්ධනය විය. ඉදිකිරීම් අංශයෙහි

**4.7 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම**




ශීඝ්‍ර වර්ධනයත් සමග පෙදරේරු සහ වඩු කාර්මික වෘත්තීන්හි ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2017 පළමු මාස හත තුළ දී මෙම වෘත්තීන්හි වැටුප්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් තීරණය වීම වෙළඳපොළ තත්ත්ව මත පදනම් වන අතර එය නාමික සහ මූර්ත වැටුප්වල වර්ධනය ස්ථාවර කිරීමට දායක වේ.

## ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

- **අඛණ්ඩව පැවති ව්‍යුහාත්මක ගැටළු මධ්‍යයේ වුවද, මූලික ශ්‍රම වෙළඳපොළ දර්ශක කිහිපයක වැඩි වර්ධනයක් පැවතීම හේතුවෙන් සමස්තයක් ලෙස ශ්‍රම වෙළඳපොළ මිශ්‍ර සංඥා පෙන්නුම් කළේය.** 2017 පළමු භාගය තුළ දී ශ්‍රම බලකා සහභාගිත්වය ඉහළ ගිය අතර සේවා වියුක්ති අනුපාතිකය පහළ ගියේය. අඩු මට්ටමක පවතින ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම ධනාත්මක ප්‍රවණතා මධ්‍යයේ වුව ද, තරුණයින්, ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සහිත පුද්ගලයින් සහ කාන්තාවන් අතර සේවා වියුක්තිය තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. ශ්‍රම ඉල්ලුම සළකා බලන කල, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර මතය පිළිබඳ සමීක්ෂණවලින් අනාවරණය වූ පරිදි ආර්ථිකයෙහි ශ්‍රම සැපයුමේ හිඟයක් පවතින බව පෙන්නුම් කරමින්, වෙළඳපොළෙහි පවතින පුහුණු සහ නුපුහුණු ශ්‍රම සැපයුම අපේක්ෂා කරන මට්ටමට වඩා පහළින් පවතින බව සේවා යෝජකයන් අවධාරණය කරන ලදී. වැඩිදියුණු කළ කුසලතා සහ වඩා සුභදායී සේවා තත්ත්වයන් ඇති කර වැඩ කරන වයසේ ජනගහනය ආර්ථික වශයෙන් අක්‍රීය කාණ්ඩයේ සිට ආර්ථික වශයෙන් සක්‍රීය කාණ්ඩයට ආකර්ෂණය කර ගැනීම මගින් ශ්‍රම ඌණතාවය මැඩපැවැත්විය යුතුය.

## ශ්‍රම බලකාය

- **විභව ශ්‍රම සැපයුම සම්බන්ධ මූලික දර්ශකය වන වැඩ කරන වයසේ (වයස අවුරුදු 15 සහ ඊට වැඩි) කුටුම්භ ජනගහනය, 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළ දී පුද්ගලයින් මිලියන 0.4 කින් (සියයට 2.4 කින්) ඉහළ ගියේය.** රට තුළට සිදුවන සංක්‍රමණයන්ගේ ඉහළ යෑම සහ ආයතනික ජීවන රටාවේ සිට කුටුම්භ ජීවන රටාව[2] දක්වා පුද්ගලයන් සිදුකළ අභ්‍යන්තර සංචලන මෙම ඉහළ යෑමට හේතු විය. මේ අතරතුර, වැඩ කරන වයසේ මුළු කුටුම්භ ජනගහනයෙන්

2 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන ශ්‍රම බලකා සමීක්ෂණය මගින් ආවරණය වන්නේ කුටුම්භ ජනගහනයේ (ආයතනික නොවන ජනගහනයෙහි) ශ්‍රම බලකා ප්‍රවණතාය. ආයතනික ජනගහනයට සුභසාධන කඳවුරු, නේවාසිකාගාර වැනි ආයතනවල ජීවත්වන පුද්ගලයන් ඇතුළත් වේ.

**4.1 සංඛ්‍යා සටහන**

**ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය (අ)(ආ)**

| අයිතමය | 2016 | | 2017 (ඇ) | |
|---|---|---|---|---|
| | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය | පුරෝකථන |
| කුටුම්භ ජනගහනය '000 (වයස අවුරුදු 15 හා ඊට වැඩි) | 15,383 | 15,449 | 15,749 | 15,616 |
| ශ්‍රම බලකාය '000 | 8,256 | 8,311 | 8,551 | 8,511 |
| සේවා නියුක්ත '000 | 7,892 | 7,948 | 8,184 | 8,145 |
| සේවා වියුක්ත '000 | 364 | 363 | 367 | 366 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 53.7 | 53.8 | 54.3 | 54.5 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 4.4 | 4.4 | 4.3 | 4.3 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට, නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.
(ආ) මුළු දිවයිනම ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4

සියයට 54 ක් කාන්තාවන් ලෙස වාර්තා වීම, ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩිකිරීමේ වැදගත්කම පිළිබිඹු කරයි.

- **වැඩ කරන වයසේ කුටුම්භ ජනගහනයෙහි වර්ධනයත් සමග ආර්ථිකයේ වර්තමාන ශ්‍රම සැපයුම විදහා දක්වන ප්‍රධාන මිණුම් දණ්ඩක් වන ශ්‍රම බලකාය, 2016 වර්ෂයේ පළමු භාගයේ වාර්තා කළ පුද්ගලයන් මිලියන 8.256 සිට 2017 අනුරූප කාලපරිච්ඡේදයේ දී මිලියන 8.551 ක් දක්වා සියයට 3.6 ක කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කළේය.** වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය ශ්‍රම බලකායට ඇතුළත් වේ. තවදුරටත් අර්ථ දැක්වුවහොත්, ශ්‍රම බලකා සමීක්ෂණයට අදාළ කාලපරිච්ඡේදය තුළ දී සේවයේ නියුක්ත හෝ සේවයෙන් වියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව ශ්‍රම බලකායට ඇතුළත් වේ. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශ්වයේම ශ්‍රම බලකායට ඇතුල්වීම්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී නාගරික සහ වතු ආශ්‍රිත ශ්‍රම බලකාය සැළකිය යුතු ලෙස වර්ධනය වූ අතර, ග්‍රාමීය ශ්‍රම බලකාය සුළු වශයෙන් වර්ධනය විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2012 වසරේ දී මුළු දිවයින ම ආවරණය වන පරිදි පවත්වන ලද ජන හා නිවාස සංගණනයට පසුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ප්‍රකාශයට පත් කළ මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුව භාවිත කර, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී[3]. නැවත බර තැබීමෙහි අරමුණ වූයේ වෙනත් රටවල් විසින් අනුගමනය කරන පරිදි, නවතම ජනගහන දත්තවලට අනුකූලව ශ්‍රම බලකා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමයි. ඒ අනුව, නැවත බර තැබූ ශ්‍රම වෙළඳපොළ ඇස්තමේන්තු 2016 වසරට පෙර වාර්තා කරන ලද ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

- **ශ්‍රම බලකාය, වයස අවුරුදු 15 ට සහ ඊට වැඩි ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස අර්ථ දැක්වෙන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2016 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 53.7 සිට 2017 වසරේ පළමු භාගයේ දී සියයට 54.3 දක්වා ඉහළ ගියේය.** මෙයට හේතු වූයේ, වැඩ කළ හැකි වයසේ ජනගහනයේ වර්ධනයට සාපේක්ෂව ශ්‍රම බලකායේ සිදු වූ ඉහළ වර්ධනයයි. මේ සඳහා මූලික ලෙස දායක වී ඇත්තේ, 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය සියයට 35.7 සිට සියයට 36.7 දක්වා ඉහළ යෑමයි. මෙම සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, පුරුෂ කුටුම්භ ජනගහනය, පුරුෂ ශ්‍රම බලකායට වඩා වැඩි වේගයකින් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 75.2 සිට සියයට 74.8 දක්වා පහළ ගියේය. පසුගිය පස් වසරෙහි දත්ත සංසන්දනය කළ විට සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ ම කාර්තුමය අගය වාර්තා කර ඇත. ඉන්පසු 2017 වසරේ දෙවන කාර්තුවේ දී එම අගයන් සුළු වශයෙන් පහළ ගියේය. කෙසේ වෙතත්, ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනය ළඟා කර ගැනීම සඳහා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ නැංවීම හරහා සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය තවදුරටත් ඉහළ නැංවිය හැකි විභවතාවයක් පවතී.

### සේවා නියුක්තිය

- **ආර්ථිකයේ සපුරනු ලැබූ ශ්‍රම ඉල්ලුම පිළිබිඹු කරන සමස්ත සේවා නියුක්තිය, 2016 පළමු භාගයේ දී වාර්තා වූ පුද්ගලයන් මිලියන 7.892 හා සැසඳීමේ දී, 2017 වසරේ පළමු භාගයේ දී මිලියන 8.184 දක්වා සියයට 3.7 කින් ඉහළ ගියේය.** මෙම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කර්මාන්ත අංශයේ සේවා නියුක්තියේ සිදු වූ සියයට 10.0 ක ඉහළ යාමයි. මේ අතර මෙම කාලපරිච්ඡේදය තුළ දී, කෘෂිකාර්මික හා සේවා අංශවල සේවා නියුක්තිය පිළිවෙළින් සියයට 2.3 කින් සහ සියයට 0.9 කින් ඉහළ ගියේය. කර්මාන්ත හා සේවා අංශයේ සේවා නියුක්තියේ සිදු වී ඇති මෙම වෙනස් වීම් මගින් මෑතකාලීනව එම අංශවල සිදු වූ ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනය පිළිබිඹු කරයි. කෘෂිකාර්මික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමීත්වය

3 2012 ජන හා නිවාස සංගණනයට පසු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කළ මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු, 2011 වසරේ සිට 2012 වසර දක්වා මධ්‍ය වාර්ෂික ජනගහනයෙහි පහළ යෑමක් පෙන්නුම් කරයි. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර පරිචවලට අනුකූලව, මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුවලට හඳුන්වාදුන් සංශෝධන පිළිබිඹු වන පරිදි ශ්‍රම බලකා ඇස්තමේන්තු නැවත බර තබන ලද අතර 2016 ජූලි මාසයේ දී 2011 වසරේ සිට 2016 වසර දක්වා කාලපරිච්ඡේදය සඳහා නව ශ්‍රම බලකා ඇස්තමේන්තු ශ්‍රේණියක් ප්‍රකාශයට පත් කරන ලදී.


මධ්‍යයේ වුව ද එම අංශයේ සේවා නියුක්තියෙහි ඉහළ යෑමක්, විශේෂයෙන්ම 2017 දෙවන කාර්තුවේ දී දක්නට ලැබිණි. මේ අතරතුර, සමස්ත සේවා නියුක්තියෙන් සියයට 45 ක් වන සේවා අංශය ආර්ථිකය තුළ ප්‍රමුඛතම රැකියා උත්පාදක අංශය ලෙස තවදුරටත් ඉදිරියෙන් පවතී. 2017 වසරේ පළමු භාගය තුළ දී කෘෂිකාර්මික සහ කාර්මික අංශ සමස්ත සේවා නියුක්තියට පිළිවෙළින් සියයට 26 ක සහ සියයට 28 ක දායකත්වයක් දක්වයි. විශේෂයෙන්, මෑතකාලීන අහිතකර කාලගුණික විපර්යාස නිසා බලපෑමට ලක්වූ දිවයිනේ ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල තරුණ ප්‍රජාවට කෘෂිකාර්මික කටයුතු තවදුරටත් ප්‍රායෝගික රැකියා මාර්ගයක් නොවන හෙයින් කෘෂිකාර්මික අංශයේ සිට අනෙක් අංශ කරා සේවා නියුක්තියේ තාවකාලික විතැන්වීමක් නිරීක්ෂණය කළ හැකිය.

- **සේවා නියුක්ති ස්වභාවය සැලකීමේ දී, සියලු අංශවල සේවා නියුක්තිය 2017 පළමු භාගය තුළ දී ඉහළ ගියේය.** මෙම ඉහළ යෑම සේවා යෝජක කාණ්ඩයේ විශේෂයෙන් දක්නට ලැබුණි. මෙය ධනාත්මක ප්‍රවණතාවක් ලෙස සැලකිය හැක්කේ සේව්‍ය අංශයේ යම් වර්ධනයක් මගින් තවත් රැකියා අවස්ථා උත්පාදනය වීමයි. එය පෞද්ගලික අංශයේ සේවා නියුක්තියෙහි සිදු වූ සියයට 6.2 ක වර්ධනයෙන් පිළිබිඹු වේ. කෙසේ වුවත්, පුද්ගලයින් සංඛ්‍යාව සැලකූ විට දී 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සේවා නියුක්තියේ ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ පෞද්ගලික අංශය යි. ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් කාණ්ඩය සියයට 5.1 කින් වැඩි වූ අතර මෙම අංශයේ සේවා නියුක්තිකයන් කිසිදු කම්කරු නීතියකින් ආවරණය නොවන හෙයින් අනාරක්ෂිත රැකියා නියුක්තිය[4] ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්වයි. ඒ අතර, ස්වයං රැකියාවල නියුතු වූවන් සංඛ්‍යාව සියයට 0.9 කින් ඉහළ ගියේය. තවද, 2016 වසරේ දී අවිධිමත් අංශයේ රැකියා නියුක්තිය මුළු සේවා නියුක්තියෙන් සියයට 60.2 ක් ලෙස වාර්තා විය.

4 ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි අර්ථ දැක්වීමට අනුව අනාරක්ෂිත රැකියා නියුක්තිය යනු ස්වයං රැකියාවල නියුතු වූවන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන්ගේ එකතුවයි.

**4.8 රූප සටහන**

**සේවා නියුක්තියේ ව්‍යුහය**





- **ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අර්ධ වාර්ෂික සමීක්ෂණයට අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය, 2017 පළමු භාගය අවසානයේ දී මිලියන 1.398 ක් ලෙස වාර්තා විය.** අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය, සමස්ත රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙන් සියයට 17.4 ක් වන අතර අවශේෂ සියයට 82.6 ක ප්‍රමාණය වෙනත් රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන්ගෙන් සමන්විත වේ. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා යන ආයතන පිළිවෙළින් සියයට 10.4, සියයට 39.7 හා සියයට 29.3 ක දායකත්වයක් දක්වන ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙන් සියයට 3.3 කට දායක විය.

4

## සේවා වියුක්තිය

- **සේවා වියුක්ති අනුපාතිකය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 4.4 ට සාපේක්ෂව 2017 පළමු භාගයේ දී සියයට 4.3 ක් දක්වා පහත වැටුණි.** රැකියා විරහිත මුළු පුද්ගල සංඛ්‍යාව පසුගිය වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 363,843 සිට 2017 පළමු භාගයේ දී 366,734 දක්වා සියයට 0.8 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, සේවා වියුක්ති අනුපාතිකය පහළ යෑමට හේතු වූයේ ශ්‍රම බලකායේ ප්‍රතිශත වර්ධනයට වඩා අඩු වේගයකින් රැකියා වියුක්ත ජනගහනයේ ප්‍රතිශත වර්ධනය සිදු වීම යි. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය තුළ පවතින රැකියා අවස්ථා ඉහළ ගොස් ඇති බව, ඉහළ ගිය සේවා නියුක්තිය මගින් පෙන්නුම් කරයි. කාන්තා සේවා නියුක්තිය වැඩි වූ ප්‍රමාණයට වඩා පුරුෂ සේවා නියුක්තිය වැඩි වූ ප්‍රමාණය ඉහළ හෙයින් වර්ධනය වූ රැකියා අවස්ථා ප්‍රමාණයෙන් වැඩි කොටසක් පුරුෂ පාර්ශ්වය අත්පත් කරගෙන ඇති බව පෙනේ. පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සියයට 3.1 සිට සියයට 2.9 දක්වා අඩු වීමෙන් පෙනී යන්නේ පුරුෂ පාර්ශ්වය අත්පත් කරගත් රැකියා අවස්ථා ප්‍රමාණය එම පාර්ශ්වයේ ශ්‍රම බලකාය වර්ධනය වූ ප්‍රමාණයට

**4.9 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (2013-2017)**




වඩා ඉහළ බව යි. ඒ අතර කාන්තා රැකියා වියුක්ති අනුපාතිකය, සියයට 6.7 සිට සියයට 6.8 දක්වා වැඩි වී ඇත. එමගින් පිළිබිඹු වන්නේ, කාන්තා ශ්‍රම බලකාය වර්ධනය වූ ප්‍රමාණයට වඩා අඩු වේගයකින් රැකියාවන්හි නියුතු කාන්තාවන් සංඛ්‍යාව වර්ධනය වීම යි. මෙම ප්‍රවණතා මගින් අඛණ්ඩව ඉස්මතු වනුයේ කාන්තාවන්ගේ සේවා නියුක්ති හැකියාව අඩු බව සහ කාන්තාවන්ගේ රැකියා අපේක්ෂා සම්බන්ධ පරතරයක් පවතින බව යි.

- **වයස් කාණ්ඩය අනුව රැකියා වියුක්ති අනුපාතිකයේ පවතින විෂමතා 2017 වසරේ පළමු භාගය තුළ දී ද අඛණ්ඩව කැපී පෙනිණි.** 2017 පළමු භාගයේ දී තරුණ[5] රැකියා වියුක්තිය සියයට 19.3 ක් තරම් සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතුණි. අනෙක් අතට, අවුරුදු 30-39 සහ අවුරුදු 40 ට වඩා වැඩි වයස් කාණ්ඩ අනුපිළිවෙළින් සියයට 2.7 සහ සියයට 1.0 ලෙස සාපේක්ෂව පහළ රැකියා වියුක්ති අනුපාතික වාර්තා කර ඇත. මීට හේතුවන්නේ, මෙම වයස් කාණ්ඩ තුළ රැකියා සම්බන්ධ කුසලතා හා සේවා අත්දැකීම් ඉහළ මට්ටමක පැවතීම යි.

- අධ්‍යාපන මට්ටම් අනුව සලකා බැලීමේ දී, **ඉහළ ම සේවා වියුක්ති අනුපාතිකය වන සියයට 8.0 ක අගය, අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ලද කාණ්ඩයෙන් වාර්තා විය.** ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ කුසලතාවල පවතින නොගැලපීම, සේවා අත්දැකීම් අඩු වීම, අපේක්ෂිත හා සැබෑ වැටුප් ව්‍යුහයන්වල පවතින වෙනස්කම්, ඇතැම් රැකියා කාන්තාවන්ට හෝ පුරුෂයන්ට පමණක් සීමා වේ යැයි සැළකීම සහ රැකියාවන් අතරතුර තාවකාලික විරාමයකින් පසුව නැවත රැකියාවක් ලබාගැනීමේ අපහසු බව වැනි කරුණු ය. මෙයට තවදුරටත් හේතුවිය හැකි වන්නේ පෞද්ගලික අංශයේ රැකියාවක නිරතවීමට වඩා, සම්ප්‍රදායික සමාජ ආරක්ෂක විධිවිධාන හා වෙනත් ප්‍රතිලාභ විඳිමින් රාජ්‍ය අංශයේ රැකියාවක නියැලීමට ඇති වැඩි කැමැත්තයි. මේ අතර 6-10 වසර සමත් කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතිකය 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේ දී, පිළිවෙළින් සියයට 3.4 සිට සියයට 3.2 දක්වා පහළ ගිය අතර අ.පො.ස.(සා.පෙළ) සමත් පුද්ගල කාණ්ඩයෙහි සේවා වියුක්ති අනුපාතිකය සියයට 5.8 සිට සියයට 5.9 දක්වා ඉහළ ගියේය.

### විදේශ සේවා නියුක්තිය

- **2016 පළමු භාගයට සාපේක්ෂව 2017 පළමු භාගයේ දී, විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන් සංඛ්‍යාව සියයට 14.6 කින් පහළ ගිය අතර, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද 2016 පළමු භාගයට සාපේක්ෂව සියයට 7.2 කින් පහළ ගියේය.** සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන් සහ තවත් මැද පෙරදිග සහ අප්‍රිකානු රාජ්‍යයන්, කටාර් රාජ්‍ය සමග පැවැති සම්බන්ධතා අතහැර දැමීමේ තත්ත්වය අඛණ්ඩ ව පැවතී ම, ප්‍රධාන තෙල් අපනයන රටවල්වල ආර්ථික වර්ධනය අඩු වීම සහ ගෘහ සේවිකා කාණ්ඩය යටතේ පිටත්ව යන සංඛ්‍යාව අවම කිරීමට බලධාරීන් විසින් ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, විදේශ රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් සංඛ්‍යාව අඩු කිරීමට හේතු විය. 2017 පළමු භාගය තුළ දී විදේශ සේවා සඳහා පිටත්ව යන පුරුෂ සහ ස්ත්‍රී පාර්ශ්ව, මුළු පිටත්ව යෑම් වලින් පිළිවෙළින් සියයට 66 ක් සහ සියයට 34 ක් ලෙස වාර්තා වූ අතර, දෙපාර්ශ්වයේ ම විදේශ සේවා සඳහා පිටත්ව යෑම් 2016 පළමු භාගය හා සැසඳීමේ දී ආසන්න වශයෙන් සියයට 15 කින් පහළ ගියේය.

- **ශ්‍රම නිපුණතා කාණ්ඩ අනුව සලකා බැලීමේ දී, සියලු කාණ්ඩවල විදේශ රැකියා සඳහා පිටත්වීම්වල පහළ යෑමක් 2016 පළමු භාගයට සාපේක්ෂව 2017 පළමු භාගය තුළ දී පෙන්නුම් කළේය.** මෙම පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වූයේ, අර්ධ පුහුණු, ලිපිකරු හා ආශ්‍රිත කාණ්ඩය, සහ ගෘහ සේවිකා කාණ්ඩයන් ය.

5 වයස අවුරුදු 15 - 24 අතර

ඉහළ නිපුණතා කාණ්ඩය යටතේ පිටත්ව යැම් තවදුරටත් දිරිගැන්වීම සඳහා වන ප්‍රතිපත්ති නොකඩවා ක්‍රියාත්මක කළ යුත්තේ, අනාගතයේ දී විදේශ සේවා නියුක්තිකයන් විසින් රට තුළට සිදු කරන ප්‍රේෂණයන්හි තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා ය. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවා නියුක්තිකයන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් 2017 පළමු භාගය තුළ දී ගිවිසුම් තුනක් සඳහා අත්සන් තැබිණි. එතෙර සේවය කරන සේවකයින්ට ආරක්ෂාව සැපයීම සහ බඳවා ගැනීම් විධිමත් කර ගැනීම සඳහා සිංගප්පූරුව සමග පළමු ගිවිසුම අත්සන් තැබිණි. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවකයින් සඳහා පුහුණුව ලබාදීමත්, පුහුණු ශ්‍රමිකයින්ට සවුදි අරාබියේ රෝහල්වල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියා සම්පාදනය කිරීම සඳහාත් දෙවන ගිවිසුම අත්සන් තැබිණි. ජර්මනියේ වයස්ගත වූවන් රැකබලා ගැනීමේ ක්ෂේත්‍රයේ පුහුණු හා රැකියා අවස්ථා උදා කර ගැනීම සඳහා එරට ආර්ථික කටයුතු සහ බලශක්ති අමාත්‍යාංශය සමග තෙවන ගිවිසුම අත්සන් තැබිණි.

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නියම කරන ලද ප්‍රමිතීන්වලට අනුකූල වීමට අසමත් වූ විදේශ සේවා නියෝජිත ආයතනවලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් බලපත්‍රලාභී විදේශ සේවා නියෝජිතයන්ගේ සංඛ්‍යාවෙහි සැලකිය යුතු පහළ යෑමක් පෙන්නුම් කළේය.** පසුගිය කාලයේ නිරීක්ෂණය කළ ප්‍රවණතාව එලෙස ම පවත්වා ගෙන යමින්, බලපත්‍රලාභී නියෝජිතයන් හරහා විදේශ සේවා සඳහා පිටත්ව යැම් මුළු පිටත් ව යැම් අතරින් සියයට 36 ක් ලෙස ද, පෞද්ගලික මූලාශ්‍ර හරහා පිටත් ව යැම් සියයට 64 ක් ලෙස ද 2017 පළමු භාගයේ දී වාර්තා විය. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2016 වසරේ පළමු භාගයේ නිකුත් කළ නව බලපත්‍ර 50 ට සාපේක්ෂව, 2017 පළමු භාගය තුළ දී නව බලපත්‍ර 3 ක් පමණක් නිකුත් කරන ලදී. එමෙන්ම, 2017 පළමු භාගය තුළ දී අලුත්කරන ලද බලපත්‍ර සංඛ්‍යාව, 16 කින් පහළ ගිය අතර මුළු නියෝජිත ආයතන සංඛ්‍යාව 449 ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්තියෙහි විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 2017 පළමු මාස 6 තුළ දී නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධ වැටලීම් 69 ක් සිදු කළ අතර, නීති විරෝධී ආයතන සහ නීතිය කඩකළ බවට චෝදනා ලැබ සිටින බලපත්‍රලාභී නියෝජිත ආයතනවලට එරෙහිව නඩු පැවරීම් 127 ක් සිදු කරන ලදී. 2017 වසරේ පළමු භාගය තුළ දී සංක්‍රමණික සේවකයින්ගේ නව පැමිණිලි 2,194 ක් ලැබුණු අතර, පැමිණිලි 3,079 ක් මෙම කාලය තුළ දී සමථයකට පත් කරන ලදී.

- **සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා වන අවම වැටුප සියලු ම රටවල් සඳහා 2017 පෙබරවාරි පළමු වෙනි දින සිට බල පැවැත්වෙන ලෙස ඉහළ දමන ලදී.** ඒ අනුව, පුහුණු සහ නුපුහුණු ශ්‍රමිකයන් සඳහා වන අවම වැටුප් පිළිවෙළින් මසකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 450 හා 350 දක්වා ඉහළ නංවන ලදී. මෙහි අරමුණ වූයේ විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීමත්, පහළ වැටුප් තලවල විදේශ සේවා නියුක්තිය අධෛර්යමත් කිරීම හා සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ කුසලතා වර්ධනය දිරිගැන්වීමත් ය. කෙසේ වුවත්, මෙම අවම වැටුප් සඳහා වන රෙගුලාසිය, ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සඳහා වන පිරිවැය ඉහළ නංවන අතර, එය අන්තර්ජාතික ශ්‍රම වෙළඳ පොළෙහි ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ තරගකාරිත්වයට බලපෑමක් එල්ල කරනු ඇත.

### කම්කරු සබඳතා

- **පෞද්ගලික අංශයේ කර්මාන්තවලට අදාළව කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා වූ දත්ත අනුව, වැඩ වර්ජන සංඛ්‍යාව, වර්ජන සඳහා සහභාගි වූ සේවක සංඛ්‍යාව සහ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පිළිබඳ සලකන විට, 2017 පළමු භාගය තුළ දී කම්කරු සබඳතාවයන් හි වර්ධනයක් පෙන්නුම් කෙරිණි.** ප්‍රධාන වශයෙන්ම වැවිලි අංශයේ වර්ජන නිසා අහිමි වූ මිනිස් දින ගණන අඩු වීම හේතු කොට ගෙන 2016 වසරේ පළමු භාගයේ දී, වර්ජන නිසා අහිමි වූ මිනිස් දින ගණන වන 55,219 සිට 2017 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී 20,454 දක්වා සියයට 63 කින් පහළ ගියේය. 2016 වසරේ පළමු භාගය තුළ වර්ජනවලට සහභාගි වූ සේවක සංඛ්‍යාව වන 13,628 හි සිට 2017 වසරේ වාර්තා වූ 4,559 දක්වා පහත වැටිණි. පෞද්ගලික අංශයේ කර්මාන්තවල සිදු වූ වර්ජනවලට අමතරව, පොදුවේ ලබාගත හැකි දත්ත මගින් පෙන්නුම් කරන පරිදි, සෞඛ්‍ය, අධ්‍යාපන, ඛණිජ තෙල්, තැපැල් හා ප්‍රවාහන ආදී ක්ෂේත්‍රවල 2017 වසරේ ආරම්භයේ සිට වර්ජන 14 ක් පමණ සිදු වී ඇති අතර, එමගින් රටේ සමාජීය හා ආර්ථික ක්‍රියාදාමයන්ට සහ මහජනතාවගේ දෛනික දිවිපෙවෙතට දැඩි අහිතකර බලපෑම් සිදු වූ බැව් පෙනී යයි.

- **කාර්මික සාමය වර්ධනය කිරීම සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.** නව පනත්, පනත් සහ නීතිමය ප්‍රතිපාදන සඳහා සංශෝධන හඳුන්වාදීමත්, කම්කරු ගැටළු, සේවා නියුක්තිය සහ දැනට පවතින නියාමන රාමුවට අදාළ ගැටළු නිරාකරණය සඳහා නොයෙක් පූර්වාරක්ෂක උපක්‍රම හඳුන්වාදීමත් ඒ අතරට අයත් වේ. ජාතික කම්කරු උපදේශක සභාව මගින් එකඟ වූ පරිදි, අඩු කාන්තා ශ්‍රම සහභාගිත්වය, කාන්තාවන්ට රාත්‍රියේ වැඩ කිරීමට ඇති සීමාවන්, සංසන්දනාත්මකව ගත් කල ඇති අඩු මාතෘ පහසුකම්, සේවා නියුක්තියේ දී ඇතිවන අනතුරු, සේවා වියුක්තිය සහ කාර්මික ආරවුල් විසඳීමේ ක්‍රියාපටිපාටියෙහි ඇති අකාර්යක්ෂමතා වැනි ගැටලු විසඳීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සංශෝධනය කිරීමට තීරණය කර තිබේ. ව්‍යාපාරවල ඵලදායිතාව තහවුරු කිරීමට හා ව්‍යාපාර ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා කාර්මික ආරවුල් කළමනාකරණය කිරීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුව තුළ විශේෂ "මැදිහත් වීමේ ඒකකයක්" පිහිටුවීමට තීරණය කෙරිණි.

4

### ශ්‍රම ඵලදායිතාව

- **වැඩ කරන පැයක දී එකතු කළ අගය (2010 මිල අනුව) මගින් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව 2016 පළමු කාර්තුවේ වාර්තා වූ රුපියල් 452.82 සිට 2017 පළමු කාර්තුවේ දී රුපියල් 446.57 දක්වා සියයට 1.4 කින් පහළ ගියේය.** 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, අංශ තුනෙහිම, ශ්‍රම ඵලදායිතාවයෙහි පහළ යෑමක් වාර්තා විය. ඵලදායිතා මට්ටම අනුව සැලකීමේ දී, වැඩ කරන පැයකට රුපියල් 524.96 ක ඉහළ ම ඵලදායිතා මට්ටමක් වාර්තා කරමින් සේවා අංශය ශ්‍රම සම්පත් භාවිතයේ ඉහළම කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන ලදී. ඊට ආසන්න අගයක් වර්තා කරමින් කර්මාන්ත අංශය වැඩ කරන පැයකට රුපියල් 522.26 ක ඵලදායිතා මට්ටමක් වාර්තා කරන ලදී. 2016 වසරේ පළමු කාර්තුව හා සසඳන විට 2017 අනුරූප කාලපරිච්ඡේදයේ දී, මෙම අංශ දෙකෙහි ඵලදායිතාවයෙහි සිදු වූ පහළ යෑමට, අංශ දෙකෙහි ම සේවයේ නියුතු සංඛ්‍යාව වැඩි වීම තුළින් නිරීක්ෂණය කෙරුණු පරිදි අලුතින් එකතු වූ ශ්‍රමිකයින් ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය කාලයේ දී නිරීක්ෂණය කළ ප්‍රවණතාව එලෙසම පවත්වා ගෙන යමින් කෘෂිකාර්මික අංශයෙහි ඵලදායිතාව අඩුම අගයක් වාර්තා කළේය. ඒ අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රය, 2017 වසරේ පළමු කාර්තුවේ දී වැඩ කරන පැයකට රුපියල් 159.61 ක ඵලදායිතා මට්ටමක් වාර්තා කළ අතර එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට පහළ යෑමකි. කෘෂිකාර්මික අංශයේ සේවයේ නියුතු සංඛ්‍යාවේ පහළ යෑමක් මධ්‍යයේ වුව ද ශ්‍රම ඵලදායිතාව පහළ වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අහිතකර කාලගුණික තත්ත්ව නිසා එම අංශයේ එකතු කළ අගය පහළ යෑම යි.

## අපේක්ෂිත වර්ධනයන්

### මිල

- **උද්ධමනය 2017 වසරේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ මැද තනි ඉලක්කම් අගයකට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෑත කාලීනව පැවැති අසාමාන්‍ය අහිතකර කාලගුණික තත්ත්ව නැවුම් ආහාර සැපයුමට සැලකිය යුතු මට්ටමේ බාධාවන් එල්ල කළේය. විශේෂයෙන්ම පොදු මිල මට්ටමේ ඉහළ යෑමට දැනටමත් හේතු වී ඇති එළවළු, සහල් සහ පොල් මිල ගණන් කෙටිකාලීනව ද පහළ නොවැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. පරිපාලිත මිල ගණන් සඳහා සංශෝධන හඳුන්වා දෙනු ලැබුවහොත් ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය ද ඉහළ යනු ඇත. එමෙන්ම, පසුගිය කාලය තුළ අඩු මට්ටමක පැවැති අන්තර්ජාතික වෙළඳපොළේ මිල මට්ටම ද ඉහළ යන ලක්ෂණයන් පෙන්නුම් කරයි. දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය අගය දුර්වල මට්ටමක පැවතීම සමග අන්තර්ජාතික වෙළඳපොළේ මිල ප්‍රවණතාවල බලපෑම, දේශීය වෙළඳපොළේ මිල මට්ටම් කෙරෙහි වඩාත් බලපානු ඇත. එසේ නමුත්, මනාව පාලනය කෙරුණු උද්ධමන අපේක්ෂාවන් සහ ඉදිරි දැක්ම මත පදනම් වූ ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති මගින් උද්ධමනය කෙටිකාලීනව තනි ඉලක්කම් අගයක පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### වැටුප් හා ඵලදායිතාව

- **විධිමත් පෞද්ගලික සහ රාජ්‍ය යන අංශවල ඇති මූර්ත වැටුප්වල පහළ යෑම, ඉදිරි කාලයේ දී ඇති විය හැකි වැටුප් පීඩන ගොඩනැගීමක් සහ ඵලදායිතා ක්ෂයවීම් පිළිබඳව හඟවයි.** රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික අංශවල මූර්ත වැටුප් වර්ධනයෙහි බර තැබූ සාමාන්‍ය පිළිබිඹු කරන

සංයුක්ත වැටුප් ප්‍රමාණ දර්ශකය අනුව 2017 වසර ආරම්භයේ සිට මූර්ත වැටුප්වල අඩුවීමක් පෙන්නුම් කරයි. එවැනි පසුබිමක් තුළ වැටුප් ඉහළ නැංවීම සඳහා පීඩනයක් සහ ඵලදායිතාව පහළ යෑමේ ඉහළ නැඹුරුවක් පවතී. විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පිරිවැය තරගකාරිත්වය සහ ඵලදායිතාව කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. ජී.එස්.පී ප්ලස් (GSP+) සහනය සහ ඉදිරියේ දී එළඹීමට නියමිත වෙළඳ ගිවිසුම් හරහා නැවත ලබාගත් වෙළඳපොළ ප්‍රවේශ මගින් ඇති වූ වඩා විශාල ජාත්‍යන්තර පාරිභෝගික පදනමක් තුළින් ලැබිය හැකි අවස්ථාවලින් ප්‍රතිලාභ ලැබීමට නම් නිෂ්පාදන ධාරිතාව මෙන්ම ඵලදායිතාව ද වැඩි දියුණු කර ගත යුතුය. ඒ අනුව කුසලතා සංවර්ධනය, නව තාක්ෂණ ප්‍රතිග්‍රහණය කිරීම, ශ්‍රම බලකායේ ආකල්ප ගැලපීම සහ ඵලදායිතාව හා ඈඳුණු දිරිදීමනා ඇසුරින් වැටුප්වලට කෙරෙන ගැලපීම් ඇතුළත්ව ආර්ථිකයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වන වැඩපිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කළ යුතු වේ.

- **කෘෂිකාර්මික අංශයේ පහළ ඵලදායිතා මට්ටම මධ්‍යයේ සිදු වූ මූර්ත වැටුපෙහි පිරිහීම මෙම අංශයේ ඵලදායිතාව තව දුරටත් පහළ දැමීමට දායක වන අතර වෙනත් සමාජයීය සහ ආර්ථික කැළඹීම්වලට ද මග පාදයි.** කෘෂිකාර්මික අංශයේ සේවයේ නියුතු ඉහළ පුද්ගල ප්‍රතිශතය සැලකීමේ දී, මෙම අංශය මත යැපෙන විශාල සංඛ්‍යාවකින් යුතු පිරිසකගේ ජීවන තත්ත්වය ද මෙමගින් පිරිහෙනු ඇත. නව තාක්ෂණික ක්‍රම භාවිතයේ හිඟකමට අමතරව, නිතර ඇතිවන දරුණු කාලගුණික තත්ත්වයන් ද කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායිතාව අඩුවීමට හේතු වේ. අවසානයේ දී, කෘෂිකාර්මික අංශයේ මෙම ප්‍රවණතා හේතුවෙන් නැවුම් ආහාර මිල ගණන් ඉහළ යන අතර එමගින් ඇති වන උද්ධමනකාරී තත්ත්වයන් ආර්ථිකයට හා ජනතාවට බලපෑම් එල්ල කරයි.

- **ආර්ථිකයේ මූර්ත වැටුප් පහළ යෑම සඳහා පිළියමක් ලෙස, වර්තමාන බදු ව්‍යුහයේ ඇති වක්‍ර බදු කෙරෙහි ඇති වැඩි නැඹුරුව සෘජු බදු කෙරෙහි යොමු කිරීමෙන් නිවැරදි කළ හැකිය.** වත්මන් බදු ව්‍යුහය අනුව, සෘජු බදුවලට සාපේක්ෂව වක්‍ර බදු ඉහළ අගයක පවතින නිසා උද්ධමනය ඉහළ යෑම හේතුවෙන්, වැටුප්වල මූර්ත අගය පිරිහීමකට භාජනය වේ. වක්‍ර බදු ගෙවීමේ දී සිදුවන්නේ ආදායම් තත්ත්වය කුමක් වුව ද භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී/භාවිත කිරීමේ දී එම බදු ගෙවිය යුතු වීමයි. මේ අනුව, වක්‍ර බදු හේතුවෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යන අතර, එය උද්ධමනය ඉහළ දමමින් මූර්ත වැටුප් පහළ යෑමට මග පාදයි. මේ අනුව, වැටුප්වල මූර්ත අගය පහත යෑමට පිළියම් ලෙස නාමික වැටුප් වර්ධකය ලබාදෙනු වෙනුවට කඩිනම් වැඩපිළිවෙළක් තුළින් බදු ව්‍යුහය වෙනස්කිරීම හා ඵලදායිතාව හා බැඳි දිරිදීමනා හඳුන්වාදිය හැක.

## ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

- **ශ්‍රම වෙළඳපොළ තුළ පවත්නා කුසලතා නොගැලපීම් හා අනෙකුත් ගැටළු රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේ ම මැදිහත් වීමෙන් විසඳා ගැනීමට උත්සාහ කළ යුතු අතර, එවැනි වැඩසටහන් ග්‍රාමීය තරුණ පරපුර වෙත ළඟා විය යුතුය.** දිගු කලක සිට තරුණයන් සහ කාන්තාවන් අතර පවත්නා කුසලතා නොගැලපීම හා ඉහළ සේවා වියුක්ති තත්ත්වය පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී මැදිහත්වීමක් තුළින් විසඳාලිය යුතුය. අවශ්‍යතා විශ්ලේෂණය පදනම් කරගෙන බිහිවූ රැකියා අවස්ථා තුළින් පෞද්ගලික අංශයට මේ සඳහා දායක විය හැක. දැනට රජය හා පෞද්ගලික අංශ මගින් මේ සඳහා දරන ප්‍රයත්න දිරිගන්වන සුළු ය. සමහර වෘත්තීන් පිළිබඳව ඇති අකමැත්ත සහ ඒ වටා පවතින ස්ත්‍රී පුරුෂ ඒකාකෘති බිඳ දැමීම සඳහා වන වැඩසටහන්, රජයේ හා පෞද්ගලික අංශවල මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වෙතත්, මෙම වැඩසටහන් වඩාත් ඵලදායී වීම සඳහා දරිද්‍රතාවයෙන් පෙළෙන ග්‍රාමීය තරුණ පරපුර වෙත ළඟා විය යුතු අතර, එමගින් ඔවුන්ට නිසි ඉලක්කයක් සහිත තිරසාර විසඳුම් සැපයීම අරමුණ කරගත යුතුය. මෙවැනි වැඩපිළිවෙළවල් තරුණ NEET (Not in Employment, Education or Training) (රැකියාවක, අධ්‍යාපනය හෝ පුහුණු කටයුතුවල නොයෙදෙන) අනුපාතය පහත දැමීමට ද ඉවහල් වනු ඇති අතර, එය දිගුකාලීනව රැකියා වියුක්තව සිටීම හා ඌණ සේවා නියුක්ති තත්ත්ව වලට ද විසඳුම් සපයනු ඇත. තවදුරටත්, කුසලතා වර්ධනය කිරීම සඳහා වන පුහුණු කිරීමේ වැඩසටහන් අදාළ සියලු ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් සහිතව ක්‍රියාත්මක විය යුතුය. තවද, පුහුණු ආයතන මගින් දියත් කරන වැඩසටහන්වල විෂය මාලා වඩා ගතික විය යුතු අතර, පුහුණුව ලබන්නන් ශ්‍රම හිඟයක් පවතින

සහ ආර්ථිකයේ නැගී එන අංශවල සේවයේ නියුතු කිරීමේ හැකියාව ඉහළ දැමීම ඉලක්ක කරගත යුතුය. මේ අතර පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහ උපදේශනය ද ඇතිව පැරණි සහ යල්පිනූ විෂය මාලා ඉවත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ පුහුණු කටයුතු අතර සබැඳියාවක් නොමැති වුවහොත් එය යථාර්තවාදී නොවන අපේක්ෂා ගොඩනංවාලීමට හේතු විය හැක. එබඳු පුහුණුවකින් පසුව ආදායම් උත්පාදක මාර්ග සම්පාදනයක් සිදු නොවිය හැක. තවද, ආර්ථිකයේ නැගී එන සමහර අංශවලට අවශ්‍ය ශ්‍රම සැපයුම දේශීය ශ්‍රම වෙළඳපොළ තුළින් ලබාගැනීමට නොහැකි නම්, අවශ්‍ය නීති රෙගුලාසිවලට යටත්ව ශ්‍රමය ආනයනය කිරීම එම කර්මාන්ත වල ඉදිරි පැවැත්ම සඳහා ඉවහල් වනු ඇත.

- **මුළු සේවා නියුක්තියෙන් විශාල ප්‍රතිශතයක් අවිධිමත් අංශයේ නියැලී සිටීම අවම කිරීමට ක්‍රම ක්‍රමයෙන් පියවර ගැනීම තුළින් රැකියා සම්බන්ධ අවදානම අවම කර ගැනීම හා ආර්ථිකයේ ශ්‍රම ප්‍රමිතීන් නිසි මට්ටම්වල පවත්වා ගැනීම තහවුරු කර ගත හැකිය.** අවිධිමත් සේවා නියුක්තිය රටෙහි වර්තමාන රැකියා ව්‍යුහයෙන් සියයට 60.2 ක් නියෝජනය කරන අතර ඇතැම් විට ඔවුන් නිසි විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයකට හිමිකම් නොකියයි. ස්වයං ආයකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ඇති කිරීම හා එවැනි යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සේවා නියුක්තිකයන්ට අභිමානයෙන් යුතුව විශ්‍රාම දිවියක් ගත කිරීමට සහ රටක් ලෙස ජනගහනය වයස්ගත වීමේ සංසිද්ධිය තුළින් ඇති වන අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට ද හැකි වනු ඇත. අවිධිමත් අංශයේ නවෝත්පාදක කුසලතාවලින් පොහොසත් ව්‍යවසායකයන් හට මූල්‍ය පහසුකම් ලබා ගත හැකි අයුරින් ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. තවද, සියලුම වෘත්තීන් හැකියා මට්ටම අනුව, අනුක්‍රමික බලපත්‍ර ලබාදීමේ ක්‍රමයකට භාජනය කිරීම තුළින් සේවා නියුක්තියේ අවිධිමත් ස්වභාවය අවම කළ හැකි අතර විවිධ වෘත්තීන් සඳහා පිළිගැනීමක් ඇති කිරීමට හා ආර්ථිකයේ ශ්‍රම ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමට ද හැකියාව පවතී. මෙමගින් වෘත්තීය කුසලතා මත පදනම්ව වෘත්තීය කාණ්ඩ සඳහා අවම වැටුප් ඇති කිරීම සහ රටෙහි පවතින ශ්‍රම බලකායේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සිදුකළ හැක.

- **කේන්ද්‍රස්ථාන සංකල්පය, (Hub Concept) සහ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය කේන්ද්‍රය වැනි නව ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමට සීමාමායිම් රහිත ජාත්‍යන්තර අවධානයකින් යුතුව කම්කරු නීති ප්‍රතිසම්පාදනය සඳහා කටයුතු ආරම්භ කළ යුතු ය.** කම්කරු නීති මගින් තිරසාර, ඵලදායී හා ස්ථිර රැකියා බිහි කිරීම ධෛර්යමත් විය යුතු අතර අනාරක්ෂිත, අර්ධකාලීන හා අවිධිමත් සේවා නියුක්තිය අධෛර්යමත් විය යුතුය. ඒ අනුව, නම්‍යශීලී ලෙස හා රාත්‍රී කාලයේ වැඩ කිරීම (සුරක්ෂිතභාවය, සුදුසු සේවා කොන්දේසි හා අවශ්‍ය පහසුකම් සහිතව), වෙළඳපොළ බලවේග මත වැටුප් තීරණය වීම, වැඩකරන පැය ගණන ආවරණය කිරීමේ නම්‍යශීලී භාවය ඇති කිරීම සහ ඵලදායීතාවය හා බැඳි දිරිදීමනා අරමුණු කොටගෙන ප්‍රතිසංස්කරණ සිදුවිය යුතු අතර එය සේව්‍ය හා සේවක යන දෙපාර්ශ්වයට ම සුභදායී වන නවමු සේවා තත්ත්වයන් ඇති කිරීමට ඉවහල් වනු ඇත. එවැනි වැඩපිළිවෙළවල් තුළින් සිදුවන ඵලදායිතා ප්‍රවර්ධනයක් ඍජු විදේශ ආයෝජන දිරිමත් කරන අතර එමගින් ආර්ථික වර්ධනය දිරිගැන්වීම තුළින් අවසානයේ දී ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීමට දායක වනු ඇත.

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත දත්ත අනුව, ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා ස්ත්‍රී ජනගහනයේ දායකත්වය ඉහළ නැංවීමට විශාල අවකාශයක් පවතී.** 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ සිට විශ්ව විද්‍යාල ප්‍රවේශ මට්ටම දක්වා අඩකට වඩා වැඩි සාර්ථක ප්‍රතිඵල නියෝජනය කරන්නේ කාන්තාවන් වුව ද නොකඩවා පහළ මට්ටමක පවතින ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙන් පෙන්වන පරිදි ආර්ථික ක්‍රියාකාරකම්වලට ස්ත්‍රීන්ගේ දායකත්වය ඔවුන්ගේ හැකියා මට්ටමට වඩා පහළ මට්ටමක පවතී. මේ නිසා ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තුළින් කාන්තාවන් ශ්‍රම බලකාය තුළට ආකර්ෂණය කර ගැනීම සිදුකළ යුතුය. මේ සඳහා විශ්වාසනීය හා දැරිය හැකි මිලකට දිවා සුරැකුම් පහසුකම් සැලසීම, ආරක්ෂිත නවාතැන් හා ප්‍රවාහන පහසුකම් ඇති කිරීම, නිවසේ සිට, නම්‍යශීලී පදනමට හෝ අර්ධකාලීන ලෙස කාන්තාවන්ට සේවයේ නියුතුවීමට අවස්ථා බිහි කිරීම වැනි කරුණු සඳහා අවධානය යොමු විය යුතුය. තවද, පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම දිරිමත් කිරීම සහ ස්ත්‍රීන් සහ

පුරුෂයන්ට සම තත්ත්වයෙන් සැලකීම ප්‍රවර්ධනය කිරීමට, කම්කරු ගිවිසුම් ශක්තිමත් කිරීම ද සිදුකළ යුතුය.

- **වර්තමාන ජන විකාශනය අනුව, ළමා සුරැකුම් හා වැඩිහිටි ආරක්ෂණ ආයතන ඇතිවීම සඳහා ඉතා ඉහළ විභවයක් ඇත.** ආර්ථිකයේ වැඩ කරන වයසේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් නියෝජනය කළ ද, ගෙදරදොර වගකීම් හේතුවෙන් ඔවුන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය අඩු මට්ටමක පවතින නමුත් ආර්ථිකයේ වැඩිවෙමින් පවතින ශ්‍රම ඉල්ලුම සපුරාලීම සඳහා කාන්තාවන් වැඩි වශයෙන් ශ්‍රම බලකායට ආකර්ෂණය කර ගැනීම සිදු කළ යුතුය. නිවෙස්වල වගකීම්වලින් කාන්තාවන් යම් දුරකට හෝ නිදහස් කිරීම තුළින් කාන්තාවන්ට ආර්ථිකව ක්‍රියාකාරී වීමට ඉඩ සැලසේ. කුඩා ළමුන් සඳහා ළමා සුරැකුම් මධ්‍යස්ථාන හා වයසින් වැඩි දරුවන් සඳහා දිවා නේවාසිකාගාර පහසුකම් සැලසීම මගින් එම සේවාවන් සපයන්නන්ට රැකියා අවස්ථා උදාවන අතර එම සේවාවන් ලබන දෙමව්පියන් හට ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වීමට කාලය හා අවකාශ සැලසේ. තවද, 2030 වර්ෂය වන විට ජනගහනයෙන් සියයට 20 ක් වැඩිහිටි පුද්ගලයන්ගෙන් සමන්විත විය හැකි බවට පුරෝකථනය කර ඇති අතර ඒ අනුව වැඩිහිටි සුරැකුම් පහසුකම් සඳහා ජනිත විය හැකි ඉල්ලුම පිළිබිඹු වේ. තවද ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව[6] සමස්ත ජනගහනයෙන් ආසන්න වශයෙන් සියයට 7.9 කි (පුද්ගලයින් මිලියන 1.6). මෙවැනි පුද්ගලයන් ඔවුන්ගේ හැකියාවන් අනුව ආදායමක් උත්පාදනය කළ හැකි ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කරවීම මගින් ඔවුන්ගේ මූල්‍යමය ශක්තිය, ස්වාධීනත්වය හා අභිමානය ඉහළ නංවන අතර ඔවුන්ට ආර්ථිකයේ වර්ධන ක්‍රියාවලියට දායක වීමට ද අවස්ථාව ලබා දෙයි.

- **අවුරුදු 13 ක අධ්‍යාපනය සහතික කිරීමේ රජයේ නියමු ව්‍යාපෘතිය යටතේ වෘත්තීය අධ්‍යාපන විෂය ධාරාවට හඳුන්වාදුන් විෂයයන් තුළින් ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීමට පවතින සූදානම සහතික කිරීමට උත්සාහ කිරීම මගින්, නිදහස් අධ්‍යාපන ක්‍රමයට අගය එකතු කිරීමක් සිදු විය.** මෙම විෂයධාරාව යටතේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව ශිෂ්‍යයන්ට ඔවුන්ගේ අභිරුචිය පරිදි විෂයධාරාවක් ඉගෙන ගැනීමට හැකියාව ලැබෙන අතර හඳුන්වාදුන් විෂයයන් මගින් ශිෂ්‍යයන්ගේ මෘදු කුසලතා (Soft Skills) වර්ධනය කිරීම අරමුණු කෙරේ. නිසි සම්පත් සමග මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමට හැකි වුවහොත් තරුණ පරපුරට අවුරුදු 13 ක අධ්‍යාපනය සාර්ථකව අවසන් කිරීමෙන් පසුව දේශීය ශ්‍රම වෙළඳපොළෙහි පවතින අවස්ථා නොපමාව ග්‍රහණය කර ගත හැකි වේ.



6 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ජන හා නිවාස සංගණනය (2012)

4

# 5

## විදේශීය අංශයේ ප්‍රවණතා

*ජංගම ගිණුමෙහි හිඟය ඉහළ යෑම හමුවේ වුවද, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ඉහළ යෑම තුළින් ගෙවුම් තුලනය මත වූ පීඩනය ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් 2017 වසරේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 2017 වසරේ පළමු භාගයේ දී ජංගම ගිණුමේ හිඟය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 644 සිට එ.ජ. ඩොලර් මිලියන 1,466 ක් දක්වා ඉහළ ගියේය. විශේෂයෙන්ම, මාර්තු මාසයේ සිට අපනයන ආදායම් ක්‍රමයෙන් ඉහළ යෑම හමුවේ වුවද, වසරේ පළමු භාගය තුළ දී ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් වීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ධාවන පථය අලුත්වැඩියා කිරීමේ කටයුතු හේතුවෙන් ගුවන් තොටුපළ දිවා කාලයේදී වසා තැබීම සහ ඩෙංගු රෝගය පැතිරයාම හමුවේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කරන ලද අවදානම් හැඟවීම හේතුවෙන් සංචාරක ඉපැයීම් මධ්‍යස්ථ මට්ටමක පැවතීම සහ මැදපෙරදිග රටවල ආර්ථික කටයුතුවල දක්නට ලැබුණු පසුබෑම හමුවේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩුවීම යනාදිය ජංගම ගිණුමේ හිඟය වැඩි වීම සඳහා විශේෂයෙන්ම හේතු විය. කෙසේ වුවත්, 2017 වසරේ පළමු කාර්තුවේ දී ඉහළ විදේශ විනිමය ගෙවීම් හේතුවෙන් පීඩනයට ලක් වූ මූල්‍ය ගිණුම, දෙවන කාර්තුවේදී සැලකිය යුතු ලෙස වර්ධනය විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම හා සම්බන්ධ දෙවන සමාලෝචනය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යෑම සහ එක්සත් ජනපද බැඳුම්කර පොළී අනුපාතික ක්‍රමිකව ස්ථාවර වීම මූල්‍ය ගිණුමෙහි ඇති වූ වර්ධනය සඳහා හිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, වසරේ පළමු කාර්තුව තුළ දී විශාල වශයෙන් ආයෝජන නැවත ඉවත් කර ගැනීමෙන් ඇති වූ බලපෑම අවම කරමින්, 2017 වසරේ දෙවන කාර්තුවේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම්, විදේශීය සෘජු ආයෝජන සහ එකොළොස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව තුළින් හා රජය විසින් ලබා ගත් විදේශීය විනිමය කාලීන මූල්‍ය පහසුකම යටතේ වූ ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුම ශක්තිමත් විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2017 සැප්තැම්බර් මස අග වන විට ගෙවුම් තුලනයෙහි එ.ජ. ඩොලර් මිලියන 2,037 ක සමස්ත අතිරික්තයක් වාර්තා විය. වර්ධනය වූ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය, වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම සඳහා මහ බැංකුවට අවකාශ සැලසීය. ඒ අනුව, මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කරනු ලබන මැදිහත්වීම, විනිමය අනුපාතිකය මත වන බලපෑම අවම වන අයුරින් ජාත්‍යන්තර සංචිත ගොඩනගා ගැනීම සඳහා පමණක් සීමා කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසරේ පළමු මාස නවය තුළ දී, ශුද්ධ පදනම මත වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 1,161 ක් මිල දී ගැනීමත් සමඟ දළ නිල සංචිත තත්ත්වය 2016 වසර අවසානයේ දී පැවති එ.ජ.ඩොලර් බිලියන 6.0 සිට 2017 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් දක්වා වර්ධනය විය. වසරේ සැප්තැම්බර් මස අග දක්වා කාලය තුළ දී, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.2 කින් පමණක් අවප්‍රමාණය වෙමින්, ශ්‍රී ලංකා රුපියලෙහි බාහිර වටිනාකම සාපේක්ෂ ලෙස ස්ථාවරව පැවතුණි. කෙසේ වෙතත්, වෙළඳ ශේෂයේ වර්ධනයන් තුළින් ජංගම ගිණුමේ වර්ධනයක් ඇති කර ගැනීම සහ විශේෂයෙන්ම අපනයන ඉලක්ක කරගත් විදේශීය සෘජු ආයෝජන සඳහා වන විදේශීය ආයෝජන ලැබීම් ඉහළ මට්ටමක පවත්වා ගැනීම, මැතකාලීනව විදේශීය අංශයෙහි දක්නට ලැබුණු හිතකර වර්ධනයන් මැදිකාලීනව තිරසාර ලෙස පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.*


## භාණ්ඩ වෙළඳාම සහ වෙළඳ ශේෂය

- **පසුගිය දෙවසර තුළ මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ විදේශීය වෙළඳාම, 2017 වසරේ පළමු මාස අට තුළ දී නැවත යථා තත්ත්වයට පත් විය.** මෙම කාලපරිච්ඡේදය තුළ දී අපනයන ආදායම මෙන්ම ආනයන වියදමද වර්ධනය විය. කෙසේ වුවද, අපනයන ආදායමට සාපේක්ෂව ආනයන වියදම විශාල ලෙස වර්ධනය වීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත වෙළඳ හිඟය පුළුල් විය. මේ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළ දී වෙළඳ ගිණුමෙහි හිඟය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,515 සිට එ.ජ. ඩොලර් මිලියන 6,186 ක් දක්වා පුළුල් විය.

- **හිතකර වර්ධනයන් ගණනාවක් හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී අපනයන ආදායම වැඩිදියුණු විය.** 2017 වසරේ පළමු මාස අට තුළ දී අපනයන ආදායම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති එ.ජ. ඩොලර් මිලියන 6,888 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 7,413 ක් දක්වා සියයට 7.6 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන අපනයන වෙළඳපොළවල් යථා තත්ත්වයට පත්වීම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, ආයතනික සහායද සමඟින් හිතකර විදේශීය වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම, විනිමය අනුපාතිකය ක්‍රමයෙන් අවප්‍රමාණය වීම, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදිත යුරෝපා සංගමය වෙත අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ යුරෝපා සංගමය මගින් ලබා දෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්)[1] නැවත ලබා ගැනීම හේතු විය. සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන මෙම කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වූ අතර, වර්ධනය සඳහා ඉහළම දායකත්වය කෘෂිකාර්මික අපනයන (සියයට 56.1) හා කාර්මික අපනයන (සියයට 42.8) තුළින් ලැබුණි.

**5.1 රූප සටහන**

**විදේශ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය**




මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

- **සමස්ත අපනයනවලින් හතරෙන් එකක් පමණ වන කෘෂිකාර්මික අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,815 ක් දක්වා සියයට 19.4 ක වර්ධනයක් වාර්තා කරමින් ශක්තිමත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** තේ, කුළුබඩු සහ මුහුදු ආහාර අපනයනවලින් ලද ඉහළ ආදායම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2016 වසරේ පළමු මාස අට තුළ දී සියයට 7.3 කින් පහත වැටුණු තේ අපනයන ආදායම, 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,003 ක් දක්වා සියයට 20.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අපනයන පරිමාව සියයට 3.6 කින් අඩු වුවද, තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ සඳහා පවතින ඉහළ මිල ගණන් පිළිබිඹු කරමින්, 2016 වසරේ පළමු මාස අට තුළ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.23 ක්ව පැවති තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2017 වසරේ පළමු මාස අට තුළ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 5.27 ක් දක්වා සියයට 24.6 කින් වර්ධනය විය. 2017 වසරේ පළමු මාස අට තුළ දී කුළුබඩු අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 249 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 28.1 කින් වර්ධනය වූ අතර, කරාබුනැටි සහ කුරුඳු අපනයන පරිමා ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2017 වසරේ පළමු මාස අට තුළ දී කරාබු නැටි අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සිව් ගුණයකටත් වඩා ඉහළ ගිය අතර, කුරුඳු අපනයන ආදායම සියයට 18.7 කින් වර්ධනය විය. තවද, 2016 වසරේ ජූනි මාසයේ සිට ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදිත යුරෝපා වෙළඳපොළ වෙත අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත ලබා

---

1 2005 ජූලි මාසයේදී යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට ජී.එස්.පී. ප්ලස් පහසුකම ලබා දෙන ලදී. කෙසේ වුවද, මානව හා කම්කරු අයිතීන්, පාරිසරික හා යහපාලනය වැනි අංශවලට අදාළව ජාත්‍යන්තර සම්මුතීන් 27 ක ප්‍රගතිය දුර්වල වීම හේතුවෙන් 2010 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට ජී.එස්.පී. ප්ලස් පහසුකම අහිමි විය. මෙම පහසුකම 2017 මැයි මාසයේදී නැවතත් ලබා ගත් අතර එමගින් යුරෝපා වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ අපනයනවලින් සියයට 66 ක් තීරු බදු රහිතව අපනයනය කිරීමට අවස්ථාව ලැබේ.


5

ගැනීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී මුහුදු ආහාර අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 155 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 40.4 කින් වර්ධනය විය. මේ අනුව, ප්‍රංශය, එක්සත් රාජධානිය, ඉතාලිය, ජර්මනිය සහ නෙදර්ලන්තය යන රටවල් වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑමේ ප්‍රතිලාභ ලබමින් යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 118.3 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මීට අමතරව, බුලත් හා පලතුරු වැනි සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම් මෙන්ම රබර් සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම්ද මෙම කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම වර්ධනය වීම සඳහා දායක විය. පොල් අපනයන ආදායමද එ.ජ. ඩොලර් මිලියන 240 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.7 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල විශේෂයෙන්ම, දිසිඳි පොල් අපනයනයෙහි දුර්වල ක්‍රියාකාරිත්වයක් පැවතුණද, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ආදායම සියයට 7.0 කින් වර්ධනය වීම මේ සඳහා හේතු විය.

- **සමස්ත අපනයනවලින් සියයට 75 ක් පමණ වන කාර්මික අපනයන ආදායම, 2017 වසරේ පළමු මාස අට තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 5,562 ක් දක්වා සියයට 4.2 කින් වර්ධනය විය.** ඛනිජ තෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනයෙන් ලද ඉහළ ආදායම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නැව් සඳහා යොදා ගන්නා ඉන්ධන අපනයන පරිමා ඉහළ යෑම සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ මිල ගණන් පැවතීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 36.3 කින් වර්ධනය විය. සිංගප්පූරුව වෙත නෞකා තුනක් අපනයනය කිරීම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 138 ක් දක්වා සියයට 70.7 කින් වර්ධනය විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 20.9 කින් වර්ධනය වූ අතර, විද්‍යුත් උපකරණ හැර අනෙකුත් සියලුම උපකාණ්ඩ අපනයනවල වාර්තා වූ වර්ධනය මේ සඳහා හේතු විය. මීට අමතරව, ආහාර, පානවර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත, මූල ලෝහ හා මූල ලෝහ නිෂ්පාදිත සහ දැව හා කඩදාසි නිෂ්පාදිත අපනයන ආදායම්ද මෙම කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයන සඳහා ප්‍රධාන සාම්ප්‍රදායික වෙළඳපොළ වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත, විශේෂයෙන්ම වසරේ පළමු භාගය තුළ දී සිදු කරන ලද අපනයන අඩු වීම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළ දී මුළු අපනයනවලින් සියයට 44 කටත් වඩා වැඩි දායකත්වයක් දක්වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,283 ක් දක්වා සියයට 1.5 කින් පහත වැටුණි. කෙසේ වුවද, කැනඩාව, ඕස්ට්‍රේලියාව, හොංකොං, මෙක්සිකෝව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන මෙම කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, වසරේ පළමු මාස අට තුළ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල අඩුවීමක් වාර්තා වුවද, 2017 වසරේ මැයි මාසයේ සිට ප්‍රතිස්ථාපිත ජී.එස්.පී. ප්ලස් පහසුකමෙහි ධනාත්මක බලපෑම පිළිබඳව ලක්ෂණ පිළිබිඹු කරමින් 2017 වසරේ ජූලි සහ අගෝස්තු මාසවලදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මැණික්, දියමන්ති හා

**5.2 රූප සටහන**

**අපනයන සංයුතිය (2017 ජන.-අගෝ.)**




මූලයන් : ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

ස්වර්ණාභරණ සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම්, පිළිවෙළින්, සියයට 11.0 ක් සහ සියයට 7.5 ක් වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 167 ක් හා එ.ජ. ඩොලර් මිලියන 107 ක් දක්වා පහත වැටුණි.


- **2017 වසරේ පළමු මාස අට තුළ දී ඛනිජ නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 25 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 24.6 කින් වර්ධනය විය.** මෙම කාලපරිච්ඡේදය තුළ දී ඛනිජ නිෂ්පාදිත අපනයන ආදායමෙහි වර්ධනය සඳහා සියලුම උප කාණ්ඩ, විශේෂයෙන්ම පස් වර්ග හා පාෂාණ වර්ග දායක විය.

- **2017 වසරේ පළමු මාස අට තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 13,599 ක් දක්වා සියයට 9.6 කින් වර්ධනය විය.** ජාත්‍යන්තර වෙළඳපොළ තුළ වෙළඳ භාණ්ඩ මිල ගණන්වල ඉහළ යෑම, නියං තත්ත්වය හේතුවෙන් තාප විදුලිබල උත්පාදනය කෙරෙහි විශාල වශයෙන් යොමුවීම සහ දේශීය සහල් සැපයුමෙහි ඇති වූ හිඟය සපුරාලීම සඳහා සහල් ආනයනය කිරීමට රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග, 2017 වසරේ පළමු මාස අට තුළ දී ආනයන වියදම ඉහළ යෑම සඳහා හේතු විය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඉන්ධන නොවන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 11,446 ක් දක්වා සියයට 5.0 කින් වර්ධනය විය.

- **ආනයන වියදම ඉහළ යෑම කෙරෙහි අන්තර් භාණ්ඩ ආනයන විශාල වශයෙන් දායක විය.** මුළු ආනයනවලින් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයකින් සමන්විත වන අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2017 වසරේ පළමු මාස අට තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,272 ක් දක්වා සියයට 15.3 කින් වර්ධනය වූ අතර, ඉන්ධන ආනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් ඉහළ යෑම මෙන්ම ආනයන පරිමා ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් ප්‍රධාන වශයෙන් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,588 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 54.0 කින් ඉහළ යෑම හේතුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළ දී ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,153 ක් දක්වා සියයට 43.4 කින් වර්ධනය විය. එසේම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් ඉහළ යෑම සහ දේශීය විදුලිබල උත්පාදන අංශයෙන් වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් බොරතෙල් සහ ගල්අඟුරු ආනයන වියදමද මෙම කාලපරිච්ඡේදය තුළ දී ඉහළ ගියේය. බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2016 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 43.44 හා සැසඳීමේදී 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් 54.38 ක් දක්වා සියයට 25.2 කින් වර්ධනය විය. මේ අතර දියමන්ති, වටිනා ගල් වර්ග හා ලෝහ ආනයන වියදම 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් මිලියන 475 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 58.6 කින් ඉහළ ගිය අතර, 2016 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි රත්‍රන් ආනයනය සඳහා පනවා තිබූ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද (PAL) ඉවත් කිරීමත් සමඟ රත්‍රන් ආනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් රත්‍රන් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 403 ක් දක්වා සියයට 90.6 කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මූල ලෝහ (සියයට 41.5), තිරිඟු හා ඉරිඟු (සියයට 36.9) සහ ආහාර සැකසුම් (සියයට 29.7) ආනයන වියදම් ඉහළ යෑමද, 2017 වසරේ පළමු මාස අට තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම කෙරෙහි දායක විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම 2017 වසරේ පළමු මාස අට තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.9 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත ලැබීමෙන් පසුව රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායමේ දක්නට හැකි වූ ඉහළ ක්‍රියාකාරිත්වයට අනුකූලව රෙදිපිළි හා ඇඟලුම්

**5.3 රූප සටහන**

**ආනයන සංයුතිය (2017 ජන.-අගෝ.)**




මූලයන් : ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

කර්මාන්තය සඳහා වන අමුද්‍රව්‍ය ආනයනය ඉදිරි කාලය තුළ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී පොහොර, ඛනිජ නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම්, පිළිවෙළින්, සියයට 35.4 කින්, සියයට 22.4 කින් සහ සියයට 3.2 කින් පහත වැටුණි.

- **පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය සැලකීමේදී, 2017 වසරේ පළමු මාස අට තුළ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි.** සමස්ත ආනයනවලින් සියයට 22 ක් පමණ වන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,825 සිට 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,952 ක් දක්වා සියයට 4.5 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම, සහල් සහ කිරි නිෂ්පාදිත සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,204 ක් දක්වා සියයට 15.9 කින් ඉහළ ගියේය. දේශීය සැපයුමේ පවතින හිඟය සපුරාලීම සඳහා සහල් ආනයනය දිරිගැන්වීමට රජය විසින් ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ ජනවාරි මස සිට සහල් ආනයනයෙහි අඛණ්ඩ ඉහළ යෑමක් වාර්තා විය. ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළ දී සහල් ආනයන පරිමාව 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 18 සිට කිලෝග්‍රෑම් මිලියන 446 ක් දක්වා ඉහළ ගියේය. ගෝලීය සැපයුම් අවහිරතා මධ්‍යයේ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ කිරිපිටි නිෂ්පාදිත සඳහා පැවති සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ යෑම විශාල වශයෙන් පිළිබිඹු කරමින්, 2017 වසරේ පළමු මාස අට තුළ දී කිරි නිෂ්පාදිත ආනයන වියදමද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 29.2 කින් ඉහළ ගියේය. මීට අමතරව, මෙම කාලය තුළ දී පලතුරු සහ තෙල් හා මේද ආහාර ආනයන වියදම්ද, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ යෑම සඳහා බලපෑවේය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස අට තුළ දී කුළුබඩු සහ එළවළු ආනයන සඳහා වූ වියදම් පහත වැටුණි. මේ අතර ප්‍රධාන වශයෙන්ම, පෞද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා රථවාහන සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයනය පහත වැටීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,748 ක් දක්වා සියයට 2.1 කින් පහත වැටුණි. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී සන්නිවේදන උපකරණ සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය.


- **2017 වසරේ පළමු මාස අට තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණි.** ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2017 වසරේ පළමු මාස අට තුළ දී එ.ජ. ඩොලර් මිලියන 3,238 ක් දක්වා සියයට 0.7 කින් පහත වැටුණු අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 4.2 කින් පහත වැටීම මේ සඳහා හේතු විය. ඉංජිනේරු උපකරණ මෙන්ම කාර්යාල උපකරණ ආනයනවල ඉහළ යෑමක් පැවතියද ඇඟලුම් කර්මාන්තය සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන යන්ත්‍රසූත්‍ර, විදුලි මෝටර් හා විදුලිජනක කට්ටල, ටර්බයිනර් සහ සන්නිවේදන උපකරණ ආනයන කාණ්ඩවල අඩු වීම මේ සඳහා හේතු විය. කෙසේ වුවද, යකඩ හා වානේ, ඇලුමිනියම් උපාංග, දැව නිෂ්පාදිත සහ ආවරණය කරන ලද කම්බි සහ දඟර ආනයන සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,055 ක් දක්වා සියයට 2.8 කින් ඉහළ ගියේය. ටැංකි, බවුසර්, සහ ට්‍රැක්ටර් ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදමද සියයට 5.9 කින් ඉහළ ගියේය.

## වෙළඳ මිල අනුපාතය

- **ආනයන මිල දර්ශකය ඉහළ යෑමට සාපේක්ෂව අපනයන මිල දර්ශකය වැඩි වශයෙන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2016 වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස අට තුළ දී වෙළඳ මිල අනුපාතය ඉහළ ගියේය.** කෘෂිකාර්මික අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත අපනයන මිල දර්ශකය, දර්ශකාංක 95.8 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.5 ක මධ්‍යස්ථ අගයකින් වර්ධනය විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි පවතින ඉහළ මිල ගණන්වලට සමගාමීව තේ මිල ගණන් සියයට

5

**5.4 රූප සටහන**
**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

23.3 කින් ඉහළ යෑම, 2017 වසරේ පළමු මාස අට තුළ දී කෘෂිකාර්මික අපනයන මිල දර්ශකය සියයට 13.1 කින් ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, කාර්මික අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.8 කින් පහත වැටුණු අතර, බොහොමයක් උපභාණ්ඩ, විශේෂයෙන්ම ප්‍රවාහන උපකරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මූල ලෝහ සහ උපාංග, දැව හා දැව නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත වැනි උපභාණ්ඩවල සාමාන්‍ය මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඉන්ධන මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන මිල දර්ශකය සියයට 27.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර ආයෝජන භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ ආනයන මිල ගණන්වල පහළ යෑමක් පැවතියද, අන්තර් භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත ආනයන මිල දර්ශකය සියයට 0.4 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. විශේෂයෙන්ම පොහොර, ඛනිජ නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වැනි බොහොමයක් අන්තර් භාණ්ඩවල මිල ගණන් පහළ ගියද, ඉන්ධන සඳහා වන මිල දර්ශකය සියයට 21.6 කින් ඉහළ යෑම පිළිබිඹු කරමින් අන්තර් භාණ්ඩ ආනයන මිල දර්ශකය සියයට 2.9 කින් ඉහළ ගියේය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගණන් පහළ යෑම පිළිබිඹු කරමින් ආයෝජන භාණ්ඩ ආනයන මිල දර්ශකය පහත වැටුණි. ආහාර හා පාන වර්ග සහ අනෙකුත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩවල සාමාන්‍ය මිල ගණන් පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම කාලපරිච්ඡේදය තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන මිල දර්ශකය පහත වැටුණි. ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළ දී වෙළඳ මිල අනුපාතය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව දර්ශකාංක 103.7 ක් දක්වා සියයට 1.0 කින් වර්ධනය විය. තවද, ඉන්ධන ආශ්‍රිත නිෂ්පාදිත හැරුණු කොට අනෙකුත් භාණ්ඩවල වෙළඳ මිල අනුපාතය සියයට 2.8 කින් ඉහළ ගියේය.

## සේවා වෙළඳාම


- **සේවා ආනයන වියදම් ඉක්මවා සේවා අපනයන ආදායම් ලැබීම හේතුවෙන් 2017 වසරේ පළමු භාගයේ දී සේවා ගිණුමේ අතිරික්තය ඉහළ ගියේය.** ඒ අනුව, ප්‍රධාන වශයෙන් සංචාරක, ප්‍රවාහන සහ විදුලි සංදේශ, පරිගණක හා තොරතුරු සේවාවන්ගෙන් සමන්විත ගෙවුම් තුලනයෙහි සේවා ගිණුම, 2016 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,314 ක අතිරික්තයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,407 ක අතිරික්තයක් වාර්තා කළේය.

- **මගී ගාස්තු, නැව් කුලී සහ වරාය හා ගුවන් තොටුපළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමන්විත ප්‍රවාහන සේවා සඳහා දළ ලැබීම්, 2017 වසරේ පළමු භාගය තුළ දී මධ්‍යස්ථව වර්ධනය විය.** ඒ අනුව, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රවාහන සේවාවලට අදාළ දළ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,182 ක් දක්වා සියයට 3.9 කින් වර්ධනය විය. මේ අතර, ප්‍රධානවශයෙන්ම නැව් කුලී හා ගුවන් ගමන් සේවා මත වූ වියදම් ඉහළ යෑමත් සමග වරාය හා ගුවන් තොටුපළ ආශ්‍රිත සේවා ගෙවීම් විශාල වශයෙන් වර්ධනය වීම හේතුවෙන්, ප්‍රවාහන සේවා සඳහා වූ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 872 දක්වා සියයට 5.3 ක ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය විය. 2017 වසරේ පළමු භාගයේ දී මගී ගාස්තු සඳහා වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 568 දක්වා සියයට 2.9 කින් වර්ධනය විය. විශේෂයෙන් ම ගුවන් පථය නැවත සකස් කිරීමේ කටයුතු හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ අර්ධ වශයෙන් වසා දැමීම නිසා මෙරටට පැමිණෙන ගුවන් මගීන් සංඛ්‍යාව අඩුවීම, වසරේ පළමු කාර්තුව තුළ දී මගී ගාස්තු මත වූ ඉපැයීම් පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමග, වරාය හා ගුවන් තොටුපළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට සම්බන්ධ ප්‍රවාහන කුලී ආදායම් ලැබීම් 2017 වසරේ

පළමු භාගයේ දී වර්ධනය විය. ප්‍රධාන වශයෙන් කොළඹ වරායේ නැව් භාණ්ඩ, බහලුම් සහ නැව්ගත කිරීම් ප්‍රමාණයන්ගේ හැසිරවීම් ඉහළ යෑම නිසා නැව් ගාස්තු මත දළ ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 614 දක්වා සියයට 4.9 කින් ඉහළ ගියේය.


- **සංචාරක කර්මාන්තය, ශ්‍රී ලංකා ආර්ථිකයෙහි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් ලෙස පවතින අතර, 2017 වසරේ පළමු මාස නවය තුළ මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය.** 2016 වසරේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව පළමු වරට මිලියන දෙකක සන්ධිස්ථානය පසු කළද, 2017 වසරේ පළමු මාස නවය තුළ දී 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.9 ක මන්දගාමී වර්ධනයක් (සංචාරක පැමිණීම් 1,551,931) වාර්තා කරමින් සංචාරක කර්මාන්තය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ගුවන් පථය අලුත්වැඩියාව සහ නවීකරණ කටයුතු නිසා ගුවන් තොටුපළ මෙහෙයුම් කටයුතු සම්පූර්ණ ලෙස සිදු නොවීම හේතුවෙන් 2017 වසරේ අප්‍රේල් මාසය තෙක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ ගුවන් ගමන් වාර අවලංගු වීම් සහ ප්‍රමාද වීම් මෙන්ම ඩෙංගු රෝග ව්‍යාප්තිය උත්සන්න වීම සංචාරක කර්මාන්තයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය සඳහා හේතු විය. සංචාරක පැමිණීම්වල ප්‍රමුඛ ස්ථානය බටහිර යුරෝපය විසින් හිමි කර ගෙන ඇති අතර, දකුණු ආසියාව සහ නැගෙනහිර ආසියාව දෙවන හා තෙවන ස්ථාන හිමි කරගෙන ඇත. කෙසේ වුවද, 2016 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස නවය තුළ දී දකුණු ආසියාවෙන් පැමිණි සංචාරකයන් ප්‍රමාණය සුළු වශයෙන් අඩු වූ අතර ප්‍රධාන වශයෙන්,

**5.5 රූප සටහන**
**සංචාරක පැමිණීම් සහ සංචාරක ඉපැයීම්**




මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.6 රූප සටහන**
**රටවල් අනුව සංචාරක පැමිණීම් (2017 ජන.-සැප්.)**




මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මාලදිවයිනෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව සියයට 17.3 කින් පහත වැටීම මේ සඳහා හේතු විය. රටවල් අනුව ගත් කල ප්‍රධාන සංචාරක මූලාශ්‍රය වන ඉන්දියාවෙන් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 267,601 ක් දක්වා සියයට 6.1 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, චීනයෙන් පැමිණෙන සංචාරක සංඛ්‍යාවෙහි මධ්‍යස්ථ අඩුවීමක් වාර්තා විය.

- **2017 වසරේ පළමු භාගයේ දී සංචාරක පැමිණීම්වල දක්නට ලැබුණු ප්‍රවණතාවට අනුකූල වන පරිදි, සංචාර ඉපැයීම්[2] මධ්‍යස්ථ ලෙස වර්ධනය විය.** 2017 වසරේ පළමු භාගයේ දී සමුච්චිත පදනම මත වන සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,733.6 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය. 2017 වසරේ පළමු මාස නවය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,587.9 ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 2,662.6 ක් දක්වා සියයට 2.9 කින් වර්ධනය විය.

- **2017 වසරේ පළමු මාස අට තුළ දී සංචාරක කර්මාන්තය සැලකිය යුතු ප්‍රමාණයක ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සමත් විය.** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2010 වසරේ දී සංචාරක කර්මාන්තය තුළ ආයෝජනය කිරීමට අපේක්ෂා

5

2 2017 වසර සඳහා සංචාරකයෙකුගේ දෛනික සාමාන්‍ය වියදම සහ රට තුළ රැඳී සිටින සාමාන්‍ය කාලසීමාව පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් සිදු කරන සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමත් සමග මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

කරන, ඒ සඳහා හැකියාවක් ඇති ආයෝජකයන් හට සහාය වීම සඳහා මධ්‍යගත ප්‍රවර්ධන සහ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක්, එනම් විවිධ කාර්යයන් එක් ස්ථානයකදී ඉටු කර ගැනීම සඳහා වූ ඒකකය (One Stop Unit) පිහිටුවීමෙන් පසු මේ දක්වා කාලය තුළ ව්‍යාපෘති යෝජනා 597 ක් ලැබී ඇත. මේ අතුරින්, කාමර පහසුකම් 28,783 ක් සහිත ආයෝජන වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 5,137 ක් වූ ව්‍යාපෘති 497 ක් අනුමත කර ඇත. එයින්, 2017 වසරේ පළමු මාස අට තුළ දී කාමර ධාරිතාව 1,966 ක් වන එ.ජ. ඩොලර් මිලියන 261 ක වටිනාකමින් යුත් නව හෝටල් ව්‍යාපෘති 53 ක් සඳහා යෝජනා ලැබී ඇති අතර, කාමර ධාරිතාව 1,550 ක් වූ එ.ජ. ඩොලර් මිලියන 314 ක වටිනාකමකින් යුතු ව්‍යාපෘති 26 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. මීට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළ කාමර 1,190 කින් සමන්විත වන හෝටල් ව්‍යාපෘති 17 ක් සිය මෙහෙයුම් කටයුතු අරඹා ඇත. වසර 2020 වන විට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරනු ලබන මිලියන හතරක සංචාරකයන් ප්‍රමාණයට පහසුකම් සැලසීම සපුරාලීම සඳහා මෙම සංවර්ධනයන් උපකාරී වනු ඇත.

- **සේවා ගිණුමේ වාර්තා වූ වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වෙමින්, විදුලි සංදේශ, පරිගණක හා තොරතුරු සේවා මත වූ ඉපැයීම් 2017 වසරේ පළමු භාගයේ දී අඛණ්ඩව ස්ථාවර ලෙස වර්ධනය විය.** 2016 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කරන ලද එ.ජ. ඩොලර් මිලියන 442 කට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා අපනයන මත වූ මුළු ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 457 ක් විය. මෙම උපඅංශයෙහි වර්ධනය සඳහා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) වැනි තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා (ITES) සහ මෘදුකාංග අපනයන මත වූ ලැබීම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

## ප්‍රාථමික ආදායම

- **2017 වසරේ පළමු භාගයේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් වුව ද තවදුරටත් පුළුල් වූ අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත වූ පොලී ගෙවීම් එයට ප්‍රධාන වශයෙන් හේතු විය.** ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2016 වසරේ පළමු භාගය තුළ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 971 ට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී මිලියන 1,038 ක් විය. කෙසේ වුවත්, 2017 වසරේ පළමු භාගයේ දී සෘජු ආයෝජකයින් විසින් ලාභාංශ ඉවත් කර ගැනීම සහ සෘජු ආයෝජනවලට අදාළව ප්‍රතිලාභ ප්‍රතිආයෝජනය කිරීම 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී පැවති මට්ටමට සමානව පැවතුණි. ජාත්‍යන්තර පොලී අනුපාතවල ඉහළ යෑම, රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහිම ණය පිරිවැය කෙරෙහි අයහපත් ලෙස බලපෑම හේතුවෙන් නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මෙන්ම විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් මත රජය විසින් ගෙවිය යුතු පොලී ගෙවීම් ක්‍රමිකව වර්ධනය වීමක් දැකිය හැකිය.

## ද්විතීයික ආදයම

- **2017 වසරේ පළමු භාගයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහළ යෑමත් සමඟ පෞද්ගලික සහ රජයේ සංක්‍රාමවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස අඩු විය.** 2017 වසරේ පළමු භාගයේ දී ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 3,204 සිට එ.ජ. ඩොලර් මිලියන 2,904 දක්වා සියයට 9.4 කින් පහත වැටුණි. පසුගිය වසරේ දක්නට ලැබුණු ආකාරයටම ඉන්ධන මිල ගණන් සාපේක්ෂව අඩු අගයක පැවතීම හා භූ-දේශපාලනික අස්ථාවරත්වයන් හේතුවෙන් මැදපෙරදිග ආර්ථිකයන්හි ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම, 2017 වසරේදී ද සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 2017 වසරේ මුල් භාගය සඳහා නිකුත් කර ඇති දත්තවලට අනුව විදේශ රැකියා සඳහා සෑම පුහුණු කාණ්ඩයක් යටතේම වන ශ්‍රම සංක්‍රමණ 2016 පළමු භාගයට සාපේක්ෂව අඩු වීම, සමස්ත ශ්‍රම සංක්‍රමණ අනුපාතය සියයට 14.6 කින් සැලකිය යුතු ලෙස පහත හෙළීමට හේතු වී ඇත. සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වීමටද මෙය යම්තාක් දුරට දායක වී ඇත. මේ අතර, 2017 වසරේ පළමු මාස නවය තුළ වාර්තා කළ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 5,382 හා සැසඳීමේදී, එ.ජ. ඩොලර් මිලියන 4,985 දක්වා සියයට 7.4 කින් පහළ ගොස් ඇත.

### ජංගම ගිණුමේ ශේෂය

- **ප්‍රධාන වශයෙන්ම නියගය ආශ්‍රිත ආනයන ඉහළ යෑම, අපනයනවල මන්දගාමී වර්ධනය, සංචාරක ඉපැයීම් මධ්‍යස්ථ මට්ටමක පැවතීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සිදු වූ අඩු වීම හේතුවෙන් 2017 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ හිඟය, වසර සඳහා අපේක්ෂා කරන ලද වර්ධනයට එරෙහිව තවදුරටත් පුළුල් විය.** 2017 මාර්තු මාසයේ සිට අපනයන ආදායම්වල වර්ධනයක් දක්නට ලැබුණද, අපනයන ආදායම ආනයන වියදම්හි සිදු වූ සැලකිය යුතු ඉහළ යෑම පියවීම සඳහා ප්‍රමාණවත් නොවීම හමුවේ වෙළඳ ශේෂය කැපී පෙනෙන ලෙස පිරිහීමට ලක් විය. නියගය හේතුවෙන් ඉන්ධන සහ සහල් මත වූ ආනයන වියදම් ඉහළ යෑම, වසරේ පළමු භාගයේ දී මුළු ආනයන වියදම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අදාළ කාලපරිච්ඡේදය තුළ දී ආනයන වියදම් ඉහළ යෑම සඳහා රත්‍රන් ආනයන වැඩි වීම ද හේතු විය. තවද, ප්‍රධාන වශයෙන් පොලී ගෙවීම් ඉහළ යෑම හේතුකොට ගෙන වසරේ ජුනි අග දක්වා කාලය තුළ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය. සංචාරක හා ප්‍රවාහන උප අංශයන්ගේ මන්දගාමී ක්‍රියාකාරිත්වය මුල්කොටගෙන කාලපරිච්ඡේදය තුළ දී සේවා ගිණුමේ අතිරික්තය මධ්‍යස්ථ මට්ටමක පැවතුණු අතර, ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම මත ඇඩි පීඩනයක් ඇති කරමින් ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත වන ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් සැලකිය යුතු ලෙස පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ පළමු භාගය තුළදී එ.ජ. ඩොලර් මිලියන 644 ක්ව පැවති ජංගම ගිණුමේ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,480 ක් දක්වා ඉහළ ගියේය.

### ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

- **2017 වසරේ පළමු භාගයේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** වසරේ පළමු භාගයේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය 2016 වසරේ පළමු භාගයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 1 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 8 ක් විය. 2010 වසරේදී ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් ලබන රටක් බවට පත් වීමත් සමඟ, රජය වෙත වන ප්‍රදාන අඩු වීම හේතුවෙන් පසුගිය වසර කිහිපයේදී සමස්ත ගෙවුම් තුලනය තුළ ප්‍රාග්ධන ගිණුමේ ප්‍රමුඛත්වය ක්‍රමයෙන් හීන වී ඇත.

### මූල්‍ය ගිණුම

- **2017 වසරේ පළමු භාගයේ දී මූල්‍ය ගිණුම මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය.** මූලික වශයෙන් රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශ ආයෝජන සැලකිය යුතු ලෙස ඉවත් කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ පළමු කාර්තුව තුළ දී මූල්‍ය ගිණුම තුළ කැපී පෙනෙන විදේශ විනිමය ගෙවීම් ප්‍රමාණයක් දක්නට ලැබුණි. වසරේ පළමු කාර්තුව තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන අඩු වීම මෙන්ම සෘජු ආයෝජන අඩු මට්ටමක පැවතීම ද මූල්‍ය ගිණුමේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. කෙසේ වුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම අඛණ්ඩව ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යෑමත්, එක්සත් ජනපද රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතික ක්‍රමයෙන් ස්ථාවර වීමත් සමඟ වසරේ දෙවන කාර්තුවේදී විදේශ විනිමය ප්‍රවාහයන්හි වෙනස් වීමක් දක්නට ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වසරේ දෙවන කාර්තුව තුළ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත අඛණ්ඩව විදේශ ආයෝජන ගලා ආ අතර, මෙම කාලය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ විදේශීය ලැබීම් ප්‍රමාණයක් දක්නට ලැබුණි. එකොළොස්වන අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සාර්ථක ලෙස සිදු කිරීම හා රජය විසින් ලබා ගන්නා ලද විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ විදේශීය ලැබීම්හි ප්‍රධාන මූලාශ්‍ර විය.

- **විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය.** ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2016 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 293 ට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ එ.ජ. ඩොලර් මිලියන 711 ක් විය. මේ අතර, 2017 වසරේ පළමු භාගය තුළ දී විදේශීය ණය ලැබීම් හැර ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2016 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 173 සිට එ.ජ. ඩොලර් මිලියන 509 ක් දක්වා ඉහළ ගියේය. 2017 වසරේ පළමු භාගය තුළ දී සෘජු ආයෝජන ලැබීම්වලින් වැඩි ප්‍රමාණයක්

සංචාරක, විදුලි සංදේශ හා යටිතල පහසුකම් යන අංශ වෙත යොමු විය. ණය බරක් ඇති නොකරන සහ දිගුකාලීන ස්වභාවයකින් යුක්ත වන බැවින් විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් වේ. එබැවින්, ශ්‍රී ලංකාව විසින් නිතර නිතර වෙනස්වීම්වලට බඳුන් නොවන පරිදි එකිනෙකට ගැළපෙන ආකාරයට ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම හා දේශපාලන ස්ථාවරභාවය රැක ගනිමින් විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රටේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම උදෙසා වූ ආර්ථික ප්‍රතිසංස්කරණ කඩිනම් කළ යුතු වේ. විදේශීය සෘජු ආයෝජන ඉහළ මට්ටමක් කරා ළඟා කර ගැනීම සඳහා 2017 වසර සඳහා වූ අයවැය තුළ යෝජනා කිහිපයක් ඇතුළත් වූ අතර, ශ්‍රී ලංකා සන්නාමය වෙනුවෙන් මුදල් වෙන් කිරීම සහ දින 50 ක් ඇතුළත ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීමේ අරමුණ ඇතිව විදේශීය ආයෝජන වෙනුවෙන් පහසුකම් සැලසීමේ සංවර්ධන කාර්යාංශයක් ස්ථාපිත කිරීම යනාදී මුලපිරීම් ඒ තුළ අන්තර්ගත විය. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වා ගෙන යාමේ පහසුව වැඩිදියුණු කිරීම උදෙසා ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකා රජය විසින් 2017 වසරේ ජූලි මාසයේ දී "ආයෝජන වාතාවරණය ඉහළ නැංවීම සඳහා වූ ඉදිරි දැක්ම" හඳුන්වා දෙන ලදී. මෙම ඉදිරි දැක්ම මගින් නව ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සියලු කටයුතු එක් ස්ථානයක දී සිදු කිරීමට යෝජනා කෙරෙන අතර එමගින් නව ව්‍යාපාර ආරම්භයේදී ඇතිවන අපහසුතා විශාල ලෙස අඩු කිරීමට අපේක්ෂා කෙරෙනු ඇත.

- **වසර තුළ දී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකර ගත් විදේශ විනිමය හුවමාරු ගිවිසුම මෙන්ම 2009 වසරේ දී ලබා ගත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකමේ ඉතිරි හිඟ ණය ප්‍රමාණයද පියවන ලදී.** 2016 වසර අවසන් වන විට පැවති එකම අන්තර්ජාතික විදේශ විනිමය හුවමාරු ගිවිසුම වූ ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකර ගත් විදේශ විනිමය හුවමාරු ගිවිසුමට අදාළව නොපියවා ඉතිරිව පැවති එ.ජ. ඩොලර් මිලියන 400 ක මුදල 2017 මාර්තු මාසයේ දී සම්පූර්ණයෙන් ම පියවන ලදී. තවද, මහ බැංකුව විසින් 2017 ජූලි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලදී.


- **2017 වසරේ පළමු භාගයේ දී මූල්‍ය ගිණුමේ සිදු වූ සමස්ත වර්ධනයන්, මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ ලැබීමක් සඳහා හේතු විය.** එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු භාගයේ දී මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් එ.ජ. ඩොලර් මිලියන 2,353 ක් වූ අතර, මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 1,057 ක් විය. ඒ අනුව, සළකා බලන කාලපරිච්ඡේදය තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,295 ක් විය.

- **මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම්වල තත්ත්වය පිළිබිඹු කරමින්, 2017 වසරේ පළමු කාර්තුව අවසානයේදී දළ නිල සංචිත, 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 6.0 සිට එ.ජ. ඩොලර් බිලියන 5.1 ක් දක්වා අඩු වූ අතර, 2017 වසරේ පළමු භාගය අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 7.0 දක්වා ක්‍රමයෙන් ඉහළ ගියේය.** වසරේ පළමු මාස දෙක තුළ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන අඛණ්ඩව ඉවතට ගලා යෑම හමුවේ, මෙම කාලපරිච්ඡේදය තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත කැපී පෙනෙන මැදිහත්වීමක් සිදු කිරීමට මහ බැංකුවට සිදු වූ අතර, එය වසරේ පළමු කාර්තුව තුළ දී සංචිතවල සැලකිය යුතු අඩු වීමකට හේතු විය. කෙසේ වෙතත්, දෙවන කාර්තුව තුළ දී විදේශීය ආයෝජන ලැබීමේ ප්‍රවණතාවයන්හි සිදු වූ හිතකර වෙනස් වීමත් සමඟ 2017 වසරේ මාර්තු මස සිට ශ්‍රී ලංකා මහ බැංකුවට වෙළඳපොළ වෙතින් ක්‍රමයෙන් විදේශ විනිමය මිලදී ගැනීමට හැකි වූ අතර, එමගින් 2017 වසරේ දෙවන කාර්තුව තුළ දී සංචිත මට්ටම වර්ධනය විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තෙවන වාරිකය ලැබීම් හේතුවෙන් 2017 වසරේ තෙවෙනි කාර්තුව අවසාන වන විට දළ නිල සංචිත තවදුරටත් වර්ධනය විය.

- **2016 වසරේ පැවති අහිතකර ගෝලීය ආර්ථික පරිසරය සහ විදේශීය අංශයේ ස්ථාවරතාවය මත අඛණ්ඩව ඇති වූ පීඩනය හමුවේ ශ්‍රී ලංකාව විසින් 2016 වසරේ ජූනි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගන්නා ලදී.** එම පහසුකම මගින් ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීම සහ රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා සහාය ලබා ගැනීම

5

**5.7 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුණු කෙරිණි. මෙම ණය පහසුකමෙහි සමස්ත වටිනාකම විශේෂ ගැනුම් හිමිකම් බිලියන 1.1 ක් (දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5ක්) වන අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාවට අදාළ වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. විස්තීර්ණ ණය පහසුකම යටතේ විශේෂ ගැනුම් හිමිකම් මිලියන 119.9 (දළ වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 169) ක් වූ පළමු වාරිකය 2016 වසරේ ජුනි මාසයේදී ශ්‍රී ලංකාවට ලැබුණි. එතැන් සිට මේ දක්වා කාලය තුළ දී තවත් වාරික දෙකක් ලැබුණු අතර, එහි නවතම ලැබීම ලෙස විස්තීර්ණ ණය පහසුකමෙහි තුන්වන වාරිකය 2017 ජූලි මාසයේ දී ලැබුණි. ඒ අනුව, 2017 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් ශ්‍රී ලංකාවට විශේෂ ගැනුම් හිමිකම් මිලියන 360 ක් (දළ වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 500ක්) ලැබී ඇති අතර, එහි සිව්වන වාරිකය 2017 වසරේ දෙසැම්බර් මාසය මුලදී ලැබීමට නියමිතය. ණය පහසුකමේ ඉතිරි ප්‍රමාණය ඉදිරි වර්ෂ දෙක පුරා තවත් ණය වාරික තුනකින් ලබා ගැනීමට අපේක්ෂා කෙරෙන අතර අවසාන වාරිකය, 2019 වසරේ අප්‍රේල් මාසයේ දී ලබා ගැනීමට අපේක්ෂිතය.

## අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

- **2017 වසරේ ජුනි මාසය අවසාන වන විට අන්තර්ජාතික ආයෝජන තත්ත්වය අනුව, ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වයන් 2016 වසර අග වන විට පැවති තත්ත්වයන්ට සාපේක්ෂව ඉහළ ගියේය.** දළ නිල සංචිත ඉහළ යෑම, සමස්ත වත්කම් තත්ත්වය ඉහළ යෑමට මූලිකව හේතු විය. සංචිත වත්කම් තත්ත්වය 2016 වසරේ දෙසැම්බර් මස අවසන් වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 6,019 සිට 2017 වසරේ ජුනි මස අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 6,959 ක් දක්වා ඉහළ ගිය අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් ලද අරමුදල් හැරුණු කොට මහ බැංකුව විසින් වෙළඳපොළ වෙතින් අඛණ්ඩව විදේශ විනිමය මිලදී ගැනීම ද මේ සඳහා හේතු විය. තවද, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්හි නොපියවා ඉතිරිව ඇති තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගිය අතර, තැන්පතු භාර ගන්නා ආයතනවල අනෙකුත් ලැබිය යුතු ගිණුම්හි නොපියවා ඉතිරිව ඇති තත්ත්වය 2016 වසර අවසානයේ පැවති තත්ත්වය සමඟ සැසඳීමේ දී 2017 ජුනි මස අවසානය වන විට පහළ යෑමක් පෙන්නුම් කළේය. මෙම කාලපරිච්ඡේදය තුළ දී සෘජු ආයෝජන වත්කම් තත්ත්වය ද සුළු වශයෙන් වැඩි විය.

- **ශ්‍රී ලංකාවේ මුළු විදේශීය වගකීම් තත්ත්වය පසුගිය වසරේ සිට 2017 වසරේ ජුනි මාසය අවසාන වන විට ඉහළ ගියේය.** එ.ජ. ඩොලර් බිලියන 1.5 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මෙන්ම විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම් සමඟ රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණයවල තත්ත්වය ඉහළ යෑම, විදේශීය වගකීම් වැඩි වීම සඳහා මූලික වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු විදේශීය වගකීම් තත්ත්වය 2016 දෙසැම්බර් අවසන් වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 55,036 සිට 2017 ජුනි මස අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 58,094 ක් දක්වා ඉහළ ගියේය. 2017 වසරේ ජුනි මස අවසන් වන විට සෘජු ආයෝජන හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්වල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් සෘජු ආයෝජන තත්ත්වය ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ දී හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්වල තත්ත්වය ඉහළ යෑම සඳහා විශේෂයෙන්ම සෘජු ආයෝජන ගනුදෙනු සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම්වල මිල තක්සේරු ලාභ හේතු ලෙස දැක්විය හැකිය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් හේතුවෙන් නොපියවා ඉතිරිව ඇති විවිධ ආයෝජනවල තත්ත්වය ඉහළ ගියේය. පොදු ලැයිස්තුගත සමාගම්වල තක්සේරු අලාභ තිබියදී වුව ද, කොළඹ කොටස් වෙළඳපොළෙහි ප්‍රාථමික හා

5

ද්විතීයික වෙළඳපොළවල් වෙත වූ අඛණ්ඩ විදේශීය ආයෝජන ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ පළමු භාගයේ දී හිමිකම් කොටස් තත්ත්වය ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මෙන්ම භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ලෙස වන රුපියල්වලින් නාමනය කරන ලද ණය සුරැකුම්පත්වල නොපියවූ ප්‍රමාණය සුළු වශයෙන් ඉහළ යැමත් සමඟ ණය සුරැකුම්පත්වල විවිධ ආයෝජන තත්ත්වය වර්ධනය විය.

- **2017 වසරේ ජූනි මාසයේ දී රජය විසින් ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, රජය වෙත වූ අනෙකුත් ව්‍යාපෘති ණය මෙන්ම තැන්පතු භාර ගන්නා ආයතනවල දිගුකාලීන ණය ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු භාගය තුළ දී නොපියවා ඉතිරිව ඇති සමස්ත විදේශීය ණය තත්ත්වය ඉහළ ගියේය.** අන්තර්ජාතික ආයෝජන තත්ත්වය තුළ නොපියවා ඉතිරිව ඇති වගකීම් ප්‍රමාණයෙහි විශාලතම සංරචකය වන රජය විසින් ලබා ගන්නා ලද විදේශීය ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය, වසරේ පළමු භාගය තුළ ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම ද ඇතුළුව රජය විසින් ලබා ගත් ව්‍යාපෘති ණය ප්‍රමාණය ඉහළ යෑමත් සමඟ වැඩි විය. තැන්පතු භාර ගන්නා ආයතන විසින් ලබා ගන්නා ලද විදේශීය ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය ඉහළ යෑම සඳහා බැංකු අංශය මගින් ලබා ගත් දිගුකාලීන ණය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2009 වසරේ දී ලබා ගත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකමට අදාළ ගෙවීම් මහ බැංකුව විසින් 2017 ජූලි මාසය වන විට එය සම්පූර්ණයෙන්ම පියවන ලදී.

- **2017 වසරේ පළමු භාගයේ දී මුදල් සහ තැන්පතු වගකීම් සහ අනෙකුත් ගෙවිය යුතු වගකීම්හි නොපියවා ඉතිරිව ඇති තත්ත්වය පහළ ගිය අතර, ගෙවිය යුතු වෙළඳ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය ඉහළ ගියේය.** අදාළ කාලපරිච්ඡේදය තුළ දී තැන්පතු භාර ගන්නා ආයතනයන්හි නොපියවා ඉතිරිව පැවති මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය, එම ආයතන විසින් ඉහළ විදේශීය ණය ලබා ගැනීම් සඳහා නැඹුරු වීමත් සමඟ කැපී පෙනෙන ලෙස අඩු විය. විශේෂයෙන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා ගන්නා ලද වෙළඳ ණය හේතුවෙන් කාලපරිච්ඡේදය තුළ දී නොපියවා ඉතිරිව පැවති වෙළඳ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය ඉහළ ගියේය.

## විදේශීය ණය තත්ත්වය

- **ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2017 වසරේ පළමු භාගයේ දී ඉහළ ගියේය.** ඒ අනුව, 2017 ජූනි අග වන විට නොපියවා ඉතිරිව ඇති සමස්ත විදේශීය ණය ප්‍රමාණය, 2016 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් බිලියන 46.6 සිට එ.ජ. ඩොලර් බිලියන 49.1 දක්වා ඉහළ ගියේය. 2017 ජූනි මස අග වන විට රටෙහි විදේශීය ණයවල ප්‍රධාන සංරචකය වන රජය සතු විදේශීය ණය ප්‍රමාණය 2016 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 27,197 සිට එ.ජ. ඩොලර් මිලියන 29,697 දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම එ.ජ. ඩොලර් බිලියන 1.5 ක එකොළොස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ එ.ජ. ඩොලර් මිලියන 450 ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙහි පළමු කොටස හේතු විය. රජයේ විදේශීය ණය තත්ත්වය ඉහළ නැංවීම සඳහා දායක වෙමින් රජය වෙත වූ ව්‍යාපෘති ණය ලැබීම් ද ඉහළ ගියේය. කෙසේ නමුත්, ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති එ.ජ. ඩොලර් මිලියන 400 ක විදේශ විනිමය හුවමාරු ගිවිසුම පියවීම, එ.ජ. ඩොලර් මිලියන 50 ක වටිනාකමකින් යුත් ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් නැවත ගෙවීම සහ සමීපස්ථ ණය පහසුකමෙහි එ.ජ. ඩොලර් මිලියන 187 ක ගෙවීම් හේතුවෙන් 2017 වසරේ පළමු භාගයේ දී මහ බැංකුව සතු නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය පහළ ගියේය. මේ අතර, මූලික වශයෙන් දිගු කාලීන ණය ලෙස වූ ලැබීම්හි ඉහළ යෑම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනයන්හි විදේශීය ණය තත්ත්වය ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන් ම වෙළඳ ණය සහ අත්තිකාරම් වැඩි වීම හේතුවෙන් පෞද්ගලික අංශය සතු නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය ද ඉහළ ගියේය.


## විදේශීය සංචිත වත්කම් තත්ත්වය

- **2017 සැප්තැම්බර් මස අග වන විට දළ නිල සංචිත ප්‍රමාණය 2016 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා වර්ධනය විය.** 2017 මාර්තු මාසයේදී ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති විදේශ විනිමය හුවමාරු ගිවිසුම යටතේ එ.ජ. ඩොලර් මිලියන 400 ක් පියවීම, එ.ජ. ඩොලර් බිලියන 1.3 ක විදේශීය ණය

5

සේවාකරණ ගෙවීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ එ.ජ. ඩොලර් මිලියන 187 ක ණය ආපසු ගෙවීම සහ ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 319 පමණ වූ ආසියානු නිශ්කාශන සංගමය වෙත වූ පියවීම් හමුවේ සංචිතවල මෙම කැපී පෙනෙන වර්ධනය සිදු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් වූ ලැබීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හරහා වූ ශුද්ධ ණය ගැනීම් හැරුණු විට දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 1,161 ක් ශුද්ධ පදනම මත අවශෝෂණය කර ගැනීම ද වසරේ පළමු මාස නවය තුළ දී දළ නිල සංචිත කැපී පෙනෙන ලෙස වර්ධනය වීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 සැප්තැම්බර් මස අග වන විට දළ නිල සංචිත ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් දක්වා ඉහළ ගියේය. එමඟින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් වන පරිදි සංචිත ගොඩනගා ගැනීමට මහ බැංකුවට හැකි විය. වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ඍජුවම විදේශ විනිමය මිලදී ගැනීම් සහ කෙටි කාලීන වගකීම් අඩු කිරීම හරහා සංචිත ගොඩනගා ගැනීම ජාත්‍යන්තර සංචිතවල ගුණාත්මකභාවය වැඩිදියුණු වීම සඳහා දායක විය. ඒ අනුව, 2017 සැප්තැම්බර් අග වන විට, කෙටි කාලීන ණය සහ වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සංචිතවල ප්‍රමාණාත්මකභාවය 2016 වසර අග වන විට පැවති සියයට 52 සිට සියයට 62 දක්වා වැඩි විය.

**5.8 රූප සටහන**
**දළ නිල සංචිත සහ ආනයනික මාස**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

- **2017 අගෝස්තු මස අවසානයේ දී දළ නිල සංචිත හා වාණිජ බැංකුවල විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය සංචිත ප්‍රමාණය 2016 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 8.4 සිට එ.ජ. ඩොලර් බිලියන 9.8 ක් දක්වා වැඩි විය.** දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,675 කින් ඉහළ යෑම සහ වාණිජ බැංකු සතු විදේශීය වත්කම් එ.ජ. ඩොලර් මිලියන 276 කින් අඩු වීමේ සාමූහික බලපෑම මෙම වැඩිවීම සඳහා හේතු විය. 2017 වසරේ අගෝස්තු මස අවසාන වන විට පැවති මුළු විදේශ සංචිත මාස 5.7 ක ආනයන ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් විය.

## ගෙවුම් තුලනය

- **2017 වසරේ පළමු භාගයේ දී ගෙවුම් තුලනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,186 ක සමස්ත හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,563 ක සමස්ත අතිරික්තයක් වාර්තා කළේය.** 2017 සැප්තැම්බර් අග වන විට ගෙවුම් තුලනය එ.ජ. ඩොලර් මිලියන 2,027 ක අතිරික්තයක් දක්වා තවදුරටත් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. විදේශීය අංශය මත වූ පීඩනය පිළිබිඹු කරමින් පසුගිය වසර දෙක පුරාවට සහ 2017 වසරේ පළමු කාර්තුව දක්වා ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය හිඟයක්ව පැවති නමුත් වසරේ දෙවන කාර්තුවේ දී එය අතිරික්තයක් බවට පත් විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මගින් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5 ක ලැබීම්, එ.ජ. ඩොලර් බිලියන 1.0 ක වටිනාකමකින් යුත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හරහා සිදු කරන ලද එ.ජ. ඩොලර් මිලියන 410 ක ශුද්ධ ණය ගැනීම්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 1,161 ක් අවශෝෂණය කිරීම සහ ජූලි මස මැද භාගයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තෙවන වාරිකය ලෙස ලද එ.ජ. ඩොලර් මිලියන 167 ක ලැබීම්, 2017 වසරේ සැප්තැම්බර් අග දක්වා වූ කාලය තුළ දී විදේශීය අංශය ශක්තිමත් වීමට උපකාරී විය.

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- **2017 වසර සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙරදැක්මේ සඳහන් වූ පරිදි මහ බැංකුව වසර තුළ වඩාත් වෙළඳපොළ පදනම් කරගත් විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවූ අතර, විදේශීය විනිමය**

5


**වෙළඳපොළ තුළ මහ බැංකුවෙහි මැදිහත්වීම විනිමය අනුපාතික මත අවම බලපෑමක් ඇති වන අයුරින්, විදේශීය සංචිත ගොඩනැගීමේ අරමුණ පමණක් ඇතිව සිදු කෙරිණි.** ඒ අනුව, මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොළ වෙතින් කරන ලද සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ප්‍රමාණයක් මිල දී ගැනීම හමුවේ වුවද, 2017 වසරේ සැප්තැම්බර් අග දක්වා කාලය තුළ දී රුපියලේ බාහිර අගය සාපේක්ෂව ස්ථාවරව පැවතුණි. 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ආනයන වියදම්, ණය සේවාකරණ ගෙවීම් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් අඛණ්ඩව විදේශ විනිමය ගෙවීම් රුපියල අවප්‍රමාණය වීම කෙරෙහි සැලකිය යුතු පීඩනයක් එල්ල කිරීමට ප්‍රධාන වශයෙන් ම හේතු විය. වසරේ පළමු මාස දෙක තුළ දී රුපියල අවප්‍රමාණය වීම සඳහා පැවති පීඩනය හේතුවෙන් මහ බැංකුවට රුපියලේ බාහිර අගය ආරක්ෂා කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමට සිදු විය. කෙසේ වෙතත්, කොළඹ කොටස් වෙළඳපොළ සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ඉහළ යෑම සහ අපනයන ආදායම් වැඩි වීම හේතුවෙන් 2017 වසරේ මාර්තු මාසයේ දී මෙම තත්ත්වය වෙනස් වීමත් සමඟ එතැන් සිට වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට මහ බැංකුවට අවකාශ සැලසුණි. 2017 වසරේ මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරය සහ රුපියල අතර හුවමාරු අගය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතීම සඳහා මෙම තත්ත්වය හේතු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම් හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් වූ ලැබීම් හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යාමත් සමඟ රුපියල මත පැවති අවප්‍රමාණය වීම සඳහා වූ පීඩනය තවදුරටත් ක්‍රමයෙන් අඩු විය. සමස්තයක් ලෙස, 2017 වසරේ සැප්තැම්බර් මාසය අවසානය දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.2 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකයේ හැසිරීම පිළිබිඹු කරමින් 2017 සැප්තැම්බර් අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 10.4 කින්, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 5.3 කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 12.5 කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 5.7 කින් අවප්‍රමාණය විය.

- **2017 වසරේ පළමු මාස දෙක තුළ දී විනිමය අනුපාතිකය මත වූ පීඩනය ලිහිල් කිරීම සඳහා, වෙළඳපොළ වෙත ශුද්ධ පදනම මත විදේශ විනිමය සපයමින්ද එතැන් සිට ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගනිමින් ද මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය.** ඒ අනුව, ජනවාරි සහ පෙබරවාරි මාස තුළ දී මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 292 ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළට සැපයූ අතර, මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 1,453 ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළින් අවශෝෂණය කර ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ පළමු මාස නවය තුළ දී, මහ බැංකුව විසින් 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී සිදු කළ එ.ජ. ඩොලර් මිලියන 693 ක ශුද්ධ සැපයීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,161 ක ශුද්ධ අවශෝෂණයක් සිදු කළ අතර, එය නිල විදේශීය සංචිත මට්ටම නැවත ගොඩ නැගීම සඳහා දායක විය. විදේශ විනිමය ලැබීම් සහ වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම, වසරේ පළමු මාස නවය තුළ දී රුපියලේ බාහිර අගය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට දායක විය. එම නිසා, වසරේ පළමු මාස දෙක තුළ දී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 1.0 කින් අවප්‍රමාණය වූ රුපියල, වෙළඳපොළ වෙතින් විදේශ විනිමය ද්‍රවශීලතාවය සැලකිය යුතු ප්‍රමාණයක් අවශෝෂණය කිරීම හමුවේ වුවද මාර්තු සිට සැප්තැම්බර් අග දක්වා කාලපරිච්ඡේදය තුළ දී තවත් සියයට 1.2 ක ප්‍රමාණයකින් පමණක් අවප්‍රමාණය විය. විශේෂයෙන් ම අගෝස්තු සහ සැප්තැම්බර් මාස වල දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සුළු වශයෙන් වුව ද අතිප්‍රමාණය විය.

- **2017 වසරේ පළමු මාස නවය තුළ දී මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක ද්විත්වයම අවප්‍රමාණය විය.** ඇතැම් ප්‍රධාන මුදල් වර්ග කීපයකට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අවප්‍රමාණය සහ අනෙකුත් ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම පිළිබිඹු කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශක අවප්‍රමාණය විය. ඒ අනුව, 2017 සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළ දී මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික, පිළිවෙළින්,

**5.9 රූප සටහන**


**දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම හා විනිමය අනුපාතිකය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**5.10 රූප සටහන**

**සඵල විනිමය අනුපාතික දර්ශක: මුදල් වර්ග 24 පැස අනුව (2010=100) (අ)**




(අ) කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2013 ට යාවත්කාලීන වීම සමග මූ.ස.වි.අ. නැවත ගණනය කර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 7.6 කින් සහ සියයට 6.7 කින් අවප්‍රමාණය විය. මේ අතර, නාමික විනිමය අනුපාතිකවල වෙනස් වීමට අමතරව මුදල් පැසෙහි ඇතුළත් රටවල උද්ධමන වෙනස්වීම් ද සැලකිල්ලට ගෙන ගණනය කෙරෙන, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය පිළිබිඹු කරන දර්ශක වන මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 4.2 කින් සහ සියයට 4.7 කින් අවප්‍රමාණය විය. කෙසේ නමුත්, වර්තමානයේ සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින දේශීය උද්ධමනයත් සමඟ 2010 වසරේ දී පැවති විදේශීය තරගකාරිත්වය ළඟා කර ගැනීමට රුපියලෙහි බාහිර අගය තවදුරටත් අවප්‍රමාණය වීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, දර්ශකාංක 100 සීමාවට ඉහළින් පැවතුණි.

- **2017 වසරේ පළමු කාර්තු තුන තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි එතැන් සහ ඉදිරි ගනුදෙනු ප්‍රමාණයේ ඉහළ යෑමක් වාර්තා කළේය.** 2017 සැප්තැම්බර් මස අවසාන වන විට එතැන් ගනුදෙනුවල සමස්ත පරිමාව 2016 අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,779 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,193 ක් විය. මේ අතර, 2017 වසරේ පළමු මාස නවය තුළදී ඉදිරි ගනුදෙනුවල සමස්ත පරිමාව 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 6,462 සිට එ.ජ. ඩොලර් මිලියන 6,557 ක් දක්වා ඉහළ ගියේය. මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනුවල සාමාන්‍ය අධි මිල, පොලී අනුපාතික අන්තරයෙහි සාමාන්‍යයට වඩා ඉහළ මට්ටමක පැවැති අතර, වාණිජ බැංකුවල සාමාන්‍ය ශුද්ධ අනාවරණ තත්ත්වයද 2017 සැප්තැම්බර් අවසානය වන විට ධන අගයක පැවතිණි.

## අපේක්ෂිත වර්ධනයන්

- **ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ අපේක්ෂිත හිතකර වෙනස් වීම් සහ මූල්‍ය ගිණුම වෙත වන ලැබීම් අඛණ්ඩව සිදු වීම හේතුවෙන් විදේශීය අංශය 2017 වසරේ අවසාන භාගයේ දී සහ 2018 වසරේ දී තවදුරටත් යහපත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2017 වසරේ සැප්තැම්බර් මාසයේ අවසානය වන විට අතිරික්තයක් වාර්තා කළ ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය 2017 වසරේ අවසාන වන විට එම මට්ටමේම පවතිනු ඇතැයි ද, 2018 වසරේ දී තවදුරටත් වර්ධනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2017 වසර අවසානය වන විට ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය එ.ජ. ඩොලර් බිලියන 1.5 ක් වනු ඇතැයි ද, විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.3 ක් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මන්දගාමී ගෝලීය ආර්ථික වර්ධනය, බොරතෙල් ඇතුළු වෙළඳ භාණ්ඩවල මිල ඉහළ යෑමට ඇති හැකියාව, අපේක්ෂිත මට්ටමට වඩා අඩු විදේශීය සෘජු ආයෝජන ලැබීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමේ

5

ප්‍රවණතාව සහ ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කාර රටවල භූ-දේශපාලනික අස්ථාවරත්වයන් ඇති වීම, විදේශීය අංශයේ ගිණුම්වල අපේක්ෂිත වර්ධනයන් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි අවදානම් වේ.

- **පසුගිය දෙවසරක කාලය තුළ අපනයන ආදායමේ පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය වෙනස් කරමින්, 2017 වසරේ ඉදිරි කාලය තුළ දී සහ 2018 වසරේ දී අපනයන ආදායම වැඩි වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත.** අපනයන හා ආනයන යන දෙකෙහිම අපේක්ෂිත ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ දී වෙළඳ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.2 ක මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂිතය. ලෝක වෙළඳ සංවිධානය විසින් 2017 වසරේ අප්‍රේල් මාසයේ දී සිදු කරන ලද පුරෝකථනවලට අනුව ජාත්‍යන්තර භාණ්ඩ වෙළඳාමේ පරිමාව 2017 වසරේ දී සියයට 1.8-3.6 ක පරාසයක් දක්වා ද, 2018 වසරේ දී සියයට 2.1-4.0 ක පරාසයක් දක්වා ද වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර වෙළඳාම වැඩිදියුණු වීම, 2017 වසරේ මැයි මාසයේ සිට යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත හිමි වීම, බහුපාර්ශ්වීය වෙළඳ ගිවිසුම් හරහා අපේක්ෂිත වෙළඳ සබඳතා වර්ධනය වීම, ශක්තිමත් ආයතනික සහයෝගිතාව සහ අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය ආයෝජන ඉහළ යෑමට උපකාරී වන ස්ථාවර ප්‍රතිපත්ති හේතුවෙන් අපනයනවල ඉහළ වර්ධනයක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයන සඳහා යුරෝපා සංගමය මගින් පනවා තිබූ තහනම 2016 වසරේ මැද භාගයේ සිට ඉවත් කිරීම හේතුවෙන් මත්ස්‍ය අපනයනවල ඇති වූ වර්ධනය තුළින් මත්ස්‍ය අපනයන ශක්තිමත් වර්ධනයක් ළඟා කර ගනු ඇතැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ මිල ගණන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ, 2018 වසරේ දී තේ හා කුළුබඩු ආදායම්වල ඉහළ යෑමක් ද අපේක්ෂා කෙරේ. මේ අතර, 2018 වසරේ දී ආනයන වියදම මධ්‍යස්ථව වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන්, විශේෂයෙන්ම ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑම, ආනයන වියදම කෙරෙහි ද බලපානු ඇත. මීට අමතරව, අපනයන සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වර්ධනය හා සමගාමීව 2018 වසර තුළ දී ආනයන පරිමාව ද ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2018 වසරේ දී වෙළඳ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.8 ක් ලෙස වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂිතය.

- **ගෙවුම් තුලනයේ සේවා ගිණුම 2017 වසරේ දෙවන භාගයේ දී සහ ඉන් පසුව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි මෙහෙයුම් කටයුතු පූර්ණ වශයෙන් නැවත ආරම්භ කිරීම හේතුවෙන් සංචාරක පැමිණීම් සංඛ්‍යාව ඉහළ යෑමත් සමඟ සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්වනු ඇත. ඉලක්කගත ප්‍රවර්ධන ව්‍යාපාර සහ රටෙහි සංචාරක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන අඛණ්ඩ ආයෝජන හේතුවෙන් ශ්‍රී ලංකාවේ සන්නාම වටිනාකම ඉහළ නැංවීමට ප්‍රයත්න දැරීම තුළින් සංචාරක ඉපැයීම් වර්ධනය වනු ඇත. ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම සහ පුහුණු ශ්‍රම බලකාය හේතුවෙන්, ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ඇතුළු සේවා අපනයන පුළුල් කිරීමට හැකි වනු ඇත. තවද, සාම්ප්‍රදායික මෘදුකාංග නිපැයුමෙන් ඔබ්බට ගොස් ජංගම සහ ක්ලවුඩ් පදනම් කරගත් යෙදවුම් (Cloud Based Applications) දෙසට නැඹුරුවීමත් සමඟ පරිගණක හා තොරතුරු සේවා තුළින් වන ඉපැයීම් තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම හිතකර වර්ධනයන්ගෙන් ඇති වන ප්‍රවණතාවයන් හේතුවෙන්, 2018 වසරේ දී සේවා ගිණුම තවදුරටත් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉදිරි කාලයේ දී සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** විදේශ රැකියා සපයන ප්‍රධාන රටවල ආර්ථික කටයුතුවල වර්ධනයත් සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල දක්නට ලැබුණු අඩු වීමේ ප්‍රවණතාව 2018 වසරේ දී වෙනස් වනු ඇතැයි ද, එය සුළු ප්‍රමාණයකින් වුව ද ඉහළ යනු ඇතැයි ද අපේක්ෂිතය. පසුගිය වසර කිහිපය තුළ දී පුහුණු හා වෘත්තීය අංශයන් යටතේ වන ශ්‍රම සංක්‍රමණවල වර්ධන ප්‍රවණතාවක් දක්නට ලැබුණ ද, ප්‍රධාන වශයෙන් ම, විදේශීය සේවායෝජකයින් විසින් ශ්‍රමිකයන්ගේ විශේෂිත හැකියාවන් අපේක්ෂා කිරීම මත රැකියා අවස්ථා සඳහා වන ජාත්‍යන්තර ඉල්ලුම සහ ශ්‍රී ලංකාවේ සැපයුම් හැකියාව අතර විශාල නොගැළපීමක් පවතී. එබැවින්, අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව ඉහළ ගුණාත්මකභාවයකින් යුත් පුහුණුවීම් සපයනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා නිපුණතා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම තුළින් ඉහළ ඉපැයීම් සහිත රැකියා අවස්ථාවන් සුරක්ෂිත වනු ඇත. මීට අමතරව

5

සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ භාෂා ප්‍රවීණතාව වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු විය යුතුය. එමෙන්ම, මැදපෙරදිග කලාපයේ ආර්ථික හා භූ-දේශපාලනික අස්ථාවරත්වයක් වර්ධනය වීමේ පසුබිම හමුවේ එම කලාපයේ රටවල් මත රඳා පැවතීම වෙනුවට නව ශ්‍රම වෙළඳපොළවල් සොයා යෑම සහ සිංගප්පූරුව, ජපානය හා යුරෝපීය රටවල් ඇතුළු අනෙකුත් සංවර්ධිත රටවල් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹීම වැදගත් වේ.

- **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස, ජංගම ගිණුමේ හිඟය 2017 වසරේදී සියයට 3.0 දක්වා පුළුල් වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබුණද, එය 2018 වසරේ දී සියයට 2.5 ක් දක්වා වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ දෙවන භාගයේ දී අපනයනවල ඉහළ යෑමක් සහ ආනයනවල සුළු වර්ධනයක් සඳහා වන අපේක්ෂාවන් සමඟ, 2017 වසරේ දෙවන භාගයේ දී වෙළඳ හිඟය සුළු වශයෙන් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ ගිණුමෙහි වන මෙම යහපත් ප්‍රවණතාවය 2018 වසරේ දී ද අඛණ්ඩව තවදුරටත් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. අඩු වර්ධනයක් සහිත සංචාරක ඉපැයීම් හේතුවෙන් 2017 වසරේ දී සේවා ගිණුම වෙත වන ලැබීම් අඩු ප්‍රමාණයකින් වුව ද වර්ධනය වේ යැයි අපේක්ෂිත අතර, එය 2018 වසරේ දී වඩා ඉහළ වේගයකින් වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. මැදපෙරදිග කලාපයේ ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වයෙහි වන අහිතකර වාතාවරණය හේතුවෙන් 2017 වසරේ දී පහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ දී යම් වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපනයන විවිධාංගීකරණය සීමිත වීම, වෙළඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයන් මූල්‍යනය කිරීම සඳහා සංචාරක ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත දැඩි ලෙස රඳා පැවතීම, ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය අඩු කිරීම සම්බන්ධයෙන් පවතින අභියෝග වේ.

- **2017 වසර තුළ දී සහ ඉන් පසුව මූල්‍ය ගිණුම ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2017 වසරේ දෙවන භාගයේ මේ දක්වා කාලය තුළ දී විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් වූ ලැබීම් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ලැබීම් සමඟ මූල්‍ය ගිණුම ශක්තිමත් විය. රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වන විදේශ ආයෝජන ලැබීම් වර්තමානයේ දී පවතින හිතකර ප්‍රවණතාව 2018 වසරේ දී ද අඛණ්ඩව පවතිනු ඇතැයි ද, කොළඹ කොටස් වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන වඩා වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එකිනෙකට ගැළපෙන ප්‍රතිපත්ති, දේශපාලනික ස්ථාවරභාවය සහ ස්ථායී සාර්ව ආර්ථික වටපිටාව හේතුවෙන් විදේශීය ඍජු ආයෝජන වැනි ණය නොවන මූලාශ්‍ර මගින් වන ලැබීම් ඉහළ යෑමත් සමඟ 2018 වසරේ දී මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවත්, එක්සත් ජනපදයේ සිදු විය හැකි පොලී අනුපාත ඉහළ යෑම සහ බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඇතුළු ලෝකය පුරා සිදු විය හැකි අපේක්ෂිත වර්ධනයන් හමුවේ මූල්‍ය ගිණුම වෙත ලැබීම් ආකර්ෂණය කර ගැනීම අභියෝගාත්මක විය හැකිය.

5

# 6

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු

ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව කෙරෙහි රජයේ කැපවීම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය මූල්‍ය අංශයේ යම් වර්ධනයක් දැකිය හැකි විය. විශේෂයෙන්ම එකතු කළ අගය මත බද්ද ඇතුළු බදු ආදායම් ඉහළ යෑම හේතු කොට ගෙන රජයේ ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මෙම කාලපරිච්ඡේදයේදී සියයට 9.0 ක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.2 ක් විය. 2017 පළමු මාස අට තුළදී මුළු වියදම හා ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 12.2 ට සාපේක්ෂව සියයට 13.0 ක් දක්වා වැඩි වූ අතර පුනරාවර්තන වියදම් සහ රාජ්‍ය ආයෝජන වැඩි වීම ඒ සඳහා හේතු විය. රාජ්‍ය ආදායමේ වැඩි වීමට වඩා රාජ්‍ය වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 3.9 සිට සියයට 4.0 ක් දක්වා වැඩි විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස අට තුළදී රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.2 සිට සියයට 0.9 ක් දක්වා අඩු විය. 2017 වසරේ අයවැය මෙහෙයුම් කටයුතු තුළ දක්නට ලැබුණු විශේෂිතම ලක්ෂණය වන්නේ පළමු මාස 6 තුළදී ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමට හැකි වීමයි. ආදායම සහ පොලී නොවන වියදම් අතර පරතරය පිළිබිඹු කෙරෙන ප්‍රාථමික ගිණුමේ 2017 ජූනි මාසය වන විට වාර්තා වූ රුපියල් බිලියන 16.1 ක අතිරික්තය මගින් මේ වසරේ අයවැය මෙහෙයුම් කටයුතුවල කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ රාජ්‍ය මූල්‍ය අංශය සඳහා වන ප්‍රමාණාත්මක කාර්යසාධන ඉලක්කයද සපුරාලන ලදී. කෙසේ වුවද, ප්‍රාථමික ගිණුමේ පැවති අතිරික්තය ගංවතුර සහ නියඟයට අදාළ වියදම් හේතුකොට ගෙන 2017 අගෝස්තු මස වන විට රුපියල් බිලියන 1.6 ක හිඟයක් දක්වා අඩු විය. සමස්ත අයවැය හිඟය මූල්‍යනය කිරීමේදී දේශීය මූලාශ්‍ර මත මෙන්ම විදේශ මූලාශ්‍ර මතද රඳා පැවතීමට සිදු විය. දේශීය වශයෙන් මූල්‍යනය කිරීමේදී බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2017 පළමු මාස අට තුළදී, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ රුපියල් බිලියන 138.1 සිට රුපියල් බිලියන 236.5 ක් දක්වා වැඩි වුවද, 2017 පළමු මාස අට තුළදී බැංකු නොවන අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ රුපියල් බිලියන 171.4 සිට රුපියල් බිලියන 37.0 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. රාජ්‍ය මූල්‍ය අංශයේ යම් වර්ධනයක් පෙන්නුම් කළද, 2017 අයවැයෙහි සඳහන් රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීම අභියෝගාත්මක වනු ඇත. නව දේශීය ආදායම් පනත ක්‍රියාවට නැංවීම ප්‍රමාද වීම, ආනයන තීරුබදු සහ මත්පැන් හා දුම්වැටිවලින් ලබා ගන්නා සුරා බදු අඩු වීම, පොලී ගෙවීම සඳහා සහ නියඟය හා ගංවතුර සඳහා වන සහනාධාර සඳහා රාජ්‍ය වියදම් ඉහළ යෑම හේතුකොට ගෙන 2017 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඩාල විය හැකිය.

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

- **අයවැය හිඟය සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය මැදිකාලීනව ක්‍රමයෙන් අඩු කිරීමේ අරමුණින් රජය ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය 2017 වසර තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** මැදිකාලීන රාමුව අනුව 2020 වන විට, අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 දක්වා සහ රාජ්‍ය ණය තිරසාර මට්ටමකට අඩු කර ගැනීමට අපේක්ෂිතය. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා රජයේ ආදායම ඉහළ නංවා ගැනීමට සහ පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීමට මෙන්ම රාජ්‍ය ආයෝජන තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, දැනට පවතින ආදායම් බදු ව්‍යුහය සරල කිරීම සහ බදු පදනම පුළුල් කිරීම සිදු කරන අතරම, බදු පරිපාලනය සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ අරමුණින් යුතුව නව දේශීය ආදායම් පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 07 දින සම්මත කරන ලදී. මීට අමතරව, බදු ගෙවන්නන් හට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ බදු වර්ග කිහිපයක් සඳහා අන්තර්ජාලය ඔස්සේ බදු ගෙවීම් කළ හැකි විය. මීට අමතරව, රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමට පාර්ලිමේන්තුවට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා 2017 අයවැය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි 2017 වසරේ පළමු සහ දෙවන කාර්තු සඳහා වන කාර්තුමය වියදම් සහ ආදායම් තත්ත්වයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. තවද, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව සඳහා වන ජාතික නියෝජිතායතනය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ස්ථාපිත කරන ලදී. රාජ්‍ය ව්‍යවසාය පාලනය සහ මූල්‍ය විනය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසාය 5 ක් සමඟ ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කළ අතර, රජය සතු තවත් වාණිජ ව්‍යවසාය 10 ක් සමඟද ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කිරීමට අපේක්ෂිතය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විනිවිදභාවය වැඩි කිරීම සඳහා වසර තුළදී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලද අතර, වගකීම් කළමනාකරණය වඩාත් ක්‍රමවත් කිරීම සඳහා රාජ්‍ය වගකීම් කළමනාකරණ පනත කෙටුම්පත් කෙරෙමින් පවතී. මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීම සඳහා 2016 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.4 ක පැවති අයවැය හිඟය 2017 වසරේදී සියයට 4.6 ක් දක්වා අඩු කර ගැනීමට අපේක්ෂා කරන බව 2017 අයවැයේදී සඳහන් කරන ලදී. තවද, අයවැයෙහි වර්තන ගිණුමේ ශේෂය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.5 ක අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම, 2017 වසර තුළ දී ප්‍රාථමික ගිණුමේ ශේෂයද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ධන අගයක, එනම්, 0.4 ක අතිරික්තයක් බවට පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- **සෘජු බදු අනුපාතය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව නව දේශීය ආදායම් පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් 07 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදී.** නව පනත මගින් දැනට පවතින ආදායම් බදු ව්‍යුහය සරල සහ තාර්කිකරණය කිරීම, බදු අත්හැරීම් ඉවත් කිරීම මගින් ආදායම් බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම මෙන්ම සෘජු බදු ආදායම ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කෙරේ. පුද්ගල ආදායම් බදු අංශය සැලකීමේදී, බදු නිදහස් සීමාව දැනට පවතින රුපියල් 500,000 මට්ටමේ පවත්වා ගැනීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත්, සේවා නියුක්ති ආදායම සැලකීමේදී, බදු නිදහස් සීමාව දැනට පවතින රුපියල් 750,000 සිට රුපියල් මිලියන 1.2 දක්වා වැඩි කෙරෙනු ඇත. ස්ථර තුනකින් යුත් බදු ව්‍යුහයක් හඳුන්වා දීමත් සමඟ සංස්ථාපිත ආදායම් බදු ව්‍යුහයද විධිමත් කෙරෙනු ඇත. ඒ අනුව, මත්පැන්, දුම්කොළ, ලොතරැයි සහ ඔට්ටු හා සූදු සඳහා සියයට 40 ක්, බැංකු, මූල්‍ය, රක්ෂණ ව්‍යාපාර සහ වෙළඳ කටයුතු සඳහා සියයට 28 ක් සහ අනෙකුත් අංශ සඳහා සියයට 14 ක් ලෙසින් සංස්ථාපිත ආදායම් බදු ව්‍යුහය වෙනස් වනු ඇත. මීට අමතරව, ප්‍රාග්ධන වත්කම් විකිණීමේදී ලැබෙන ලාභ මත සියයට 10 ක අනුපාතයකින් ප්‍රාග්ධන ලාභ බද්ද හඳුන්වා දීමට යෝජනා කර ඇත. තවද, නේවාසික පුද්ගලයන්ගේ පොලී ආදායම මත බදු අනුපාතිකය දැනට පවතින සියයට 2.5 සිට සියයට 5 දක්වා ඉහළ නංවනු ඇති අතර, බදු පදනම පුළුල් කිරීමේ අරමුණින් විශේෂ ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා සියයට 5 ක සහ සියයට 14 ක අනුපාතයකින් රඳවා ගැනීමේ බදු හඳුන්වා දෙනු ඇත. මේ අතර, ආර්ථික සේවා ගාස්තු සඳහා 2017 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධන කිහිපයක් සිදු කරන ලදී. ඒ අනුව, ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 12.5 දක්වා අඩු කරන ලදී. තවද, සෑම ආනයනික මෝටර් වාහන තොගයක්

6

සඳහාම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරන ලද පිරිවැය, රක්ෂණ, නැව් ගාස්තු අගය (CIF Value) මත ආර්ථික සේවා ගාස්තු අය කරනු ලැබේ.

- **එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 2016 ඔක්තෝබර් මාසයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.** ඒ අනුව, 2016 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 11 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී.[1] බදු අනුපාතික සංශෝධනය කිරීමට අමතරව, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු උපරිම සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට කාර්තුවකට රුපියල් මිලියන 3 දක්වා අඩු කරන ලදී. තවද, එකතු කළ අගය මත බදු පදනම පුළුල් කිරීමේ අරමුණින්, මද්‍යසාර, දුම්වැටි, ගල් අඟුරු, සුවඳ විලවුන්, විදුලි සහ විද්‍යුත් උපකරණ සහ විදුලි සංදේශ උපකරණ වැනි භාණ්ඩ කිහිපයක් මත එකතු කළ අගය මත බදු පනවන ලදී. එකතු කළ අගය මත බදු සංශෝධනය කිරීමෙන් ආදායම් උත්පාදනය මත ඇති වන සම්පූර්ණ බලපෑම 2017 වසරේදී දක්නට ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2016 නොවැම්බර් 01 දින සිට එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් වෙනස්කම්වලට අමතරව, 2017 වසර සඳහා වන අයවැය මගින්ද තවත් ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කර ඇත. පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා වන පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපාංග, ශාරීරික සත්කාර සහ දරුවන් රැක බලා ගැනීමේ සේවා සැපයීම සහ සමහර විදුලි උපාංග එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට යෝජනා කර ඇති අතර, මෙම යෝජනා හා සම්බන්ධව එකතු කළ අගය මත බදු පනතට සිදු කළ යුතු සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

- **ජාතිය ගොඩ නැගීමේ බදු ආදායම ඉහළ නැංවීම සඳහා 2016 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතිය ගොඩනැගීමේ බදු පනතට සංශෝධන කිහිපයක් සිදු කර ඇත.** ඒ අනුව, ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි විය යුතු උපරිම සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3.75 සිට රුපියල් මිලියන 3 දක්වා අඩු කර ඇති අතර, විදුලි සංදේශ, විදුලි සැපයුම් සහ ලිහිසි ද්‍රව්‍ය සඳහා වූ ජාතිය ගොඩනැගීමේ බදු අත්හැරීම් ඉවත් කර ඇත. තවද, 2017 වසර සඳහා වන අයවැය මගින් යෝජනා කර ඇති පරිදි අන්තර්ජාතික ප්‍රවාහන සේවා, නිවාස සංකීර්ණ සැපයීම සහ සමූපකාර සමිති හෝ ලක් සතොස මගින් භාණ්ඩ හෝ සේවා සැපයීම මත වූ ජාතිය ගොඩනැගීමේ බදු අත්හැරීම් 2017 අගෝස්තු 01 දින සිට ඉවත් කර ඇත.

- **සංයෝජිත වර්ගීකරණ සංකේත[2] සහ ඇතැම් තීරු බදු අයිතම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේද අනුව සංශෝධනය කෙරිණි.** ඒ අනුව, ලෝක රේගු සංවිධානයේ මග පෙන්වීම අනුව සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා ජාතික උප වර්ගීකරණ නිර්මාණය කර ඇති අතර, ලෝක වෙළඳ සංවිධානය සමඟ එකඟ වූ පරිදි 2016 නොවැම්බර් මාසයේදී තීරු බදු අයිතම 96 ක් සංශෝධනය කර ඇත. මීට අමතරව, 2016 නොවැම්බර් 11 දින සිට බලපැවැත්වෙන පරිදි මුද්‍රිත පොත්, සඟරා, ජර්නල් සහ වාර සඟරා මත වූ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු ඉවත් කරන ලද අතර, ඇතැම් ඖෂධ නිෂ්පාදන මත වූ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 2.5 දක්වා අඩු කරන ලදී.

- **අස්වනු කාලය තුළදී දේශීය කෘෂි නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සහ දේශීය වෙළඳපොළ මිල උච්චාවචන අවම කිරීම සඳහා ආහාර ද්‍රව්‍ය කිහිපයක ආනයන මත වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 වසර තුළදී වරින් වර සංශෝධනය කරන ලදී.** ඒ අනුව, 2017 ජනවාරි 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි කැකුළු සහල්, නාඩු සහල් සහ සම්බා සහල් ආනයන මත කිලෝග්‍රෑමයට රුපියල් 15 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. කෙසේ වෙතත්, එම අගය 2017 ජනවාරි 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා සහ 2017 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝග්‍රෑමයට ශත 25 දක්වා අඩු කරන ලද අතර, රටේ දිස්ත්‍රික්ක කිහිපයක පැවති නියඟය හේතුවෙන් දේශීය වෙළඳපොළට සහල් සැපයීම අඩු වීම මේ සඳහා හේතු විය. ඊට අමතරව, 2017 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි එළවළු තෙල් ආනයන මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 20 කින් අඩු කරන ලදී. 2017 පෙබරවාරි 24 දින සිට ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන

1 2016 අංක 20 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත අනුව මෙම ක්‍රියාමාර්ග වලංගු වන්නේ 2016 මැයි 02 දින සිට 2016 ජූලි 11 දක්වා කාලය සඳහා සහ 2016 නොවැම්බර් 01 දිනෙන් පසුවය.

2 සංයෝජිත වර්ගීකරණ සංකේත ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන සංයෝජිත වර්ගීකරණ භාණ්ඩ විස්තර සහ සංකේත පද්ධතිය ලෝක රේගු සංවිධානය විසින් ජාත්‍යන්තරව භාණ්ඩ නාමනය කිරීම සඳහා හඳුන්වාදී ඇති බහුකාර්ය පද්ධතියකි.

පරිදි එම අගය තවත් රුපියල් 20 කින් අඩු කරන ලදී. තවද, කරවල, යෝගට්, බටර්, සුදු ළූණු, දොඩම් ඇපල්, ලූණු, කුරක්කන් පිටි ඇතුළු අයිතම 12 ක් සඳහා අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අප්‍රේල් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. මේ අතර, මාළු, මුං ඇට, මැංගුස්ටින්, වියළි දොඩම්, කිවි ෆෘට්, පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 මැයි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

- **ආදායම් එක්රැස් කරනු ලබන ආයතන ශක්තිමත් කිරීමේ අරමුණින් 2017 අයවැය මගින් බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී.** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත කර ඇති ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) යටතේ 2017 මාර්තු මස සිට ලියාපදිංචි බදු ගෙවන්නන් හට පුද්ගල සහ හවුල් ව්‍යාපාර ආදායම් සඳහා වන බදු ගෙවීම් අන්තර් ජාලය ඔස්සේ බැංකු හරහා එම පද්ධතිය වෙත සිදු කළ හැකිය. මේ අතර, මූල්‍ය සේවා සඳහා වන එකතු කළ අගය මත බදු ගෙවීම් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා සිදු කිරීම 2017 සැප්තැම්බර් මාසයේදී ආරම්භ විය. එයට අමතරව, බදු ගෙවන්නන්ට පහසුකම් සැලසීම සඳහා එකතු කළ අගය මත බදු, සරල කරන ලද එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, උපයන විට ගෙවීමේ බදු සහ සංස්ථාපිත ආදායම් බදු සඳහා අන්තර්ජාලය පදනම් කරගත් උපදෙස් සහ අන්තර්ජාලය පදනම් කරගත් අනෙකුත් සේවා සැපයීම්ද ආරම්භ කරන ලදී. මේ අතර, ආනයන සහ අපනයනකරුවන් හට වඩාත් උසස් සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා රේගුවද ජාතික තනි ප්‍රවේශ පද්ධතිය ස්ථාපිත කිරීමට මූලික පියවර ගෙන ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කර ඇති ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා අයවැය සම්පාදනය, අයවැය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ආදායම් වියදම් ගණනය, භාණ්ඩාගාර කටයුතු හා මුදල් පරිපාලනය ආදී ප්‍රධාන භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය නවීකරණය කිරීමට අපේක්ෂා කෙරෙන අතර මූල්‍ය වාර්තා සම්පාදනයේදී රජයට සහාය වනු ඇත. තෝරාගත් අමාත්‍යාංශ කිහිපයක් සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය 2017 අවසන් කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත්, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වියදම් දරන අනෙකුත් රාජ්‍ය ආයතන ආවරණය කරමින් මෙම පද්ධතිය ක්‍රියාත්මක වීම 2018 වර්ෂයේ සිට ක්‍රමිකව සිදු වනු ඇතැයි අපේක්ෂිතය. අයවැය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධතාව ශක්තිමත් කිරීම, බැඳීම් ගිණුම්ගත කිරීම (Commitment Accounting) ක්‍රියාත්මක කිරීම, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ගෙවීම් මධ්‍යගත කිරීම, උපචිත ගිණුම්කරණය වෙත යොමු වීම සහ ඒකාබද්ධ ගිණුම් සටහන (Unified Chart of Accounts) ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය උපකාරී වනු ඇත.

- **වියදම් අංශය සැලකීමේදී, රාජ්‍ය මූල්‍ය ඉලක්ක වෙතින් අපගමනය වීම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමට පාර්ලිමේන්තුවට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා 2017 අයවැය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි 2017 වසරේ පළමු සහ දෙවන කාර්තු සඳහා වන කාර්තුමය වියදම් සහ ආදායම් කාර්යසාධනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙමගින්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය හා සමගාමීව කිසියම් කාර්තුවක ආදායම් හිඟ වීමකදී පාර්ලිමේන්තුවේ අනුමැතියද සහිතව වියදම් නැවත ගැලපීමට රජයට හැකියාවක් ලැබෙනු ඇත. එම වාර්තාවලට අනුව 2017 වසරේ පළමු සහ දෙවන කාර්තු සඳහා වන ආදායම් සහ වියදම් කාර්යසාධනය පිළිබඳ වාර්තා ඉලක්කගත අගයට වඩා අඩු අගයක පැවතුණි. ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2017 යටතේ, වියදම් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පවත්වා ගැනීමේ අරමුණින් වියදම් දරන ආයතන සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳව අඛණ්ඩව අධීක්ෂණය කිරීමට තීරණය කර ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ස්ථාපිත කරන ලද අයවැය ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කමිටුව මගින් තෝරාගත් අමාත්‍යාංශ දාහතරක ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල කාර්යසාධනය අධීක්ෂණය කරන ලදී. රාජ්‍ය වියදම් තාර්කිකරණය කිරීම සඳහා එහි ප්‍රගතිය අනුව මාසිකව අවශ්‍ය කරනු ලබන මුදල් ප්‍රමාණය ලබා දෙන ලදී.

- **රජයේ විශ්‍රාමික නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතරම රජය විසින් ත්‍රිවිධ හමුදාවේ ආබාධිත නිලධාරීන්**

6

**සඳහා "රණවිරු සුරැකුම් දීමනාව" ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමත් වසර 10/12 සේවා කාලය සම්පූර්ණ නොකළ ආරක්ෂක අංශ සේවකයන්ට විශ්‍රාම වැටුප් ලබා දීමටත් කටයුතු කරන ලදී.** ඒ අනුව, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2017 යටතේ 2017 ජනවාරි 01 දින සිට ත්‍රිවිධ හමුදා නිලධාරීන් "රණවිරු සුරැකුම් දීමනාව" සඳහා හිමිකම් ලබයි. මෙම දීමනාව ත්‍රිවිධ හමුදාවන්හි සේවය කර (අ) සේවා කාලය තුළදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ අයට (ආ) ඔවුන්ගේ මරණින් පසුව ඔවුන්ගේ කලත්‍රයාට සහ (ඇ) ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් මරණයට පත් වූ යුධ විරුවන්ගේ වැන්දඹුවන්ට විශ්‍රාම වැටුප සමඟ ස්ථාවර දීමනාවක් වශයෙන් ලබා දෙයි. තවද, වසර 10/12 සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වී විශ්‍රාම ගන්වනු ලැබූ ආරක්ෂක අංශ සේවකයන්ටද විශ්‍රාම වැටුප් ලබා දෙන ලදී. ඒ අනුව, ත්‍රිවිධ හමුදා සේවයේ සහ පොලිස් සේවයේ වසර 10 ක් සම්පූර්ණ නොකළ නිලධාරීන්ට සහ සන්නද්ධ හමුදා සේවයේ වසර 12 ක් සම්පූර්ණ නොකළ සෙසු නිල සඳහා විශ්‍රාම වැටුප් ලබා දෙන ලදී. එයට අමතරව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2017 යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු 61 දක්වා දීර්ඝ කරන ලදී.

- **ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් රජය 2017 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කළේය.** ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළදී පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ කඩවත සිට කෙරවලපිටිය දක්වා වන III අදියර සහ දක්ෂිණ අධිවේගී මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ මාතර සිට හම්බන්තොට දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතුද අඛණ්ඩව ක්‍රියාත්මක විය. තවද, මෙම කාලය තුළදී මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට දඹුල්ල දක්වා කොටසේ සහ පොතුහැර සිට ගලගෙදර දක්වා සම්බන්ධිත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීම්වලට අදාළ ආයෝජනද සිදු කරන ලදී. මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා වන II අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2017 වසරේ මුල් කාලයේදී ආරම්භ විය. ඒ අතර, සෞඛ්‍ය අංශය සඳහා වන රජයේ ආයෝජන, ප්‍රධාන වශයෙන්ම රෝහල් ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම කෙරෙහි යොමු වූ අතර, 2017 වසරේ පළමු මාස අට තුළදී අධ්‍යාපන යටිතල පහසුකම් සඳහා වන ආයෝජන "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ මානව සම්පත් සහ භෞතික යටිතල පහසුකම් සඳහා වන ආයෝජන දියුණු කිරීම සඳහා යොමු විය.

- **රාජ්‍ය ආයෝජන සිදු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හේතුවෙන්, රටේ යටිතල පහසුකම් අවශ්‍යතාව සපුරාලීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය, ජාතික උපායමාර්ගයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2017 වසරේදී රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව සඳහා වන ජාතික නියෝජිතායතනය පිහිටුවන ලදී.** රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා වන ජාතික ආයතනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කළ හැකි සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශවල උපදෙස් මත අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම සහ ලංසු කැඳවීම හා ආයෝජකයන් තෝරාගැනීම සඳහා ප්‍රමාණවත් නෛතික, පරිපාලනමය හා මූල්‍යමය බලය ඇති කේන්ද්‍රීය ආයතනයක් පිහිටුවීමයි. මෙම කේන්ද්‍රීය ආයතනය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ස්ථාපිත කර ඇත.

- **රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායවල මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීම සඳහා 2017 වසරේ පළමු මාස අට තුළදී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ඒ අනුව, රාජ්‍ය ව්‍යවසාය පාලනය සහ මූල්‍ය විනය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසාය පහක් වන ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ 2017 මාර්තු මසදී ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කරන ලදී. තවද, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රජය සතු තවත් වාණිජ ව්‍යවසාය දහයක් සමඟද ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කිරීමට අපේක්ෂිත අතර නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය දැව සංස්ථාව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මිල්කෝ සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, ලංකා සතොස ආයතනය සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව එම ආයතන වේ.

6

- **ආර්ථිකය පිළිබඳ ආයෝජකයන්ගේ අඛණ්ඩ විශ්වාසය සහ සාධනීය ඉදිරි දැක්ම පිළිබිඹු කරමින් රජය විසින් සිය එකොළොස්වෙනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කරන ලදී.** මේ අනුව, 2017 මැයි මාසයේදී සියයට 6.20 ක වාර්ෂික ඵලදා අනුපාතිකයක් යටතේ අවුරුදු 10 ක කල් පිරීමේ කාලයක් සහිතව එ.ජ.ඩොලර් බිලියන 1.5 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කිරීමට රජයට හැකි විය. එයට අමතරව, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලෙස වසර තුළදී එ.ජ.ඩොලර් බිලියන 1.0 ක මුදලක් ලබා ගන්නා ලද අතර එම මුදල් 2017 මැයි මාසයේදී එ.ජ.ඩොලර් මිලියන 450 ක් සහ 2017 අගෝස්තු මාසයේදී එ.ජ.ඩොලර් මිලියන 550 ක් වශයෙන් අවස්ථා දෙකකදී ලැබුණි.

- **යහපත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයට සහයෝගය දැක්වීම සඳහා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විනිවිදභාවය වර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති ගණනාවක් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, 2017 අප්‍රේල් 26 වැනි දින සිට රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සඳහා වන ඉලෙක්ට්‍රොනික බැඳුම්කර වෙළඳ පද්ධතියක් වන බ්ලූම්බර්ග් (Bloomberg) හා සම්බන්ධ වන ලෙස මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් සහ බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. ප්‍රාථමික වෙළඳුන් විසින් ඔවුන් අතර සිදුවන මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සහ ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවලදී එය වෙළඳ පද්ධතිය හරහා සිදු කළ යුතු අතර ප්‍රාථමික අලෙවිකරුවන් ආයෝජකයන් සමඟ සිදු කරනු ලබන රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි සියලුම විකුණුම් හා අදාළ තොරතුරු විනාඩි 30 ක් ඇතුළත එම පද්ධතිය වෙත වාර්තා කිරීමට අවශ්‍ය වේ. වෙළඳපොළ සහභාගිවන්නන්ගේ පහසුව පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් දින, සතියක සහ සති දෙකක කාල පරාසයක ප්‍රතිමිලදී ගැනීම් ප්‍රමාණයන් සහ ඵලදා අනුපාතික පිළිබඳ වෙළඳ තොරතුරු සහිත සාරාංශයක් දිනපතා නිකුත් කරනු ලබයි. මෙම ක්‍රියාමාර්ග මගින් විනිවිදභාවය වැඩිදියුණු වන අතර, මිල ගණන් දැන ගැනීමට පහසුකම් සැලසීම සහ වෙළඳපොළ ද්‍රවශීලතාව හා ව්‍යාප්තිය වැඩි කිරීම මගින් ණය ගැනීම සඳහා වන පිරිවැය මැදිකාලීනව අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ. 2017 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුතු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. 2015 වසරේ පෙබරවාරි මාසයේ සිට සම්පූර්ණ වෙන්දේසි ක්‍රමය මත පදනම්ව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමය වෙනුවට මෙම නව ක්‍රමය භාවිතා වේ. වඩාත් ව්‍යුහාත්මක ලෙස සැකසූ මෙම නව ක්‍රමයට මාසික භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි ඇතුළත් වේ. සෑම මාසික නිකුතුවකදීම විවිධ කල්පිරීම් කාල සහිත භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ දෙකක් ඉදිරිපත් කෙරෙන අතර එම කාණ්ඩවල පරිණත කාලයන් වෙළඳපොළ තුළ පවතින සම්පත් හා ගැළපීම අපේක්ෂා කෙරේ. එක් එක් පූර්ව අදියරේ ප්‍රතිඵලය මත රඳා පවතින, එක් එක් කාණ්ඩය යටතේ වන නිකුත් කිරීම්, අනුක්‍රමික අදියර තුනක් හෝ ඊට අඩු අදියර ගණනක් තුළ ක්‍රියාත්මක වේ. පළමුවන අදියර යටතේ සාධාරණ වෙළඳපොළ ලංසු ඔස්සේ තරගකාරී බහුවිධ මිල වෙන්දේසි ක්‍රමයක් තුළ නිවේදනය කරන ලද සම්පූර්ණ වටිනාකම නිකුත් කිරීමට උත්සාහ කෙරේ. කෙසේ වුවද, පළමු අදියරේදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් ලබා ගැනීමට තීරණය වුවහොත්, දෙවන අදියර පරිමාව මත පදනම් වූ ස්වේච්ඡා මිල කැඳවීම් සඳහා විවෘත කරනු ලබයි. දෙවන අදියර යටතේ නිකුත් කිරීම්, පළමු අදියරේදී තීරණය වූ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය මත සිදු කරන අතර, පළමු අදියරේදී පිළිගත් ලංසු ප්‍රමාණය සහ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණයන් අතර වෙනසට එය සීමා වේ. සෑම ප්‍රාථමික අලෙවිකරුවෙකු මෙන්ම ප්‍රාථමික නිකුත් කිරීම් සඳහා බලයලත් අනෙකුත් සහභාගිකරුවෝ, දෙවන අදියර යටතේ ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති. පළමුවන සහ දෙවන අදියර යටතේ, අපේක්ෂිත මුදල් ප්‍රමාණයට වඩා අඩුවෙන් එක්රැස් කර ඇති අවස්ථාවලදී එම හිඟය, තුන්වන අදියරේදී අනිවාර්ය පදනමක් මත බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට ප්‍රාථමික අලෙවිකරුවන් අතර පමණක් නිකුත් කෙරේ. ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ඵලදායී සහභාගිත්වය තක්සේරු කිරීම සඳහා නව කාර්යසාධන සමාලෝචන යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. මේ අතර, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහ ආයෝජකයන්ගේ ආයෝජන සැලසුම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාර්තුමය වශයෙන් වූ භාණ්ඩාගාර බැඳුම්කර දින දර්ශනය කල් තියා ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම නව ක්‍රමය හඳුන්වා දීම මගින් රජයේ දේශීය ණය ගැනීම්වල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය තවදුරටත් වර්ධනය වීම සිදු වනු ඇත.

- **ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2017 වසරේදී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්වලට සංශෝධන කිහිපයක් සිදු කරන ලදී.** 2017 පෙබරවාරි 09 වන දින ෆිච් (Fitch) ආයතනය

ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශීය ණය සහ දේශීය ව්‍යවහාර මුදල් ණය පැහැර හැරීමේ ශ්‍රේණිගත කිරීම "B+" දක්වා තහවුරු කළ අතර, රාජ්‍ය මූල්‍ය වැඩිදියුණු වීම, ප්‍රතිපත්තිවල පැහැදිලි බව හා විශ්වසනීයත්වය වැඩිවීම සහ තිරසාර සංවර්ධනය යන කරුණු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ඉදිරි දැක්ම "සෘණාත්මක" සිට "ස්ථාවර" දක්වා සංශෝධනය කරන ලදී. ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (Standard & Poor's) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය 2017 මාර්තු මස 07 වැනි දින "B+" දිගුකාලීන සහ "B" කෙටිකාලීන ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම තහවුරු කරන ලද අතර, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ සිදු වූ වර්ධනයන් ඒ සඳහා හේතු විය. කෙසේ වුවද, එහි ඉදිරි දැක්ම "සෘණාත්මක" ලෙස තවදුරටත් පැවති අතර, විදේශීය අංශයේ දුර්වල කාර්යසාධනය සහ රාජ්‍ය ණය මත විදේශ විනිමය අනුපාතිකයේ බලපෑම ඉහළ යෑම මේ සඳහා හේතු විය. 2017 වසරේ ජූලි 13 දින මූඩීස් (Moody's) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම "B1" ලෙස හා ඉදිරි දැක්ම "සෘණාත්මක" ලෙස තහවුරු කරන ලදී.

## රජයේ අයවැය කටයුතු

### ආදායම සහ ප්‍රදාන

#### ආදායම

- **2017 වසර සඳහා වන ඇස්තමේන්තු අනුව, 2017 වසරේ රජයේ මුළු ආදායම රුපියල් බිලියන 2,010.3 දක්වා සියයට 19.2 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2017 වසරේ මුළු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.9 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය බදු ආදායම සියයට 13.5 කින් සහ බදු නොවන ආදායම සියයට 1.4 කින් සමන්විත වේ.

- **2017 වසරේ පළමු මාස අට තුළදී, රජයේ ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 8.2 සිට සියයට 9.0 දක්වා වැඩි වූ අතර බදු ආදායම ඉහළ යෑම එයට හේතු විය.** ඒ අනුව, මෙම කාලපරිච්ඡේදය තුළදී රජයේ මුළු ආදායම නාමික වශයෙන්, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,013.4 සිට රුපියල් බිලියන 1,172.4 දක්වා සියයට 15.7 කින් වැඩි විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ එකතු කළ අගය මත බද්ද, ඛනිජ තෙල් සහ මෝටර් වාහන මත නිෂ්පාදන බදු, ජාතිය ගොඩනැගීමේ බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද වැනි භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම ඉහළ යෑමයි. මේ අතර, ආදායම් බදු ආදායමද ඉහළ ගිය අතර, ඒ සඳහා හේතු වූයේ ආර්ථික සේවා ගාස්තු ඉහළ යෑමයි. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී මද්‍යසාර, දුම්වැටි සහ දුම්කොළ මත සුරා බදු ආදායම් පහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ මද්‍යසාර සහ දුම්වැටි විකුණුම් පහළ යෑමයි. බදු නොවන ආදායම 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 77.4 දක්වා සියයට 4.9 කින් පහත වැටුණු අතර, ඒ සඳහා රජය සතු වාණිජ ව්‍යවසාය වෙතින් ලද ලාභ සහ ලාභාංශ පහළ යෑම හේතු විය. කෙසේ වුවද, බදු නොවන අනෙකුත් ආදායම් ප්‍රභව වන කුලී ආදායම, පොලී ආදායම, ගාස්තු හා අයකිරීම් සහ සමාජ ආරක්ෂණ දායක මුදල් මගින් ලද ආදායම පසුගිය වසරේ අනුරූප කාලය තුළ සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබිණි. වසරේ පළමු මාස අට තුළදී රැස් කළ මුළු ආදායම, රුපියල් බිලියන 2,010.3 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 58.3 ක් වූ අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එය සියයට 55.6 ක් විය. කෙසේ වුවද, මෙම කාලය තුළදී සාමාන්‍ය මාසික ආදායම 2017 වසර සඳහා වන අයවැය අනුව ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික ආදායම වූ රුපියල් බිලියන 167.5 හා සැසඳීමේදී රුපියල් බිලියන 146.5 ක් විය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී, ආදායම් බදු ආදායම නාමික වශයෙන් සියයට 9.1 කින් වැඩි වූ අතර, ආර්ථික සේවා ගාස්තුවලින් ලද ආදායම ඉහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය.** කෙසේ වුවද, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් බදු ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.3 හි නොවෙනස්ව පැවතුණි. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදුවලින් ලද ආදායම නාමික වශයෙන් රුපියල් බිලියන 82.3 සිට රුපියල් බිලියන 81.2 දක්වා සියයට 1.3 කින් අඩු විය. කෙසේ වුවද, 2017 වසරේ මුල් මාස අට තුළදී උපයන විට ගෙවීමේ බදු ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 18.9 සිට රුපියල් බිලියන 22.4 දක්වා ඉහළ ගිය අතර, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය

6

ස්ථාපිත කිරීම තුළින් උපයන විට ගෙවීමේ බදු හා සම්බන්ධ වාර්තා සැපයීමේ හා ගෙවීම් කිරීමේ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් වීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළදී, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම අඩු වීම හේතුවෙන් රඳවා ගැනීමේ බදු ආදායම රුපියල් බිලියන 36.2 දක්වා සියයට 18.6 කින් පහත වැටිණි. ආර්ථික සේවා ගාස්තු ආදායම 2016 වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 11.1 සිට 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේදී රුපියල් බිලියන 31.2 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ආර්ථික සේවා ගාස්තු අනුපාතිකය සියයට 0.25 සිට සියයට 0.5 දක්වා ඉහළ නැංවීම, රුපියල් මිලියන 120 ක උපරිම බදු වගකීම ඉවත් කිරීම සහ කාර්තුවකට රුපියල් මිලියන 50 ඉක්මවා පිරිවැටුමක් ඇති ලාභ උපයන ව්‍යාපාර සඳහා පැවති ආර්ථික සේවා ගාස්තු නිදහස ඉවත් කිරීම එයට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී එකතු කළ අගය මත බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 1.4 සිට සියයට 2.2 දක්වා වැඩි විය.** මෙම කාලපරිච්ඡේදය තුළදී එකතු කළ අගය මත බදු ආදායම නාමික වශයෙන්ද පෙර වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 175.8 සිට රුපියල් බිලියන 290.0 දක්වා සියයට 65.0 කින් ඉහළ ගියේය. ඒ අනුව, දේශීය ආර්ථික කටයුතුවලින් ලද සහ ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම 2017 වසරේ පළමු මාස අට තුළදී සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. 2016 වසරේ අග භාගයේදී එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 11 සිට සියයට 15 දක්වා ඉහළ නැංවීම, එකතු කළ අගය මත බදු යටතේ ලබාදී තිබූ ඇතැම් බදු නිදහස් කිරීම් 2016 අග භාගයේදී ඉවත් කිරීම මගින් එකතු කළ අගය මත බදු පදනම පුළුල් වීම සහ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ආරම්භ කිරීමත් සමග බදු අනුකූලතාව ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු ආදායම ඉහළ ගියේය. ඒ අනුව, දේශීය ආර්ථික කටයුතුවලින් ලද එකතු කළ අගය මත බදු ආදායම පසුගිය වසරේ මුල් මාස අට තුළ පැවති රුපියල් බිලියන 108.3 සිට රුපියල් බිලියන 181.4 දක්වා සියයට 67.5 කින් වැඩි විය. ඒ හා සමානවම,

**6.1 සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය ආදායම**

රු. බිලියන

| අයිතමය | 2015 | 2016 (අ) | 2017 අනුමත ඇස්තමේන්තු | 2016 ජන-අගෝ (අ) | 2017 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **1,355.8** | **1,463.7** | **1,827.0** | **932.0** | **1,094.9** |
| ආදායම් බදු | 262.6 | 258.9 | 334.6 | 156.7 | 171.0 |
| එකතුකළ අගය මත බදු | 219.7 | 283.5 | 380.0 | 175.8 | 290.0 |
| නිෂ්පාදන බදු | 497.7 | 455.0 | 579.0 | 297.2 | 312.5 |
| ආනයන මත බදු | 132.2 | 156.5 | 165.5 | 100.8 | 92.5 |
| වරාය සහ ගුවන් තොටුපළ බද්ද | 58.6 | 88.8 | 106.0 | 56.7 | 65.6 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 45.0 | 57.4 | 66.0 | 35.4 | 45.0 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 52.3 | 55.8 | 65.0 | 39.9 | 49.2 |
| සෙස් බද්ද | 46.3 | 61.7 | 60.0 | 38.9 | 39.5 |
| අනෙකුත් | 41.4 | 46.1 | 70.9 | 30.6 | 29.5 |
| **බදු නොවන ආදායම** | **99.1** | **222.4** | **183.3** | **81.4** | **77.4** |
| **මුළු ආදායම** | **1,454.9** | **1,686.1** | **2,010.3** | **1,013.4** | **1,172.4** |

මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

(අ) තාවකාලික

මෙම කාලපරිච්ඡේදය තුළදී ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම 2016 වසරේ මුල් මාස අට හා සැසඳීමේදී රුපියල් බිලියන 67.5 සිට රුපියල් බිලියන 108.6 දක්වා සියයට 61.0 කින් වර්ධනය විය. තවද, 2017 වසරේ පළමු මාස අට තුළ එකතු කළ අගය මත බදු ආදායම, මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 18.9 සිට සියයට 26.5 දක්වා වැඩි විය. මේ අතර, 2017 පළමු මාස අට තුළදී මුළු බදු ආදායම සඳහා එකතු කළ අගය මත බදු ආදායමෙහි දායකත්වය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 17.3 සිට සියයට 24.7 දක්වා වැඩි විය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී නිෂ්පාදන බදු/සුරා බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 2.4 හි නොවෙනස්ව පැවතුණි.** කෙසේ වුවද, නාමික වශයෙන් ගත් විට නිෂ්පාදන බදු/සුරා බදු ආදායම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 297.2 සිට රුපියල් බිලියන 312.5 දක්වා සියයට 5.2 කින් ඉහළ ගියේය. 2017 වසරේ පළමු මාස අට තුළදී ඛනිජ තෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම රුපියල් බිලියන 50.1 දක්වා සියයට 35.2 කින් ඉහළ ගිය අතර, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ඉහළ යෑම ඒ සඳහා හේතු විය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළදී මෝටර් වාහන ආනයනය පහත වැටීම් හමුවේ වුවද නිෂ්පාදන බදු අනුපාත සඳහා කරන ලද සංශෝධන හේතුවෙන් පසුගිය වසර හා සැසඳීමේදී මෝටර් වාහන මත වූ නිෂ්පාදන බදු ආදායම රුපියල් බිලියන 129.5 දක්වා

6


සියයට 8.0 කින් වර්ධනය විය. සැර හා මෝල්ට් මද්‍යසාර විකුණුම් පහළ යැම හේතුවෙන් මද්‍යසාර මත වූ සුරා බදු ආදායම 2016 අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 78.3 සිට රුපියල් බිලියන 73.7 දක්වා සියයට 5.9 කින් අඩු විය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී දුම්වැටි විකුණුම් පහළ යැම හේතුවෙන් දුම්කොළ සහ දුම්වැටි මත නිෂ්පාදන බදු ආදායමද රුපියල් බිලියන 54.6 දක්වා සියයට 8.1 කින් අඩු විය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආනයන බදු ආදායම 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ සියයට 0.8 සිට 0.7 දක්වා සුළු වශයෙන් අඩු විය.** 2016 වසරේ පළමු මාස අට හා සැසඳීමේදී ආනයන බදු ආදායම නාමික වශයෙන් රුපියල් බිලියන 100.8 සිට රුපියල් බිලියන 92.5 දක්වා සියයට 8.3 කින් අඩු වී ඇති අතර, ආනයන බදු අදාළ වන ආනයන පහළ යැම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ගොවි ප්‍රජාව ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව භාණ්ඩ කිහිපයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දැමීමත් සමග විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායමද පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 39.9 හා සැසඳීමේදී රුපියල් බිලියන 49.2 දක්වා සියයට 23.4 කින් වැඩි විය.

- **2017 පළමු මාස අට තුළදී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම සහ සෙස් බදු ආදායම නාමික වශයෙන් ඉහළ ගියේය.** ඒ අනුව, ජාතිය ගොඩනැගීමේ බදු ආදායම නාමික වශයෙන් රුපියල් බිලියන 45.0 දක්වා සියයට 27.1 කින් වැඩි විය. මෙම වසරේ පළමු මාස අට තුළදී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.3 හි නොවෙනස්ව පැවතුණි. දේශීය ආර්ථික කටයුතු මත සහ ආනයන මත වූ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2017 පළමු මාස අට තුළදී ඉහළ ගියේය. ඒ අනුව, එක් වර්ෂයකට බද්දට යටත් සීමාව රුපියල් මිලියන 15 ක සිට රුපියල් මිලියන 12 ක් දක්වා අඩු කිරීම සහ 2016 වසරේ අග භාගයේදී[3] බදු නිදහස් කිරීම් කිහිපයක් ඉවත් කිරීම හේතුවෙන් දේශීය ආර්ථික කටයුතු මත ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2016 වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 23.7 සිට රුපියල් බිලියන 32.6 දක්වා සියයට 37.6 කින් ඉහළ ගියේය. ආනයන මත වූ ජාතිය ගොඩනැගීමේ බදු තුළින් ලද ආදායම 2016 වසරේ මුල් මාස අට තුළ පැවති රුපියල් බිලියන 11.7 සිට රුපියල් බිලියන 12.4 දක්වා සියයට 6.0 කින් වැඩි විය. වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 56.7 සිට රුපියල් බිලියන 65.6 දක්වා සියයට 15.8 කින් වැඩි විය. 2017 වසරේ පළමු මාස අට තුළදී සෙස් බදු ආදායමද 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 38.9 සිට රුපියල් බිලියන 39.5 දක්වා සියයට 1.7 කින් වැඩි විය.

**6.1 රූප සටහන**

**රාජ්‍ය ආදායමේ සංයුතිය (2017 ජන. - අගෝ.)**




මූලය : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

- **2017 වසරේ පළමු මාස අට තුළදී, බදු නොවන ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.7 සිට සියයට 0.6 දක්වා පහත වැටිණි.** එමෙන්ම, බදු නොවන ආදායම නාමික වශයෙන්ද පහළ ගිය අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේදී රුපියල් බිලියන 81.4 සිට රුපියල් බිලියන 77.4 දක්වා සියයට 4.9 කින් අඩු විය. අනෙකුත් බදු නොවන ආදායම් මූලාශ්‍ර වන ගාස්තු හා අය කිරීම්, කුලී ආදායම, පොලී ආදායම සහ සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම ඉහළ යැම හමුවේ වුවද බදු නොවන ආදායම් අඩු වීමට හේතු වූයේ රජය සතු වාණිජ ව්‍යවසාය වෙතින් ලද ලාභ සහ ලාභාංශ පහළ යැමයි. රජය සතු වාණිජ ව්‍යවසාය වෙතින් ලද ලාභ

3 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ (සංශෝධන) බදු පනත අනුව මෙම ක්‍රියාමාර්ග වලංගු වන්නේ 2016 මැයි 02 දින සිට 2016 ජූලි 11 දක්වා සහ 2016 නොවැම්බර් 01 දිනෙන් පසුවය.

6

සහ ලාභාංශ 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 29.9 සිට රුපියල් බිලියන 12.5 දක්වා සියයට 58.4 කින් අඩු විය. මේ සඳහා 2017 වසරේ පළමු මාස අට තුළදී රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායවල දුර්වල මූල්‍ය කාර්යසාධනය ප්‍රධානවම හේතු විය. ගාස්තු සහ අයකිරීම්වලින් ලද ආදායම 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 41.6 දක්වා සියයට 25.0 කින් වැඩි වූ අතර, එයට හේතු වූයේ නැව් නැගීමේ/ගුවන් ගතවීමේ බදු වැඩි කිරීම සහ ගිනි අවි හා බීඩි කොළ මත බලපත්‍ර ගාස්තුවක් පැනවීමයි. කුලී ආදායම සහ පොලී ආදායමද ප්‍රාදේශීය වතු සමාගම්වලින් ලැබෙන කල්බදු කුලීවලින් ලද ආදායම් ඉහළ යෑම සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් සිදු කරන ණය පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන්, පිළිවෙළින්, රුපියල් බිලියන 2.6 සහ රුපියල් බිලියන 4.2 දක්වා සියයට 25.9 කින් සහ 35.2 කින් වැඩි විය.

## ප්‍රදාන

- **2017 වසරේ පළමු මාස අට තුළදී, ලද මුළු විදේශීය ප්‍රදාන වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු විය.** ඒ අනුව, මෙම කාලපරිච්ඡේදයේදී ලද විදේශීය ප්‍රදාන ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 0.7 හා සැසඳීමේදී වර්ධනයක් පෙන්නුම් කළද, 2017 වසර සඳහා වන රුපියල් බිලියන 10.0 ක වාර්ෂික ඇස්තමේන්තුව හා සැසඳීමේදී එය රුපියල් බිලියන 2.3 ක් විය.



## වියදම් සහ ශුද්ධ ණය දීම්

- **2017 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුව අනුව, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ පැවති සියයට 19.7 සිට සියයට 19.6 දක්වා අඩු වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.** 2016 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.8 ක් වූ පුනරාවර්තන වියදම, 2017 වසරේදී සියයට 14.4 දක්වා පහළ යනු ඇතැයිද, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ පැවති සියයට 4.9 සිට සියයට 5.2 දක්වා ඉහළ යනු ඇතැයිද ඇස්තමේන්තු කර ඇත. නාමික වශයෙන්, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් 2016 වසරේ පැවති රුපියල් බිලියන 2,333.9 සිට රුපියල් බිලියන 2,645.3 දක්වා සියයට 13.3 කින් වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2017 වසරේදී පුනරාවර්තන වියදම රුපියල් බිලියන 1,946.0 දක්වා සියයට 10.7 කින් ඉහළ යනු ඇතැයිද, ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 699.3 දක්වා සියයට 21.4 කින් ඉහළ යනු ඇතැයිද අපේක්ෂා කෙරෙයි.

- **2017 වසරේ පළමු මාස අට තුළදී, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 12.2 සිට සියයට 13.0 දක්වා වැඩි වූ අතර පුනරාවර්තන වියදම් මෙන්ම ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්ද වැඩි වීම එයට හේතු විය.** 2017 වසරේ පළමු මාස අට තුළදී, නාමික වශයෙන් මුළු වියදම සහ ශුද්ධ ණය දීම් 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 1,499.1 සිට රුපියල් බිලියන 1,694.9 දක්වා සියයට 13.1 කින් වැඩි විය. 2017 වසරේ පළමු මාස අට තුළදී මුළු වියදම සහ ශුද්ධ ණය දීම් වාර්ෂික ඇස්මේන්තුවෙන් සියයට 64.1 ක් වන අතර එය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ අගයට වඩා ඉහළ අගයකි.

- **2017 වසරේ පළමු මාස අට තුළදී, පුනරාවර්තන වියදම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 9.4 සිට සියයට 10.0 දක්වා වැඩි වූ අතර, පොලී ගෙවීම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** 2017 වසරේ පළමු මාස අට තුළදී,

### 6.2 සංඛ්‍යා සටහන
### ආර්ථික වර්ගීකරණය අනුව වියදම


රු. බිලියන

| අයිතමය | 2015 | 2016 (අ) | 2017 අනුමත ඇස්තමේන්තු | 2016 ජන-අගෝ (අ) | 2017 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,701.7** | **1,757.8** | **1,946.0** | **1,159.5** | **1,294.4** |
| *එයින්* වැටුප් හා වේතන | 561.7 | 576.5 | 615.0 | 378.9 | 392.5 |
| පොලී ගෙවීම් | 509.7 | 610.9 | 680.1 | 414.6 | 518.6 |
| විදේශීය | 115.4 | 126.7 | 123.3 | 71.9 | 97.6 |
| දේශීය | 394.3 | 484.2 | 556.8 | 342.7 | 421.0 |
| සමෘද්ධි දීමනා | 40.0 | 40.7 | 44.0 | 27.3 | 26.6 |
| විශ්‍රාම වැටුප් | 155.3 | 171.9 | 180.8 | 113.5 | 120.3 |
| පොහොර සහනාධාර | 49.6 | 27.8 | 36.5 | 20.6 | 16.8 |
| **ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම්** | **588.7** | **576.1** | **699.3** | **339.7** | **400.5** |
| **මුළු වියදම හා ශුද්ධ ණය දීම්** | **2,290.4** | **2,333.9** | **2,645.3** | **1,499.1** | **1,694.9** |

(අ) තාවකාලික

මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**6.2 රූප සටහන**
**රාජ්‍ය වියදමේ සංයුතිය (2017 ජන. - අගෝ.)**




මූලය : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

නාමික වශයෙන් පුනරාවර්තන වියදම 2016 අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,159.5 හා සැසඳීමේදී රුපියල් බිලියන 1,294.4 දක්වා සියයට 11.6 කින් වැඩි විය. 2017 වසරේ පළමු මාස අට තුළදී, පොලී ගෙවීම් සඳහා වූ වියදම 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 414.6 සිට රුපියල් බිලියන 518.6 දක්වා සියයට 25.1 කින් වැඩි වූ අතර, දේශීය වෙළඳපොළ තුළ සාපේක්ෂව ඉහළ පොලී අනුපාතික පැවතීම සහ ජාත්‍යන්තර පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යෑම හේතුවෙන් විචල්‍ය පොලී අනුපාතික යටතේ ලබා ගත් විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වැටුප් හා වේතන වියදම රුපියල් බිලියන 392.5 දක්වා සියයට 3.6 කින් ඉහළ ගිය අතර, විශ්‍රාම වැටුප් ගෙවීම්ද රුපියල් බිලියන 120.3 දක්වා සියයට 5.9 කින් වැඩි විය. එසේම පොහොර සහනාධාර වියදම තාර්කිකරණය කිරීමේ සාර්ථකත්වය පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළදී පොහොර සහනාධාරය සඳහා වන වියදම රුපියල් බිලියන 16.8 දක්වා සියයට 18.2 කින් අඩු විය.


- **2017 වසරේ පළමු මාස අට තුළදී, ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 2.8 සිට සියයට 3.1 දක්වා වැඩි විය.** නාමික වශයෙන්, ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 400.5 දක්වා සියයට 17.9 කින් වැඩි විය. සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ සියයට 39.5 හා සැසඳීමේදී සියයට 57.3 ක් විය.

## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ

- **2017 වසරේ පළමු මාස අට තුළ දී අයවැය හිඟය සුළු වශයෙන් ඉහළ ගියද, වර්තන හා ප්‍රාථමික ගිණුම්වල වර්ධනයක් දක්නට ලැබුණි.** ඒ අනුව, 2017 වසරේ පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ පළමු මාස අට තුළදී පැවති සියයට 3.9 සිට සියයට 4.0 දක්වා වැඩි විය. නාමික වශයෙන් ගත් කල, 2017 වසරේ පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 485.1 සිට රුපියල් බිලියන 520.2 දක්වා වැඩි විය. 2017 පළමු මාස අට තුළදී රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.2 සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.9 දක්වා අඩු විය. ප්‍රාථමික ගිණුමේ හිඟය (පොලී ගෙවීම් රහිත අයවැය හිඟය) පෙර වසරේ වාර්තා වූ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.6 ක හිඟයට (හිඟය රුපියල් බිලියන 70.5) සාපේක්ෂව මෙම වසරේ පළමු මාස අට තුළදී ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.0 (හිඟය රුපියල් බිලියන 1.6) ක් විය.

6

**6.3 රූප සටහන**
**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක**



## අයවැය හිඟය මූල්‍යනය කිරීම

- **2017 වසරේ පළමු මාස අට තුළදී අයවැය හිඟය මූල්‍යනය දේශීය මූලාශ්‍ර මෙන්ම විදේශීය මූලාශ්‍ර මතද රඳා පැවතුණි.** මෙම කාලපරිච්ඡේදයේදී ශුද්ධ දේශීය මූල්‍යනය රුපියල් බිලියන 273.5 ක් වූ අතර එය 2016 වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 309.5 ට වඩා අඩු අගයකි. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ශුද්ධ විදේශීය මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී පැවති රුපියල් බිලියන 175.6 ට සාපේක්ෂව රුපියල් බිලියන 246.7 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

- **2016 වසරේ අදාළ කාලපරිච්ඡේදය සමඟ සසඳන කල 2017 වසරේ පළමු මාස අට තුළ අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කිරීමේදී බැංකු අංශයේ දායකත්වය ප්‍රධාන වූ අතර, බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.** 2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 138.1 සමඟ සසඳන කල රුපියල් බිලියන 236.5 ක් වූ අතර, එය සමස්ත දේශීය මූල්‍යනයෙන් සියයට 86.5 ක් විය. 2017 වසරේ පළමු මාස අට තුළදී වාණිජ බැංකු මගින් සිදු කළ මූල්‍යනය 2016 වසරේ පැවති රුපියල් බිලියන 28.5 ක ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 355.9 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය ඉහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2017 වසරේ පළමු මාස අට තුළදී මහ බැංකුවෙන් සිදු කළ මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී පැවති රුපියල් බිලියන 166.6 සිට රුපියල් බිලියන 119.5 ක ණය ආපසු ගෙවීමක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළ බැංකු නොවන අංශයෙන් සිදු කළ දේශීය මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 171.4 සිට රුපියල් බිලියන 37.0 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

- **දේශීය මූල්‍යනය සම්බන්ධයෙන් ගත් කල, 2016 වසරේ පළමු මාස අටට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස අට තුළදී මහ බැංකුව විසින් රජයට ලබා දෙන තාවකාලික අත්තිකාරම් වැඩි දායකත්වයක් සැපයූ අතර, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වැනි ණය උපකරණ මගින් සිදු කළ මූල්‍යනය සාපේක්ෂව අඩු අගයක් ගත්තේය.** 2017 වසරේ පළමු මාස අට තුළදී භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 57.3 ට සාපේක්ෂව රුපියල් බිලියන 7.4 ක් විය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළදී භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 314.3 සිට රුපියල් බිලියන 48.7 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. 2017 වසරේ පළමු මාස අට තුළදී මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ මූල්‍යනය 2016 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් බිලියන 133.0 ක ණය ගැනීමට සාපේක්ෂව රුපියල් බිලියන 239.8 ක ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. කෙසේ වුවද,

6

**6.3 සංඛ්‍යා සටහන**

**ණය ලබාගැනීමේ මූලාශ්‍ර**

රු. බිලියන


| අයිතමය | 2015 | 2016 (අ) | 2016 ජන-අගෝ (අ) | 2017 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|
| **දේශීය මූල්‍යනය (ආ)** | **592.7** | **248.4** | **309.5** | **273.5** |
| බැංකු | 291.8 | 140.0 | 138.1 | 236.5 |
| බැංකු නොවන | 300.9 | 108.5 | 171.4 | 37.0 |
| **විදේශීය මූල්‍යනය** | **236.8** | **391.9** | **175.6** | **246.7** |
| ණය | 131.3 | 109.3 | 37.6 | 15.1 |
| වාණිජ ණය | 232.8 | 319.7 | 136.8 | 224.6 |
| භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජන | -79.9 | -44.3 | -2.9 | 7.1 |
| භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය ආයෝජන | -47.3 | 7.2 | 4.0 | ..... |
| **සමස්ත මූල්‍යනය** | **829.5** | **640.3** | **485.1** | **520.2** |

මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2015 වසරේදී රජය සතු වාණිජ ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන් ලබාගන්නා ලද අරමුදල් ඇතුළත් නොවේ.

**6.4 රූප සටහන**

**අයවැය හිඟය මූල්‍යනය**




මූලයන් : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකාරම් 2016 වසරේ එම කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 33.5 සිට සලකා බලන කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 120.3 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබාගත් ණය 2016 පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 56.0 ක ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 53.3 ක් විය.

- **2017 වසරේ පළමු මාස අට තුළදී ශුද්ධ විදේශීය මූල්‍යනය සැලකිය යුතු ලෙස වැඩි විය.** 2017 වසරේ පළමු මාස අට තුළදී සිදු කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සමඟ 2017 වසරේ පළමු මාස අට තුළදී අයවැය හිඟය පියවීමට ගන්නා ලද විදේශ ණය ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 175.6 ට සාපේක්ෂව රුපියල් බිලියන 246.7 දක්වා වැඩි විය. ශුද්ධ විදේශීය මූල්‍යනය, රුපියල් බිලියන 15.1 ක විදේශ ව්‍යාපෘති ණය ලබා ගැනීම්, රුපියල් බිලියන 224.6 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, රුපියල් බිලියන 7.1 ක භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජන සහ රුපියල් මිලියන 39.0 ක භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ ආපසු ගෙවීම්වලින් සමන්විත වේ.


## රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

### රාජ්‍ය ණය

- **2016 වසර අවසානයේදී රුපියල් බිලියන 9,387.3 ක් වූ නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වසරේ අගෝස්තු මාසය අවසාන වන විට රුපියල් බිලියන 10,285.9 දක්වා රුපියල් බිලියන 898.6 කින් වැඩි විය.** දේශීය ණය රුපියල් බිලියන 5,659.4 දක්වා රුපියල් බිලියන 317.9 කින් වැඩි වූ අතර, විදේශීය ණය රුපියල් බිලියන 4,626.5 දක්වා රුපියල් බිලියන 580.7 කින් වැඩි විය. අයවැය හිඟය සහ ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව අවප්‍රමාණය වීම ණය තොගය වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් ඇති කළේය.

- **මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකාරම් ඉහළ යෑම හේතුවෙන් සමස්ත දේශීය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කෙටිකාලීන ණය ප්‍රමාණය ඉහළ ගියේය.** ඒ අනුව, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත දේශීය ණයවලින් කෙටිකාලීන ණය ප්‍රමාණය 2016 වසර අවසානයට පැවති සියයට 18.1 ට සාපේක්ෂව සියයට 20.1 දක්වා වැඩි විය. මෙයට ප්‍රතිවිරුද්ධව, සමස්ත දේශීය ණයවලින් මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණය 2016 වසර අවසානය වන විට පැවති සියයට 81.9 ට සාපේක්ෂව 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 79.9 දක්වා අඩු විය. සමස්ත දේශීය ණයවලින් භාණ්ඩාගාර බිල්පත් මාර්ගයෙන් ලබාගත් ණය ප්‍රමාණය 2016 වසර

**6.5 රූප සටහන**
**මධ්‍යම රජයේ නොපියවූ ණය**




මූලයන් : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**6.4 සංඛ්‍යා සටහන**
**මධ්‍යම රජයේ නොපියවූ ණය**

රු. බිලියන

| අයිතමය | 2015 | 2016 (අ) | 2016 අගෝස්තු අවසානයට (අ) | 2017 අගෝස්තු අවසානයට (අ) |
|---|---|---|---|---|
| **දේශීය ණය (ආ)** | **4,959.2** | **5,341.5** | **5,345.3** | **5,659.4** |
| කල්පිරීම අනුව | | | | |
| කෙටිකාලීන | 913.3 | 968.4 | 987.9 | 1,135.0 |
| මැදි හා දිගුකාලීන | 4,045.9 | 4,373.1 | 4,357.4 | 4,524.4 |
| ආයතන අනුව | | | | |
| බැංකු | 1,924.0 | 2,114.9 | 2,071.6 | 2,401.5 |
| බැංකු නොවන අංශය | 3,035.2 | 3,226.6 | 3,273.7 | 3,257.9 |
| **විදේශීය ණය (ඇ)** | **3,544.0** | **4,045.8** | **3,970.7** | **4,626.5** |
| සහනදායී | 1,729.9 | 1,897.7 | 1,863.7 | 2,061.0 |
| සහනදායී නොවන | 1,814.1 | 2,148.1 | 2,107.0 | 2,565.5 |
| **රජයේ මුළු ණය** | **8,503.2** | **9,387.3** | **9,316.0** | **10,285.9** |

මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) 2012 ජනවාරි මාසයේදී රජයේ ආයතන විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,447 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර සහ 2013 මාර්තු මාසයේදී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් නොවේ.

(ඇ) රුපියල් වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ විදේශ ආයෝජනවල නොපියවූ ප්‍රමාණය ඇතුළත් වේ.


6

අවසානයේදී පැවති සියයට 14.6 සිට 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 14.0 දක්වා සුළු වශයෙන් අඩු විය. නොපියවූ දේශීය ණය සඳහා වැඩිම දායකත්වයක් සපයන භාණ්ඩාගාර බැඳුම්කර මාර්ගයෙන් ලබා ගත් ණය ප්‍රමාණය සමස්ත දේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස 2016 වසර අවසානය වන විට පැවති සියයට 69.5 ට සාපේක්ෂව 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 66.5 දක්වා අඩු විය. කෙසේ වුවද, අයවැය හිඟය මූල්‍යනය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යොදා ගැනීම ඉහළ යෑම හේතුවෙන් සමස්ත දේශීය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ප්‍රමාණය 2016 වසර අවසානයට පැවති සියයට 10.7 සිට 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 11.3 දක්වා වැඩි විය. මේ අතර මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකාරම් 2016 වසරේ අවසානයට පැවති රුපියල් බිලියන 83.3 සිට 2017 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 203.7 දක්වා වැඩි විය.

- **විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කළ නොපියවූ දේශීය ණය ප්‍රමාණය 2016 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 602.2 (එ.ජ. ඩොලර් මිලියන 4,019.8) සිට 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 702.0 (එ.ජ. ඩොලර් මිලියන 4,593.2) දක්වා වැඩි විය.** ඒ අනුව, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් සිදු කළ නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 637.8 (එ.ජ. ඩොලර් මිලියන 4,173.2) ක් වූ අතර, අක්වෙරළ බැංකු ඒකකවලින් සිදු කළ නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 64.2 (එ.ජ. ඩොලර් මිලියන 420.0) ක් විය. 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කළ දේශීය ණය ප්‍රමාණය, 2016 වසර අවසානය වන විට පැවති සියයට 11.3 ට සාපේක්ෂව සියයට 12.4 දක්වා වැඩි විය.

- **2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සහනදායී නොවන ණය ප්‍රමාණය සමස්ත විදේශීය ණයවලට දක්වන අනුපාතය, 2016 වසර අවසානයේ පැවති සියයට 53.1 සිට සියයට 55.5 දක්වා වැඩි විය.** ඒ අනුව, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත විදේශ ණය ප්‍රමාණයෙන් සහනදායී ණය

**6.6 රූප සටහන**
**රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සහ රජයේ ආදායම්**




මූලයන් : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතය 2016 වසර අග පැවති සියයට 46.9 සිට සියයට 44.5 දක්වා අඩු විය. සහනදායී නොවන ණය රුපියල් බිලියන 2,565.5 දක්වා සියයට 19.4 කින් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මාර්ගයෙන් ණය ලබා ගැනීම ඇතුළු වාණිජ ණය ලබා ගැනීම ඉහළ යෑමයි.

## ණය සේවාකරණ ගෙවීම්

- **2017 වසරේ පළමු මාස අට තුළදී දේශීය හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,304.4 ක් විය.** මෙය ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 785.8 (සියයට 60.2) කින් සහ පොලී ගෙවීම් රුපියල් බිලියන 518.6 (සියයට 39.8) කින් සමන්විත වේ. තවද, දේශීය හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් පිළිවෙළින් රුපියල් බිලියන 1,065.4 ක් සහ රුපියල් බිලියන 239.0 ක් විය. 2017 වසරේ අගෝස්තු මස දක්වා සමස්ත ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 88.1 ක් විය.

## අපේක්ෂිත වර්ධනයන්

- **ප්‍රධාන වශයෙන් ගංවතුර සහ නියගය සඳහා අදාළ වන රාජ්‍ය වියදම් හේතු කොට ගෙන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.6 ක් වූ 2017 වසර සඳහා ඉලක්කගත අයවැය හිඟයෙන් අපගමනය වීමට ඉඩ ඇති නමුත් ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය**

6

**ඒකාග්‍රතාව මගින් මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක අත්පත් කර ගැනීමට ක්‍රියා කරනු ඇත.** 2018 අප්‍රේල් මස සිට දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම මේ සඳහා ප්‍රධාන අනුබලයක් වනු ඇත. ඒ අනුව, 2020 වසර වන විට බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16 ක් පමණ දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂිත අතර 2017-2020 කාලසීමාව තුළදී රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5-6 අතර ප්‍රමාණයක පවත්වා ගනු ඇති අතර ඵලදායී නොවන වියදම් කපා හරිනු ඇත. තවද, 2020 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය සියයට 3.5 දක්වා අඩු කිරීමට මෙන්ම රාජ්‍ය ණය අනුපාතය වඩාත් තිරසාර මට්ටමකට අඩු කිරීමටද අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, රජයේ සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ගේ ඉතා දැඩි කැපවීමක් නොමැතිව මැදිකාලීන ඉලක්ක සපුරා ගැනීම ඉතා අභියෝගාත්මක වනු ඇත. ඒ අනුව, '2025 දැක්ම' යන ප්‍රතිපත්තිමය ප්‍රකාශනයේ සඳහන් වන පරිදි රාජ්‍ය මූල්‍ය කළමණාකරණ වගකීම් පනත ශක්තිමත් කිරීම රජයේ අපේක්ෂාව වී ඇත.

6

6

# 7

# මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

ආර්ථිකයේ අධි ඉල්ලුම් පීඩන මෙන්ම අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම කල් ඇතිව වළක්වා ගැනීම සඳහා 2017 වසරේ පළමු මාස නවය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය. 2016 වසරේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක අංක 1.50 කින් ඉහළ නැංවීම සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් ඉහළ නැංවීමට අමතරව, 2017 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් පදනම් අංක 25 කින් ඉහළ නැංවීය. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද) අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත තවදුරටත් තනි අගයක පැවතිය ද, 2016 වසර තුළදී රාජ්‍ය බදු ව්‍යූහයේ සිදු කරන ලද සංශෝධනවල බලපෑම මෙන්ම අයහපත් කාලගුණික තත්ත්ව මගින් ඇති වූ ආහාර උද්ධමනය පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය 2017 වසරේ බොහෝ මාසවලදී අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ අගයක පැවතුණි. මේ අතර, බැංකු පද්ධතිය තුළ ශුද්ධ විදේශ වත්කම් ක්‍රමයෙන් වර්ධනය වීමත්, අඩු වේගයකින් වුවද රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත බැංකු පද්ධතිය තුළින් සපයන ලද ණය තවදුරටත් ඉහළ යෑමත් හේතුවෙන් පුළුල් මුදල් සැපයුම අඛණ්ඩව ඉහළ වේගයකින් ප්‍රසාරණය විය. වාණිජ බැංකු විසින් රජය වෙත සපයන ලද ණය තවදුරටත් ඉහළ අගයක පැවතිය ද, රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගත් ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු විය. 2017 ජුනි මාසයේ සිට කිසියම් අඩු වීමක් වාර්තා කළ ද, රාජ්‍ය සංස්ථා විසින් ලබාගත් ණය ප්‍රමාණය 2017 වසර තුළදී ඉහළ ගියේය. ඉහළ නාමික සහ මූර්ත පොලී අනුපාතික මගින් පිළිබිඹු වන දැඩි මුදල් තත්ත්ව වලට ප්‍රතිචාර වශයෙන් වසර තුළදී පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය ක්‍රමිකව අඩු වීමක් පෙන්නුම් කළේය. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම වෙළඳපොළ තුළ පැවති ද්‍රවශීලතා හිඟය හේතුවෙන් 2017 වසරේ පළමු භාගය තුළදී වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2017 වසරේ ජූලි මාසයේ සිට වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතීම හේතුවෙන් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි යම් අඩු වීමක් පෙන්නුම් කළ අතර, අනෙකුත් බැංකු පොලී අනුපාතික ඉහළ මට්ටමක ස්ථාවර වීමට එය හේතුවිය. රජය වෙත ලැබෙන විදේශ මූල්‍ය ප්‍රවාහ වර්ධනය වීම, රාජ්‍ය ආදායම ඉහළ යෑම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි ක්‍රමයෙහි සිදු කරන ලද වැඩිදියුණු කිරීම් හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2017 අප්‍රේල් මාසයේ සිට සැලකිය යුතු ලෙස අඩු විය. ඉදිරි කාලයේදී, පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය වර්ධනය ක්‍රමිකව අඩු වීමත්, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියත් හේතුවෙන් මුදල් ප්‍රසාරණයෙහි අඩුවීමක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර මිල ගණන් උච්චාවචනය වීම හේතුවෙන් උද්ධමනය කෙටිකාලීනව ඉහළ මටටමක පවතිනු ඇතැයි අපේක්ෂා කළ ද මැදිකාලීන වශයෙන් උද්ධමනය හිතකර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.


## ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

- **තිරසාර වර්ධනයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන වාතාවරණයක් ඇති කරන අතරම උද්ධමනය සියයට 4-6 දක්වා පරාසය තුළ මැදි-තනි අගයක ස්ථායීව පවත්වා ගැනීම සඳහා, මැදිකාලීනව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (Flexible Inflation Targeting) වෙත නැඹුරු වීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ක්‍රියාත්මක කළේය.** වර්තමානයේ ක්‍රියාත්මක වන වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) අපේක්ෂිත පරිදි හැසිරවීම සඳහා වූ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ ලෙස වෙළඳපොළ පදනම් කරගත් ප්‍රතිපත්ති උපකරණ, විශේෂයෙන්ම, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු යොදා ගනු ලැබිණි. මෙම රාමුව තුළ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හැසිරවීමේ ප්‍රධාන අතරමැදි දර්ශක විචල්‍යයක් ලෙස පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අඛණ්ඩව යොදා ගන්නා ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ වැඩපිළිවෙළ සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ආයතනික වෙනස්කම් ගණනාවක් සිදු කරන අතර, ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සිදු කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කරන ලදී. තවද, දැනට ක්‍රියාත්මක මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා සහාය වන අතරම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශ කරන ලද පරිදි නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය හඳුන්වා දීම සඳහා අවශ්‍ය සහාය සැලසීමට 2017 වසරේ පළමු මාස නවය තුළදී වඩාත් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පිළිබඳ විශ්වසනීය මැදිකාලීන පුරෝකථන මෙන්ම ප්‍රතිපත්ති සමාකරණ සහ විශ්ලේෂණ මත පදනම් වන හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ද ඇතිව පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forecasting and Policy Analysis System) මේ වන විටත් සංවර්ධනය කොට ඇති අතර, එය මේ වන විටත් ශ්‍රී ලංකා මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා ඒකාබද්ධ කොට ඇත. තවද, "2017 වසර සහ ඉදිරිය සඳහා වූ මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" මගින් නිවේදනය කරනු ලැබූ ආකාරයට, පුළුල් සාර්ව ආර්ථික විශ්ලේෂණ සහ පුරෝකථන සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් මහ බැංකු කාර්ය මණ්ඩලයට ලබා දීමේ අරමුණින් වසරක් තුළ පවත්වනු ලබන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් සංඛ්‍යාව අට දක්වා අඩු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සැකසුම් ක්‍රියාවලිය තුළ තීරණ ගැනීමේ දී පෞද්ගලික අංශයේ අදහස් ලබා ගැනීමේ අරමුණින් ශාස්ත්‍රඥයන්, වෘත්තීයවේදීන් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව 2017 වසරේදී නැවත ස්ථාපිත කරන ලදී.

- **බදු සංශෝධන, රට තුළ පැවති කාලගුණය ආශ්‍රිත අවහිරතා සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම් යනාදියෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2017 වසරේ මේ දක්වා කාලය තුළ පාරිභෝගික මිල උද්ධමනය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ අගයක පැවතුණි.** ප්‍රධාන වශයෙන්, අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ ඇතිවූ අවහිරතා මෙන්ම, රජයේ බදු සංශෝධනවල බලපෑම පිළිබිඹු කරමින් ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම් කරගෙන මනිනු ලබන මතුපිට උද්ධමනය, 2017 වසරේ පළමු කාර්තුව තුළදී ඉහළ අගයක පැවතුණි. කාලගුණික තත්ත්ව ආශ්‍රිතව පැවති බාධා පහව යෑම හේතුවෙන් සැපයුම් අංශයේ ඇතිවූ වර්ධනය සහ රජය මගින් අත්‍යවශ්‍ය ආහාර අයිතම ආනයනය සඳහා පියවර ගැනීම හේතුවෙන් දේශීය වෙළඳපොළ තුළ මිල පීඩනය අඩුවීම, වසරේ දෙවන කාර්තුව තුළදී උද්ධමනය ක්‍රමයෙන් පහළ යෑමට උපකාරී විය. කෙසේ වෙතත්, ආහාර උද්ධමනයෙහි ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 සැප්තැම්බර් මාසයේදී ජා.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය සියයට 8.6 ක් දක්වා නැවත ඉහළ ගියේය. ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2016 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 4.0 හා සාපේක්ෂව 2017 වසරේ සැප්තැම්බර් මාසය වන විට සියයට 6.8 ක් විය. මේ අතර, සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013 = 100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2017 මාර්තු මාසයේදී සියයට 7.3 ක උපරිම අගයක් වාර්තා කළද, සැපයුම් අංශයේ අවහිරතාවල බලපෑම අඩුවීමත් සමඟ ආහාර උද්ධමනය අඩු වීම හේතුවෙන් 2017 ජූලි මාසයේදී උද්ධමනය සියයට 4.8 ක් දක්වා ක්‍රමයෙන් අඩු විය. ඉන් පසුව, ප්‍රධාන

**7.1 රූප සටහන**

**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (ජාතික පාරිභෝගික මිල දර්ශකය)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වශයෙන්, ආහාර උද්ධමනයෙහි සිදුවූ තියුණු ඉහළ යෑම හේතුවෙන් කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 7.1 ක් දක්වා නැවතත් ඉහළ ගියේය. කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2016 වසර අවසානයේ දී පැවති සියයට 4.0 හා සාපේක්ෂව 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 5.8 ක් විය.

- **ඉල්ලුමෙන් ජනිත වන උද්ධමනය ලෙස සලකනු ලබන මූලික උද්ධමනය 2017 වසරේ පළමු කාර්තුව තුළදී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ඉන් අනතුරුව මන්දගාමී විය.** 2017 පළමු කාර්තුව තුළදී මූලික උද්ධමනයෙහි ඉහළ යෑම සඳහා ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් වැඩි වශයෙන් දායක වූ අතර, බදු සංශෝධනවල බලපෑමද මූලික උද්ධමනයෙහි වෙනස් වීම් සඳහා හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සඳහා ප්‍රතිචාර දැක්වීම කිසියම් දුරකට පිළිබිඹු කරමින් මූලික උද්ධමනය බොහෝ මාසවලදී මතුපිට උද්ධමනයට පහළින් පැවතිණි. ඒ අනුව, 2016 අවසානයේ දී වාර්තා කළ සියයට 6.7 හා සැසඳීමේදී ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 4.6 ක් දක්වා අඩු විය. ජා.පා.මි.ද. මත පදනම්ව ගණනය කරනු ලබන වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2016 අවසානයේ වූ සියයට 5.9 හා සාපේක්ෂව 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 5.7 ක් විය. 2016 වසර අවසානයේ වූ සියයට 5.8 හා සැසඳීමේ දී කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 6.0 ක් වූ අතර, 2016 වසර අවසානයේ දී සියයට 4.4 ක් ලෙස පැවති වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2017 සැප්තැම්බර් මාසයේදී සියයට 5.8 ක් විය.

**7.2 රූප සටහන**

**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉදිරි දැක්මක් සහිත මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2017 වසරේ මේ දක්වා කාලය තුළදී ආර්ථික පාර්ශ්වකරුවන්ගේ උද්ධමන අපේක්ෂා පුළුල් ලෙස පාලනය වී පැවතිණ.** ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා 2017 මුල් කාලයේදී ඉහළ යෑමක් පිළිබිඹු කළ නමුත්, මිල ගණන් මත වන පීඩන අඩු වීමට ඇති හැකියාව පිළිබඳ ආයතනික අංශයෙහි අපේක්ෂා පිළිබිඹු කරමින් උද්ධමනයෙහි අඩුවීමක් ඉන්පසුව අපේක්ෂා කෙරිණ. කෙසේ වෙතත්, 2017 ජූනි මාසයෙන් පසු මන්දගාමී වීමක් දක්නට ලැබුණ ද, ඊට පෙර කුටුම්බ අංශයේ උද්ධමන අපේක්ෂාවල ඉහළ යෑමේ ප්‍රවණතාවක් පිළිබිඹු විය. අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ ඇති වූ අවහිරතා සහ බදු සංශෝධන හේතුවෙන් ඇති වූ බලපෑම් උද්ධමන අපේක්ෂා ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, දේශීය සහ විදේශීය වෙළඳපොළ මිල ගණන් ඉහළ යෑමද, අනාගත උද්ධමනය පිළිබඳ අපේක්ෂා කෙරෙහි බලපාන සාධකයක් ලෙස සමීක්ෂණයෙහි ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කර ඇත.

- **උද්ධමනය හා මුදල් සමස්තවල ප්‍රවණතා මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේ මේ දක්වා කාලය තුළදී අඛණ්ඩව දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය.** 2016 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.50 ක් දක්වා ප්‍රතිශතාංක 1.50 කින් ඉහළ නංවමින් ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කළේය. ඉල්ලුම නිසා ඇති විය හැකි උද්ධමන පීඩන අවම කිරීම සහ ඉහළ මුදල් හා ණය ප්‍රසාරණය අවම කිරීමේ පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස 2016 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික අදියර දෙකකදී පදනම් අංක 100 කින් ඉහළ නැංවීය. මේ අතර, මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග සහ වෙළඳපොළ ද්‍රවශීලතාව පහළ මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. කෙසේ වෙතත්, ණය පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ වුව ද, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ණය අපේක්ෂිත මට්ටම ඉක්මවා ඉහළ අගයකින් අඛණ්ඩව වර්ධනය විය. පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය වෙත සපයන ලද දේශීය ණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වසර අවසාන කාලය තුළදී සහ 2017 වසරේ මුල් කාලය තුළදී මුදල් ප්‍රසාරණය අඛණ්ඩව ඉහළ අගයක පැවතිණි. මෙම ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සහ රජයේ බදු වෙනස් කිරීම් සහ සැපයුම් අංශයෙහි සාධකවල බලපෑම හේතුවෙන් මිල ගණන්වල පසුව ඇතිවිය හැකි දෙවන වර බලපෑම් අවම කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 කින් ඉහළ නංවමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2017 මාර්තු මාසයේදී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කළේය. ඉන්පසුව, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි බලපෑම සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් 2017 වසරේ මේ දක්වා කාලය තුළදී වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගිය අතර, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය ක්‍රමයෙන් පහළ යෑමක් පෙන්නුම් කළේය.

**7.3 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **මුදල් ප්‍රතිපත්ති අරමුණු හා අනුරූප වන පරිදි එක්දින පොලී අනුපාතික හැසිරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සඵලදායී ලෙස විවට වෙළඳපොළ කටයුතු සිදු කළේය.** ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදල් මෙහෙයුම් සහ රජයේ භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු හේතුවෙන් දේශීය වෙළඳපොළ තුළ රුපියල් ද්‍රවශීලතාව මිශ්‍ර විචලනයක් පෙන්නුම් කළ ද, 2017 වසරේ පළමු මාස හත තුළ බොහෝ අවස්ථාවලදී ද්‍රවශීලතාව හිඟ මට්ටමක පැවතිණ. 2017 වසරේ පළමු කාල සීමාවේ දී වෙළඳපොළ තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි සහ ස්ථාවර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම සඳහා වෙන්දේසි පැවැත්වීය. 2017 වසරේ පෙබරවාරි මස සිට ජූලි මස මැද දක්වා කාලය තුළ වෙළඳපොළ ද්‍රවශීලතාව බොහෝවිට හිඟ මට්ටමක පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි සහ නිත්‍ය පහසුකම් හරහා වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සිදු කළේය. හිඟ ද්‍රවශීලතා මට්ටමක් පැවතීම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයෙහි අඛණ්ඩව පැවතිණි. ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් වාණිජ බැංකුවල තැන්පතු සහ ණය පොලී අනුපාතික ද ක්‍රමයෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2017 ජූලි මස මැද භාගයේ සිට වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමඟ කෙටි කාලීන පොලී අනුපාතික, විශේෂයෙන්ම, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික කිසියම් මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.

- ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා නිසි පරිදි කළමනාකරණය කරන අතර, මුදල් ප්‍රතිපත්ති තීරණ විනිවිදභාවයෙන් යුතුව මහජනයා වෙත අඛණ්ඩව සන්නිවේදනය කිරීම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන උපායමාර්ගය තුළින් තවදුරටත් අරමුණු කෙරිණ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති නිවේදනය නිකුත් කරනු ලබන පූර්ව නිවේදිත දින දර්ශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් වසර ආරම්භයේදීම එළිදක්වනු ලැබීය. තවද, මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා තුඩුදුන් සාධක පැහැදිලි කෙරෙන මුදල් ප්‍රතිපත්ති විවරණය පිළිබඳ පුවත්පත් නිවේදන වෙළඳපොළ වෙත මුදල් ප්‍රතිපත්ති තීරණ අඛණ්ඩව නිවේදනය කරනු ලබන ප්‍රධාන ක්‍රමවේදය ලෙස තවදුරටත් ක්‍රියාත්මක විය. මීට අමතරව, සෑම මුදල් ප්‍රතිපත්ති නිවේදනයක් හා සමගාමීව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් මුලසුන දරන සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගී වන මාධ්‍ය සාකච්ඡා පවත්වනු ලැබීය. මුදල් ප්‍රතිපත්තියෙහි සඵලදායී බව තහවුරු කිරීම සඳහා වැදගත් වන මෙම ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රතිපත්ති විශ්වසනීයත්වය ඇතිකර ගැනීමට හා පවත්වා ගෙන යෑමට උපකාරී විය. ඒ අතරම, නිතිපතා නිවේදන නිකුත් කිරීම, සම්මන්ත්‍රණ හා දේශන පැවැත්වීම මෙන්ම, මහ බැංකු අධිපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පවත්වනු ලබන දේශන මහජනතාවගේ උද්ධමන අපේක්ෂා කළමනාකරණය සඳහා සහාය විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය නිතිපතා ප්‍රකාශන සහ ප්‍රයෝජනවත් ආර්ථික දත්ත දෛනික, සති, මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් භාෂා ත්‍රිත්වයෙන්ම අන්තර්ජාල සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන ලදී.


## පොලී අනුපාතිකවල හැසිරීම

### වෙළඳපොළ ද්‍රවශීලතාව, වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සහ කෙටිකාලීන පොලී අනුපාතික

- 2017 ජූලි මස මැද දක්වා බොහෝ විට හිඟ මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව ඉන්පසුව අතිරික්ත මට්ටමක් දක්වා වර්ධනය විය. 2016 වසර අවසාන කාලයේදී බොහෝ විට හිඟ ද්‍රවශීලතාවක් සහිත වූ මුදල් වෙළඳපොළ, ප්‍රධාන වශයෙන්ම, උත්සව කාලසීමාවෙන් පසුව

**7.4 රූප සටහන**

**දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ ද්‍රවශීලතා කළමනාකරණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් බැංකු පද්ධතිය වෙත යළි ලැබීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබාදුන් තාවකාලික අත්තිකාරම් සහ ශ්‍රී ලංකා මහ බංකුව සමග වූ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් කල්පිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් සිට 2017 ජනවාරි මාසය දක්වා වූ කෙටි කාලසීමාව තුළ අතිරික්ත ද්‍රවශීලතාවක් වාර්තා කළේය. කෙසේ වුවත්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය කල්පිරීම මෙන්ම විදේශ ප්‍රාග්ධන ආයෝජන ඉවතට ඇදී යෑම හමුවේ 2017 පළමු කාර්තුව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීමේ බලපෑම හේතුවෙන් අතිරික්ත ද්‍රවශීලතාව 2017 පෙබරවාරි මස මුල සිට සැලකිය යුතු ලෙස අඩුවී හිඟ තත්ත්වයක පැවතිණි. අලුත් අවුරුදු කාලසීමාවෙන් පසුව බැංකු පද්ධතිය වෙත ව්‍යවහාර මුදල් ලැබීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් කොටසක් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමෙන් ලද ලැබීම් හේතුවෙන් අවස්ථා කිහිපයකදී ද්‍රවශීලතාව අතිරික්ත මට්ටම්වල පැවතුණද, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගයෙන් සැලකිය යුතු කොටසක් කල්පිරීම හේතුවෙන් 2017 පෙබරවාරි මස මුල සිට ජූලි මස මැද දක්වා කාලසීමාව තුළදී ද්‍රවශීලතාව බොහෝ විට හිඟ මට්ටමක පැවති අතර, එම කාලසීමාව තුළදී ද්‍රවශීලතා හිඟය සාමාන්‍යයෙන් රුපියල් බිලියන 7.9 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් සහ රජය විසින් ලබාගත් ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් සහ

7


විදේශ ණය මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමෙන් ලද ලැබීම්, 2017 ජූලි මස මැද සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක් දක්වා ඉහළ නැංවීමට හේතු විය. ඒ අනුව, 2017 ජූලි මස මැද සිට 2017 සැප්තැම්බර් මාසය දක්වා කාලසීමාව තුළ දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව සාමාන්‍යයෙන් රුපියල් බිලියන 25.0 ක් පමණ විය. මෙම තත්ත්වය හමුවේ අනුරූපව එක්දින පොලී අනුපාතික ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවට වෙළඳපොළ වෙන්දේසි පැවැත්වීම සහ අවශ්‍ය පරිදි නිත්‍ය පහසුකම් ලබාදීම සිදු කළේය.

- **ඇඩි මුදල් තත්ත්වයෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2017 වසරේ පළමු මාස හත තුළදී එක්දින මුදල් වෙළඳපොළ පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයෙහි පැවති අතර, වර්ධනය වූ ද්‍රවශීලතා තත්ත්වයට ප්‍රතිචාර දක්වමින් 2017 ජූලි මස මැද සිට එක්දින මුදල් වෙළඳපොළ පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යය දක්වා පහළ යෑමක් දක්නට ලැබිණි.** 2017 ජනවාරි මාසයේදී වෙළඳපොළ ද්‍රවශීලතා මට්ටම්වල සිදුවූ තාවකාලික වර්ධනයත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පහළ ගිය නමුත්, 2017 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීම සහ වෙළඳපොළ ද්‍රවශීලතා මට්ටම් පහළ යෑම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉහළ ගොස් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවෙහි පැවතිණි. කෙසේ වුවද, මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා මට්ටම්වල සිදුවූ වර්ධනයත් සමඟ සියයට 8.75 මට්ටමෙහි පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2017 ජූලි මස මැද භාගයේ සිට පහළ ගිය අතර, 2017 සැප්තැම්බර් මාසය අවසානය වන විට එය සියයට 8.11 ක් විය. මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම් සහ ද්‍රවශීලතා හිඟය හේතුවෙන් දෛනික විවට වෙළඳපොළ වෙන්දේසි සඳහා වන බරිත සාමාන්‍ය එළඳා අනුපාතික 2017 ජූලි මස මැද දක්වා ක්‍රමිකව ඉහළ ගිය ද, මුදල් වෙළඳපොළෙහි වර්ධනය වූ ද්‍රවශීලතා තත්ත්වයත් සමඟ එම අනුපාතික 2017 ජූලි මස මැද සිට පහළ ගියේය. මේ අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්වීම්වලට සහ ද්‍රවශීලතා තත්ත්වවලට අනුරූපීව, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික වෙනස් වූ අතර, එක්දින සහ මාස 12 සඳහා වන ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික 2016 වසර අවසානයේ වාර්තා වූ සියයට 8.44 හා සියයට 12.00 හා සැසඳීමේදී 2017 සැප්තැම්බර් මාසය අවසානය වන විට සියයට 8.11 ක් හා සියයට 11.99 ක් විය.

### රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතික

- **2017 වසරේ පළමු මාස හතර තුළදී රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතික ක්‍රමයෙන් ඉහළ යෑමක් දක්නට ලැබුණ ද, ඉන්පසු කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය මූල්‍ය අංශයේ යහපත් ප්‍රවණතා, විදේශ මූල්‍ය ලැබීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසි පද්ධතියෙහි සිදු කරන ලද වැඩිදියුණු කිරීම් මගින් ඇති වූ හිතකර වෙළඳපොළ තත්ත්වවලට ප්‍රතිචාර දක්වමින් එළදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය.** රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා පූර්ණ වශයෙන් වෙන්දේසි ක්‍රමය යොදා ගැනීම තුළ අරමුදල් සඳහා ඇතිවූ ඉහළ ඉල්ලුමෙහි බලපෑම මෙන්ම, ඇඩි මුදල් තත්ත්වයෙහි බලපෑම වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස හතර තුළදී ප්‍රාථමික වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් මත එළදා අනුපාතික ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, දින 91, දින 182, සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් මත එළදා අනුපාතික 2016 වසර අවසානයේ පැවති එළදා අනුපාතික හා සැසඳීමේදී 2017 වසරේ අප්‍රේල් මස අවසානය වන විට, පිළිවෙළින්, පදනම් අංක 101 කින්, පදනම් අංක 107 කින් සහ පදනම් අංක 85 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 වසරේ මාර්තු මාසයේ සිට රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සඳහා වූ ඉහළ විදේශීය ලැබීම් මෙන්ම එ.ජ. ඩොලර් බිලියන 1.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය මගින් ලද ලැබීම් සහ එ.ජ. ඩොලර් බිලියන 1.0 ක ඒකාබද්ධ ණය පහසුකම් ලැබීම් හේතුවෙන් රජයේ සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ එළදා අනුපාතික මත වූ පීඩනය සැලකිය යුතු ලෙස අඩු විය. තවද, රාජ්‍ය ආදායම් රැස් කිරීම් ඉහළ යෑම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි තුන්වන වාරිකය ලැබීම ද හිතකර වෙළඳපොළ අපේක්ෂා ඉහළ නැංවීමට උපකාරී විය. මෙම වර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන්, 2017 අප්‍රේල් මස අවසානයේ දී පැවති එළදා අනුපාතික හා සැසඳීමේ දී, දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ එළදා අනුපාතික, පිළිවෙළින්, පදනම් අංක 102 කින්, පදනම් අංක 169 කින් සහ පදනම් අංක 192 කින් සියයට 8.71, සියයට 9.01 සහ සියයට 9.10 දක්වා 2017 සැප්තැම්බර් මස අවසානය වනවිට අඩු විය.

### 7.5 රූප සටහන
### භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික (අ)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ.

- **කෙටිකාලීන ඵලදා අනුපාතිකවල හැසිරීම අනුව යමින්, ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතික ද 2017 අප්‍රේල් මාසයේ සිට පහළ ගියේය.** රජයේ ඉහළ අරමුදල් අවශ්‍යතාව හේතුවෙන් 2017 වසරේ පළමු කාර්තුව තුළදී භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ඉන්පසුව ක්‍රමයෙන් අඩු විය. ඉහළ පොලී අනුපාතික පැවතීම හේතුවෙන්, 2017 වසරේ පළමු මාස නවය තුළදී රජය කෙටි සහ මැදිකාලීන බැඳුම්කර වැඩි වශයෙන් නිකුත් කළේය. පස් අවුරුදු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතික, 2017 ජනවාරි මස ආරම්භයේදී පැවති සියයට 12.16 සිට 2017 අප්‍රේල් මස මුල් කාලය වන විට සියයට 12.60 දක්වා ඉහළ ගිය නමුත්, 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 10.09 දක්වා පහළ ගියේය. දස අවුරුදු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතික ද 2016 වසර අවසානයේ පැවති සියයට 12.11 සිට 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 10.31 දක්වා පහළ ගියේය. අනෙකුත් පරිණත කාල සහිත භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඵලදා අනුපාතික ද මෙයට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මේ අතර, රජය විසින් කෙටි හා මැදිකාලීන පදනම මත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාතික සහිතව නිකුත් කරන ලදී. තවද, 2017 මැයි මාසයේදී සියයට 6.20 ක සාපේක්ෂ වශයෙන් අඩු පොලී අනුපාතිකයක් යටතේ රජය දස අවුරුදු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් නිකුත් කළේය. විදේශ විනිමය මත පදනම් වූ මෙම ණය

### 7.1 සංඛ්‍යා සටහන
### පොලී අනුපාතිකවල හැසිරීම්

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2016 දෙසැම්බර් අවසානයට | 2017 සැප්තැම්බර් අවසානයට | |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 7.25 | |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.75 | |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 8.42 | 8.11 | |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | |
| **ප්‍රාථමික වෙළඳපොළ (අ)** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 8.72 | 8.71 | |
| දින 182 | 9.63 | 9.01 | |
| දින 364 | 10.17 | 9.10 | |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 11.04 | 9.83 | |
| වසර 3 | 11.62 | - | |
| වසර 4 | 11.94 | 11.14 | |
| වසර 5 | 11.76 | 10.09 | |
| වසර 10 | 12.11 | 10.31 | |
| **ද්විතීයික වෙළඳපොළ** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 8.69 | 8.61 | |
| දින 182 | 9.60 | 8.92 | |
| දින 364 | 10.17 | 9.11 | |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 11.38 | 9.42 | |
| වසර 3 | 11.80 | 9.71 | |
| වසර 4 | 12.04 | 9.94 | |
| වසර 5 | 12.18 | 10.04 | |
| වසර 10 | 12.55 | 10.28 | |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ආ)** | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.50-9.00 | 0.50-9.50 | |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඇ) | 4.50-15.00 | 4.89-15.00 | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 8.17 | 9.25 | |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය | 10.46 | 11.81 | |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය | 11.17 | 11.04 | (ඈ) |
| ***ණය පොලී අනුපාතික*** | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය | 11.73 | 11.42 | |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය | 13.20 | 13.90 | (ඈ) |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය | 14.37 | 15.12 | (ඈ) |
| **අනෙකුත් මූල්‍ය ආයතන (ඉ)** | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.25 | 4.00 | |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 11.00 | 11.00 | |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඊ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.38-7.74 | 5.44-7.84 | (ඈ) |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.13-14.06 | 12.53-14.08 | (ඈ) |
| ***ණය පොලී අනුපාතික*** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 9.75-15.00 | 13.00-16.00 | |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (උ) | 10.50-20.00 | 10.50-20.00 | |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඊ) | | | |
| මූල්‍ය කල්බදු | 17.48-25.97 | 17.52-29.29 | (ඈ) |
| කුලීපිට ගැනුම් | 17.51-22.65 | 16.83-20.77 | (ඈ) |
| නිශ්චල දේපළ මත ලබා දුන් ණය | 19.12-20.80 | 18.03-20.23 | (ඈ) |
| **සාංගමික ණය වෙළඳපොළ** | | | |
| ණයකර | 9.60-13.75 | 12.75-15.00 | (ඈ) |
| වාණිජ පත්‍රිකා | 8.70-14.80 | 14.25-16.50 | (ඈ) |

මූලයන්: කොළඹ කොටස් හුවමාරුව
අදාළ මූල්‍ය ආයතන
ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික.
(ආ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඇ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(ඈ) 2017 අගෝස්තු මාසය අවසාන වන විට.
(ඉ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඊ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ඉදිරිපත් කරන ලද උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2017 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(උ) නිවාස කටයුතු සඳහා දෙන ණය පමණි.

7

සුරැකුම්පත් නිකුත් කිරීම, දේශීය ණය උපකරණවල ඵලදා අනුපාතික මත වූ පීඩනය බොහෝ දුරට සමනය කිරීමට උපකාරී විය. මේ අතර, රජයේ දේශීය ණය ගැනීමේ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වර්ධනය කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 ජූලි මාසයේදී භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුතු පද්ධතියක් හඳුන්වා දෙනු ලැබීය.

- **2017 වසරේ පළමු මාස හතර තුළදී ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉහළ ගියද ඉන්පසුව ඵලදා අනුපාතිකවල පහළ යෑමක් දක්නට ලැබුණු අතර, එමගින් රජයේ සුරැකුම්පත් සඳහා වන ඵලදා වක්‍රය, විශේෂයෙන්ම දිගුකාලීන අන්තය ශීඝ්‍රයෙන් පහළට විතැන් විය.** කෙටිකාලීන පරිණත කාල සීමාවක් සහිත, භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික සුළු වශයෙන් පහළ ගිය අතර, දිගුකාලීන පරිණත කාල සීමාවන්ගෙන් යුත් ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික 2016 වසර අවසානයේ දක්නට ලද ඵලදා අනුපාතික හා සැසඳීමේ දී 2017 සැප්තැම්බර් මස අවසානය වන විට, පිළිවෙළින්, පදනම් අංක 8 කින්, පදනම් අංක 68 කින් සහ පදනම් අංක 106 කින් පහළ ගියේය. 2016 වසර අවසානයේ පැවති ඵලදා අනුපාතික හා සැසඳීමේ දී ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික 2017 සැප්තැම්බර් මස අවසානය වන විට පදනම් අංක 196 සිට 242 දක්වා පරාසයකින් අඩු විය. ඵලදා වක්‍රයෙහි මෙම විතැන් වීම සඳහා අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ වැඩිදියුණු වූ ණය කළමනාකරණ උපායමාර්ග පෙරදැරිව ඇති වූ හිතකර වෙළඳපොළ අපේක්ෂා මෙන්ම, ඉදිරි දැක්මක් සහිත මුදල් ප්‍රතිපත්ති තීරණවල ප්‍රතිඵලයක් ලෙස මැදිකාලීන උද්ධමන අපේක්ෂා වර්ධනය වීම හේතු විය.

**7.6 රූප සටහන**
**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### තැන්පතු සහ ණය පොලී අනුපාතික


- **වාණිජ බැංකුවල තැන්පතු පොලී අනුපාතික, විශේෂයෙන්ම 2017 වසරේ පළමු මාස හත තුළදී අඛණ්ඩව ඉහළ ගියේය.** වෙළඳපොළෙහි පැවති දැඩි මුදල් තත්ත්වය මධ්‍යයේ මහජනතාව වෙතින් තැන්පතු රැස්කර ගැනීම සඳහා වාණිජ බැංකු අතර පැවති ඉහළ තරගකාරීත්වය පිළිබිඹු කරමින් මෙම කාලය තුළදී තැන්පතු පොලී අනුපාතික ඉහළ ගියේය. ඒ අනුව, වාණිජ බැංකු වෙතැති පොලී උපයන සියලුම තැන්පතුවලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරනු ලබන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 2016 වසර අවසානයේ පැවති සියයට 8.17 සිට 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 9.25 දක්වා පදනම් අංක 108 කින් ඉහළ ගියේය. මේ අතර, වාණිජ බැංකු වෙතැති පොලී උපයන සියලුම කාලීන තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වන බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ද 2016 වසර අවසානයේ පැවති සියයට 10.46 සිට 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 11.81 දක්වා පදනම් අංක 135 කින් ඉහළ ගියේය. තවද, පොලී උපයන සියලුම නව තැන්පතුවලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පෙන්නුම් කරනු ලබන බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය, 2016 දෙසැම්බර් මස අවසානයේදී පැවති සියයට 11.17 සිට 2017 ජූලි මස අවසානය වන විට සියයට 11.72 දක්වා පදනම් අංක 55 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, අනෙකුත් කෙටිකාලීන පොලී අනුපාතිකවල අඩුවීමේ ප්‍රවණතාව අනුව යමින් බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 11.04 දක්වා අඩු විය.

- **දැඩි මුදල් තත්ත්වයෙහි බලපෑම වෙළඳපොළ වෙත ක්‍රමයෙන් සම්ප්‍රේෂණය වීමත් සමඟ වාණිජ බැංකුවල ණය පොලී අනුපාතික තවදුරටත් ඉහළ ගිය අතර, 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ණය පොලී අනුපාතික ඉහළ මට්ටම්වල ස්ථාවරව පැවතිණි.** කෙටිකාලීන පොලී අනුපාතිකවල හැසිරීම

පිළිබිඹු කරමින්, වාණිජ බැංකු විසින් සිය ප්‍රමුඛ ගනුදෙනුකරුවන් සඳහා සතියක් තුළ සපයනු ලබන කෙටිකාලීන ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වන සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය, 2016 වසර අවසානයේ පැවති සියයට 11.52 හා සැසඳීමේදී 2017 ජූලි මස අවසානය වන විට සියයට 12.26 ක් වූ උපරිම මට්ටමක් දක්වා පදනම් අංක 74 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, වෙළඳපොළ ද්‍රවශීලතා මට්ටම ක්‍රමයෙන් ඉහළ යෑමත් සමඟ අනෙකුත් කෙටිකාලීන පොලී අනුපාතිකවල හැසිරීම අනුව යමින් සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 11.55 දක්වා අඩු විය. තවද, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති සියලුම ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වූ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය, 2016 වසර අවසානයේ පැවති සියයට 13.20 සිට 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 13.90 දක්වා පදනම් අංක 70 කින් ඉහළ ගියේය. මේ අතර, වාණිජ බැංකු අනුව වර්ගීකරණය කරන ලද බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතික 2016 වසර අවසානයේ පැවති සියයට 10.12-15.66 පරාසය හා සැසඳීමේ දී 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 10.80-16.31 පරාසය දක්වා ඉහළ ගියේය. මසක් තුළ වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද නව ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික පෙන්නුම් කරනු ලබන බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකයද, 2016 දෙසැම්බර් මස අවසානයේ වූ සියයට 14.37 සිට 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 15.12 දක්වා පදනම් අංක 75 කින් ඉහළ ගියේය.

**7.7 රූප සටහන**


**තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.8 රූප සටහන**

**නව තැන්පතු සහ නව ණය අනුපාතික**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### සාංගමික ණය උපකරණ මත පොලී අනුපාතික

- **අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම අනුව යමින්, 2017 වසරේ පළමු මාස අට තුළදී සාංගමික ණය උපකරණ සඳහා වන පොලී අනුපාතික ඉහළ ගියේය.** කෙටිකාලීන ණය ලබාගැනීමේ උපකරණයක් වන වාණිජ පත්‍රිකාවලට අදාළ පොලී අනුපාතික, 2016 වසර අවසානයේ පැවති සියයට 8.70-14.80 පරාසය හා සැසඳීමේදී 2017 පළමු මාස අට තුළදී සියයට 14.25-16.50 පරාසයක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2017 පළමු මාස අට තුළදී සමාගම් දෙකක් විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණයකර නිකුතු හතක් වාර්තා වූ අතර, එම ණයකර වසර 5 සිට 8 දක්වා පරිණත කාලසීමා සහිතව විවිධ නිත්‍ය සහ විචල්‍ය පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලදී. ස්ථාවර පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලද ණයකර සඳහා වන පොලී අනුපාතික 2016 වසරේ වාර්තා කළ සියයට 9.60-13.75 අතර පරාසය හා සැසඳීමේ දී 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 12.75-15.00 අතර පරාසයක පැවතිණ.

### විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

- **වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික 2017 වසරේ පළමු මාස නවය තුළදී සුළු වශයෙන් ඉහළ ගියේය.** 2017 මාර්තු සහ ජූනි මාසවලදී ඉලක්කගත ෆෙඩරල් අරමුදල් අනුපාතිකය ඉහළ නැංවීමත් සමඟ එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන

7

යනු ලබන ඉතිරිකිරීමේ තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2016 වසර අවසානයේ පැවති සියයට 0.02-3.62 පරාසය හා සැසඳීමේ දී 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.02-4.23 පරාසයක පැවතිණ. තවද, එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2016 වසර අවසානයේ වූ සියයට 0.15-5.00 පරාසය හා සැසඳීමේ දී 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.15-6.15 පරාසයක පැවතිණි. මේ අතර 2016 වසර අවසානයේ සියයට 0.05-2.01 පරාසයක පැවති ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතිරි කිරීමේ තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.10-2.00 ක් ලෙස බොහෝ දුරට නොවෙනස්ව පැවති අතර, ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2016 වසර අවසානයේ දී පැවති සියයට 0.25-4.02 පරාසය හා සැසඳීමේ දී 2017 සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 0.20-4.52 පරාසයක පැවතිණ.

## මුදල් සහ ණය සමස්තවල හැසිරීම


### සංචිත මුදල්

- **2016 වසරේදී ඉහළ වේගයකින් වර්ධනය වූ සංචිත මුදල් සැපයුම, 2017 වසරේ පළමු මාස අට තුළදී මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2016 ජනවාරි මාසය තුළදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීම හේතුවෙන් එම වසරේ අනුරූප කාලසීමාව තුළ සංචිත මුදල් සැපයුමේ දක්නට ලද ඉහළ වර්ධනයෙහි පදනම් බලපෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.** වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංචිත මුදල් වර්ධනය 2016 වසර අවසානයේ පැවති සියයට 27.1 හා සැසඳීමේ දී 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 16.0 දක්වා මන්දගාමී විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතුවල වර්ධනයෙහි සිදුවූ සැලකිය යුතු මන්දගාමී වීම පිළිබිඹු කරමින්, 2016 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 112.3 කින් වැඩි වූ සංචිත මුදල් ප්‍රමාණය 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 911.4 ක් දක්වා රුපියල් බිලියන 55.2 කින් ඉහළ ගියේය. සංචිත මුදල් සැපයුම පිළිබඳ වගකීම් පාර්ශ්වයෙන් සලකා බලන විට, ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය 2016 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 82.3 ක ඉහළ යෑම හා සැසඳීමේ දී, 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 329.7 ක් දක්වා රුපියල් බිලියන 26.4 කින් ඉහළ ගියේය. 2017 අගෝස්තු මස අවසානය වන විට සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 581.7 ක් දක්වා රුපියල් බිලියන 28.9 කින් ඉහළ ගියේය. උත්සව සමයේදී දක්නට හැකි තියුණු ඉහළ යෑම් සහිතව මීට පෙර වසරවල පෙන්නුම් කළ රටාවට අනුකූලවම සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් විචලනය වුවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංසරණයෙහි පවතින මුදල් වර්ධනය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සියයට 12.4 හා සැසඳීමේදී 2017 වසරේ අගෝස්තු අවසානයේදී සියයට 11.5 ක් විය. මෙම වර්ධනයන් සමඟින්, දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දර්ශක ඉලක්කයක් ලෙස සලකනු ලබන සංචිත මුදල්, 2017 වසරේ තුන්වන කාර්තුවට අදාළ වූ ඉලක්කගත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතුණි.

- **වත්කම් අනුව සලකා බැලීමේ දී, 2017 වසරේ පළමු මාස අට තුළදී සංචිත මුදල් වර්ධනය සඳහා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වර්ධනය මුළුමනින්ම දායක වී ඇති අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් පහළ ගියේය.** 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල් බිලියන 77.2 ක පහළ යෑම හා සැසඳීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්, 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 187.2 කින් ඉහළ ගියේය. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විනිමය මිලදී ගැනීම මෙන්ම රජය විසින් ලබාගත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයෙන් සහ ඒකාබද්ධ ණයෙන් කොටසක් උපයෝජනය කිරීමත් සමඟ විදේශ මුදලින් ඇති මූල්‍ය වත්කම් ඉහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම සඳහා හේතු විය. ශුද්ධ විදේශීය වත්කම් වර්ධනය වුවද, 2016 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 200.3 ක සැලකිය යුතු ඉහළ යෑම හා සැසඳීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 165.6 ක් දක්වා රුපියල් බිලියන 131.9 කින් අඩු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය පහළ යෑම, ශුද්ධ දේශීය වත්කම් පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය භාණ්ඩාගාර බිල්පත් කල් පිරීමට ඉඩ හැරීමත් සමඟ

7

**7.9 රූප සටහන**
**දෛනික සංචිත මුදල් (අ)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ඇතැම් මාසවල දෛනික සංචිත මුදල්වල ක්ෂණික වෙනස්වීම්වලට හේතු වී ඇත්තේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවෙහි සිදු කළ වෙනස් කිරීම් සහ කාලීන සාධකවල බලපෑම්ය.

මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා වූ රුපියල් බිලියන 166.6 ක ඉහළ යෑම හා සැසඳීමේදී 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 293.5 ක් දක්වා රුපියල් බිලියන 119.5 කින් පහළ ගියේය. රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි පහළ යෑම සඳහා සැලකිය යුතු ලෙස දායක වෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු හැර), මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වන 2016 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 330.0 හා සැසඳීමේදී 2017 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 90.2 ක් දක්වා රුපියල් බිලියන 239.8 කින් පහළ ගියේය. භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමට ඉඩහැරීමට අමතරව, 2017 වසරේ ජූලි මස මැද භාගයේ සිට වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර පදනම යටතේ විකිණීම සඳහා වෙන්දේසි පැවැත්වීය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද තාවකාලික අත්තිකාරම් 2017 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 203.7 ක් දක්වා රුපියල් බිලියන 120.3 කින් ඉහළ ගියේය.

### පටු මුදල් සැපයුම ($M_1$)

- **වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටමක පවතින වාතාවරණයක් තුළ මුදල් ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 වසරේ පළමු මාස අට තුළදී පටු මුදල් වර්ධනය අඛණ්ඩව මන්දගාමී විය.** ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු යන ඉහළ ද්‍රවශීල මූල්‍ය වත්කම්වලින් සමන්විත වන පටු මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2016 වසර අවසානයේ පැවති සියයට 8.6 හා සැසඳීමේ දී 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 6.3 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. පටු මුදල් සැපයුමේ ඉහළ යෑම සඳහා සියයට 87 ක පමණ දායකත්වය සපයමින් මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්, 2016 වසර අවසානයේ වාර්තා කළ සියයට 10.7 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී සියයට 9.7 කින් වර්ධනය විය. මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2016 වසරේ වාර්තා කළ සියයට 6.2 ක වර්ධනය හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී සියයට 1.9 කින් පමණක් වර්ධනය විය. පෙර වසරේ සමාන මාස දොළහක කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල් බිලියන 23.5 ක ඉහළ යෑම හා සැසඳීමේදී, මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු, 2017 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 6.0 කින් ඉහළ ගියේය.

### පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සහ දේශීය ණය

- **පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2017 වසරේ පළමු මාස අට තුළදී අඛණ්ඩව ඉහළ වේගයකින් වර්ධනය විය.** 2016 වසර අවසානයේදී සියයට 18.4 ක අගයක් වාර්තා කළ පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2017 අගෝස්තු මස අවසානයේදී සියයට 21.3 ක අගයක් වාර්තා කළ අතර, එහි සාමාන්‍ය වර්ධනය 2016 වසරේ වාර්තා වූ සියයට 18.1 හා සාපේක්ෂව 2017 වසරේ පළමු මාස අට තුළදී සියයට 20.1 ක මට්ටමේ පැවතුණි. මෙම කාලපරිච්ඡේදය තුළ පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ශුද්ධ දේශීය වත්කම් සහ ශුද්ධ විදේශීය වත්කම් හේතු විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂමය වර්ධනය සඳහා ශුද්ධ දේශීය වත්කම් සියයට 78 ක දායකත්වයක් සැපයූ අතර, ඉතිරිය සඳහා ශුද්ධ විදේශීය වත්කම් දායක විය.

- **වගකීම් පාර්ශ්වයෙන් සැලකූ කල, පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය සඳහා වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතුවල ඉහළ යෑම වැඩි දායකත්වයක් දැක්වීය.** පොලී උපයන තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයක් වාණිජ බැංකු වෙත


7

අඛණ්ඩව ආකර්ෂණය කර ගැනීම සඳහා දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු ඊට පෙර මාස දොළහක කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල් බිලියන 671.9 ක ඉහළ යෑම හා සැසඳීමේදී 2017 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 1,017.1 කින් ඉහළ ගියේය. පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය සඳහා සියයට 96 ක පමණ දායකත්වයක් සපයමින්, 2016 වසර අවසානයේ වාර්තා වූ සියයට 20.2 හා සැසඳීමේදී කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු 2017 අගෝස්තු මස අවසානයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 23.8 කින් වර්ධනය විය. මේ අතර, මහජනයා සතු වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන ඉල්ලුම් තැන්පතු, 2017 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය තුළදී සුළු වර්ධනයක් පමණක් වාර්තා කළේය.

- **මුදල් සැපයුමේ වත්කම් අංශය සැලකූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයෙහි ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය.** ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් 2017 වසරේ පළමු මාස අට තුළ රුපියල් බිලියන 187.2 කින් ඉහළ යෑම මුළුමනින්ම හේතුකොටගෙන බැංකු අංශයෙහි ශුද්ධ විදේශීය වත්කම්, 2016 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 66.9 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 181.1 කින් ඉහළ ගියේය. (2017 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය තුළ එහි ඉහළ යෑම රුපියල් බිලියන 231.4 කි). වාණිජ බැංකුවල විදේශීය මූල්‍ය වගකීම් අඩුවීම හේතුවෙන් 2017 ජුනි මාසයේ සිට වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම්වල ක්‍රමානුකූල වර්ධනයක් සිදු වුවද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල් බිලියන 93.8 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 6.0 කින් පහළ ගියේය. මේ සඳහා වසරේ පළමු මාස අට තුළදී අක්වෙරළ බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 18.7 කින් අඩු වීමේ සහ දේශීය බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 12.7 කින් වැඩි වීමේ ශුද්ධ බලපෑම හේතු විය. විදේශීය බැංකුවලින් ලබාගත් ණය ප්‍රමාණය පහළ යෑම මධ්‍යයේ, අනේවාසිකයන්ගේ තැන්පතු ඉහළ යෑම සහ අනේවාසිකයන් සඳහා ලබාදුන් ණය ප්‍රමාණය අඩු වීම වැනි විවිධ සාධකවල ඒකාබද්ධ බලපෑම හේතුවෙන් අක්වෙරළ බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් පහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ විදේශීය බැංකු ඒකකවල පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු ශේෂ පහළ ගිය ද, විදේශීය බැංකු ඒකකවලින් ලබාගත් ණය පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2017 වසරේ පළමු මාස අට තුළ වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක සතු ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය.

**7.10 රූප සටහන**

**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායක වූ ප්‍රධාන සාධක (අ)**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2016 වසරේ අගෝස්තු සිට 2017 වසරේ අගෝස්තු දක්වා පුළුල් මුදල් සැපයුම සඳහා තුඩුදුන් සාධකවල වෙනස්වීම් බුබුලෙහි ප්‍රමාණයෙන් නිරූපණය වේ.

**7.11 රූප සටහන**

**බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

7

- **පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශය සඳහා වන ණය සැපයුමෙහි වර්ධනය හේතුවෙන්, බැංකු අංශයෙහි ශුද්ධ දේශීය වත්කම් 2017 වසරේ පළමු මාස අට තුළදී ඉහළ ගියේය.** ඒ අනුව, පුළුල් මුදල් ප්‍රසාරණය සඳහා සියයට 78 ක දායකත්වයක් සපයමින් බැංකු අංශයෙහි ශුද්ධ දේශීය වත්කම්, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රුපියල් බිලියන 406.0 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 463.8 කින් ඉහළ ගියේය (2017 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස දොළහක කාලපරිච්ඡේදය තුළ ශුද්ධ දේශීය වත්කම්වල ඉහළ යෑම රුපියල් බිලියන 830.6 කි). 2016 ජූලි මාසයේ සිට පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය මන්දගාමී වීමක් සහ 2017 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබාදුන් ණය සුළු වශයෙන් වැඩිවීමක් වාර්තා වුවද, පෞද්ගලික අංශයට, රජයට මෙන්ම රාජ්‍ය ව්‍යවසාය සඳහා සපයන ලද ණය ප්‍රමාණය 2017 වසරේ මේ දක්වා කාලය තුළ ශුද්ධ දේශීය වත්කම්වල ප්‍රසාරණය සඳහා හේතු විය.

- **ශුද්ධ දේශීය වත්කම්වල ප්‍රසාරණය සඳහා සියයට 57 ක පමණ දායකත්වයක් සපයමින්, බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2017 වසරේ පළමු මාස අට තුළදී අඛණ්ඩව ඉහළ ගියේය.** බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රුපියල් බිලියන 178.4 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 265.4 කින් ඉහළ ගියේය. රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සඳහා වාණිජ බැංකු විසින් සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම මුළුමනින්ම හේතු වී ඇති අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය පහළ ගියේය. ඒ අනුව, වාණිජ බැංකු විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කරන ලද රුපියල් බිලියන 11.8 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 384.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වාණිජ බැංකු විසින් රජයට සපයන ලද ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සඳහා වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකක මගින් රජයට සැපයූ ණය ප්‍රමාණය ඉහළ යෑම හේතු විය. ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යනාදියෙහි සිදු කරන ලද ආයෝජන, පිළිවෙළින්, රුපියල් බිලියන 255.4 කින් සහ රුපියල් බිලියන 39.5 කින් ඉහළ යෑම හේතුවෙන් වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2016 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 96.6 ක ඉහළ යෑමට සාපේක්ෂව 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 323.6 කින් ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ වාණිජ බැංකුවල පවත්නා රජයේ නොපියවූ අයිරා ශේෂය ද රුපියල් බිලියන 50.6 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු මාස අට තුළ වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කරන ලද ආයෝජන රුපියල් බිලියන 14.7 කින් පහළ ගියේය. තවද, 2016 වසර අවසානයේදී රුපියල් බිලියන 67.1 කින් පහළ ගිය වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය, 2017 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 61.3 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සිදු කරන ලද ආයෝජන රුපියල් බිලියන 22.1 කින් ඉහළ යෑම සහ රජයට සපයන ලද විදේශ විනිමය ණය

**7.2 සංඛ්‍යා සටහන**

**දේශීය ණය ප්‍රසාරණය සහ දායකත්ව සාධක**

| කාලපරිච්ඡේදය | වෙනස (රු. බිලියන) | | | | දේශීය ණය සඳහා දායකත්වය (%) | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය ණය(අ) | පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය | රජය වෙත සපයන ලද ශුද්ධ ණය | රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය | පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය | රජය වෙත සපයන ලද ශුද්ධ ණය | රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය |
| 2013 | 504.7 | 175.9 | 256.1 | 72.6 | 34.9 | 50.7 | 14.4 |
| 2014 | 439.4 | 223.9 | 134.6 | 80.9 | 51.0 | 30.6 | 18.4 |
| 2015 | 1,091.9 | 691.4 | 323.6 | 76.9 | 63.3 | 29.6 | 7.0 |
| 2016 | 939.6 | 754.9 | 212.6 | -27.9 | 80.3 | 22.6 | -3.0 |
| ජන - අගෝ 2016 | 553.3 | 456.3 | 178.4 | -81.5 | 82.5 | 32.3 | -14.7 |
| **ජන - අගෝ 2017** | **677.8** | **404.6** | **265.4** | **7.8** | **59.7** | **39.2** | **1.2** |

(අ) දේශීය ණය තුළ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය, රජය වෙත ලබාදුන් ශුද්ධ ණය සහ රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය අන්තර්ගත වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


රුපියල් බිලියන 39.2 කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2016 වසරේ දක්නට පැවති ප්‍රවණතාව වෙනස් කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 119.5 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු හැර) 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 90.2 දක්වා රුපියල් බිලියන 239.8 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සැලකිය යුතු ප්‍රමාණයක් කල් පිරීමට ඉඩහරින ලද අතර, 2017 වසරේ ජූලි සහ අගෝස්තු මාසවලදී වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව ස්ථිරව අවශෝෂණය කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාවර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම ද ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය අඩුවීම සඳහා හේතු විය. මේ අතර, රජය විසින් මුළු වසර සඳහා නියමිත තාවකාලික අත්තිකාරම් 2017 ජනවාරි මාසයේදී මුළුමනින්ම උපයෝජනය කිරීමත් සමඟ, 2017 වසරේ ජනවාරි මාසයේදී රුපියල් බිලියන 203.7 ක් දක්වා රුපියල් බිලියන 120.0 කින් පමණ තියුණු ලෙස වැඩිවූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට සපයනු ලබන තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය 2017 අගෝස්තු මස අවසානය වන විට බොහෝ දුරට නොවෙනස්ව එම මට්ටමේම පැවතිණ.

- **රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණයෙහි 2016 වසරේ සැප්තැම්බර් මාසයේ සිට දක්නට ලැබුණු ඉහළ යෑමේ ප්‍රවණතාව 2017 වසරේ පළමු මාස පහ තුළදී ද අඛණ්ඩව පැවතියද, ඉන් අනතුරුව එහි මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.** 2017 මැයි මස අවසානය වන විට රුපියල් බිලියන 66.6 ක ඉහළ යෑමක් වාර්තා කළ රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය, ඉන් අනතුරුව, 2017 අගෝස්තු මාසය අග වන විට 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා කළ රුපියල් බිලියන 81.5 ක පහළ යෑම හා සැසඳීමේ දී රුපියල් බිලියන 7.8 ක වැඩිවීමක් දක්වා පමණක් සීමා විය. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ලබාගත් ණය ප්‍රමාණය, පිළිවෙළින්, රුපියල් බිලියන 16.2, රුපියල් බිලියන 7.8 සහ රුපියල් බිලියන 7.6 කින් ඉහළ යෑම 2017 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි සමස්ත ඉහළ යෑම සීමා කරමින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2017 වසරේ මැයි සිට අගෝස්තු දක්වා කාලය තුළ සිය ණය වගකීම්වලින් රුපියල් බිලියන 52.8 ක් පමණ බැංකු අංශයට ආපසු ගෙවීම් සිදු කරනු ලැබුව ද, 2017 වසරේ පළමු මාස හතර තුළ ඉහළ ගිය ණය වගකීම් හේතුවෙන් වසරේ පළමු මාස අට තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආපසු ගෙවන ලද සමස්ත ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 10.8 කට සීමා විය. තවද, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා පොහොර සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය, වී අලෙවි මණ්ඩලය, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන රාජ්‍ය සංස්ථා විසින් 2017 වසරේ පළමු මාස අට තුළදී වාණිජ බැංකු වෙත නොපියවූ වගකීම්වලින්, පිළිවෙළින්, රුපියල් බිලියන 6.5, රුපියල් බිලියන 2.7, රුපියල් බිලියන, 2.6, රුපියල් බිලියන 1.8, රුපියල් බිලියන 1.3 සහ රුපියල් බිලියන 1.1 වශයෙන් ආපසු ගෙවන ලදී.

- **ඉහළ නාමික සහ මූර්ත පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ, 2017 වසරේ පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළදී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය ක්‍රමයෙන් මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.** ඉහළ ණය ප්‍රසාරණය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමට අමතරව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ තෝරාගත් ආනයන අධෛර්යවත් කිරීම සඳහා සිදු කරන ලද තීරු බදු වෙනස්කම් ද පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය මන්දගාමී වීම සඳහා දායක විය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2016 ජූලි මාසයේදී වාර්තා වූ සියයට 28.5 ක උපරිමය සහ 2016 වසර අවසානයේ වාර්තා වූ සියයට 21.9 හා සැසඳීමේදී, 2017 අගෝස්තු මස අවසානය වන විට සියයට 18.0 ක් විය. 2017 වසරේ පළමු මාස අට තුළදී පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ අගයක පැවතිණ. ඒ අනුව, 2017 වසරේ පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප

**7.12 රූප සටහන**

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 456.3 ක ඉහළ යෑම හා සාපේක්ෂව රුපියල් බිලියන 404.6 ක් විය. මේ අතර, 2017 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය කාඩ්පත් හා අනෙකුත් ණය සහ කල්පිරුණු ණය හා අත්තිකාරම් සඳහා වාණිජ බැංකු විසින් පනවන ලද දඩ පොලී අනුපාතික සඳහා වූ පොලී අනුපාතික උපරිම සීමා ඉවත් කිරීමේ ක්‍රියාමාර්ගය ඉදිරි කාලය තුළදී පෞද්ගලික අංශය වෙත සපයන ණය ප්‍රමාණය කිසියම් දුරකට මන්දගාමී කිරීමට හේතු වනු ඇත.

- **ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ සඳහා ලබාදුන් ණය 2017 පළමු භාගය තුළ මන්දගාමී අනුපාතයකින් වුවද අඛණ්ඩව ඉහළ ගියේය.** වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, 2017 ජූනි මස අවසානය වන විට කර්මාන්ත සහ කෘෂි අංශ සඳහා සපයන ලද ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 21.1 කින් සහ සියයට 20.5 කින් වර්ධනය විය. කෘෂි අංශය තුළ සියලුම ප්‍රධාන උප අංශ සඳහා සපයන ලද ණය වර්ධනයක් වාර්තා කළ අතර, පොල්, වී, පශු සම්පත් හා කිරිපට්ටි පාලනය සහ ධීවර යන උප අංශ සඳහා සපයන ලද ණය වර්ධනය 2017 ජූනි මස අග වන විට සියයට 35 කට වැඩි වාර්ෂික ලක්‍ෂමය වර්ධනයක් වාර්තා කළේය. ඇතැම් ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් වූ හානි යථා තත්ත්වයට පත් කිරීම සඳහා ලබාදුන් ණය ප්‍රමාණය ඉහළ යෑම, කෘෂි අංශයට සපයන ලද ණය වර්ධනය සඳහා කිසියම් දුරකට හේතු විය. කර්මාන්ත අංශයෙහි ද සියලු ප්‍රධාන උප අංශ සඳහා ලබාදුන් ණය ධනාත්මක වර්ධනයක් වාර්තා කළ අතර, කර්මාන්ත අංශයෙහි සමස්ත ණය සැපයුමෙන් සියයට 48 ක් සහ සමස්ත පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙන් සියයට

**7.3 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම් වර්ගීකරණය (අ)(ආ)**

රුපියල් බිලියන

| කාණ්ඩය | 2016 ජූනි අවසානයට (ඇ) | 2017 ජූනි අවසානයට (ඈ) | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස | |
|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | % |
| **කෘෂිකාර්මික සහ ධීවර** | **317.0** | **382.0** | **65.0** | **20.5** |
| එයින්, තේ | 78.1 | 84.6 | 6.6 | 8.4 |
| රබර් | 20.4 | 25.3 | 4.9 | 23.8 |
| පොල් | 12.5 | 19.6 | 7.0 | 56.0 |
| වී | 23.5 | 32.3 | 8.9 | 37.8 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර භෝග | 22.0 | 27.2 | 5.2 | 23.6 |
| ධීවර | 12.3 | 16.8 | 4.5 | 36.8 |
| **කර්මාන්ත** | **1,539.6** | **1,864.0** | **324.4** | **21.1** |
| එයින්, ඉදිකිරීම් | 741.0 | 902.8 | 161.8 | 21.8 |
| ආහාර සහ පාන වර්ග | 86.5 | 103.6 | 17.2 | 19.8 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 144.7 | 156.8 | 12.0 | 8.3 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 126.5 | 158.5 | 32.0 | 25.3 |
| **සේවා** | **1,149.7** | **1331.0** | **181.3** | **15.8** |
| එයින්, තොග සහ සිල්ලර වෙළඳාම | 353.6 | 400.0 | 46.3 | 13.1 |
| සංචාරක ව්‍යාපාරය | 118.8 | 160.4 | 41.7 | 35.1 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 282.2 | 306.6 | 24.4 | 8.7 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 26.1 | 22.7 | -3.4 | -12.9 |
| **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඉ)** | **824.2** | **972.1** | **147.9** | **17.9** |
| එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ | 172.0 | 207.0 | 35.1 | 20.4 |
| උකස් ණය | 122.3 | 137.5 | 15.2 | 12.4 |
| **එකතුව** | **3,830.5** | **4,549.1** | **718.6** | **18.8** |


(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වී ඇත.
(ආ) ණය, අයිරා සහ වට්ටම් කළ සහ මිලට ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් වේ.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික
(ඉ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත් කර ඇති අතර, ණය කාඩ්පත් මගින් ලබාදෙන නොපියවූ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

20 ක් වන ඉදිරිකිරීම් උප අංශය වෙත ලබාදුන් ණය 2017 ජුනි මස අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 21.8 කින් වර්ධනය විය. මූල්‍ය සහ ව්‍යාපාර සේවා උප අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි පහළ යෑම හේතුකොටගෙන 2017 ජුනි මස අවසානය වන විට, සේවා අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා කරන ලද සියයට 46.1 ක වර්ධනය හා සාපේක්ෂව සියයට 15.8 ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කළේය. තවද, සංචාරක, ප්‍රවාහන, මුද්‍රණ හා ප්‍රකාශන සහ අධ්‍යාපන යන උප අංශ සඳහා සපයන ලද ණය සාපේක්ෂව ඉහළ වර්ධනයක් වාර්තා කළ අතර, නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය යන උප අංශය සඳහා සපයන ලද ණය ප්‍රමාණය 2017 ජුනි මස අවසානය වන විට සියයට 12.9 කින් පහළ ගියේය. 2017 වසරේ පළමු භාගය තුළ පෞද්ගලික ණය සහ අත්තිකාරම් අංශය යටතේ සපයන ලද ණය ප්‍රමාණය, 2016 වසරේ එයට අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ සියයට 18.7 ක වර්ධනය හා සැසඳීමේ දී සියයට 17.9 කින් වර්ධනය වී සුළු මන්දගාමී වීමක් පෙන්නුම් කළේය. මෙම උප අංශය තුළ, ණය කාඩ්පත් යටතේ සපයන ලද ණය ප්‍රමාණය 2017 වසරේ පළමු භාගයේ දී සියයට 22.6 කින් වර්ධනය විය. 2013 වසරේ සැප්තැම්බර් මස සිට පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ උකස් ණය අත්තිකාරම්වල එම ප්‍රවණතාව වෙනස් කරමින් 2017 වසරේ පළමු භාගයේ දී සියයට 12.4 ක වර්ධනයක් වාර්තා කළේය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම, ජාත්‍යන්තර රත්‍රන් මිල ගණන් ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම සඳහා සපයන ලද ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 58.9 ක සැලකිය යුතු වර්ධනය හා සාපේක්ෂව 2017 වසරේ ජුනි මස අග වන විට සියයට 20.4 ක් දක්වා මන්දගාමී විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සඳහා වන පරිණත කාලසීමා අනුව සැලකීමේදී, 2017 ජුනි මස අග වන විට කෙටිකාලීන ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 15.7 ක වාර්ෂික ලක්‍ෂමය වර්ධනය හා සැසඳීමේ දී සියයට 18.4 කින් වර්ධනය විය. මේ අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ, පිළිවෙළින්, සියයට 25.6 හා සියයට 55.8 ක් ලෙස වර්ධනය වූ මැදි හා දිගුකාලීන ණය වර්ධනය 2017 වසරේ ජුනි මස

**7.13 රූප සටහන**

**වාණිජ බැංකු විසින් ප්‍රධාන අංශ වෙත ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂමය වර්ධනය**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

අවසානය වන විට සියයට 14.2 හා සියයට 23.3 ක වර්ධනයක් වාර්තා කරමින් සැලකිය යුතු මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.

## පුළුල් මුදල් සැපයුම ($M_4$)

- **මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරනු ලබන පුළුල් මුදල් සැපයුමෙහි ($M_4$)[1] වර්ධනය, $M_{2b}$ පුළුල් මුදල් සැපයුමට සමගාමීවූ හැසිරීමක් පෙන්නුම් කළේය.** 2016 වසර අවසානයේ පැවති සියයට 15.9 ක වර්ධනය හා සැසඳීමේ දී පුළුල් මුදල් සැපයුම ($M_4$) 2017 වසරේ අගෝස්තු මස අවසානයේ දී සියයට 20.7 ක ඉහළ වර්ධනය අනුපාතිකයක් වාර්තා කළේය. පුළුල් මුදල් සැපයුමෙහි ($M_4$) වගකීම් අංශයෙන් සලකා බලන විට, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සතු සියලුම කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2016 වසර අවසානයේ පැවති සියයට 17.1 හා සැසඳීමේ දී 2017 අගෝස්තු මස අවසානයේදී සියයට 22.7 ක් විය. මෙම කාලපරිච්ඡේදය තුළදී තැන්පතු සඳහා පිරිනමන ලද ඉහළ සහ තරගකාරී පොලී අනුපාතික හේතුවෙන් 2017 අගෝස්තු මස අවසානය වන විට, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු, පිළිවෙළින්, සියයට 15.5 කින් සහ සියයට 25.6 කින් වර්ධනය විය.

1 මූල්‍ය සමීක්‍ෂණය ද්‍රවශීලතාව පිළිබඳව වඩාත් පුළුල් මිනුමක් වන අතර, එයට මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළත් වේ.

7

### 7.4 සංඛ්‍යා සටහන
### පුළුල් මුදල් ($M_4$) සැපයුමෙහි වත්කම් අංශය (මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)

රුපියල් බිලියන

| අංශය | 2016 අගෝස්තු අවසානයට | 2016 අවසානයට | 2017 අගෝස්තු අවසානයට (අ) | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස: 2016 අවසානයට | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස: 2017 අගෝස්තු අවසානයට | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **පුළුල් මුදල් ($M_4$)** | **6,178.8** | **6,630.3** | **7,457.0** | **910.0** | **15.9** | **1,278.2** | **20.7** |
| තුඩුදුන් සාධක | | | | | | | |
| **ශුද්ධ විදේශීය වත්කම්** | **-429.1** | **-383.2** | **-205.2** | **61.0** | **13.7** | **223.9** | **52.2** |
| මුදල් අධිකාරීන් | 499.0 | 558.6 | 745.8 | -17.6 | -3.1 | 246.8 | 49.4 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -780.5 | -789.8 | -795.9 | 84.5 | 9.7 | -15.3 | -2.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් | -147.6 | -152.0 | -155.1 | -6.0 | -4.1 | -7.6 | -5.1 |
| **ශුද්ධ දේශීය වත්කම්** | **6,607.9** | **7,013.5** | **7,662.3** | **849.1** | **13.8** | **1,054.4** | **16.0** |
| **දේශීය ණය** | **8,293.2** | **8,763.3** | **9,595.6** | **1,159.6** | **15.3** | **1,302.4** | **15.7** |
| **රජයට ලබාදුන් ශුද්ධ ණය** | **2,529.4** | **2,555.9** | **2,843.2** | **211.6** | **9.0** | **313.7** | **12.4** |
| මුදල් අධිකාරීන් | 396.5 | 413.0 | 293.5 | 183.1 | 79.6 | -103.0 | -26.0 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 1,541.4 | 1,559.1 | 1,944.0 | 29.6 | 1.9 | 402.6 | 26.1 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 527.0 | 515.7 | 541.4 | -13.6 | -2.6 | 14.5 | 2.7 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 64.5 | 68.1 | 64.2 | 12.5 | 22.5 | -0.3 | -0.5 |
| **රාජ්‍ය සංස්ථාවලට දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු)** | **441.5** | **495.1** | **502.9** | **-27.9** | **-5.3** | **61.4** | **13.9** |
| **පෞද්ගලික අංශයට ලබා දුන් ණය** | **5,322.3** | **5,712.3** | **6,249.5** | **975.9** | **20.6** | **927.2** | **17.4** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3,905.9 | 4,204.4 | 4,609.1 | 754.9 | 21.9 | 703.2 | 18.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 528.2 | 562.2 | 631.9 | 80.5 | 16.7 | 103.7 | 19.6 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 888.2 | 945.7 | 1,008.6 | 140.5 | 17.4 | 120.3 | 13.5 |
| **අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ)** | **-1,685.3** | **-1,749.8** | **-1,933.3** | **-310.6** | **-21.6** | **-248.0** | **-14.7** |

(අ) තාවකාලික
(ආ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වත්කම් අංශය සැලකූ විට, පුළුල් මුදල් සැපයුමෙහි ($M_4$) වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 648.8 කින් ඉහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී ශුද්ධ විදේශීය වත්කම් ද රුපියල් බිලියන 178.0 කින් වර්ධනය විය.

- **මූල්‍ය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය 2017 වසර පළමු මාස අට තුළදී මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.** පුළුල් මුදල් සැපයුමට ($M_4$) අනුව, පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි 2016 වසර අවසානයේ පැවති සියයට 20.6 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හා සැසඳීමේදී 2017 වසර අගෝස්තු මස අවසානය වන විට සියයට 17.4 ක් දක්වා මන්දගාමී විය. ඒ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ණය වර්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2016 වසර අවසානයේ පැවති සියයට 17.4 හා සැසඳීමේ දී 2017 වසරේ අගෝස්තු අවසානය වන විට සියයට 13.5 ක් දක්වා මන්දගාමී විය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ණය වර්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2016 වසර අවසානයේ පැවති සියයට 16.7 හා සැසඳීමේදී 2017 වසරේ අගෝස්තු අවසානය වන විට සියයට 19.6 ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ණය ප්‍රමාණයෙහි ඉහළ යෑම, 2016 අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල් බිලියන 585.9 හා සැසඳීමේ දී 2017 වසරේ පළමු මාස අට තුළදී රුපියල් බිලියන 537.2 ක් විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළදී මූල්‍ය සමීක්ෂණය මගින් ආවරණය කරන ලද සියලුම බැංකු සහ මූල්‍ය ආයතනවලින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි ඉහළ යෑමක් වාර්තා විය. ඒ අනුව, රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 185.1 ක ඉහළ යෑම හා සැසඳීමේ දී 2017 වසර පළමු මාස අටක කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 287.3 කින් ඉහළ ගියේය.

## අපේක්ෂිත වර්ධනයන්

- **මැදිකාලීන වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත පිවිසීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් ශක්තිමත් කෙරෙමින් පවතී.** මෙම ක්‍රියාවලියෙහි ප්‍රධාන පියවර අතරට අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ආයතනික සහ තාක්ෂණික ශක්‍යතා වර්ධනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය සහ මහ බැංකුව කෙරෙහි ඇති විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, රජය හා මහ බැංකුව අතර සම්බන්ධතාව ඉහළ නැංවීම, අඛණ්ඩව වෙළඳපොළ මත පදනම් වූ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම, මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ මහජනතාව හා පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම යනාදිය ඇතුළත් වේ. මෙම නව මුදල් ප්‍රතිපත්ති රාමුව සුමට ලෙස ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය කරනු ලබන තවදුරටත් සපුරා නොමැති ප්‍රධාන අවශ්‍යතා සපුරාලීම කරා වන ගමන් මගට තවදුරටත් පහසුකම් සැපයීම සඳහා රජයේ සහාය ද ඇතිව නුදුරු අනාගතයේදී පෙර දැක්මක් ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මෑතකදී ප්‍රකාශයට පත් කෙරුණු '2025 දැක්ම-පොහොසත් රටක්' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය වඩාත් කාර්යක්ෂමව හැසිරවීම සඳහා ඊට අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීමට මෙන්ම, විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලීව තීරණය වීම සඳහා සහාය වීමේ රජයේ අභිලාෂය පෙන්නුම් කොට ඇත.

- **නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය හඳුන්වා දීම සහ එය වඩාත් සාර්ථක වීම සඳහා රජයේ මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය බාධා රහිතව අඛණ්ඩව ක්‍රියාත්මක වීම අතිශය වැදගත් වේ.** අඩු මෙන්ම ස්ථායී උද්ධමනයක් මැදිකාලීනව පවත්වා ගැනීමට උපකාරී වන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සාර්ථක කර ගැනීම සඳහා ආදායම රැස්කිරීම මත පදනම් වුණු රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් වෙත පිවිසීම සඳහා රජයේ ඇති කැපවීමත් සමඟ මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සඳහා වන ඉහළ කාලීන අවශ්‍යතාවක් පවතී. වැඩි දියුණු කරන ලද රාජ්‍ය මූල්‍ය අවකාශය, මහ බැංකුවට සිය මුදල් ප්‍රතිපත්තිය වඩාත් ස්වාධීනව මෙන්ම ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරණු ලබන ඉහළ නම්‍යශීලීත්වයක් ලබාදෙන අතර, එතුළින් පහසුවෙන් පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර මෙන්ම අඩු වෙළඳපොළ පොලී අනුපාතික මට්ටමක් සහිතව ආර්ථික වර්ධනයට හිතකර වන වාතාවරණයක් ළඟා කර ගත හැකි වේ.

- **විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සහ රජය මගින් සිදු කරනු ලබන කෙටිකාලීන පිරිවැය ගැළපුම්කරණ ක්‍රියාමාර්ග හේතුවෙන් දැනට දැකිය හැකි මිල මට්ටම් මත පවතින අවහිරතා නුදුරේදී පහව යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, අයහපත් කාලගුණික තත්ත්ව මත ඇති වූ සැපයුම් අවහිරතා මෙන්ම රාජ්‍ය බදු ව්‍යුහයේ සිදු කරන ලද වෙනස්කම් හේතුවෙන් 2017 වසරේ අවස්ථා ගණනාවකදීම උද්ධමනයෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුකොටගෙන ආර්ථිකයෙහි යටිදැරි උද්ධමන පීඩනය මනිනු ලබන මූලික උද්ධමනය, මේ කාලය තුළදී දැරිය හැකි මට්ටමක පැවතිණි. මෙහිදී, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් ඉල්ලුමෙන් ජනිත වන යටිදැරි උද්ධමනය පාලනය කිරීමට මෙන්ම උද්ධමන අපේක්ෂා ඉලක්කගත උද්ධමන මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරන අතරම, දැඩි ගැටලුවක්ව පවතින ආහාර උද්ධමනය පාලනය කිරීම සඳහා කෙටි හා මැදිකාලීන ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. පරිභෝජන භාණ්ඩ පැස තුළ ආහාර සහ ආනයනික භාණ්ඩ විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන්, දේශීය ආර්ථිකයෙහි සැපයුමෙන් හට ගන්නා අවහිරතා මෙන්ම, ඛනිජ තෙල් ඇතුළු ජාත්‍යන්තර වෙළඳපොළ භාණ්ඩ මිල ගණන්වල ඉහළ යෑම් ද මිල ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි බාධා එල්ල කරනු ලබයි. දේශීය වෙළඳපොළ සැපයුම් ජාලය ශක්තිමත් කිරීම සහ සැපයුම් අවහිරතා හේතුවෙන් සමාජයේ පහළ කොට්ඨාස මත ඇති විය හැකි අවදානම අඩු කිරීම සඳහා ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම එවැනි අවහිරතා සඳහා ආර්ථිකයට ඇති ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වේ.

# 8

# මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

මූල්‍ය අංශය 2017 වසරේ පළමු භාගය තුළදී වර්ධනය සහ ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. ණය සහ ආයෝජන කළඹින් සමන්විත බැංකු අංශයේ වත්කම් පදනම වර්ධනය වීමට තැන්පතු මගින් ලැබුණු අරමුදල් විශාල වශයෙන් දායක විය. බැංකු අංශයේ ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන අනුපාත ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට වඩා සැලකිය යුතු ඉහළ මට්ටමක පවත්වා ගන්නා ලදී. රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කරමින් බැංකු ශාඛා ජාලය වර්ධනය විය. වෙළඳපොළ අහිතකර වර්ධනයන් ඇතිවීම අවම කිරීමට ක්‍රියාත්මක කරන ලද සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් මන්දගාමී වූ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල වර්ධනය, සුරක්ෂිත ණයදීමේ කටයුතු සමග ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්වීය. මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය අඩු වුවද, ණය කළඹෙහි වර්ධනය හා ගැළපෙන මට්ටමක පැවතුණි. ප්‍රාථමික ගැනුම්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය මධ්‍යස්ථව පැවතුණි. රක්ෂණ අංශය සහ විශ්‍රාම අරමුදල් ධනාත්මක ක්‍රියාකාරිත්වයක් වාර්තා කළ අතර, ඒකක භාර අංශය පසුබෑමක් පෙන්වීය. ශක්තිමත් ප්‍රාග්ධන රෙගුලාසි මධ්‍යයේ සලකා බලන කාලපරිච්ඡේදය තුළදී කොටස් තැරැව්කාර අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වන ලදී. දේශීය මුදල් වෙළඳපොළේ රුපියල් ද්‍රවශීලතාව ජූලි මැද සිට අතිරික්තයක් වාර්තා කිරීමට පෙර බොහෝ දුරට වසර පුරාම හිඟ මට්ටමක පැවතුණි. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝර්වේ ඉහළ සීමාව ආසන්නයේ පැවති අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය 2017 වසරේ අගෝස්තු මාසය ආරම්භයේ සිට ක්‍රමයෙන් අඩු විය. වසරේ මුල් මාස හතර තුළදී රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළේ ඵලදා අනුපාතික සුළු වශයෙන් ඉහළ ගියද, ඉන්පසුව සැලකිය යුතු ලෙස පහත වැටුණි. රට තුළට විදේශ විනිමය ගලාඒම හේතුවෙන් ඇතිවූ යහපත් දේශීය වෙළඳපොළ තත්ත්ව මේ සඳහා හේතු විය. ආනයන විනිමය ගලායෑම් සහ අහිතකර ගෝලීය මූල්‍ය තත්ත්වයන් තුළින් වසරේ පළමු මාස හත තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළ කෙරෙහි පීඩනයක් එල්ල විය. කෙසේ වුවද, අපනයනකරුවන් රටතුළට විනිමය රැගෙන ඒමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම්වල දෙවන වාරිකය ලැබීමත් හේතුවෙන් විනිමය අනුපාතික මත වූ බලපෑම අවම විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින් වසරේ පළමු මාස නවය තුළදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 2.15 ක මධ්‍යස්ථ මට්ටමකින් අවප්‍රමාණය විය. සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ කටයුතු මධ්‍යස්ථව පැවතුණු අතර, ආයෝජක විශ්වාසය පහත වැටීම සහ වෙළඳපොළ ක්‍රියාකාරිත්වයේ විචලනය පිළිබිඹු කරමින් කොටස් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය අඩු විය. කෙසේ වෙතත්, කොටස් මිල දර්ශක සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය වර්ධනය වූ අතර, වසර තුළ මේ දක්වා විදේශිකයෝ කොටස් වෙළඳපොළ තුළ ශුද්ධ ගැනුම්කරුවන් ලෙස ක්‍රියා කළහ. මේ අතර, රටෙහි ජාතික ගෙවීම් පද්ධතිය සැලකිය යුතු බාධාවකින් හෝ පද්ධතිමය අවදානමකින් තොරව සුමටව ක්‍රියාත්මක විය. මූල්‍ය අංශයේ වර්ධනය සහ වෙනස් වන ගෙවීම් අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මෙම කාලපරිච්ඡේදය තුළදී විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.


## මූල්‍ය ආයතනවල වර්ධනයන්

### බැංකු අංශය

- බැංකුවල ණය හා ආයෝජන කළඹෙහි වර්ධනයක් පිළිබිඹු කරමින් 2017 වසරේ මුල් මාස අට තුළ බැංකු අංශයේ වත්කම් පදනම තවදුරටත් ප්‍රසාරණය විය. වත්කම් පදනමේ වර්ධනය මූලික වශයෙන් මූල්‍යනය වූයේ තැන්පතු මගිනි. ඉහළ ශුද්ධ පොලී ආදායම, සැලකිය යුතු මට්ටමේ ප්‍රත්‍යාගණන ලාභ සහ පහළ කාරක වියදම් නිසා බැංකු පද්ධතියේ ලාභදායිත්වය ඉහළ ගියේය. බැංකු ද්‍රවශීලතාව යහපත් මට්ටමක පවත්වා ගත් අතර හදිසි කම්පනයන්ට ඔරොත්තු දෙන මට්ටමේ ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් ද පවත්වා ගන්නා ලදී. ශාඛා හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයෙහි වර්ධනය තුළින් බැංකු අංශය සිය පැතිරීම තවදුරටත් තහවුරු කර ගන්නා ලදී.

- **බැංකු අංශයේ සමස්ත වත්කම් 2016 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 6.8 ක වර්ධනය හා සැසඳීමේදී 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සියයට 9.4 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් ට්‍රිලියන 9.9 ක් විය.** ශුද්ධ ණය හා අත්තිකාරම් රුපියල් බිලියන 599.4 කින්ද, ආයෝජන රුපියල් බිලියන 296.2 කින්ද ඉහළ යෑම, වත්කම් පදනමේ රුපියල් බිලියන 854.9 ක ඉහළ යෑමට මූලික වශයෙන් බලපෑවේය. මෙම වර්ධනය මූලික වශයෙන් තැන්පතු මගින් මූල්‍යනය වී ඇත. රාජ්‍ය සුරැකුම්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන, සමස්ත ආයෝජන කළඹට දැක්වූ දායකත්වය සියයට 97 ක් විය.

රූප සටහන 8.1
බැංකු අංශයේ වත්කම්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2017 වසරේ පළමු මාස අට තුළ, මුළු ණය හා අත්තිකාරම් සියයට 10.8 කින් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට එම අගය රුපියල් ට්‍රිලියන 6.1 ක් විය.** ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික හමුවේ වුවද, 2017 වසරේ පළමු භාගය තුළ ආර්ථිකයේ සෑම අංශයකටම ලබාදුන් ණයවල ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, ප්‍රවාහන, වෙළඳ, සංචාරක හා නිෂ්පාදන ක්ෂේත්‍රවලට ණය ලබාදීමේ විශාල වර්ධනයක් වාර්තා විය. 2017 වසරේ ජූනි මස අවසානය වන විට ණය, ප්‍රධාන වශයෙන්ම ඉදිකිරීම් (සියයට 17.7), වෙළඳ (සියයට 14.3), නිෂ්පාදන (සියයට 10.8) හා වෙනත් (සියයට 16.5) යන අංශවලට සංකේන්ද්‍රණය වී ඇත. 2017 වසරේ පළමු මාස අට තුළ, අයිරා (සියයට 18.4) හා කාලීන ණය (සියයට 10.3) සහ

8.1 සංඛ්‍යා සටහන
බැංකු අංශයේ තෝරාගත් දර්ශක

| අයිතම | 2015 අගෝ. අවසානයට | 2016 අගෝ. අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 අගෝ. | 2017 අගෝ. (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 7,491 | 8,624 | 9,047 | 9,901 | 15.1 | 14.8 |
| ණය සහ අත්තිකාරම් (රු. බිලියන) | 4,338 | 5,092 | 5,541 | 6,140 | 17.4 | 20.6 |
| ආයෝජන (රු. බිලියන) | 2,345 | 2,428 | 2,291 | 2,588 | 3.6 | 6.6 |
| තැන්පතු (රු. බිලියන) | 5,067 | 5,855 | 6,296 | 7,063 | 15.6 | 20.6 |
| ණය ගැනීම් (රු. බිලියන) | 1,520 | 1,758 | 1,696 | 1,604 | 15.7 | -8.8 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 613 | 683 | 707 | 823 | 11.4 | 20.5 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 13.5 | 12.2 | 12.5 | 12.2 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 16.0 | 14.7 | 15.6 | 15.0 | | |
| දළ අක්‍රීය ණය අනුපාතය (%) | 4.2 | 3.0 | 2.6 | 2.8 | | |
| ශුද්ධ අක්‍රීය ණය අනුපාතය (%) | 2.2 | 1.1 | 0.7 | 0.9 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) | 1.8 | 1.9 | 1.9 | 2.0 | | |
| හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) | 15.5 | 16.9 | 17.3 | 17.6 | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක) (%) | 35.4 | 31.4 | 30.0 | 31.2 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 30.6 | 29.2 | 27.3 | 29.0 | | |


(අ) තාවකාලික
(ආ) ජූනි මස අවසානයට

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.2 රූප සටහන**

**බැංකු අංශයේ ණය සහ අත්තිකාරම්**





උකස් අත්තිකාරම් (සියයට 8.7) ක සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කරන ලදී. එසේ වුවත්, කල්බදු අත්තිකාරම් කළඹ වර්ධනය වූයේ සියයට 3.1 ක් වැනි සුළු ප්‍රමාණයකිනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2017 වසරේ ජනවාරි මස සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් හඳුන්වා දුන් වටිනාකම මත ණය අනුපාතයයි. 2017 වසරේ පළමු මාස අට තුළ විදේශ විනිමය ණය හා අත්තිකාරම් සියයට 13.4 කින් වර්ධනය විය. මුළු ණය හා අත්තිකාරම් කළඹින් විදේශ විනිමය ණය මත අත්තිකාරම් අනුපාතයක් ලෙස ගත් කල 2016 වසරේ දෙසැම්බර් මස අවසානයට පැවති සියයට 18 ට සාපේක්ෂව 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 19 ක් දක්වා ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

- **2017 වසරේ පළමු මාස අට තුළ ආයෝජන කළඹේ සංයුතියේ වෙනස්වීමක් පිළිබිඹු විය.** 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට කල්පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන කළඹ මුළු ආයෝජන කළඹින් සියයට 73.8 ක් වූ අතර, එය 2016 වසරේදී සියයට 79.5 ක් විය. ගනුදෙනු කරන ආයෝජන කළඹ, මුළු ආයෝජන කළඹෙහි අනුපාතයක් ලෙස 2016 වසර අවසානය වන විට සියයට 20.5 ක් වූ අතර, එය 2017 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 25.9 ක් දක්වා ඉහළ ගියේය. අගෝස්තු මාසයෙන් අවසන් වන වසර තුළ දී ගනුදෙනු කරන ආයෝජන කළඹෙහි වර්ධනය සියයට 43.3 කි.

**8.3 රූප සටහන**

**බැංකු අංශයේ අරමුදල් මූලාශ්‍ර**




- **බැංකු අංශයෙහි ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වන තැන්පතු සමස්ත වත්කම්වලින් සියයට 71.3 ක් වශයෙන් පැවති අතර, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට එහි වටිනාකම රුපියල් ට්‍රිලියන 7 ඉක්මවීය.** බැංකු අංශයේ තැන්පතු පදනම රුපියල් බිලියන 767.9 (සියයට 12.2) කින් වර්ධනය වූ අතර, ඉන් සියයට 84 ක් රුපියල් තැන්පතුවලින් සමන්විත විය. සියයට 19.1 ක වර්ධනයක් පෙන්වූ කාලීන තැන්පතු, මුළු තැන්පතුවල වර්ධනයට මූලික වශයෙන් හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ, ජංගම තැන්පතු සියයට 8.9 කින් අඩු වූ අතර, ඉතුරුම් තැන්පතු සියයට 3.9 කින් ඉහළ යෑමක් වාර්තා කළේය. ජංගම හා ඉතුරුම් තැන්පතු මුළු තැන්පතුවල අනුපාතයක් ලෙස ගත් කල 2017 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 33.5 ක අගයක් ගත් අතර එය 2016 වසරේ දෙසැම්බර් මස අවසානයේදී වාර්තා වූ සියයට 37.1 ක අගයට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරයි.

- **2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයේ ණය ලබාගැනීම් රුපියල් බිලියන 92.2 (සියයට 5.4) කින් අඩු විය.** 2017 වසරේ පළමු මාස අට තුළ සිදුවූ රුපියල් ණය ලබාගැනීම්වල රුපියල් බිලියන 100.3 (සියයට 15.1) ක අඩුවීම, මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට සාපේක්ෂව, රුපියල් බිලියන 8.1 (එ.ජ. ඩොලර් මිලියන 52.9) කින් බැංකු අංශයේ විදේශ විනිමය ණය ලබාගැනීම් වර්ධනය වීම හේතුවෙන්, මෙම අංශයේ විදේශ විනිමය ණය ප්‍රමාණය සමස්ත ණයෙහි අනුපාතයක් වශයෙන් 2016 වසර අවසානයේදී පැවති සියයට 61 ට සාපේක්ෂව 2017


වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 65 ක් දක්වා වැඩි විය. දේශීය මූලාශ්‍රවලින් ලබාගත් විදේශ විනිමය ණය රුපියල් බිලියන 14.5 හෝ එ.ජ. ඩොලර් මිලියන 95.2 (සියයට 18.4) කින් වැඩි වූ අතර, විදේශ මූලාශ්‍රවලින් ලබාගත් විදේශ විනිමය ණය ලබාගැනීම් රුපියල් බිලියන 6.5 හෝ එ.ජ. ඩොලර් මිලියන 42.2 (සියයට 0.7) කින් පහළ ගියේය.

- **2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මක භාවයෙහි සුළු පහතයෑමක් පෙන්නුම් කරන ලදී.** මුළු අක්‍රීය ණය රුපියල් බිලියන 169 ක් දක්වා රුපියල් බිලියන 26.8 කින් වැඩි විය. එසේ වුවද, අක්‍රීය ණය අනුපාතය 2016 වසරේ දෙසැම්බර් මස අවසානයේදී වාර්තා වූ සියයට 2.6 ට සාපේක්ෂව 2017 වසරේ අගෝස්තු මස සියයට 2.8 ක් දක්වා සුළු වැඩි වීමක් පමණක් පෙන්නුම් කරයි. අක්‍රීය ණය අනුපාතයේ සුළු වැඩිවීමට බැංකු විසින් අනුගමනය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ ක්‍රමවේදය හා ණය කළඹෙහි වූ විශාල වැඩි වීම හේතු විය. 2017 වසරේ ජුනි මස අවසානයේදී වැඩිම අක්‍රීය ණය අනුපාත වාර්තා වූ අංශ ලෙස සංචාරක (සියයට 4.7), කෘෂිකර්ම හා ධීවර (සියයට 4.1), නිෂ්පාදන (සියයට 3.8), වෙළඳ (සියයට 3.6), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (සියයට 3.2) හා ඉදිකිරීම් (සියයට 3.0) වාර්තා විය. 2017 වසරේ අගෝස්තු අවසානය වන විට විශේෂ වෙන්කිරීම්, මුළු වෙන් කිරීම්වලින් සියයට 72.5 ක් විය. විශේෂ වෙන් කිරීම් ආවරණ අනුපාතය 2016 වසරේ දෙසැම්බර් මස වාර්තා වූ සියයට 52.1 සිට 2017 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 48 ක් දක්වා පහළ වැටුණි.

- **2017 වසරේ පළමු මාස අට තුළ බැංකු අංශය තම ද්‍රවශීලතාවය යහපත් මට්ටමක පවත්වා ගන්නා ලදී.** දේශීය බැංකු අංශයේ හා අක්වෙරළ බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව වූ සියයට 20.0 ට වඩා වැඩියෙන්, පිළිවෙළින්, සියයට 31.2 හා සියයට 35.4 ක් ලෙස පවත්වා ගන්නා ලදී. 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට වන විට මුළු වත්කම්වලට සාපේක්ෂව ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 29 ක් විය. තැන්පතුවලට ණය අනුපාතය 2016 වසරේ වසර අවසානයේදී වාර්තා වූ සියයට 88 ට සාපේක්ෂව 2017 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 86.9 ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධාන හේතුව තැන්පතු රැස් කිරීම්වල ඉහළ වර්ධනයයි. බාසල් III ද්‍රවශීලතා සම්මත යටතේ හඳුන්වා දුන් රුපියල් හා මුළු විනිමය ද්‍රවශීලතා ආවරණ අනුපාතය, පිළිවෙළින්, සියයට 205.3 ක් හා සියයට 176.2 ක් වූ අතර, එය සියයට 80 ක ව්‍යවස්ථාපිත අවම අනුපාතයට වඩා ඉතා ඉහළ අගයක පවත්වා ගන්නා ලදී.


- **2017 වසරේ පළමු මාස හය තුළ බැංකු අංශයේ දේශීය බැංකු ඒකකවල විදේශ විනිමය නිරාවරණ වැඩි වීමක් පෙන්නුම් කළ අතර, එයට ප්‍රධානම හේතුව වූයේ විදේශ විනිමය ණය ගැනීම්වල රුපියල් අගය වැඩි වීමයි.** දේශීය බැංකු අංශයේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණ, බැංකුවල නියාමන ප්‍රාග්ධනයේ හා මතුපිට ශේෂ පත්‍රයේ විදේශ විනිමය වත්කම්වල

**8.4 රූප සටහන**
**බැංකු අංශයේ අක්‍රීය ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.5 රූප සටහන**
**බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්වය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 1.9 ක් හා 1.5 ක් විය. 2017 වසරේ ජූනි මස අවසානය වන විට බැංකු අංශය රුපියල් බිලියන 15.6 ක දිගු විදේශ විනිමය තත්ත්වයක් පවත්වා ගත් අතර, 2016 වසරේ දෙසැම්බර් අවසානයේදී දිගු විදේශ විනිමය තත්ත්වය රුපියල් බිලියන 16.4 ක් විය.


- **2017 වසරේ පළමු මාස අට තුළ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාග්ධන ලාභය රුපියල් බිලියන 3.4 තෙක් ඉහළ ගිය අතර, එය 2016 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 2.3 ක් විය.** මෙයට ප්‍රධාන හේතුව වූයේ මෙම කාලපරිච්ඡේදය තුළ පැවති රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික අඩු වීමේ ප්‍රවණතාවයයි. බැංකු අංශයේ කොටස් ආයෝජන අවදානම ඉතා අවම අගයක් ගත් අතර, මෙයට ප්‍රධානම හේතුව වූයේ බැංකු අංශයේ රුපියල් බිලියන 42.1 ක කොටස් වෙළඳපොළ නිරාවරණය මුළු වත්කම්වලින් හා ගනුදෙනු කරන ආයෝජනවලින්, පිළිවෙළින්, සියයට 0.4 ක් හා සියයට 3.1 ක් වීමයි.

- **2017 වසරේ පළමු මාස අට තුළ බැංකු අංශයේ බදු පසු ලාභය රුපියල් බිලියන 86.6 ක් ලෙස වාර්තා වූ අතර, එය 2016 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 18.2 ක වැඩි වීමකි.** මෙම ඉහළ ලාභයට ප්‍රධාන හේතුව රුපියල් බිලියන 24.9 කින් වැඩි වූ ශුද්ධ පොලී ආදායමයි. මුල් මාස හය තුළ පොලී නොවන ආදායම ද රුපියල් බිලියන 18.3 කින් වැඩි විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ සැලකිය යුතු ප්‍රාග්ධන ලාභ හා අනෙකුත් ආදායම් මාර්ගවල වැඩි වීමයි. 2017 වසරේ පළමු මාස අට තුළ කාරක වියදම් රුපියල් බිලියන 5.1 කින් වැඩි වුවත්, වෙළඳ හා ආයෝජන සුරැකුම්පත් අලාභවල අඩු වීමක් පෙන්නුම් කරයි. සේවක වියදම් රුපියල් බිලියන 3.3 කින් වැඩි වූ අතර, එය පසුගිය වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5.7 ක වැඩි වීමකි.

- **වත්කම් මත, බදු අඩු කිරීමට පෙර ප්‍රතිලාභ හා හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ යන ලාභදායිතා අනුපාත පෙර වසරේ මෙම කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ, පිළිවෙළින්, සියයට 1.9 හා 16.9 ට සාපේක්ෂව, 2017 වසරේ පළමු මාස අට තුළදී, පිළිවෙළින්, සියයට 2.0 ක් හා සියයට 17.6 ක් දක්වා වර්ධනය විය.** සියයට 46.2 ක් වූ කාර්යක්ෂමතා අනුපාතය 2016 වසරේ දෙසැම්බර් මස අවසානයට සාපේක්ෂව පදනම් අංක 300 කින් යහපත් අතට පැමිණ ඇත. 2017 වසරේ අගෝස්තු අවසානය වන විට ශුද්ධ පොලී ආන්තිකය පසුගිය වර්ෂයේ අදාළ කාල පරිච්ඡේදයට සාපේක්ෂව නොවෙනස්ව සියයට 3.5 ක මට්ටමක පැවතිණ.


- **ඕනෑම අහිතකර අවදානමක් දරා ගත හැකි වන පරිදි බැංකු අංශය විසින් 2017 වසරේ පළමු මාස හය තුළ ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගන්නා ලදී.** පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2017 වසරේ ජූනි අග වන විට, පිළිවෙළින්, සියයට 12.2 ක් හා සියයට 15 ක් වූ අතර, එය අවම නියාමන මට්ටම වන, පිළිවෙළින්, සියයට 5 හා සියයට 10 ට වඩා වැඩියෙන් පැවතිණ.

**8.6 රූප සටහන**
**බැංකු අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.7 රූප සටහන**
**බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

- **මූල්‍ය පහසුකම්වලට ළඟා වීමට ඇති හැකියාව වඩාත් වැඩිදියුණු කරමින් 2017 වසරේ පළමු භාගය තුළදී ශාඛා ජාලය තවදුරටත් ප්‍රසාරණය විය.** ඒ අනුව, 2017 වසරේ ජුනි මස අවසානය වන විට බැංකු ශාඛා 3,543 කුත්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,045 කුත් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4,148 කුත් ස්ථාපිත කර තිබිණි. 2017 වසරේ මෙම කාලපරිච්ඡේදය තුළ නව ශාඛා 19 ක් විවෘත කළ අතර, එක් ශාඛාවක් වසා දැමිණි. ඒ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 335 ක් විවෘත කරන ලදී.


- **ශ්‍රී ලංකාව තුළ ඇති විදේශ බැංකුවල ප්‍රමාණය ඉහළ නැංවීම අරමුණු කරමින් ශ්‍රී ලංකාවේ බැංකු ශාඛාවක් ස්ථාපිත කිරීමට තාවකාලික අනුමැතිය බැන්ක් ඔෆ් චයිනා නම් වූ චීන බැංකුව වෙත 2017 වසරේ ජූලි මස ලබාදෙන ලදී.**

### බැංකු නොවන මූල්‍ය ආයතන අංශය

- **බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල කාර්යසාධනය 2017 වසරේ පළමු මාස අට තුළදී මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරන ලදී.** රථවාහන ආනයනය කිරීමට හා වාහන මිලදී ගැනීමට ණය ලබාදීම සීමා කිරීම සඳහා ගන්නා ලද රාජ්‍ය මූල්‍ය හා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගත්, දෙවන කාර්තුව තුළදී වෙළඳපොළෙහි පැවති ණය පොලී අනුපාත ඉහළ යෑමේ ප්‍රවණතාවත් මෙම අංශයේ මූලික ණය සේවාවන් සඳහා පැවති ඉල්ලුම කෙරෙහි සෘණාත්මක ලෙස බලපාන ලදී. කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන ව්‍යාපාරික කර්තව්‍යය වන රථවාහන සඳහා කල්බදු

**8.8 රූප සටහන**

**බැංකු නොවන මූල්‍ය ආයතනවල සමස්ත තැන්පතු සහ ණය ගැනීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පහසුකම් සැපයුමේ සිට වෙනත් සුරක්ෂිත ණයදීමේ කටයුතු වෙත ක්‍රමයෙන් යොමු වීමක් දක්නට ලැබිණි. බලපත්‍රලාභී මුදල් සමාගම් 45 කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 6 කින්ද, ඒ යටතේ ක්‍රියාත්මක වන 1,344 ක ශාඛා ජාලයකින්ද සමන්විත මෙම අංශය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වලින් සියයට 7.8 ක් නියෝජනය කරයි.

- **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ව්‍යාප්තිය සැලකිය යුතු මට්ටමකින් අඩු විය.** 2016 වසරේ පළමු මාස අට තුළ සියයට 14.4 ක්ව පැවති (රුපියල් බිලියන 143.5) සමස්ත වත්කම් ප්‍රමාණයේ වර්ධනය හා සසඳන කල 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේදී එය රුපියල් බිලියන 1,306.8 දක්වා සියයට 7.8 (රුපියල් බිලියන 94.9) කින් ඉහළ ගියේය. ණය වර්ධනයෙහි මන්දගාමී බව බලපත්‍රලාභී මුදල් සමාගම්

**8.2 සංඛ්‍යා සටහන**

**බැංකු නොවන මූල්‍ය ආයතනවල තෝරාගත් දර්ශක (අ)**

| අයිතම | 2015 අගෝ. අවසානයට | 2016 අගෝ. අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 අගෝ. අවසානයට (ආ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 අගෝ. | 2017 අගෝ. (ආ) |
| මුළු වත්කම් - ශුද්ධ (රු. බිලියන) | 924.8 | 1,139.7 | 1,211.9 | 1,306.8 | 23.2 | 14.7 |
| ණය සහ අත්තිකාරම් - ශුද්ධ (රු. බිලියන) | 715.2 | 899.5 | 962.7 | 1,020.2 | 25.8 | 13.4 |
| තැන්පතු (රු. බිලියන) | 454.5 | 506.2 | 530.7 | 635.6 | 11.4 | 25.6 |
| ණය ගැනීම් (රු. බිලියන) | 272.8 | 408.3 | 438.7 | 413.2 | 49.7 | 1.2 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 127.0 | 142.4 | 144.1 | 167.4 | 12.2 | 17.6 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 13.0 | 12.0 | 11.3 | 12.5 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 13.6 | 12.6 | 11.7 | 13.3 | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 6.3 | 5.5 | 5.3 | 5.5 | | |
| ශුද්ධ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 1.8 | 1.3 | 1.2 | 1.3 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) - වාර්ෂික පදනම මත | 4.2 | 3.7 | 3.6 | 3.0 | | |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) - වාර්ෂික පදනම මත | 20.8 | 20.0 | 19.8 | 14.9 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 8.2 | 7.0 | 7.1 | 8.5 | | |


(අ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශය, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් සමන්විත වේ.
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.10 රූප සටහන**

**බැංකු නොවන මූල්‍ය ආයතනවල අක්‍රීය අත්තිකාරම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල වත්කම් පදනමෙහි ව්‍යාප්තිය කෙරෙහි අහිතකරව බලපෑවේය.


- **මෙම අංශයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන්ම මූල්‍යනය කරන ලද්දේ තැන්පතු මගිනි.** පසුගිය වසර දෙක තුළ මෙම අංශයේ වර්ධනය ඉහළ නැංවූයේ ණයගැනීම් හරහා රැස් කරන ලද අරමුදල් මගිනි. කෙසේ වුවත්, මෙම අංශයේ 2016 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 29.9 ක ණය ගැනීමේ වර්ධනය හා සසඳන කල 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් බිලියන 413.2 දක්වා සියයට 5.8 (රුපියල් බිලියන 25.5) කින් අඩු විය. අනෙක් අතට 2016 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 5.3 ක (රුපියල් බිලියන 25.6) තැන්පතු වර්ධනය හා සසඳන කල 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේදී එය රුපියල් බිලියන 635.6 දක්වා සියයට 19.8 කින් (රුපියල් බිලියන 104.9) වර්ධනය විය.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට ණය වර්ධනය ප්‍රතිචාර දැක්වීය.** රථවාහන ණය සඳහා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත්, පොලී අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාව ණය ඉල්ලුමට අහිතකර අන්දමින් බලපෑමත් නිසා ණය දීමේ කටයුතුවල මන්දගාමී බවක් පෙන්නුම් කෙරිණි. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබාදුන් ණය ප්‍රමාණය, 2016 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 13.0 ක වර්ධනය හා සසඳන කල 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේදී එය රුපියල් බිලියන 1,020.2 දක්වා සියයට 6 (රුපියල් බිලියන 57.5) කින් වර්ධනය විය.

- **වත්කම්වල ගුණාත්මකභාවයෙහි කිසියම් පීඩනයක් දැකිය හැකි වුවද එය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතිණි.** 2017 වසර තුළ අක්‍රීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 59.0 දක්වා සියයට 11.5 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට අක්‍රීය ණය අනුපාතය සියයට 5.5 ක මට්ටමේ පැවති අතර, මෙය 2016 වසර අවසානයේදී මස වාර්තා වූ සියයට 5.3 සිට සුළු වශයෙන් වර්ධනය වීමකි. ණය අලාභ සඳහා වූ

**8.9 රූප සටහන**


**බැංකු නොවන මූල්‍ය ආයතනවල සමස්ත ණය සහ අත්තිකාරම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.11 රූප සටහන**

**බැංකු නොවන මූල්‍ය ආයතනවල සමස්ත ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීලතා අනුපාත**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙන්කිරීම් සලකා බලන කල 2016 වසර අවසානයේ දී සියයට 1.2 ක්ව පැවති ශුද්ධ අක්‍රීය ණය අනුපාතය, 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 1.3 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.

- **බැංකු නොවන මූල්‍ය ආයතනවල සමස්ත ද්‍රවශීලතාව, අතිරික්තයක් වාර්තා කළේය.** මෙම අංශයේ ව්‍යවස්ථාපිත අවම ද්‍රවශීලතා අවශ්‍යතාව වන රුපියල් බිලියන 85.2 ට සාපේක්ෂව රුපියල් බිලියන 30.5 ක අතිරික්ත ද්‍රවශීලතාවක් සහිතව රුපියල් බිලියන 115.6 ක සමස්ත ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් වාර්තා විය. මෙම අතිරික්තය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සමාගම් විසින් ද්‍රවශීල වත්කම් පවත්වා ගනිමින් එදිනෙදා ව්‍යාපාර කටයුතු සඳහා ණය ගැනීම් හරහා අරමුදල් සපයා ගැනීමය. ණය ගැනීම් අඩුවීම හේතුවෙන් ද්‍රවශීලතා අනුපාතය (තැන්පතු හා ණයගැනීම්වලට ද්‍රවශීල වත්කම් දක්වන අනුපාතය) 2016 වසරේ අවසානයට වාර්තා වූ සියයට 9.3 ක ප්‍රමාණයේ සිට 2017 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට සියයට 11.0 ක් දක්වා වර්ධනය විය.


- **ලාභදායීත්වය යහපත් මට්ටමක පවත්වා ගැනුණි.** 2016 වසරේ පළමු මාස අට තුළදී, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ පැවති රුපියල් බිලියන 22.1 ක ලාභයට සාපේක්ෂව, 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ එය රුපියල් බිලියන 17.6 ක් විය. රුපියල් බිලියන 67.2 දක්වා සියයට 11.4 කින් වර්ධනය වූ ශුද්ධ පොලී ආදායම මගින් පෙන්නුම් කෙරෙන පරිදි මෙම අංශයේ ලාභය එලෙසම පවත්වා ගැනීම සඳහා සාපේක්ෂව ඉහළ ලාභ ආන්තිකයක් පැවතීම ඉවහල් වී ඇත. වාර්ෂික වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතයන් 2016 වසරේ අගෝස්තු අවසානයේ පැවති සියයට 3.7 සහ 20.0 ට සාපේක්ෂව 2017 වසරේ සලකා බලන කාලපරිච්ඡේදයේදී පිළිවෙළින් සියයට 3.0 ක් සහ 14.9 ක් විය.

**8.12 රූප සටහන**
**බැංකු නොවන මූල්‍ය ආයතනවල වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.13 රූප සටහන**
**බැංකු නොවන මූල්‍ය ආයතනවල ප්‍රාග්ධන තත්ත්වය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **ප්‍රාග්ධන තත්ත්වය වැඩිදියුණු විය.** ප්‍රධාන වශයෙන්ම රඳවාගත් ලාභ හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ ප්‍රාග්ධන මූලිකාංග රුපියල් බිලියන 161.9 දක්වා සියයට 10.8 කින් වර්ධනය විය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය අවම අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමකින් පැවති අතර, එය 2016 වසර අවසානයට වාර්තා වූ සියයට 11.7 සිට 2017 වසරේ අගෝස්තු මාසය අවසානයේදී සියයට 13.3 ක් දක්වා ඉහළ ගියේය.

## ක්ෂුද්‍රමූල්‍ය ආයතන

- **ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ ඇති කාර්යයන් 2017 වසර තුළදීද අඛණ්ඩව සිදු කරන ලදී.** 2017 වසර තුළදී, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනයට අදාළ, ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීම, වසා දැමීම හා ප්‍රතිස්ථානගත කිරීම සහ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳව වූ මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිත විධාන දෙකක් ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

විසින් නිකුත් කරන ලදී. තවද, ක්ෂුද්‍රමූල්‍ය පනතේ 28(1) වගන්තිය යටතේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාට රීති සකස් කිරීමට සහ ඒවා බලාත්මක කිරීමට අදාළ වන මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිත ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම ද සිදුකරන ලදී. ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් කිහිපයක් මේ වන විට ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර ඒවා ඇගයීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## රක්ෂණ අංශය

- **සමස්ත වත්කම් සහ වාරික ආදායම සැලකිල්ලට ගත් විට රක්ෂණ අංශය අඛණ්ඩව වර්ධනය විය.** 2016 වසරේ ජූනි මස අවසානයේදී වාර්තා කළ සියයට 9.9 ක වර්ධනයට සාපේක්ෂව මෙම අංශයේ සමස්ත වත්කම් 2017 වසරේ ජූනි මස අවසානයේදී වාර්ෂික පදනම මත සියයට 11.4 කින් වර්ධනය විය. තවද, 2017 වසරේ පළමු භාගයේදී රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික සියයට 13.9 ක් වූ අතර 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එම වර්ධනය සියයට 17.2 ක් විය. 2017 වසරේ පළමු භාගය තුළදී සාමාන්‍ය රක්ෂණ අංශයේ වාරික ආදායමෙහි සිදුවූ සියයට 16.2 ක වර්ධනය දළ ලියාහළ වාරිකයේ සිදුවූ මෙම වර්ධනයට විශාල වශයෙන් හේතු විය. ඒ අතර, දිගුකාලීන රක්ෂණ අංශයේ වාරික ආදායමෙහි වර්ධනය 2016 වසරේ ජූනි මස අවසානයේදී වූ සියයට 21.3 ක වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 11.1 කින් පහත වැටුණි. සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකයට සියයට 63.3 ක විශාලතම දායකත්වය ලබාදුන් රථවාහන රක්ෂණය 2017 වසරේ පළමු භාගය තුළදී සියයට 15.8 ක සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයකින් වර්ධනය විය. 2016 වසරේ අනුරූප කාලයේදී රථවාහන රක්ෂණයේ දළ ලියාහළ වාරිකයේ වාර්ෂික වර්ධනය සියයට 14.5 ක් විය. තවද, ගිනි රක්ෂණයෙහි (දායකත්වය සියයට 9.4) සහ මුහුදු රක්ෂණයෙහි (දායකත්වය සියයට 2.6) වාරික ආදායම 2016 වසරේ පළමු භාගයේදී, පිළිවෙළින්, සියයට 18.3 ක සහ සියයට 0.1 ක වාර්ෂික පහත වැටීමක් වාර්තා කළ අතර, ඒ සමග සැසැඳීමේදී

**8.3 සංඛ්‍යා සටහන**

**රක්ෂණ අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2015 ජූනි අවසානයට | 2016 ජූනි අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 ජූනි | 2017 ජූනි (අ) |
| **මුළු වත්කම් (රු. බිලියන)** | **435.4** | **478.4** | **503.1** | **533.1** | **9.9** | **11.4** |
| **මුළු ආදායම (රු. බිලියන) (ආ)** | **71.2** | **82.2** | **181.0** | **96.6** | **15.5** | **17.6** |
| දළ වාරික ආදායම (රු. බිලියන) (ආ) | 57.1 | 66.9 | 140.3 | 76.2 | 17.2 | 13.9 |
| ආයෝජන ආදායම (රු. බිලියන) (ආ) | 14.1 | 15.3 | 40.7 | 20.5 | 8.7 | 33.9 |
| **බදු පෙර ලාභය (රු. බිලියන) (ආ)** | **3.9** | **5.2** | **21.6** | **4.7** | **32.7** | **-10.0** |
| **නුබුන්වත් ආන්තික අනුපාතය (වා)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 9.3 | ලැ.නො | ලැ.නො. | ලැ.නො. | | |
| සාමාන්‍ය රක්ෂණය | 2.2 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | | |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ඇ)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | ලැ.නො. | 296 | 317 | 358 | | |
| සාමාන්‍ය රක්ෂණය | ලැ.නො. | 166 | 192 | 117 | | |
| **රඳවා ගැනීමේ අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 96.1 | 96.2 | 96.6 | 95.9 | | |
| සාමාන්‍ය රක්ෂණය | 161.2 | 159.1 | 80.1 | 78.5 | | |
| **හිමිකම් අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 40.3 | 37.1 | 37.5 | 36.9 | | |
| සාමාන්‍ය රක්ෂණය | 63.0 | 55.7 | 65.9 | 63.9 | | |
| **ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 87.0 | 85.1 | 84.2 | 86.2 | | |
| සාමාන්‍ය රක්ෂණය | 107.6 | 97.2 | 105.2 | 102.9 | | |
| **වත්කම් මත ප්‍රතිලාභය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 2.0 | 2.2 | 2.9 | 1.8 | | |
| සාමාන්‍ය රක්ෂණය | 1.8 | 2.4 | 7.3 | 8.9 | | |
| **හිමිකම් මත ප්‍රතිලාභය (%) - සාමාන්‍ය රක්ෂණය** | **2.9** | **4.5** | **14.5** | **18.8** | | |
| **ප්‍රාරක්ෂණ අනුපාතය (%) - සාමාන්‍ය රක්ෂණය** | **14.6** | **15.7** | **17.8** | **17.1** | | |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ
(ඇ) නුබුන්වත් ආන්තික අනුපාතය වෙනුවට 2016 වසරේ සිට හඳුන්වාදෙන ලදී.

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

2017 වසරේ පළමු භාගය තුළදී සියයට 11.0 ක සහ සියයට 7.3 ක ඉහළ වර්ධනයක් පෙන්වීය.

- **වසරේ පළමු භාගයේදී රක්ෂණ අංශයේ සමස්ත ලාභදායීත්වයෙහි පහත වැටීමක් පෙන්නුම් කළේය.** රක්ෂණ අංශයේ සමස්ත බදු පෙර ලාභය 2016 වසරේ පළමු භාගයේදී සියයට 34.9 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ නමුත් 2017 වසරේ පළමු භාගයේදී සියයට 11.4 කින් පහත වැටුණි. දිගුකාලීන රක්ෂණ අංශයේ දුර්වල කාර්යසාධනය මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දිගුකාලීන රක්ෂණ අංශයේ බදු පෙර ලාභය 2017 වසරේ පළමු භාගයේදී සියයට 78.5 කින් පහත වැටුණු අතර, පසුගිය වසරේ අනුරූප කාලයේදී එය සියයට 34.1 කින් ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සාමාන්‍ය රක්ෂණ අංශයේ සහ දිගුකාලීන රක්ෂණ අංශයේ හිමිකම් පෑම්, පිළිවෙළින්, සියයට 11.9 කින් සහ සියයට 8.3 කින් ඉහළ ගියේය. රක්ෂණ සමාගම්වල ආයෝජන ආදායම 2016 වසරේ පළමු භාගයේදී සියයට 8.7 කින් වර්ධනය වූ අතර, 2017 වසරේ පළමු භාගයේදී සියයට 33.9 කින් වර්ධනය විය. දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ අංශවල සමස්ත ආයෝජන ප්‍රමාණයෙන් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන, පිළිවෙළින්, සියයට 51.3 ක් සහ සියයට 30.3 ක් විය.

## ප්‍රාථමික අලෙවිකරුවන්

- **2017 වසරේ පළමු මාස අට තුළදී ප්‍රාථමික අලෙවිකරු අංශය ව්‍යාප්ත විය.** ප්‍රධාන වශයෙන්ම ආයෝජන කළඹෙහි සිදු වූ ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 418.3 ක් දක්වා සියයට 34.2 කින් වර්ධනය වූ අතර, රජයේ සුරැකුම්පත් කළඹ රුපියල් බිලියන 393.8 ක් දක්වා සියයට 53.8 කින් වර්ධනය විය. මේ අතර, ප්‍රතිමිලදී ගැනුම් යටතේ වූ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් බිලියන 149.9 ක් දක්වා සියයට 12.3 කින් අඩු විය.

**8.4 සංඛ්‍යා සටහන**
**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2015 අගෝ. අවසානයට | 2016 අගෝ. අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 අගෝ. | 2017 අගෝ. (අ) |
| **මුළු වත්කම් (රු. බිලියන)** | **235.8** | **311.8** | **260.0** | **418.3** | **32.2** | **34.2** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 54.0 | 87.5 | 77.1 | 67.6 | 62.0 | -22.7 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 181.9 | 224.4 | 183.0 | 350.7 | 23.4 | 56.3 |
| **සමස්ත කළඹ (රු. බිලියන)** | **217.1** | **256.0** | **222.7** | **393.8** | **17.9** | **53.8** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 42.8 | 41.3 | 46.9 | 50.6 | -3.5 | 22.4 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 174.3 | 214.6 | 175.9 | 343.2 | 23.2 | 59.9 |
| **මුළු ප්‍රාග්ධනය (රු. බිලියන) (ආ)** | **9.3** | **19.5** | **21.5** | **23.2** | **108.6** | **19.3** |
| **බදු පෙර ලාභය (රු. බිලියන) (ඇ)** | **3.8** | **11.1** | **15.2** | **10.3** | **193.7** | **-7.3** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 1.5 | 7.4 | 8.7 | 2.4 | 392.9 | -68.3 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 2.3 | 3.7 | 6.5 | 8.0 | 62.3 | 114.8 |
| **පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය(%) (ආ)** | **18.0** | **33.7** | **59.9** | **57.4** | **15.7** | **23.7** |
| **මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ආ)** | **19.1** | **35.0** | **61.5** | **58.8** | **15.9** | **23.8** |
| **වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%)** | **2.8** | **5.8** | **5.8** | **4.6** | **3.0** | **-1.2** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 4.1 | 15.0 | 12.6 | 4.9 | 10.9 | -10.1 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 2.3 | 2.6 | 3.3 | 4.5 | 0.3 | 1.9 |
| **හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (%) (ආ)** | **25.1** | **70.8** | **52.1** | **14.1** | **45.6** | **-56.7** |
| **තෝරලන කාලය (ආ)** | **5.0** | **3.5** | **2.6** | **1.9** | **-29.0** | **-46.0** |
| **මෙහෙයුමේ පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (ඇ)** | **6.2** | **3.1** | **3.5** | **3.0** | **-3.1** | **-0.1** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 14.0 | 5.6 | 7.1 | 12.1 | -8.4 | 6.5 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 1.8 | 0.8 | 0.8 | 0.5 | -1.0 | -0.3 |
| **මුළු පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (ඇ)** | **66.3** | **52.7** | **57.9** | **66.2** | **-13.6** | **13.4** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 63.2 | 34.0 | 43.9 | 64.0 | -29.2 | 30.0 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 68.1 | 69.8 | 68.4 | 66.7 | 1.7 | -3.1 |
| **වත්කම් සහ වගකීම් අතර වෙනස (වසර)** | **1.2** | **1.3** | **1.2** | **1.0** | **7.9** | **-25.9** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 2.6 | 3.0 | 2.1 | 2.4 | 16.6 | -21.7 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 0.6 | 0.6 | 0.6 | 0.4 | -6.1 | -33.2 |

(අ) තාවකාලික
(ආ) බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක පමණි.
(ඇ) කාලපරිච්ඡේද තුළ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: ඉහත දත්ත තුළ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී හි මූල්‍ය දත්ත අඩංගු නොවේ.

8

- **ලාභදායිත්වය පහළ ගියේය.** 2016 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් කාලපරිච්ඡේදය තුළදී මෙම අංශයෙහි වාර්තා වූ රුපියල් බිලියන 11.1 ක ලාභය හා සසඳන කල 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 10.3 ක ලාභයක් වාර්තා විය. සමස්ත ප්‍රාග්ධන ප්‍රතිලාභ (උපලබ්ධි හා උපලබ්ධි නොවූ) 2016 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 6.9 ට සාපේක්ෂව මෙම වසරේදී රුපියල් බිලියන 3.0 ක් විය. බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලාභදායිත්වය ගණනය කරනු ලබන වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය හා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතිකය 2017 වසරේ අගෝස්තු අවසානයේදී, පිළිවෙළින්, සියයට 4.6 ක් හා සියයට 14.1 ක් විය.

- **ප්‍රාග්ධනය යහපත් තත්ත්වයේ පැවතුණි.** 2017 වසරේ අගෝස්තු අවසානය වන විට බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධන මට්ටම වන රුපියල් බිලියනයක නියාමන අවශ්‍යතාව එක් ප්‍රාථමික අලෙවිකරුවකු හැර අනෙක් සියලුම අලෙවිකරුවන් විසින් සපුරන ලදී. මෙම අංශයේ අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය 2016 වසරේ අගෝස්තු අවසානයේ වූ සියයට 35.0 සිට 2017 වසරේ අගෝස්තු අවසානය වන විට සියයට 58.8 ක් දක්වා වර්ධනය වූ අතර, එය අවම අනුපාතික අවශ්‍යතාව වූ සියයට 10.0 ට වඩා ඉහළ අගයකි.

- **අවදානම් මට්ටම යහපත් විය.** වෙළඳ කළඹ සමස්ත ආයෝජන කළඹට දක්වන අනුපාතිකය 2016 වසරේ අගෝස්තු මස අවසානයේ වූ සියයට 52.1 සිට 2017 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 34.5 දක්වා පහළ යෑම නිසා ප්‍රාථමික අලෙවිකරු අංශය වෙළඳපොළ අවදානමට අනාවරණය වීමේ ඉඩකඩ අඩු විය. අවම අවදානමකින් යුතු රජයේ සුරැකුම්පත් ඉහළ ප්‍රමාණයක් ප්‍රාථමික අලෙවිකරුවන් සතුවීමත්, අනපේක්ෂිත ද්‍රවශීලතා පරතරයන් පියවා ගැනීමට අරමුදල් ලබා ගැනීම සඳහාත් ඒවා ඇපකර ලෙස යොදා ගැනීමට ඇති හැකියාවත් නිසා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ද්‍රවශීලතා අවදානම් ව්‍යුහය අවම අගයක පැවතිණි. තවද, හදිසියේ ඇති විය හැකි ද්‍රවශීලතා පරතරය පියවා ගැනීමට පෙර සූදානම් කරගත් හදිසි අරමුදල් සැකසුම් බොහෝ ප්‍රාථමික අලෙවිකරුවන් සතුව පැවතිණි.

### ඒකක භාර අංශය

- **නිකුත් කර තිබෙන ඒකක සහ ශුද්ධ වත්කම් වටිනාකම පිළිබඳව සලකා බැලීමේදී ඒකක භාර අංශයේ පසුබෑමක් වාර්තා විය.** මෙම දුර්වල කාර්යසාධනය මධ්‍යයේ වුවද, සමස්ත ඒකක හිමිකරුවන් ගණන වාර්ෂික පදනම මත සියයට 2.3 ක සුළු ප්‍රතිශතයකින් වර්ධනය වූ අතර, ඒකක භාර සමාගම් 14 ක් විසින් කළමනාකරණය කරනු ලබන ඒකක භාර ගණන නොවෙනස්ව පැවතුණි. ඒකක භාර අංශයේ ශුද්ධ වත්කම් වටිනාකම 2017 වසරේ ජුනි මස අවසානයේ දී වාර්ෂික පදනම මත සියයට 18.5 කින් රුපියල් බිලියන 103.3 ක් දක්වා පහත වැටිණි. මේ අතර, ඒකක භාරවල ආයෝජන කළඹෙන් කොටස් වෙළඳපොළෙහි සිදු කළ ආයෝජන ප්‍රමාණය 2016 වසරේ ජුනි මස අවසානයේ පැවති සියයට 9.9 සිට 2017 වසරේ ජුනි මස අවසානය වන විට සියයට 13.9 දක්වා ඉහළ ගියේය.

**8.5 සංඛ්‍යා සටහන**

**ඒකක භාර අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2015 ජුනි අවසානයට | 2016 ජුනි අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 ජුනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 ජුනි | 2017 ජුනි (අ) |
| සමස්ත වත්කම් (රු. බිලියන) | 133.8 | 127.7 | 103.1 | 104.4 | -4.6 | -18.3 |
| ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන) | 133.1 | 126.8 | 103.1 | 103.3 | -4.7 | -18.5 |
| ආයෝජන (රු. බිලියන) | 133.6 | 122.8 | 102.9 | 102.3 | -8.1 | -16.7 |
| කොටස්වල | 13.5 | 12.6 | 13.9 | 14.4 | -6.6 | 13.9 |
| රජයේ සුරැකුම්පත්වල | 55.4 | 55.9 | 49.6 | 42.8 | 0.8 | -23.4 |
| වෙනත් (උදා: වාණිජ පත්‍ර, ණයකර, භාරකාර සහතික පත්‍ර සහ බැංකු තැන්පතු) | 64.7 | 54.4 | 39.3 | 45.2 | -16.0 | -16.8 |
| කොටස්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 10.1 | 9.9 | 13.5 | 13.9 | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 41.6 | 43.7 | 48.1 | 41.0 | | |
| වෙනත් ආයෝජනයන් ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 48.6 | 42.9 | 38.1 | 43.8 | | |
| මුළු ඒකක හිමිකරුවන්ගේ සංඛ්‍යාව | 35,660 | 39,707 | 41,249 | 40,651 | | |
| ඒකක නිකුතුන් ගණන (බිලියන) | 9.6 | 8.9 | 7.2 | 6.7 | | |
| ඒකක භාර සංඛ්‍යාව | 70 | 76 | 77 | 76 | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

8

**8.6 සංඛ්‍යා සටහන**

**කොටස් තැරැව්කාර සමාගම්වල තෝරාගත් දර්ශක**

| අයිතම | 2015 ජුනි අවසානයට | 2016 ජුනි අවසානයට | 2016 දෙසැ. අවසානයට | 2017 ජුනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2016 ජුනි | 2017 ජුනි (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 10.9 | 9.5 | 10.1 | 12.8 | -12.2 | 34.4 |
| හිමිකම් හැර මුළු වගකීම් (රු. බිලියන) | 4.8 | 3.9 | 4.5 | 7.3 | -18.7 | 87.5 |
| ශුද්ධ ප්‍රාග්ධනය (රු. බිලියන) | 4.7 | 4.5 | 4.6 | 5.6 | -2.8 | 22.6 |
| ආදායම (රු. බිලියන) (ආ) | 0.6 | 0.4 | 0.3 | 0.4 | -26.7 | 10.1 |
| බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය) (රු. මිලියන) (ආ) | 19.2 | -121.0 | -460.0 | 35.0 | -729.4 | 128.9 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## කොටස් තැරැව්කාර සමාගම් අංශය

- **ප්‍රාග්ධන නියාමන තවදුරටත් ශක්තිමත් වීම හමුවේ කොටස් තැරැව්කාර අංශය ධනාත්මක කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී.** කොටස් තැරැව්කාර සමාගම්වල ආදායම 2016 වසරේ පළමු භාගය තුළදී වාර්තා වූ රුපියල් මිලියන 447 හා සසඳන කල සිට 2017 වසරේ පළමු භාගය තුළ රුපියල් මිලියන 406 ක් දක්වා සුළු වශයෙන් පහත වැටිණි. කෙසේ වුවද, ශුද්ධ බදු පෙර ලාභය 2016 වසරේ ජුනි මස අවසානයේ වාර්තා කළ රුපියල් මිලියන 121 ක අලාභය හා සැසඳීමේදී සලකා බලන කාලපරිච්ඡේදය තුළදී රුපියල් මිලියන 35 දක්වා වර්ධනය විය. මීට අමතරව, කොටස් තැරැව්කාර අංශයේ ශුද්ධ ප්‍රාග්ධනය පසුගිය වසරේ සලකා බලන කාල පරාසය තුළ පැවති රුපියල් බිලියන 4.5 සිට රුපියල් බිලියන 5.6 දක්වා සියයට 22.6 කින් වර්ධනය වූ අතර, සමස්ත වත්කම් ආන්තිකව ඉහළ ගියේය.

- **කොටස් තැරැව්කරුවන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාව පෙර පැවති අවම ශුද්ධ ප්‍රාග්ධනයේ සිට අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා අවම ද්‍රවශීලතා ප්‍රාග්ධනය ලෙස 2017 වසරේ මාර්තු මාසයේදී ඉහළ නංවන ලදී.** 2017 වසරේ පළමු මාස දෙක තුළදී සියලුම කොටස් තැරැව්කාර සමාගම් ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලන ලදී. සමාගම් දෙකක් 2017 වසරේ මාර්තු මස හඳුන්වාදෙන ලද අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා අවම ද්‍රවශීලතා ප්‍රාග්ධනය සඳහා වන නව අවශ්‍යතාව සපුරාලීමට අපොහොසත් විය. කෙසේ වුවද, 2017 වසරේ ජුනි 30 වන විට, නව නියාමන අවශ්‍යතාව සපුරාලීමට අපොහොසත් වූයේ එක් සමාගමක් පමණකි.

## විශ්‍රාම අරමුදල්

- **ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ වත්කම් පදනම 2017 වසරේ ජුනි මාසය වන විට රුපියල් ට්‍රිලියන 1.9 ඉක්මවිය.** සේවක අර්ථසාධක අරමුදලෙහි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය 2016 වසරේ දෙසැම්බර් මස වන විට පෙර වසරට සාපේක්ෂව සියයට 3.6 කින් වැඩි වී මිලියන 17.5 ක් කරා ළඟා විය. පසුගිය වසරේ පළමු මාස හය සමග සසඳන කල මේ වසරේ පළමු මාස හය තුළදී සමස්ත ආයක මුදල් ප්‍රමාණය රුපියල්

**8.7 සංඛ්‍යා සටහන**

**විශ්‍රාම අරමුදල්වල තෝරාගත් දර්ශක**

| අයිතම | සේවක අර්ථසාධක අරමුදල | | | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | | |
|---|---|---|---|---|---|---|
| | 2016 ජුනි අවසානයට | 2017 ජුනි අවසානයට (අ) | වෙනස (%) (අ) | 2016 ජුනි අවසානයට | 2017 ජුනි අවසානයට (අ) | වෙනස (%) (අ) |
| මුළු දායකත්වය (රු. බිලියන) (ආ) | 56.3 | 65.3 | 16.0 | 9.8 | 11.1 | 13.7 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ) | 54.9 | 63.1 | 14.9 | 7.3 | 9.4 | 27.9 |
| මුළු වත්කම් (රු. බිලියන) | 1,741 | 1,948 | 11.9 | 234.7 | 263.2 | 12.1 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 1,674 | 1,873 | 11.9 | 221.0 | 247.6 | 12.1 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 93.2 | 91.6 | -1.7 | 91.7 | 84.1 | -8.3 |
| දළ ආදායම (රු. බිලියන) (ආ) | 96.0 | 107.2 | 11.7 | 11.5 | 13.6 | 18.8 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

බිලියන 65.3 ක් දක්වා සියයට 16.0 කින් සහ ප්‍රතිලාභ ආපසු ගෙවීම් සියයට 14.9 කින් රුපියල් බිලියන 63.1 ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, 2017 වසරේ පළමු භාගය තුළදී ශුද්ධ දායකත්ව මුදල් ප්‍රමාණය (දායකත්ව මුදලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) රුපියල් බිලියන 2.2 ක් වූ අතර, එය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී සියයට 57.1 ක වැඩිවීමකි. සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් ප්‍රමාණය 2017 වසරේ ජූනි 30 දිනෙන් අවසන් වන මාස 12 ක කාලපරිච්ඡේදය සඳහා රුපියල් බිලියන 1,948 දක්වා සියයට 11.9 කින් වර්ධනය විය. තවද, සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත ආයෝජන කළඹේ වටිනාකම ද සියයට 11.9 කින් වර්ධනය වූ අතර, එය 2017 වසරේ ජූනි මස අවසානය වන විට රුපියල් බිලියන 1,873 ක් විය. මෙම ආයෝජන කළඹින් සියයට 91.6 ක් රාජ්‍ය සුරැකුම්පත්වලින් ද, සියයට 4.5 ක් ව්‍යාපාර කොටස්වලින් ද, සියයට 2.1 ක් සාංගමික ණය උපකරණ එනම් ණයකර, භාරකාර සහතිකපත් සහ ප්‍රතිවිකුණුම්වලින් සමන්විත වූ අතර, සියයට 1.8 ක් ස්ථාවර තැන්පතුවලින් ද සමන්විත විය. 2017 වසරේ පළමු මාස හය සඳහා අරමුදලෙහි දළ ආයෝජන ආදායම රුපියල් බිලියන 107.0 ක් ලෙස වාර්තා වූ අතර, පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදය සමග සසඳන කල මෙය සියයට 11.5 ක වර්ධනයකි.

- **සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සතුව මිලියන 12.5 ක ගිණුම් පැවති අතර, ඉන් මිලියන 2.6 ක් පමණ සක්‍රීය ගිණුම් වේ.** 2017 වසරේ පළමු මාස හය තුළදී සමස්ත දායක මුදල් හා සාමාජිකයන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම්, පිළිවෙළින්, රුපියල් බිලියන 11.1 ක් (සියයට 13.7) හා රුපියල් බිලියන 9.4 ක් (සියයට 27.9) දක්වා වැඩි වූ අතර, එය 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී, පිළිවෙළින්, රුපියල් බිලියන 9.8 ක් හා රුපියල් බිලියන 7.1 ක් විය. ප්‍රතිලාභ ආපසු ගෙවීම්වල වැඩි වීමත් සමග සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ශුද්ධ දායක මුදල් ප්‍රමාණය 2017 වසරේ පළමු භාගයේදී සියයට 35.3 කින් පහත වැටිණි. මේ අතර, 2017 වසරේ ජූනි අවසානයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සමස්ත වත්කම් රුපියල් බිලියන 263.2 ක් දක්වා සියයට 12.1 කින් වැඩි විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ආයෝජන කළඹෙන් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනවලින් සමන්විත විය. කෙසේ වුවද, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය 2016 වසරේ ජූනි අවසානයේදී පැවති සියයට 91.7 සිට 2017 වසරේ ජූනි අවසානයේදී සියයට 84.1 දක්වා පහත වැටිණි. 2017 වසරේ ජූනි මස අවසානයේදී කොටස් වෙළඳපොළෙහි සිදු කළ ආයෝජනයේ ප්‍රමාණය සියයට 4.9 ක් විය.

- **2017 වසරේ ජූනි මස අවසානය වන විට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සතු සාමාජිකයන් ගණන 229,951 ක් විය.** රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් ප්‍රමාණය 2016 වසරේ ජූනි මස අවසානයට පැවති රුපියල් බිලියන 47.7 හා සසඳන විට 2017 වසරේ ජූනි මස අවසානයට රුපියල් බිලියන 49.9 ක් විය. 2017 වසරේ පළමු මාස හය තුළදී මෙම අරමුදලේ සමස්ත දායක මුදල් ප්‍රමාණය හා ප්‍රතිලාභ ආපසු ගෙවීම් ප්‍රමාණය, පිළිවෙළින්, රුපියල් මිලියන 897.0 ක් සහ රුපියල් මිලියන 256.8 ක් විය.

- **2017 වසරේ ජූනි මස අවසානය වන විට අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් 151 ක් පැවති අතර, ඒවායේ සාමාජිකයන් ගණන 169,281 ක් විය.** 2017 වසරේ ජූනි මස අවසානය වන විට මෙම අරමුදල සතු සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 434.3 ක් වූ අතර, සමස්ත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 264.5 ක් විය.


## මූල්‍ය වෙළඳපොළ සංවර්ධනයන්

### අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ

- **2017 වසරේ අගෝස්තු මුල් කාලය දක්වා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය මගින් සැදුම්ලත් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව සමීපයෙහි පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ඉන්පසුව අඩු වූ අතර, එය සැප්තැම්බර් මුල සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය සීමාවට ආසන්නව පැවතුණි.** 2016 වසරේ දෙසැම්බර් මස අවසානයේදී සියයට 8.42 ක්ව පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඩුවීමත් සමග නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව දක්වා වැඩි වූ අතර පෙබරවාරි මස මැද භාගය වන විට ද්‍රවශීලතා හිඟයක් ඇති විය. මහ බැංකුව විසින් 2017 වසරේ මාර්තු මස නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 25 කින්, පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 දක්වා ඉහළ නංවමින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කරන ලදී.

**8.14 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, විවට වෙළඳ කටයුතු වෙන්දේසියෙහි ඵලද අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ වෙළඳපොළ ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ අනුව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් ඉහළ ගිය අතර, 2017 වසරේ අගෝස්තු මුල් කාලය දක්වා අඛණ්ඩවම නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව සමීපයෙහි පැවතුණි. 2017 වසරේ ජූලි මැද භාගයේ සිට වෙළඳපොළ පැවති අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව හේතුකොටගෙන මහ බැංකුව විසින් පවත්වනු ලැබූ දෛනික ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසිවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය අගෝස්තු මැද භාගයේ සිට අඩුවූ අතර, 2017 වසරේ සැප්තැම්බර් අවසානයේ එය සියයට 7.25 ක් විය. මෙම ප්‍රවණතාව අනුව යමින් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද 2017 වසරේ සැප්තැම්බර් මැද භාගය දක්වා සියයට 8.00 දක්වා පහළ ගිය අතර, 2017 වසරේ සැප්තැම්බර් අවසානය වන විට සියයට 8.11 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීම අනුවම වෙනස් වූ අතර, එය මෑත සතිවලදී ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකයෙහි අඩුවීම අනුව යමින් අඩු වූ අතර 2017 වසරේ සැප්තැම්බර් අවසානයේදී බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 8.01 ක් විය.

- **2017 වසර ආරම්භයේදී දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව ශීඝ්‍රයෙන් ඉහළ ගියේය.** පෙබරවාරි මස මුල් කාලයේදී ද්‍රවශීලතාව හිග මට්ටමක් දක්වා පහළ ගොස් ඉන්පසුව ජූලි මැද භාගය දක්වා හිග මට්ටම් සහ අතිරික්ත මට්ටම් අතර විචලනය විය. ජූලි මැද භාගයේ සිට දේශීය මුදල් වෙළඳපොළ තුළ අඛණ්ඩව අතිරික්ත රුපියල් ද්‍රවශීලතාවක් පැවතුණි. මහ බැංකුව විසින් රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් හේතුකොටගෙන 2016 වසර අවසානයේ රුපියල් බිලියන 39.2 ක්ව පැවති මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව 2017 වසර ආරම්භයේදී රුපියල් බිලියන 100.0 ඉක්මවමින් ශීඝ්‍රයෙන් වර්ධනය විය. කෙසේ වෙතත්, ඉන්පසුව මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් පරිණත වීමට සැලැස්වීම මෙන්ම විවට වෙළඳ කටයුතු පැවැත්වීමට මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත විකිණීම මූලික වශයෙන් හේතුකොටගෙන පෙබරවාරි මැද භාගයේ සිට ජූලි මස මැද භාගය වන තෙක් වරින්වර මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව හිග මට්ටමක පැවතුණි. උත්සව සමය හේතුකොටගෙන මහ බැංකුවෙන් ව්‍යවහාර මුදල් පිටතට ඇදීයෑම හේතුකොටගෙන අප්‍රේල් මාසය තුළදී මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඩු විය. ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම් සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කළ විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු 2017 වසරේ පළමු මාස නවය තුළදී මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීමට හේතු විය. රජය විසින් තම නොපියවූ ණය පියවීම සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල්වලින් කොටසක් රුපියල්වලට පරිවර්තනය කිරීම ද 2017 වසරේ ජූලි මස මැද භාගයේ

**8.15 රූප සටහන**

**මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවට බලපෑ මහ බැංකු ශේෂපත්‍රයෙහි අයිතමවල වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සිට වෙළඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක් දක්වා වර්ධනය වීමට හේතු විය. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් පරිණත වීමට සැලැස්වීම සහ විවට වෙළඳ කටයුතු යටතේ ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම තුළින් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩු කළ අතර, එය සැප්තැම්බර් මාසයේ ආරම්භයේ සිට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඩු වීමට හේතු විය. 2017 වසරේ සැප්තැම්බර් අවසානය වන විට මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව රුපියල් බිලියන 20.96 ක් විය.

### දේශීය විදේශ විනිමය වෙළඳපොළ

- **2017 වසරේ පළමු මාස නවය තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සියයට 2.15 ප්‍රතිශතයකින් අවප්‍රමාණය විය.** 2017 වසරේ මාර්තු මාසයේ ඇමරිකානු ෆෙඩරල් සංචිත බැංකුව සිදු කළ පොලී අනුපාතික ඉහළ දැමීමත් සමඟ රජයේ සුරකුම්පත්වල සිදු කළ ආයෝජන ආපසු ගලායෑම වැඩිවීම සහ ආනයන ඉල්ලුම ඉහළ යෑම නිසා ශ්‍රී ලංකා රුපියල, වසරේ මුල් කාර්තු දෙක තුළ ඇඩි ලෙස අවප්‍රමාණය වීමේ පීඩනයක් ඇති විය. 2017 වසරේ ජුනි මාසයේ ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික දෙවන වරටත් ඉහළ දැමීම පිළිබඳ නිකුත් කළ නිවේදනයත් සමඟම මෙම අවප්‍රමාණය වීමේ නැඹුරුතාව තවදුරටත් 2017 වසරේ ජූලි මාසය අවසානය දක්වාම නොකඩවා පැවතිණ. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අනුමත කරන ලද විස්තීර්ණ ණය පහසුකමෙහි තෙවන වාරිකය ලැබීම සහ අපනයන ඉපැයුම් දේශීය මුදල් සඳහා පරිවර්තනය නිසා නිර්මාණය වූ ධනාත්මක අභිප්‍රායයන් සමඟ, විනිමය අනුපාතිකය මත එල්ල වූ මෙම පීඩනය 2017 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට අවම තත්ත්වයකට පත් විය. තවද, 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා වූ කාලයේදී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකයන් වන ජපන් යෙන්, ඉන්දියානු රුපියල, බ්‍රිතාන්‍ය පවුම හා යුරෝවට එරෙහිව ද අවප්‍රමාණය විය.

**8.16 රූප සටහන**

**එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි විචලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **විනිමය අනුපාතිකයේ අධික විචලනයන් පාලනය කරමින් රටෙහි විදේශ සංචිත රැස් කිරීමේ අරමුණින් 2017 වසරේ පළමු මාස නවය තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ශුද්ධ ගැනුම්කරුවෙකු ලෙස ක්‍රියාකරන ලදී.** ඒ අනුව, 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා වූ කාලයේදී ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 1,710.6 ක් වෙළඳපොළෙන් මිලදී ගෙන එ.ජ. ඩොලර් මිලියන 549.8 ක් වෙළඳපොළ වෙත විකිණීමේ ප්‍රතිඵලයක් ලෙස එ.ජ. ඩොලර් මිලියන 1,160.9 ක ශුද්ධ මිලදී ගැනීමක් සිදු කරන ලදී.


- **2017 වසරේ පළමු මාස නවය තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ගනුදෙනු පරිමාව, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේදී සියයට 13.54 ක ප්‍රතිශතයකින් ඉහළ ගියේය.** 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ගනුදෙනු පරිමාව එ.ජ. ඩොලර් බිලියන 12.75 ක් වූ අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එය එ.ජ. ඩොලර් බිලියන 11.23 ක් විය. ඊට සමගාමීව, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළේ දෛනික සාමාන්‍ය ගනුදෙනු පරිමාව ද 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 62.39 ක සිට, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එ.ජ. ඩොලර් මිලියන 70.44 දක්වා සියයට 11.43 ප්‍රතිශතයකින් වැඩි විය. 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා වූ කාලයේදී ඉදිරි වෙළඳපොළ ගනුදෙනු සමස්ත පරිමාව, 2016 වසරේ පළමු මාස නවය තුළදී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.45 සමඟ සැසඳීමේදී එ.ජ. ඩොලර් බිලියන 6.56 ක් දක්වා ඉහළ යන ලදී.

## රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ

- **2017 වසරේ පළමු භාගයේදී වැඩි වශයෙන් ණය ගැනීම් සිදුකර ඇත්තේ දේශීය වෙළඳපොළෙනි.** වෙළඳපොළේ පැවැති ඉහළ පොලී අනුපාතික සහ අඩු ද්‍රවශීලතා තත්ත්වයන් හේතු කොටගෙන, 2017 වසරේ පළමු භාගයේ ණය නිකුත් කිරීම සඳහා වූ ක්‍රමෝපායයන් කෙටි කලකින් පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත්කිරීම් වලින්ද, එ.ජ. ඩොලර් මිලියන 2,231.4 ක් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම්වලින්ද යුතු විය. මෙමගින් දේශීයව ආයෝජනය කළ හැකි අරමුදල්වලට ඇති විය හැකිව තිබූ තෙරපුම් ප්‍රතිවිපාකය (Crowding Out Effect) සමනය කිරීමටද හැකියාව ලැබුණි. කෙසේ වෙතත්, වසරේ පළමු භාගයේදී කෙටි හා මැදිකාලීන පරිණත කාල සහිත භාණ්ඩාගාර බැඳුම්කර සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් නිකුත් කිරීම හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත්වල සාමාන්‍ය පරිණත කාලය පහළ යන ලදී.

- **රාජ්‍ය සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී පසුබෑමක් පෙන්නුම් කරන ලදී.** දින 91, දින 182 භාණ්ඩාගාර බිල්පත්හි ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික පදනම් අංක 73 කින් සහ පදනම් අංක 51 කින් ඉහළ ගිය අතර, දින 364 භාණ්ඩාගාර බිල්පත් ද්විතීක වෙළඳපොළ ඵලදා අනුපාතික පදනම් අංක 3 කින් අඩු විය. ක්‍රියාකාරී ලෙස අලෙවි වන වසර 2 සිට 10 දක්වා වූ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ ඵලදා අනුපාතික 2016 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගයේදී පදනම් අංක 33 කින් අඩු විය. වර්ධනය වූ වෙළඳපොළ වාතාවරණයට සමගාමීව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය සහ ඉහළ ගිය භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශ ආයෝජන මගින් වූ විදේශ ගලා ඒම් මෙන්ම පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කරවල මුල් ආයෝජනය පමණක් දේශීය මූලාශ්‍ර මගින් පියවීමේ රාජ්‍ය උපාය මාර්ගය, දේශීය අරමුදල්කරණය මත යැපීම අඩු කිරීමට ධනාත්මක ලෙස දායක විය. 2017 වසරේ පළමු මාස හත තුළ ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික අඩු වීමට මෙම තත්ත්වයන් හේතු විය. අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර 2017 වසරේ ජනවාරි මස අවසානයේදී රුපියල් බිලියන 236.7 ක් වූ අතර 2017 වසරේ ජූලි මස අවසානයේදී රුපියල් බිලියන 254.4 ක් විය. මෙය සියයට 7.49 ක වැඩිවීමකි.

**8.17 රූප සටහන**
**රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

- **2017 වසරේ පළමු මාස හය තුළදී වාණිජ පත්‍ර වෙළඳපොළ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.** සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද වාණිජ පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 3.6 ක් වූ අතර, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එම වටිනාකම රුපියල් බිලියන 4.8 ක් විය. පසුගිය වසරේ නිරීක්ෂණය කරන ලද පොලී අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2016 වසරේ පළමු භාගය තුළදී පොලී අනුපාතික සියයට 8.7 ත් සියයට 13.0 ත් අතර පරාසයක සිට 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 14.5 ත් සියයට 16.5 ත් අතර පරාසයක් දක්වා අඛණ්ඩව වර්ධනය විය. අවාසිදායක ආයෝජන තත්ත්වයක් පිළිබිඹු කරමින් පසුගිය කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී නිකුත් කළ වාණිජ පත්‍ර කෙටි පරිණත කාල සහිත විය. මාස 3 කින් පරිණත වන වාණිජ පත්‍රවල ප්‍රමාණය, වෙළඳපොළෙන් සියයට 92.5 ක් වූ අතර, මාස 3 සිට මාස 6 දක්වා කාලය තුළ පරිණත වන වාණිජ පත්‍රවල ප්‍රමාණය, වෙළඳපොළෙන් සියයට 7.5 ක් විය. මෙම කාලපරිච්ඡේදය තුළදී මාස 6 කට වඩා වැඩි පරිණත කාලයක් පවතින වාණිජ

8


පත්‍ර කිසිවක් නිකුත් කර නොමැත. 2017 වසරේ ජූනි මස අවසානය වන විට නොපියවූ සමස්ත වාණිජ පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 2.3 ක් වූ අතර, 2016 වසරේ ජූනි අවසානයට එම වටිනාකම රුපියල් බිලියන 4.5 ක් විය.

- **පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2017 වසරේ පළමු භාගය තුළදී සාංගමික බැඳුම්කර වෙළඳපොළ පරිමාව සංකෝචනය විය.** 2017 වසරේ පළමු මාස හය තුළදී සමාගම් 02 ක් විසින් නිකුත් කරන ලද සාංගමික බැඳුම්කර සංඛ්‍යාව 7 ක් වූ අතර, 2016 වසරේ පළමු මාස හය තුළදී සමාගම් 09 ක් විසින් සාංගමික බැඳුම්කර 17 ක් නිකුත් කරන ලදී. ඒ අනුව, 2017 වසරේ පළමු මාස හය තුළදී ලැයිස්තුගත කරන ලද සාංගමික බැඳුම්කරවල සමස්ත වටිනාකම රුපියල් බිලියන 10 ක් දක්වා අඩු වූ අතර, එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ රුපියල් බිලියන 34.4 ක් විය. 2017 වසරේ පළමු මාස හය තුළදී ප්‍රධාන නිකුත්කරුවන් දෙදෙනා බැංකු හා මූල්‍ය අංශය තුළින් වූ අතර, මෙම බැඳුම්කරවල පොලී අනුපාතික සියයට 11.95 සහ සියයට 15.00 ත් අතර විචලනය විය.

## කොටස් වෙළඳපොළ

- **මිල දර්ශකවල පසුගිය මාස කිහිපය තුළ සිදුවූ ඉහළ විචලනයෙන් පිළිබිඹු වූ පරිදි කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව 2017 වසරේ දෙවන කාර්තුව තුළදී වාර්තා කරන ලද ධනාත්මක කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගැනීමට අපොහොසත් විය.** 2016 වසර අවසානයේදී කොටස් වෙළඳපොළෙහි පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය 2017 පළමු මාස තුන තුළදී අඛණ්ඩව පැවතුණි. දියුණු ආර්ථිකයන්හි පොලී අනුපාතිකවල අපේක්ෂිත ඉහළ යෑම, දේශීය ප්‍රතිපත්ති දිශානතීන්වල අස්ථාවරභාවය සහ විනිමය අනුපාතික මත ඇති වූ පීඩනය මේ සඳහා විශාල වශයෙන් හේතු විය. සැලකිය යුතු ශුද්ධ විදේශීය ආයෝජනවල ප්‍රතිඵලයක් ලෙස අප්‍රේල් මස ආරම්භයේදී මෙම වර්ධන ප්‍රවණතාව නිරීක්ෂණය කළ හැකි විය. මීට අමතරව, පවතින පහළ මිල ගණන් යටතේ දේශීය සංස්ථායික ආයෝජකයින් ලාභදායී කොටස් රැස්කර ගැනීම ආරම්භ කළ අතර කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව යථා තත්ත්වයට පැමිණීම පිළිබඳව විශ්වසනීයත්වය ගොඩනැගුණු නිසා සුළු ආයෝජකයින්ගේ ද නැවත පැමිණීමක් දැකිය හැකි විය. කෙසේ වුවද, කොටස් වෙළඳපොළ පෙර මාසවලදී පවත්වාගත් ඉහළ ගම්‍යතාවයේ අඩු වීමක් පෙන්වමින් 2017 වසරේ ජූලි ආරම්භයේ සිට පහළ ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. 2017 වසරේ පළමු භාගයෙන් පසු කොටස් වෙළඳපොළ වර්ධනය පහත වැටුණද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන කල 2017 වසරේ පළමු මාස නවය තුළදී වෙළඳපොළ ක්‍රියාකාරිත්වයේ වර්ධනයක් වාර්තා විය. 2016 වසර අවසානය සමඟ සසඳන කල 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සමස්ත කොටස් මිල දර්ශකය සහ එස්ඇන්ඩ්පී ශ්‍රී ලංකා 20 මිල දර්ශකය පිළිවෙළින් සියයට 3.4 කින් සහ සියයට 5.5 කින් ඉහළ යන ලදී.


**8.18 රූප සටහන**
**කොටස් වෙළඳපොළ මිල දර්ශකවල විචලනය**



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

- **ව්‍යාපාර වස්තු හුවමාරුවේ ව්‍යාපාර සහභාගිත්වය පිළිබිඹු කරන වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ පිරිවැටුම 2017 වසරේ පළමු මාස නවය තුළදී වැඩිදියුණු විය.** වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2016

**8.19 රූප සටහන**
**කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශීය සහභාගීත්වය**



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

8

**8.8 සංඛ්‍යා සටහන**

**කොටස් වෙළඳපොළෙහි තෝරාගත් දර්ශක**

| අයිතම | 2015 සැප්. අවසානයට | 2016 සැප්. අවසානයට | 2016 අවසානයට | 2017 සැප්. අවසානයට (අ) |
|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 7,050.9 | 6,534.8 | 6,228.3 | 6,438.2 |
| වාර්ෂික වෙනස (%) | -3.4 | -5.2 | -9.7 | 3.4 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) | 3,826.2 | 3,617.3 | 3,496.4 | 3,688.0 |
| වසර ආරම්භයේ සිට වෙනස (%) | -0.1 | -0.2 | -3.6 | 5.5 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,990.8 | 2,785.7 | 2,745.4 | 2,919.7 |
| ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස (%)* | 25.3 | 23.5 | 23.2 | 24.7 |
| වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය | 18.4 | 13.4 | 12.4 | 10.7 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 1,115.4 | 753.2 | 737.2 | 914.8 |
| ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ සමුච්චිත විදේශිය මිළදී ගැනුම් (එ.ජ. ඩොලර් මිලියන) | -23.4 | -19.4 | 13.7 | 118.6 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 296 | 295 | 295 | 295 |
| හිමිකම් නිකුතුන් ගණන (ආ) | 12 | 6 | 6 | 14 |
| හිමිකම් නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) (ආ) | 12.0 | 2.5 | 2.5 | 42.0 |
| මූලික මහජන නිකුතුන් (ආ) | 2 | 3 | 3 | 2 |
| මූලික මහජන නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) (ආ) | 0.3 | 1.9 | 1.9 | 8.5 |

* 2016 වසරේ ද.ජා.නි මත පදනම්ව (රු. බිලියන 11,839)

(අ) තාවකාලික

(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

අවසානයට වාර්තා කළ රුපියල් බිලියන 2,745.4 සමඟ සසඳන කල 2017 වසරේදී රුපියල් බිලියන 2,919.7 ක් දක්වා ඉහළ ගියේය. තවද, වසරේ පළමු මාස නවයක කාලපරිච්ඡේදය තුළදී සමස්ත පිරිවැටුම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයේදී වාර්තා කළ රුපියල් බිලියන 135.4 ට සාපේක්ෂව රුපියල් බිලියන 165.6 ක් දක්වා ඉහළ ගියේය. තවද, වසරේ පළමු මාස නවය තුළදී කොටස් වෙළඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම සහ ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව ඉහළ ගියේය. 2017 වසරේ සැප්තැම්බර් මසදී ශුද්ධ සමුච්චිත විදේශීය මිල දී ගැනුම් එ.ජ. ඩොලර් මිලියන 118.6 ක් දක්වා සියයට 711.3 කින් සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. කෙසේ වුවද, ගනුදෙනු වූ සමස්ත කොටස් සංඛ්‍යාව 727,064 ක් දක්වා පහත වැටුණු අතර, එය 2016 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේදී 882,201 ක් විය. වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය 2016 වසර අවසානයේ පැවති වාර 13.4 ට සාපේක්ෂව 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට වාර 10.7 ක් දක්වා පහළ යන ලදී. මෙම කාලසීමාව තුළදී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව මූලික මහජන නිකුතුන් 02 ක් මගින් රුපියල් බිලියන 8.5 ක් සහ හිමිකම් නිකුතුන් 14 ක් මගින් රුපියල් බිලියන 42.0 ක් රැස්කර ගන්නා ලදී.



## සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

- **සහනදායී පොළී අනුපාතික සහ කොන්දේසිවලින් යුත් සංවර්ධන ණය යෝජනා ක්‍රම ගණනාවක් ඔස්සේ සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ණය සැපයීමට 2017 වසරේ පළමු මාස අට තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩවම ක්‍රියාකරන ලදී.** මෙම ණය යෝජනා ක්‍රම මගින් කෘෂිකාර්මික, පශු සම්පත් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායී අංශයන්ගේ සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ප්‍රතිමූල්‍ය පහසුකම්, පොලී සහනාධාර සහ/හෝ ණය ඇප ආවරණ සහ ණය පරිපූරක සේවා සැපයීම සිදු කරන ලදී. තම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් මූල්‍යනය කිරීමේදී සිදු වන ඉහළ පිරිවැය දැරිය නොහැකි වීම සහ විධිමත් මූල්‍ය අංශයට ප්‍රවේශයක් නොමැති හෝ සීමිත ප්‍රවේශයක් සහිත ගොවීන්ට සහ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීමේ අරමුණින් මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබයි. පුළුල්ව ගත් කල, මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් මූල්‍ය ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සහ ඒ තුළින් රටේ මූල්‍ය අන්තර්ගතභාවය සහ තුලිත ආර්ථික වර්ධනය ඇති කරලීම අපේක්ෂා කෙරේ. සමස්තයක් ලෙස ගත් කල, 2017 වසරේ අගෝස්තු මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය

**8.9 සංඛ්‍යා සටහන**

**සියලුම අංශ සඳහා සමස්ත ණය මුදහැරීම**

| අංශය | කොටස % | | | |
|---|---|---|---|---|
| | 2016 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ | 10 | 41 | 12 | 36 |
| ක්ෂුද්‍රමූල්‍ය | 24 | 13 | 29 | 13 |
| කෘෂිකාර්මික හා පශු සම්පත් | 66 | 46 | 60 | 50 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යෝජනා ක්‍රම හරහා රුපියල් මිලියන 11,562.3 ක ණය මුදලක් ප්‍රතිලාභීන් 78,740 ක් වෙත මුදා හරින ලදී. මුළු ණය බෙදා හැරීම්වලින් සියයට 50.2 ක ප්‍රතිශතයක් කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය සඳහා මුදා හැර ඇති අතර, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ අංශය සහ ක්ෂුද්‍රමූල්‍ය අංශය සඳහා පිළිවෙළින් සියයට 36.4 ක් සහ සියයට 13.4 ක ප්‍රතිශතයක් මුදා හැර ඇත.

- **තිරසාර ආර්ථික වර්ධනය, රැකියා ජනනය සහ දිළිඳුකම තුරන් කිරීම වැනි කරුණු අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව ණය යෝජනා ක්‍රම 5 ක් ඔස්සේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශය වෙත සහනදායී ණය ලබා දුන්නේය.** එම ණය යෝජනා ක්‍රම නම්, "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය, "ස්වශක්ති-රැකියා දසලක්ෂයක් කරා" ණය යෝජනා ක්‍රමය, වියලි කලාපීය ජීවනෝපාය සඳහා සහායවීමේ සහ හවුල්වීමේ චක්‍රීය ණය වැඩසටහන, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II සහ තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය වේ. මෙම ණය යෝජනා ක්‍රම මගින් රුපියල් මිලියන 4,206.5 ක ණය ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 9,393 ක් අතරේ මුදාහැර ඇත. මෙම ණය යෝජනා ක්‍රම අතරින් ප්‍රමුඛතම ණය යෝජනා ක්‍රමය වන "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 2,616.3 ක ණය මුදල් ප්‍රමාණයක් මුදාහරින ලද අතර, එය මෙම අංශය සඳහා මුදාහරින ලද ණය ප්‍රමාණයෙන් සියයට 62.2 ක ප්‍රතිශතයකි. තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයෙහි අපේක්ෂිත අරමුණු සපුරා ගැනීම නිසා එම ණය යෝජනා ක්‍රමයෙහි සමාප්තිය ළඟා වී ඇති බැවින්, 2017 වසරේ අගෝස්තු මස දක්වා කාලයේදී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නව ණය අයදුම්පත් ලියාපදිංචි කිරීම පහත දමන ලදී. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයෙහි සංවර්ධනය සහ රැකියා උත්පාදන ඉලක්ක කර ගනිමින් "ස්වශක්ති-රැකියා දසලක්ෂයක් කරා" ණය යෝජනා ක්‍රමය 2017 වසරේ මාර්තු මස දී හඳුන්වා දුන් අතර, මෙම වසරේ අගෝස්තු මස දක්වා ප්‍රතිලාභීන් 4,045 ක් අතරේ රුපියල් මිලියන 930.4 ක මුදල් ප්‍රමාණයක් මුදාහරින ලදී.

- **සමස්තයක් ලෙස ගත් කල, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය අවසන් වෙමින් පවතින නිසා එහි අරමුදල්වල පැවති සීමාකාරී තත්ත්වය හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලය හා සැසඳීමේදී 2017 වසරේ පළමු මාස අට තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත මුදාහරින ලද ණය ප්‍රමාණය සහ ණය සංඛ්‍යාව පහත වැටී ඇත.**

- **පොදු ජනතාව අතර මූල්‍ය සේවා තවදුරටත් පුළුල් කිරීම සහ රට තුළ දිළිඳුකම පිටුදැකීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රම හතරක් හරහා ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත මූල්‍ය පහසුකම් ලබා දීම සිදු කරන ලදී.** ඒවා නම්, "දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය අදියර II" (PAMP II - RF), "දිළිඳුකම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය" (PAMP - RF), "සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන චක්‍රීය ණය ව්‍යාපෘතිය" (SFLCP-RF) සහ කෘෂිකාර්මික සහ පශු සම්පත් වෙළඳ හා වෙනත් සේවාවන් සහ ධීවර යන අංශවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නිරත වී සිටින ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින් ඉලක්ක

**8.10 සංඛ්‍යා සටහන**

**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ලබා දුන් ණය**

| ණය යෝජනා ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2016 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| සෞභාග්‍යා | 9,776 | 3,574 | 5,141 | 2,616 | -47.4 | -26.8 |
| ස්වශක්ති* | - | - | 4,045 | 930 | - | - |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II* | - | - | 190 | 82 | - | - |
| කුඩා වතු වැවිලි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන** | 198 | 25 | - | - | - | - |
| වියළි කලාපීය ජීවනෝපාය සඳහා සහය වීමේ සහ හවුල් වීමේ චක්‍රීය ණය වැඩසටහන | 12 | 1 | 3 | 0 | -75.0 | -66.7 |
| තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය | 108 | 3,450 | 14 | 577 | -87.0 | -83.3 |
| **එකතුව** | **10,094** | **7,050** | **9,393** | **4,207** | **-6.9** | **-40.3** |

* ණය යෝජනා ක්‍රමය 2017 වසරේදී ආරම්භ කරන ලදී.
** ණය යෝජනා ක්‍රමය 2016 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.11 සංඛ්‍යා සටහන**

**ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලබා දුන් ණය**

| ණය යෝජනා ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2016 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය | 3,747 | 183 | 6,174 | 307 | 64.8 | 67.7 |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය - අදියර II | 15,283 | 1,247 | 10,468 | 889 | -31.5 | -28.7 |
| සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන චක්‍රීය ණය ව්‍යාපෘතිය | 1,219 | 67 | 328 | 22 | -73.1 | -67.2 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | 4,299 | 502 | 5,451 | 338 | 26.8 | -32.7 |
| **එකතුව** | **24,548** | **1,999** | **22,421** | **1,556** | **-8.7** | **-22.2** |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

කර ගනිමින් ක්‍රියාත්මක වන ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන (NADeP) වැඩසටහනයි. මෙම ණය යෝජනා ක්‍රම යටතේ වසරේ පළමු මාස අට තුළදී, රුපියල් මිලියන 1,555.9 ක ණය ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 22,421 ක් වෙත මුදාහරින ලද අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදාහරින ලද මුළු අරමුදල්වලින් සියයට 13.4 ක ප්‍රතිශතයකි. සමස්තයක් ලෙස, දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍රමූල්‍ය චක්‍රීය ණය යෝජනා ක්‍රමය අදියර II සහ සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන චක්‍රීය ණය ව්‍යාපෘතිය කෙටි කාලයකින් අවසන් කිරීමට ඇති බැවින් ක්ෂුද්‍රමූල්‍ය අංශය යටතේ ලබාදෙන ණය ප්‍රමාණය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2017 වසරේ අගෝස්තු මස දක්වා කාලය තුළදී ලබාදෙන ලද ණය ප්‍රමාණය සියයට 22.2 ක ප්‍රතිශතයකින් පහත වැටී ඇත.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන සහනදායී ණය යෝජනා ක්‍රම යටතේ වැඩිම ණය ප්‍රමාණයක් කෘෂිකාර්මික හා පශු සම්පත් අංශයට අඛණ්ඩවම ලබා දී ඇත.** 2017 වසරේ අගෝස්තු මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම යටතේ රුපියල් මිලියන 5,799.9 ක් මෙම අංශය වෙත මුදාහරින ලද අතර, එය මුළු අරමුදල්වලින් සියයට 50.2 ක ප්‍රතිශතයකි. කෙටිකාලීන භෝග වර්ග 33 ක නිෂ්පාදන කටයුතු සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මුදාහරින ලද ණය සඳහා පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ සපයන ප්‍රමුඛතම ණය යෝජනා ක්‍රමය වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් රුපියල් මිලියන 4,959.5 ක් එනම්, සියයට 85.5 ක ණය ප්‍රමාණයක් මුදාහැර ඇත. රට තුළ නියං තත්ත්වයක් පැවතිය ද, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදාහරින ලද ණය ප්‍රමාණය සියයට 3.6 කින් ඉහළ ගොස් ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, සියලුම දිස්ත්‍රික්ක අතරින් වැඩිම කෘෂිකාර්මික ණය ප්‍රමාණයක් (සියයට 14 ක්) මොණරාගල දිස්ත්‍රික්කයට මුදාහැර ඇති අතර, අනතුරුව, පිළිවෙළින්, අනුරාධපුර (සියයට 13 ක්) සහ අම්පාර (සියයට 12 ක්) යන දිස්ත්‍රික්ක වෙත මුදාහැර ඇත. මෙම අංශය වෙත මුදාහරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 59 ක ඉහළම ප්‍රතිශතයක් ප්‍රධාන බෝගය වන වී වගාවට ලබා දී ඇත.

**8.12 සංඛ්‍යා සටහන**

**කෘෂිකාර්මික හා පශු සම්පත් අංශවලට ලබා දුන් ණය**

| ණය යෝජනා ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2016 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | | 2017 ජන.-අගෝ. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය | 53,437 | 4,788 | 45,917 | 4,960 | -14.1 | 3.6 |
| මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රම | 1,281 | 923 | 1,009 | 840 | -21.2 | -9.0 |
| තේ සංවර්ධන චක්‍රීය ණය ව්‍යාපෘතිය | 2 | 0 | - | - | - | - |
| **එකතුව** | **54,720** | **5,711** | **46,926** | **5,800** | **-14.2** | **1.6** |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

- **කිරි ගොවීන් සහ ව්‍යවසායකයන් හට කිරි ආශ්‍රිත කටයුතු සඳහා ණය අරමුදල් ලබා දෙමින්, මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය 2017 වසරේ පළමු මාස අට තුළදී ඉතා සාර්ථකව ක්‍රියාත්මක විණි.** මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, පොලී සහනාධාර ගෙවීම සඳහා සීමිත අරමුදල් ප්‍රමාණයක් පැවති හෙයින් 2016 වසරේ අගෝස්තු මස දක්වා කාලය හා සසඳා බලන කල, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ලද ණය ප්‍රමාණය සියයට 9 කින් පහළ ගොස් ඇත. සමස්තයක් ලෙස අදාළ කාලවකවානුව තුළදී, මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ කෘෂිකාර්මික හා පශු සම්පත් අංශය වෙත ලබා දෙන ලද ණය ප්‍රමාණය සියයට 1.6 ක ප්‍රතිශතයකින් ඉහළ ගියේය.

- **පුහුණු කරන්නන් පුහුණු කිරීම, ව්‍යවසායකයන් සඳහා ව්‍යාපෘති ඇගයීමේ වැඩමුළු පැවැත්වීම සහ මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය කළමනාකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය යන ක්ෂේත්‍ර ආවරණය කරමින් අදාළ කාලය තුළදී වැඩසටහන් සහ වැඩමුළු ගණනාවක් පැවැත්වීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය සාරක්ෂරතාව, අන්තර්ගතභාවය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අඛණ්ඩවම කටයුතු කරන ලදී.** ස්වයං උපකාරක කණ්ඩායම් නිර්මාණය කිරීම සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා ද ප්‍රමුඛතාව ලබා දෙන ලදී.

- **ඒ අනුව, කුසලතා සංවර්ධන වැඩසටහන් 110 ක් ද, ශක්‍යතා ගොඩනැංවීමේ වැඩසටහන් 13 ක් ද, දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය අදියර II හි ප්‍රතිලාභීන් සඳහා වැඩසටහන් 56 ක් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලදී.** අදාළ කාලය තුළදී, පවත්වන ලද වැඩසටහන්වලින් දැනුම්වත්භාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් පවත්වන ලද වැඩසටහන් ගණන උපායමාර්ගික ඉලක්ක යටතේ ලබාදුන් ඉලක්කය ඉක්මවීය. එම කාලය තුළදී, ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ අඩු ආදායම්ලාභී පවුල්වලින් යුතු සමිති 30 ක් ද ඇති කරන ලදී.

## ගෙවීම් සහ පියවීම් පද්ධතිවල වර්ධනය

- **මූල්‍ය ස්ථායීතාව ළඟාකර ගැනීමේදී මූලික අවශ්‍යතාවක් වන රටෙහි ගෙවීම් හා පියවීම් පද්ධතීන්ගේ සුරක්ෂිතභාවය, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ගෙවීම් හා පියවීම් පද්ධති අධීක්ෂණය හා නියාමනය කරයි.** රටෙහි ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාතික ගෙවීම් යටිතල පහසුකම් සඳහා 2017 වසරේ දී අඛණ්ඩව පහසුකම් සලසන ලදී.

- **"ලංකාපේ" (LankaPay) සන්නාමය යටතේ, ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම විසින් මෙහෙයවනු ලබන කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CCAPS) ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව පහසුකම් සලසන ලදී.** එම යාන්ත්‍රණය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණය (SAS) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobs) යන යාන්ත්‍රණවලින් සමන්විත වේ.

- **කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු අදියර ලෙස ස්ථාපිත කළ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, 2013 වසරේ ජූලි මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර, 2017 වසරේ පළමු මාස නවය තුළදී එහි මුළු සාමාජික සංඛ්‍යාව 27 දක්වා වර්ධනය විය.** 2017 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ යාන්ත්‍රණය හරහා ගනුදෙනු මිලියන 32.4 ක් සිදු කළ අතර එහි වටිනාකම රුපියල් මිලියන 189.2 ක් විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයට සම්බන්ධිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය හරහා සිදු කරන කාඩ්පත් ගනුදෙනුවල ආරක්ෂාව වැඩි කිරීම සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සියලුම සාමාජිකයන් විසින් ස්ථාපිත කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ඊ.එම්.වී. (Europay, MasterCard and Visa) තාක්ෂණය ඇතුළත් කරන ලෙස සාමාජික ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදෙස් ලබා දෙන ලදී.

- **කාඩ්පත් හා අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන අදියර ලෙස 2015 වසරේ අගෝස්තු 21 දිනදී විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය ස්ථාපිත කරන ලදී.** එමගින්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාල බැංකු සේවා,

ජංගම දුරකථන ආශ්‍රිත බැංකු සේවා, ස්වයං සේවා ගෙවීම් යන්ත්‍ර (Kiosks) සහ බැංකු කවුළුව හරහා යන බහුවිධ ගෙවීම් මාධ්‍යයන් මගින් සිදු කරන ගෙවීම් නිෂ්කාශනය කිරීම සඳහා පොදු යටිතල පහසුකමක් සපයයි. 2017 වසරේ පළමු මාස නවය තුළදී මූල්‍ය ආයතන අටක් මෙම යාන්ත්‍රණයේ සාමාජිකත්වය ලබා ගැනීමත් සමඟ මුළු සාමාජික සංඛ්‍යාව 30 ක් දක්වා වැඩි විය. 2017 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී මෙම යාන්ත්‍රණය හරහා මිලියන 2.1 ක ගනුදෙනු සංඛ්‍යාවක් සිදු කළ අතර ඒවායේ වටිනාකම රුපියල් බිලියන 181.1 ක් විය.

- **විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජික ආයතන හරහා ශ්‍රී ලංකා රේගුවට තත්කාලීනව රේගු ගාස්තු ගෙවීම සඳහා 2017 වසරේ ජූලි මාසයේදී 'ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව' (LPOPP) ආරම්භ කරන ලදී.** 2017 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට වාණිජ බැංකු හයක් මෙම මංගත ගෙවීම් වේදිකාවේ සාමාජිකත්වය ලබාගන්නා ලදී. එසේම, අනෙකුත් රාජ්‍ය ආයතනවල ගෙවීම් සඳහා පහසුකම් සැලසීමට 'ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව' තවදුරටත් දියුණු කිරීම සඳහා ද හැකියාව ඇත. තත්කාලීනව ශ්‍රී ලංකා රේගුව වෙත සිදු කරන ගෙවීම් සඳහා පහසුකම් සැලසීමට, විශේෂිත ක්ෂේත්‍රයක් හරහා සිදු කරන ගනුදෙනුවලදී එක් ගනුදෙනුවක් සඳහා වන උපරිම සීමාව ඉහළ නංවමින්, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කළ හැකි ගනුදෙනු වටිනාකමෙහි උපරිම සීමාව පිළිබඳ නිකුත් කර තිබූ 2015 අංක 1 දරණ ගෙවීම් හා පියවීම් පද්ධති චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කරමින්, 2017 අංක 8 දරන ගෙවීම් හා පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

- **අන්තර්ජාතික කාඩ්පත් ක්‍රමයක් හා අනුබද්ධව ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී.** ඒ අනුව, 2018 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය මගින් සමාජ සුබසාධන වැඩසටහන් සහ පොදු ප්‍රවාහන සේවා වැනි ජාතික කර්තව්‍යයන් සඳහා අඩු පිරිවැය සහිත ක්‍රම සඳහා පහසුකම් සලසා දෙනු ඇත. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදය ස්ථාපිත කිරීමෙන් පසුව විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) ක්‍රියාත්මක වනු ඇත.

- **ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන හා නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් සභාව විසින් නව තාක්ෂණය යොදා ගැනීම, නව ගෙවීම් ක්‍රමවේද, පද්ධති ස්ථායිතාවය සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව මූලික කරගත් නියෝග ආවරණය වන පරිදි ගෙවීම් පද්ධතිවල මධ්‍යකාලීන සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති පෙර දැක්මක් සෑදීම සඳහා උපදේශන ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.** සභාවේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කළ යෝජනා ඇතුළත් කර ගනිමින් එම පෙරදැක්ම සකස් කිරීම අවසන් කරන ලදී. පෙරදැක්මේ අඩංගු වන කරුණු ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා ජාතික ගෙවීම් සභාව විසින් මූල්‍ය තාක්ෂණ (FinTech) සහ බ්ලොක්චේන් (Blockchain) යන ක්ෂේත්‍ර මගින් ඇති විය හැකි බලපෑම් අධ්‍යයනය කිරීම සහ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටු දෙකක් පත් කරන ලදී.

## අපේක්ෂිත වර්ධනයන්

- **පවත්නා මූල්‍ය ප්‍රතිපත්ති දිශානතියට අනුකූලව ණය ලබාදීමෙහි වර්ධනය මධ්‍යකාලීනව ස්ථායී අනුපාතයක් දක්වා ක්‍රමිකව අඩුවීම අපේක්ෂා කෙරේ.** අක්‍රීය ණය ප්‍රමාණයෙහි වැඩිවීමක් දක්නට ලැබී ඇති අතර, ණය ලබාදීම් ඉහළ යෑමත් සමඟ මෙම අක්‍රීය ණය තවදුරටත් ඉහළ යෑම කෙරෙහි බැංකු විසින් අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, අවදානම් අවම කිරීම සඳහා නිසි අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් පවත්වා ගැනීම තහවුරු කළ යුතුය.

- **ඉහළ නැංවූ ප්‍රාග්ධන අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධනය ගොඩනැංවීමත් සමඟ බැංකුවල ප්‍රාග්ධන මට්ටම තවදුරටත් ශක්තිමත් වීම අපේක්ෂිතය.** මෙම ඉහළ නැංවූ ප්‍රාග්ධන අවශ්‍යතා සහ බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූලව බැංකු විසින් ඉහළ ගුණාත්මයෙන් යුත් ප්‍රාග්ධනය ඉහළ නැංවිය යුතුය. මෙම අවශ්‍යතාවලට අනුකූල නොවන බැංකු ස්වේච්ඡා පදනමින් ඒකාබද්ධවීම් සඳහා යොමු වීමට උනන්දු කෙරේ. තවද, 2018 වසරේ ජනවාරි මස සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක-9, 'මූල්‍ය උපකරණ' නම් වූ නව ගිණුම්කරණ ප්‍රමිතිය හඳුන්වා දීමත් සමඟ බැංකුවල ණය හානි සඳහා ප්‍රතිපාදනය කිරීම දැනට පවත්නා දැරූ ණය හානි ප්‍රවේශය වෙනුවට අපේක්ෂිත ණය හානි ප්‍රවේශය අනුව හඳුනා ගැනීම සිදු කළ යුතුවේ. ඒ අනුව, නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල

වීම සඳහා ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් ඉහළ නැංවීමට බැංකුවලට සිදු වනු ඇත. මේ තුළින් ඉදිරි වර්ෂයන්හිදී මූල්‍ය හා ආර්ථික ආතති තුළින් ඇති වන කම්පන අවශෝෂණය කර ගැනීමට බැංකු අංශයට ලැබෙන හැකියාව ඔස්සේ මූල්‍ය අංශයෙන් මූර්ත ආර්ථිකයට වන බලපෑම අවම කිරීම අපේක්ෂා කෙරේ.

- **බැංකු විසින් තම ද්‍රවශීලතා මට්ටම් යෝග්‍ය මට්ටමේ පවත්වා ගෙන යනු ඇත.** බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය සඳහා වන බැංකු පනත් විධානය අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වසරේදී නිකුත් කරන ලද අතර, 2019 වසර වන විට බැංකු විසින් සියයට සියයක ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වා ගෙන යා යුතුය. තවද, 2018 වසරේදී ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය හඳුන්වා දීමත් සමඟ බැංකුවල ද්‍රවශීලතා අවදානම් ව්‍යුහය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

- **බැංකු ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණෙන් බලපත්‍රලාභී බැංකු සඳහා වන බාසල් III තෝලන අනුපාත රාමුව පිළිබඳ උපදේශන පත්‍රිකාවක්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.** ඒ අනුව, 2017 වසරේ මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම කාර්තුවක්ම අවසානයේ සිට දින 30 ක් ඇතුළත සියලුම බැංකු විසින් සිය තෝලන අනුපාතය, නිරීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ අවසන් මාර්ගෝපදේශන නිකුත් කිරීමෙන් අනතුරුව තෝලන අනුපාතය පිළිබඳ බැංකු පනත් නියාමන නිකුත් කිරීමට කටයුතු කරන අතර, මෙහිදී තෝලන අනුපාත මගින් වත්කම් පන්තීන්හි සාපේක්ෂ අවදානම් මට්ටම් නොසලකමින් වත්කම් ව්‍යාප්තිය සීමා කෙරෙන නිසා බැංකු විසින් සිය ශේෂ පත්‍ර සහ ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම් යළි තක්සේරු කිරීමට සිදුවනු ඇත.

- **මූර්ත ආර්ථිකය තුළින් බැංකු අංශයට විහිදී යන අවදානම්වලට මුහුණ දීම සඳහා සාර්ව ආර්ථික විචල්‍යවල වෙනස්කම් හඳුනා ගැනීමට ඒවා සමීපව නිරීක්ෂණය කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බලපාන අනාගත අවදානම්වලට නිසි පරිදි මුහුණදීම සඳහා සුදුසු සාර්ව විචක්ෂණශීලී උපායමාර්ග හඳුන්වා දීමට අපේක්ෂිතය.** තවද, සඵලදායී බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් මූලික ප්‍රතිපත්ති සහ අනෙකුත් ජාත්‍යන්තර සහ කලාපීය යහභාවිතාවලට අනුකූලව නියාමන සහ සුපරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට ද අපේක්ෂිතය. බැංකු සහ බැංකු අංශයේ කාර්යක්ෂමතාව, සඵලදායීතාව සහ තිරසාරභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් බැංකු පරීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කෙරෙනු ඇත.

- **බැංකු ක්ෂේත්‍රයේ සයිබර්-ආරක්ෂණ සහ මූල්‍ය-තාක්ෂණ යන විෂය පථයන්ට අදාළ අන්තර් ජාතික ප්‍රමිති සහ ප්‍රශස්ත ක්‍රියාපටිපාටිවලට අනුගතව බැංකු සුපරීක්ෂණ සහ නියාමන රාමුවට අවශ්‍ය වෙනස්කම් සිදු කෙරේ.** මේ යටතේ පැන නැගෙන නව තොරතුරු අවශ්‍යතා කඩිනමින් සැපයීමේ අරමුණ ඇතිව බැංකුවල කළමනාකරණ තොරතුරු පද්ධතීන් සහ අනෙකුත් සම්බන්ධිත තොරතුරු පද්ධතීන් ශක්තිමත් කිරීම සහ ඉහළ නැංවීමට කටයුතු කෙරෙනු ඇත. බැංකු විසින් සිය බැංකු සේවා ලබා දීමේ මාධ්‍යයක් ලෙස අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණය වැනි තොරතුරු තාක්ෂණය මත පදනම් වූ නව්‍ය තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දෙනු ලබන අතර, මෙහිදී අදාළ පද්ධතීන් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ ආරක්ෂණ උපක්‍රම සහ නිවාරණ ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකළ යුතුවේ.

- **දිවයින පුරා ආර්ථික කටයුතු පහසු කිරීම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් බැංකු ක්ෂේත්‍රය තුළ බැංකුකරණය සඳහා වන පිවිසුම් ඉහළ දැමීමට කටයුතු කරනු ඇත.** දිවයින පුරා සමබර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා බැංකු විසින් ඒ ඒ පළාත් සඳහා තැන්පතු මත ණය අනුපාතය මනාව නිරීක්ෂණය කිරීමට සහ වර්ධනය කිරීමට අපේක්ෂිත අතර එමගින් ඒ ඒ පළාත්හි එකතුවන තැන්පතු එම ප්‍රදේශයන්හිම සිදු කෙරෙන ආර්ථික කටයුතු සඳහා යෙදවීම වර්ධනය කිරීමට අපේක්ෂිතය.

- **බැංකු ක්ෂේත්‍රයේ භූගෝලීය ව්‍යාප්ති වපසරිය පුළුල් කිරීමේ අරමුණින් විශාල බැංකුවලට කලාපය තුළ ව්‍යාප්ත වීමේ ඉඩ ප්‍රස්ථා සොයා බැලීම සඳහා දිරිමත් කරනු ලබන අතර මේ සඳහා කලාපයේ නියාමකයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ සහ අන්තර් දේශ සීමා නියාමන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිව සමීප සබඳතාවයක් පවත්වාගෙන යනු ලැබේ.**

- **අවදානම මත බරතැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය පිළිබඳ විධානය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල**

අවදානම් කළමනාකරණය කෙරෙහි දැඩි අවධානයක් ඇති කිරීම සහ මෙම සමාගම්වල අවදානම් තක්සේරු කිරීමේ හැකියාවන් අඛණ්ඩව වර්ධනය කිරීම දිරිමත් කිරීම අරමුණු කරගනිමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා 2017 වසර තුළදී නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුවක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. එමනිසා, මෙම යෝජිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව, බාසල් සම්මුතියෙහි මූලික ප්‍රවේශය යටතේ දැක්වෙන ණය සහ මෙහෙයුම් අවදානම් මත පදනම්ව, වැඩි අවදානම් සංවේදීතාවයක් ඉලක්ක කර ගනිමින් නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පවත්වා ගැනීමට යෝජනා කර ඇත. තවද, ඉහත සඳහන් නව නියාමන රාමුව තුළින් දැඩි නියාමන පරිසරයක් ඇති කිරීම සහ කුඩා, අකාර්යක්ෂම හා දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට විශාල සමාගම් සමඟ ඒකාබද්ධවීමට පෙළඹවීම හෝ ප්‍රාග්ධනය යෙදවිය හැකි උපායමාර්ගික ආයෝජකයන් සොයාගැනීමට පෙළඹවීමක් සිදුවෙතැයි අපේක්ෂා කෙරේ.

- **පවත්නා නියාමන රාමුවෙහි සිදුකෙරෙන වෙනස්කම් සමඟ මධ්‍යකාලීනව මෙම අංශයේ ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් පිහිටුවීම සඳහා පවත්නා අවදානම් කළමනාකරණ, ද්‍රවශීලතා සහ වෙන්කිරීම් රෙගුලාසි සංශෝධන සිදුකිරීමට යෝජිතය. ආයතනික යහපාලනය වැඩිදියුණු කිරීම සඳහා නව යහපාලන ක්‍රියාමාර්ග ද ආයතනික යහපාලන රාමුව සඳහා ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

- **දුෂ්කරතාවට පත් ඇතැම් මුදල් සමාගම්වල අර්බුද නිරාකරණය කිරීම සඳහා යෝජිත මූලික ක්‍රියාමාර්ග තුළින් ධනාත්මක ප්‍රතිඵලයක් අපේක්ෂා කෙරේ.** ප්‍රධාන වශයෙන්ම ඒකාබද්ධවීම් සහ උපායමාර්ගික ආයෝජකයන් හරහා නව ප්‍රාග්ධනය ආයෝජනය කිරීම තුළින් දුෂ්කරතාවට පත් සමාගම්වල ගැටලු නිරාකරණය කිරීම සඳහා මූලික ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය හරහා මෙම ආයතනවල තැන්පත්කරුවන්ගේ තැන්පතු පියවීම සහ ඉන්පසු එම ආයතන ඇවර කිරීම සම්බන්ධව විකල්ප ක්‍රියාමාර්ග අගයමින් පවතී.

- **2018 වසර තුළදී, ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍ර ලබාගැනීම සඳහා අයදුම්පත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලැබීම අපේක්ෂා කෙරෙන අතර එම අයදුම්පත් අතරින් සුදුසුකම් සපුරාලන ආයතන සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ.** බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය යටතට ඇතුළත් කිරීමට ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

- **ක්ෂුද්‍රමූල්‍ය අංශයෙහි ඵලදායී නියාමනය සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍රමූල්‍ය පනත සමාලෝචනය කරමින්, ඒ සඳහා සංශෝධන යෝජනා කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී සිටියි.** ඒ අනුව, තැන්පතු භාර නොගන්නා ක්ෂුද්‍ර ණය දෙන ආයතන නියාමනය කිරීම සඳහා සුදුසු නියාමන රාමුවක් සහ ක්ෂුද්‍රමූල්‍ය ගනුදෙනුකරුවන් සඳහා ඒකාබද්ධ රාමුවක් ගොඩනැගීමට අදාළ විධිවිධානවල අවශ්‍යතාව ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇත. ක්ෂුද්‍රමූල්‍ය ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් 2018 වසර තුළදී පාරිභෝගික ආරක්ෂණ ප්‍රඥප්තියක් නිකුත් කිරීම ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

- **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි නියාමන ආයතන බොහොමයක් හරහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය වීම සහ ක්ෂුද්‍රමූල්‍ය පනතින් ඇතැම් ක්ෂුද්‍රමූල්‍ය ආයතන නිදහස් වීම යන කරුණු හේතුවෙන් ක්ෂුද්‍රමූල්‍ය අංශය මනා ලෙස නියාමනය කිරීම අසීරු වී ඇත.** එමනිසා, සියලු නියාමන ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රමික කාල පරාසවලදී රැස්වන අන්තර් නියාමන මණ්ඩලයක් කැඳවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. 2018 වසර තුළදී නියාමනය සම්බන්ධ දැනුම සහ තොරතුරු හුවමාරු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව, ක්ෂුද්‍රමූල්‍ය ආයතන නියාමනය කරන අනෙකුත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට ද අපේක්ෂා කෙරේ.

- **ගනුදෙනු පියවීමේ මාධ්‍යයක් ලෙස ගෙවීම් කාඩ්පත්, ජංගම හා අන්තර්ජාල ගෙවීම් පද්ධති වැනි නවීන,**

8

**දියුණු විද්‍යුත් ගෙවීම් උපකරණ වඩාත් ජනප්‍රිය වෙතැයි අපේක්ෂා කෙරේ.** මෙම ගෙවීම් උපකරණවල භාවිතය වැඩිවීමත් සමඟම ඒවායේ අවදානම අවම කිරීම, කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිවැය අඩු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, විද්‍යුත් ගෙවීම් හා පියවීම් පද්ධති කෙරෙහි පොදු ජනතාවගේ විශ්වාසය පවත්වා ගැනීමටත් විද්‍යුත් ගෙවීම් පද්ධති භාවිතා කිරීම පහසු කරවීමට සුරක්ෂිත හා ස්ථායී වාතාවරණයක් සැකසීම සඳහාත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවීම් සේවා සඳහා අදාළ වන ජංගම අයදුම් සේවාවන් සපයන ආයතන සඳහා ජංගම අයදුම් මෘදුකාංග සඳහා මාර්ගෝපදේශ සැපයීමේ නිරත වන අතර, එම මාර්ගෝපදේශ 2018 වසර තුළදී නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.** ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ආරක්ෂා කිරීමට සහ ගනුදෙනුවල සුරක්ෂිතතාවයට අදාළ අවම ප්‍රමිතීන් ඉදිරිපත් කිරීම මෙම මාර්ගෝපදේශය මගින් සිදුවන අතර ගනුදෙනු සිදු කිරීමට භාවිතා කිරීම සඳහා සුරක්ෂිත ජංගම අයදුම් පැවතීම සහතික කිරීම ද මෙමගින් අපේක්ෂා කෙරේ.

- **ණය කාඩ්පත් කර්මාන්තයේ සිදු වී ඇති වැඩිදියුණුවීම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව, 2010 වසරේදී නිකුත් කරන ලද ණය කාඩ්පත් මෙහෙයුම් මාර්ගෝපදේශ සංශෝධනය කිරීමේ කාර්යයෙහි නියුක්තව සිටී.** අදාළ පාර්ශ්වකරුවන්ගේ යෝජනා සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව සංශෝධිත මාර්ගෝපදේශ වසර තුළදී නිකුත් කිරීමට බලාපොරොත්තු වේ.

- **වසර තුළදී ප්‍රාග්ධන වෙළඳපොළවල් සහ රක්ෂණ අංශය සඳහා බලපවත්වන අධීක්ෂණ සහ නියාමන රාමුව අඛණ්ඩව ශක්තිමත් කරන ලදී.** ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කාර සමාගම් මගින් සපයනු ලබන උපයෝගී සේවා විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාව සඳහා ක්ෂුද්‍ර රක්ෂණ රාමුවක් වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, ලෝක බැංකු සමඟ එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. දිළිඳුකම පිටුදැකීම සඳහා කාර්යක්ෂම මෙවලමක් ලෙස ක්ෂුද්‍ර රක්ෂණ දිරිගැන්වීමට මෙමගින් අදහස් කරනු ලැබේ. ක්ෂුද්‍ර රක්ෂණ අංශයේ වර්ධනය මගින් දැරිය හැකි මිලකට රක්ෂණ නිෂ්පාදන ලබා ගැනීමට පහසුකම් සැලැස්වීමත් සමග අඩු ආදායම්ලාභී කුටුම්බවල අවදානම්වලට නිරාවරණය අඩුකිරීමට සහ අවදානම් අවම කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමට හැකිවේ.

- **ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකක භාර නවීකරණය සඳහා ප්‍රවර්ධන කටයුතු සිදු කරන අතරම කොටස් තැරැව්කාර ආයතන සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවක් සහ අවම ද්‍රවශීල ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම සඳහා අවදානම් ආශ්‍රිත නිර්ණායකයක් හඳුන්වා දෙන ලදී.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පුවරුව සහ අවම පොදු විචල්‍ය බලාත්මක කිරීමේ කොන්දේසි සඳහා 2017 වසරේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීම ප්‍රාග්ධන වෙළඳපොළ කටයුතු තවදුරටත් පුළුල් කිරීමට ගත් ප්‍රධාන පියවරක් ලෙස සැලකිය හැකිය. තවද, ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය සමඟින් ශ්‍රී ලංකා කොටස් හුවමාරුවේ කටයුතු අසමුහීකරණය කිරීමට (demutualization) පහසුකම් සැලැස්වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් කරනු ලබයි. කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව අසමුහීකරණය කිරීම (demutualization) මගින් නව්‍යකරණ කටයුතු සහ ව්‍යාප්ති කිරීම සඳහා අතිරේක ප්‍රාග්ධනය එක්රැස් කිරීම, පාරිභෝගිකයින් කේන්ද්‍ර කරගත් වේගවත් ක්‍රමවේදයන් යටතේ ගතික ව්‍යාපාර පරිසරයක් තුළ ඇතිවන වෙනස්වීම් සඳහා ඉක්මණින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඉහළ නැංවීම වැනි විවිධ වාසි ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- **රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය, මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සහ මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව උපායමාර්ගයන් සකසා ඇත.** ඒ අනුව, රටේ තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ණය ගලායෑම ඉහළ නැංවීම, ණය හා ඒ ආශ්‍රිත අනෙකුත් සේවා ඉහළ නැංවීම සහ මූල්‍යමය නොවන ආධාර සැපයීමත්, ශ්‍රී ලංකාව සඳහා ජාතික මූල්‍ය අන්තර්ගත උපායමාර්ගයක් වැඩිදියුණු කිරීම තුළින් විධිමත් මූල්‍ය අංශයට මූල්‍යමය වශයෙන් සුවිශේෂී අංගයක් ගෙන ඒමෙන් හිතකර මූල්‍යමය තත්ත්වයක් ඇති කිරීමත් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම අංශයන් වෙත පහසුකම් සපයනු ලබයි.

8

# පරිශිෂ්ටය 1

# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: ජනවාරි - ඔක්තෝබර් 2017[1]

## මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2017 මාර්තු 24 | - | ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 දක්වා පදනම් අංක 25කින් ඉහළ නංවන ලදී. |

## මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 10 | - | 'බලපත්‍රලාභී බැංකු සඳහා වන බාසල් III තෝලන අනුපාත රාමුව' පිළිබඳ උපදේශන පත්‍රිකාවක් නිකුත් කරන ලදී. |
| 2017 ජනවාරි 13 | - | 2017 ජනවාරි 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් උපරිම වටිනාකම මත ණය අනුපාත අනුගමනය කරන ලෙස බැංකු පනත යටතේ 2017 අංක 01 දරන විධානය බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 01 | - | 2017 අයවැය මගින් අනුමත කරන ලද පහත දැක්වෙන කරුණු පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.<br>- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, අපනයන, සංචාරක කටයුතු, කෘෂිකර්මාන්තය, තරුණ සහ කාන්තා ආදී හඳුනා ගත් අංශ වෙත ණය පහසුකම් සැපයීම<br>- බැංකු සේවා වැඩිදියුණු කිරීම |
| 2017 පෙබරවාරි 15 | - | 2017 බැංකු පනත් විධාන අංක 01 හි විධාන 5ට අදාළ ඇතැම් අර්ථ දැක්වීම් සංශෝධනය කරමින් සහ ප්‍රතිස්ථාපනය කරමින් මෝටර් රථ සම්බන්ධව ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාතය සඳහා විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මාර්තු 22 | - | බලපත්‍රලාභී බැංකු සඳහා 1998 සැප්තැම්බර් 07 දින නිකුත් කර තිබූ උකස් කොන්දේසි සඳහා සංශෝධන ඇතුළත් කරමින් නව විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 26 | - | බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන ණය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාත සහ හිඟ ණය මුදල් මත අය කරන දඬ පොලී, ප්‍රමාණවත් අන්දමින් හෙළිදරව් කිරීමේ පදනම මත, අදාළ බැංකුවේ ණය ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි අයකර ගැනීමට අවසර දෙමින්, බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 29 | - | මෑතකදී පැවති ගංවතුර, අයහපත් කාලගුණික තත්ත්ව සහ ඊට සම්බන්ධ සිද්ධි නිසා හානියට පත් ව්‍යාපාර හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යළි නඟාසිටුවීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එකී හානියට පත් වූ, ණය ලබා ගත් ගනුදෙනුකරුවන් වෙත අවස්ථානුකූලව සහන ලබා දීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 31 | - | 2017 බැංකු පනත් විධාන අංක 02 හි විධාන 5.1 සහ 5.4 සංශෝධනය කරමින් සහ ප්‍රතිස්ථාපනය කරමින් මෝටර් රථ සම්බන්ධව ලබා දෙන ණය පහසුකම් මත පනවා ඇති වටිනාකම මත ණය අනුපාත සඳහා විධානයක් නිකුත් කරන ලදී. |

1 2017 වසරෙහි ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙහි ඇතුළත් වේ. දැනට ප්‍රකාශයට පත් කර ඇති සහ 2017 ඉදිරි කාල වකවානුව තුළදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගද මෙයට ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 2017 ඔක්තෝබර් 26 | - | බලපත්‍රලාභී බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවමින් විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | බලපත්‍රලාභී බැංකු සඳහා තෝලන අනුපාතය හඳුන්වා දීම |
| | - | බලපත්‍රලාභී බැංකු සඳහා ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය හඳුන්වා දීම |
| | - | බැංකු පරීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම |

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 13 | - | 2017 වර්ෂය සඳහා වන ජාතික අයවැය අනුව යමින්, බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර තිබූ මෝටර් වාහන වෙනුවෙන් ණය පහසුකම් ලබා දීමේදී ඒවායේ වටිනාකම් මත ලබා දෙන ණය අනුපාතය සම්බන්ධ විධාන සංශෝධනය කරන ලදී. |
| 2017 පෙබරවාරි 17 | - | 2017 ජනවාරි 13 දින නිකුත් කළ වටිනාකම් මත ණය අනුපාත විධානයෙහි වාහන වර්ග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වර්ගීකරණයට අනුරූප කිරීම සඳහා අවශ්‍ය සංශෝධන නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 23 | - | බලපත්‍රලාභී මුදල් සමාගම් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනය ක්‍රමයෙන් වැඩි කිරීම සඳහා විධානයක් නිකුත් කරන ලදී. |
| 2017 මැයි 30 | - | ගංවතුර, අහිතකර කාලගුණික තත්ත්වයන් සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවල අහිතකර බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එවන් ගනුදෙනුකරුවන් වෙත පහත දැක්වෙන සහනයන් ලබා දීමට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවසර ලබා දෙන ලදී.<br>- සියලුම සක්‍රීය ණය පහසුකම් වෙනුවෙන් මාස තුනකට නොවැඩි පමා සහනයක් ලබා දීම<br>- ඉහත පමා සහනය යටතේ වන ණය ගනුදෙනුකරුවන් සහ ඉහත සඳහන් අහිතකර බලපෑම්වලට ලක් වූ අක්‍රීය ණය ගනුදෙනුකරුවන් නැවත සැලසුම් කරන ලද කොන්දේසි යටතේ තම ව්‍යාපාර කටයුතු යළි ආරම්භ කිරීමෙන්/ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ණය පියවීම සඳහා කැමැත්තක් දක්වන්නේ නම් හිඟ ණය වෙනුවෙන් අය කරන දඩ පොලිය කපා හැරීම |
| 2017 ජූනි 02 | - | 2017 පෙබරවාරි 17 දින නිකුත් කළ වටිනාකම් මත ණය අනුපාත විධානයෙහි වාහන වර්ග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වර්ගීකරණයට අනුරූප කිරීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී. |
| අපේක්ෂිත | - | බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත විධානය ක්‍රියාත්මක කිරීම |

### රක්ෂණය

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 01 | - | රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් රක්ෂණ අංශයේ වෘත්තීමයභාවය සහ ප්‍රතිරූපය නංවාලීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ හිමිකම්පෑම් පිළිබඳව විමර්ශන සිදු කිරීම හා සම්බන්ධ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2017 මැයි 09 | - | රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් රක්ෂණ තැරැව්කාර කටයුතු හැරුණු විට වෙනත් උපයෝගී සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බවට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | රක්ෂණ ගිවිසුම්වලින් පැනනගින ආරවුල් නිරාකරණය කිරීම සඳහා විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් ලෙස ස්වාධීන ආරවුල් විසඳීමේ මණ්ඩලයක් පිහිටුවීම මගින් රක්ෂණ ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම |
| | - | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, රක්ෂණ ක්ෂේත්‍රයේ මූල්‍ය සාක්ෂරතාව පුළුල් කිරීම සඳහා වඩා විධිමත් උපායමාර්ගයක් සකස් කිරීම |
| | - | රක්ෂණ සමාගම්වල ආයෝජන ක්‍රියාකාරිත්වය සහ හිමිකම් නොපාන ලද ප්‍රතිලාභ සම්බන්ධ කටයුතු වඩා විධිමත් කිරීම සඳහා නව මාර්ගෝපදේශ සැපයීම |

## ප්‍රාග්ධන වෙළඳපොළ

| | | |
|---|---|---|
| 2017 මැයි 09 | - | විදේශීය ආයතන ලැයිස්තුගත කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවෙහි බහු ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ව්‍යාපාර වස්තු දැක්වෙන පුවරුවක් ස්ථාපිත කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2017 ජූනි 06 | - | ඒකක භාර සමාගම් විසින් මහජනතාවට ඒකක භාර අලෙවි කිරීමේදී යොදා ගන්නා වෙළඳ දැන්වීම් සහ ප්‍රවර්ධන මාධ්‍යවල අන්තර්ගතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2017 ජූනි 13 | - | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පුවරුවක් ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. |
| 2017 ජූනි 28 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුකූල නොවීම් සඳහා අවම මහජන හිමිකම් අවශ්‍යතා (Minimum Public Float) කොන්දේසි බලාත්මක කිරීමට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2017 අගෝස්තු 01 | - | කොටස් තැරැව්කාර සමාගම්වල අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා රාමුව ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාපටිපාටියක් සඳහා එම සමාගම් යොමු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. |

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 20 | - | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භන ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර, 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීමට අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 පෙබරවාරි 06 | - | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු ගෙවීම සඳහා වූ උපරිම කාලසීමාව ව්‍යාපෘතියේ ස්වභාවය මත, වසරක උපරිම සහන කාලයක් ද ඇතුළත්ව වසර 5 සිට වසර 6 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 පෙබරවාරි 08 | - | ශ්‍රී ලංකා මහ බැංකුව, රජය වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය සහ රැකියා ජනනය කිරීමේ අරමුණින් "ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා" නමින් නව ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. |
| 2017 අප්‍රේල් 03 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීමේ කාලය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලද අතර, අදාළ මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2017 අප්‍රේල් 26 | - | ලෝක බැංකුව මගින් මූල්‍යනය කරනු ලබන කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ "ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය" ආරම්භ කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 මැයි 08 | - | "තරුණ දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත හැකි ණය ප්‍රමාණය සහ ණය ආපසු ගෙවීමේ කාලය, පිළිවෙළින්, රුපියල් මිලියන 1ක් සහ මාස 48ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2017 ජූනි 28 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ, "ආපදාවලින් පසු ආර්ථික කටයුතු නැවත නඟාසිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2017 අගෝස්තු 18 | - | ආපදාවන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා සහනදායී කොන්දේසි සහ නියමයන් යටතේ මූල්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් "අත්වැල" ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| 2017 ජූලි 20 | - | ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීනව ගෙවීම් කිරීම සඳහා පහසුකම් සැලසීමට, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ විශේෂිත ගනුදෙනු කේතයක් හරහා සිදු කරනු ලබන ගනුදෙනුවක උපරිම වටිනාකම වැඩි කිරීම සඳහා, 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය ප්‍රතිස්ථාපනය කර විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව පිළිබඳ 2017 අංක 08 දරන ගෙවීම් සහ පියවීම් චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | ගෙවීම් හා සම්බන්ධ ජංගම මෘදුකාංග අයදුම් සඳහා ප්‍රමිතීන් නියම කිරීමට මාර්ගෝපදේශ නිකුත් කිරීම |

## සැක කටයුතු ගනුදෙනු වාර්තා ආකෘති

| | | |
|---|---|---|
| 2017 මාර්තු 30 | - | 2017 මාර්තු 30 දිනැති අංක 2015/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝග 2017 නිකුත් කරන ලදී. |

## විදේශ විනිමය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2017 මාර්තු 07 | - | ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක ස්ථිර නේවාසික වීසාලාභීන් සහ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය ලද ශ්‍රී ලාංකිකයන් හට බලයලත් වෙළඳුන් විසින් පවත්වාගෙන යනු ලබන දේශීය බැංකු ඒකක තුළින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ලබා ගැනීමට අවසර ප්‍රදානය කරන ලදී. |
| | - | විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ලබා ගන්නා ලද ණය මුදල් නැවත ගෙවීමේදී එම ගිණුම් හිමියාගේම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ (RFC), සහ සුරැකුම්පත් ආයෝජන ගිණුමේ (SIA) ඇති මුදල් භාවිතා කිරීමට හැකි අතර, නේවාසික දේපළක් අත්පත් කර ගැනීමේ, ගොඩගැනීමේ, සංවර්ධනය කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ අරමුණින් විදේශ ව්‍යවහාර ණය ගිණුමෙන් (FCLA) විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමට (FEEA) මුදල් මාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. |
| 2017 මැයි 25 | - | පවත්නා ලිහිල්කරණයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා බලයලත් වෙළඳුන් හට නිකුත් කරන ලද විධිවිධානයන්ට සමගාමීව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) සහ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) ආරම්භ කර පවත්වාගෙන යෑම සඳහා නව විධානයන් නිකුත් කරන ලදී. |

2017 ජූනි 23 - විදේශ විනිමය හුවමාරු සමාගම්වලින් ලැබෙන්නා වූ මුදල් බැංකු පද්ධතිය හරහා ලැබෙන්නා වූ ආමුඛ ප්‍රේෂණ ලෙස සලකා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), සුරැකුම්පත් ආයෝජන ගිණුම් (SIA) සහ විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම්වලට (SFIDA) හර කිරීමට අවසර ලබා දෙන ලදී.

2017 ජූලි 05 - 2015 අංක 09 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ, වෘත්තීමය සේවා සැපයුම්කරුවන් ආදායම් බදුවලින් නිදහස් කර ඇති හෙයින් බලයලත් වෙළඳුන් සඳහා අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE) ආරම්භ කිරීමට ලබාදී තිබූ අවසරය ඉවත් කරන ලදී. කෙසේ වුවද, දැනට පවත්නා අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE) පවත්වාගෙන යෑමට බලයලත් වෙළඳුන් හට අවසරය ලබා දෙන ලදී.

2017 ජූලි 10 - සෑම බද්ධ ගිණුම් හිමියෙක්ම නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC) විවෘත කිරීමට සුදුසුකම්ලත් පුද්ගලයන් වීම යන අවශ්‍යතාවට යටත්ව නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC) බද්ධ ගිණුම් ලෙස ආරම්භ කර පවත්වාගෙන යෑමට බලයලත් වෙළඳුන් හට සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත අවසර ලබා දෙන ලදී.

2017 ජූලි 28 - පහත අරමුණු සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනත බලාත්මක කරන ලදී.

- විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම
- විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ වගකීම රජයේ නියෝජිත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරීම
- (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලසීම

## මිල සංශෝධන

2017 ජනවාරි 09 - භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 44 දක්වා රුපියල් 5කින් අඩු කරන ලදී.

2017 ජනවාරි 27 - පහත සඳහන් අයිතම සඳහා වූ උපරිම සිල්ලර මිල සීමාවන් අඩු කරන ලදී.

- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) කිලෝග්‍රෑමයක් රුපියල් 169 සිට රුපියල් 159 දක්වා
- වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත) කිලෝග්‍රෑමයක් රුපියල් 495 සිට රුපියල් 490 දක්වා
- වියළි හාල්මැස්සන් (ආනයනික - ඩුබායි) කිලෝග්‍රෑමයක් රුපියල් 410 සිට රුපියල් 405 දක්වා
- මුං ඇට කිලෝග්‍රෑමයක් රුපියල් 220 සිට රුපියල් 205 දක්වා
- සුදු සීනි කිලෝග්‍රෑමයක් රුපියල් 95 සිට රුපියල් 93 දක්වා
- අර්තාපල් (ආනයනික) කිලෝග්‍රෑමයක් රුපියල් 120 සිට රුපියල් 115 දක්වා

2017 පෙබරවාරි 08 - සහල් සඳහා පහත සඳහන් උපරිම සිල්ලර මිල සීමාවන් පනවන ලදී.

- සම්බා සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 80
- නාඩු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 72
- කැකුළු සහල් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 70

2017 පෙබරවාරි 17 - සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා පහත පරිදි සංශෝධනය කරන ලදී.

| සහල් වර්ගය | දේශීයව නිපදවන සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) | ආනයනික සහල් සඳහා උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රුපියල්) |
|---|---|---|
| සම්බා සහල් (කීරි සහ සුදුරු සම්බා හැර) | 90 | 80 |
| නාඩු සහල් | 80 | 72 |
| කැකුළු සහල් | 78 | 70 |

- වෛද්‍ය උපකරණ සඳහා උපරිම සිල්ලර මිල සීමා පැනවීම සඳහා 2017 අංක 01 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝගය නිකුත් කරන ලදී.

2017 මාර්තු 14 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය මත වූ උපරිම සිල්ලර මිල සීමාවන් ඉවත් කරන ලදී.

- සුදු සීනි
- අධි ශීත කළ හෝ ශීත කළ සම සහිත හා සම රහිත බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා)

2017 ජූලි 01 - මගී බස් ගාස්තු සියයට 6.28ක ප්‍රතිශතයකින් වැඩි කරන ලදී. අවම බස් ගාස්තුව රුපියල් 9 සිට රුපියල් 10 දක්වා වැඩි කරන ලදී.

2017 අගෝස්තු 16 - සහල් සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා ඉවත් කරන ලදී.

2017 අගෝස්තු 30 - වියළි හාල්මැස්සන් (ආනයනික - තායිලන්ත සහ ඩුබායි) සඳහා වූ උපරිම සිල්ලර මිල සීමා ඉවත් කරන ලදී.

2017 සැප්තැම්බර් 26 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්. පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,431 දක්වා රුපියල් 110කින් වැඩි කරන ලදී.

## බදු සංශෝධන

### පුද්ගල ආදායම් බදු

අපේක්ෂිත - සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වාර්ෂික බදු නිදහස් දීමනාව වසරකට රුපියල් 750,000 සිට රුපියල් මිලියන 1.2 දක්වා ඉහළ නැංවීම

- බදු නිදහස් සීමාව රුපියල් 500,000 ලෙස පවත්වා ගන්නා අතර අනුක්‍රමික බදු අනුප්‍රමාණ ව්‍යුහයන් පහත පරිදි හඳුන්වා දීම

| බදු අය කළ හැකි ආදායම | බදු අනුපාතය |
|---|---|
| පළමු රු. 600,000 | 4% |
| රු. 600,000 - රු. 1,200,000 | 8% |
| රු. 1,200,000 - රු. 1,800,000 | 12% |
| රු. 1,800,000 - රු. 2,400,000 | 16% |
| රු. 2,400,000 - රු. 3,000,000 | 20% |
| රු. 3,000,000 ඉක්මවන | 24% |

- සියයට 10ක අනුපාතයක් යටතේ ප්‍රාග්ධන ලාභ මත බද්ද හඳුන්වා දීම

## සංස්ථාපිත ආදායම් බදු

අපේක්ෂිත - ආදායම් බදු පහත පරිදි සංශෝධනය කිරීම

- සමාගම් බදු සියයට 14ක අඩු බදු අනුප්‍රමාණය, සියයට 28ක සම්මත බදු අනුප්‍රමාණය සහ සියයට 40ක ඉහළ බදු අනුප්‍රමාණය ලෙස බදු අනුප්‍රමාණ 3කට පහත පරිදි සංශෝධනය කිරීම

  (අ) සියයට 14ක අඩු බදු අනුප්‍රමාණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, භාණ්ඩ හා සේවා අපනයන, කෘෂිකාර්මික ව්‍යවසාය සහ අධ්‍යාපන සේවාවලින් ලද ලාභ සහ ආදායම් මත අදාළ වේ.

  (ආ) ඉහළ බදු අනුප්‍රමාණය වන සියයට 40, ඔට්ටු හා සූදු, මත්පැන්, දුම්කොළවලින් ලද ලාභ සහ ආදායම් සඳහා අදාළ වේ.

  (ඇ) සම්මත බදු අනුප්‍රමාණය වන සියයට 28, බැංකු හා මූල්‍ය ව්‍යාපාර, රක්ෂණ, කල්බදු සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළුව අනෙකුත් සියලුම අංශවල ලාභ සහ ආදායම් මත අය කෙරේ.

## රඳවා ගැනීමේ බදු

අපේක්ෂිත - පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අනුපාතිකය පවත්නා සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කිරීම

- මසකට රුපියල් 50,000ක් ඉක්මවන නිශ්චිත ගාස්තු සඳහා රඳවා ගැනීමේ බද්දක් හඳුන්වා දීම

## ආර්ථික සේවා ගාස්තු

2017 අප්‍රේල් 01 - ආර්ථික සේවා ගාස්තුවට යටත් වන පිරිවැටුමේ සීමාව කාර්තුවකට රුපියල් මිලියන 50 සිට කාර්තුවකට රුපියල් මිලියන 12.5 දක්වා අඩු කරන ලදී.

- සෑම ආනයනික මෝටර් වාහන තොගයක් සඳහාම (ආර්ථික සේවා ගාස්තුව අදාළ වන උපරිම සීමාව නොසලකමින්) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරන ලද පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු අගය (CIF value) මත ආර්ථික සේවා ගාස්තු අය කරනු ලැබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සේවා ගාස්තුව සඳහා යටත් ආයතනයක් ලෙස නැවත නිර්වචනය කරන ලද අතර ආර්ථික සේවා ගාස්තුවට යටත් කරන ලදී.

## එකතු කළ අගය මත බදු

අපේක්ෂිත - පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා වන පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපාංග ආනයනය මත එකතු කළ අගය මත බදු නිදහස් කිරීම

- විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ආනයනය කරනු ලබන පිරියත සහ යන්ත්‍රෝපකරණ මත එකතු කළ අගය මත බදු නිදහස් කිරීම

- කිරි පිටි හැර දේශීයව නිෂ්පාදනය කරනු ලබන කිරි ආහාර මත වන එකතු කළ අගය මත බදු ඉවත් කිරීම

## ජාතිය ගොඩනැගීමේ බද්ද

2017 අප්‍රේල් 01 - පහත සඳහන් භාණ්ඩ හා සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

- බාහිර පිවිසුම් ක්‍රියාකරුවන් විසින් දේශීය ක්‍රියාකරුවන් වෙත ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම

- පුවත්පත් හැර මුද්‍රිත පොත්, සඟරා, ජර්නල් සහ වාර සඟරා සැපයීම
- ලංකා විදුලිබල මණ්ඩලය හැර වෙනත් ආයතනයකින් විදුලිය සැපයීම

2017 අගෝස්තු 01 - පහත සඳහන් අයිතම මත වූ ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් කිරීම් ඉවත් කර ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කරන ලදී.

- ශ්‍රීලංකන් ගුවන් සමාගම, මිහින් ලංකා (පෞද්.) සමාගම සහ එයාර්ලංකා කේටරින් සමාගම විසින් අන්තර්ජාතික ප්‍රවාහන සේවා සැපයීම සඳහා අවශ්‍ය වන ඕනෑම භාණ්ඩයක් සැපයීම
- සමූපකාර සමිති හෝ ලක්සතොස මගින් භාණ්ඩ හා සේවා සැපයීම
- උප කොන්ත්‍රාත්කරුවෙකු හැර කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කරන ඉදිකිරීම් සේවා
- සංචාරක ඒජන්තවරයෙකු විසින් සපයනු ලබන දේශීය ගමන් සේවා (බැංකුවක් හරහා විදේශීය මුදලින් සිදුවන ගෙවීම් අදාළ වන සිදුවීම් හැර)
- පදිංචිය සඳහා නිවාස සැපයීම

## නිෂ්පාදන/සුරා බදු

2017 ජනවාරි 01 - බෝතල් කරන ලද රා සඳහා අය කළ බද්ද ලීටරයට රුපියල් 30 සිට ලීටරයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී.

- වාර්ෂික ස්කාගාර බලපත්‍ර ගාස්තුව (තල් අරක්කු හැර) රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 1 දක්වා අඩු කරන ලදී.
- රට බීම බලපත්‍ර සමඟ නිකුත් කරනු ලබන අරක්කු බලපත්‍රයක් සඳහා රුපියල් 100,000ක බලපත්‍ර ගාස්තුවක් පනවන ලදී.
- බෝතල් රා විකිණීම සඳහා රුපියල් 50,000ක බලපත්‍ර ගාස්තුවක් පනවන ලදී.

2017 මාර්තු 13 - විදේශීය මත්පැන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සරල කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී.

## නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද

2017 අගෝස්තු 18 - සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.04 යටතේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මෝටර් වාහන මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද ඒකකයක් සඳහා රුපියල් 1,000,000 සිට රුපියල් 700,000 දක්වා අඩු කරන ලදී.

- සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.11 යටතේ මෝපෙඩ් ඇතුළු මෝටර් බයිසිකල් මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද සංශෝධනය කරන ලදී.

## ආනයන තීරු බදු

2017 පෙබරවාරි 01 - ඩීසල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 3ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව ඩීසල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 12කි.

- පෙට්‍රල් ආනයනය සඳහා ලීටරයට රුපියල් 10ක තීරුබදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව පෙට්‍රල් සඳහා අදාළ තීරු බදු අනුපාතිකය ලීටරයට රුපියල් 25කි.

2017 පෙබරවාරි 17 - සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, දුනු කොළ නිෂ්පාදනය සඳහා වන වානේ දඬු සහ පොලු වර්ග සහ ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි තැනීම සඳහා යොදා ගන්නා වානේ මත වූ ආනයන බදු නිදහස් කරන ලදී.

| | | |
|---|---|---|
| | - | ප්‍රාථමික ස්වරූපවලින් ඇති බහු අවයවික, සෝයා බෝංචි, ටයර්, වානේ, බෝල බෙයාරිං, ස්පාක් ප්ලග් සහ බැටරි සඳහා අදාළ තීරු බදු සංශෝධනය කරන ලදී. |
| 2017 ජූලි 08 | - | කිරිපිටි ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 180 සිට කිලෝග්‍රෑමයට රුපියල් 223 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව කිරිපිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 2කි. |
| 2017 අගෝස්තු 02 | - | තිරිඟු ඇට ආනයනය කිරීමේදී පැවති තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 3 සිට කිලෝග්‍රෑමයට රුපියල් 6 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව තිරිඟු ඇට සඳහා අදාළ වන තීරු බදු අනුපාතිකය කිලෝග්‍රෑමයට රුපියල් 6කි. |

## ආනයන වටිනාකම

| | | |
|---|---|---|
| 2017 මාර්තු 15 | - | ඇඟලුම් නිෂ්පාදනය හා අපනයනය කිරීමේ කර්මාන්තයේ යෙදී සිටින ව්‍යාපාර විසින් තීරුබදුවලින් නිදහස් යෝජනා ක්‍රමයක් යටතේ කොන්දේසි සහිතව ආනයනය කරන ලද යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීමේදී රේගු වටිනාකම නිර්ණය කිරීම සඳහා ක්‍රමවේදයක් ප්‍රකාශ කරන ලදී. |

## සෙස් බද්ද

| | | |
|---|---|---|
| 2017 අගෝස්තු 02 | - | තිරිඟු පිටි ආනයනය සඳහා අය කළ සෙස් බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා අඩු කරන ලදී. |

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 07 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 ජනවාරි 19 | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20කින් අඩු කරන ලදී. |
| 2017 ජනවාරි 28 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත දින 30ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 10ක් වූ බදු අත්හැරීමක් ලබා දෙන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 5කි. |
| 2017 පෙබරවාරි 17 | - | අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | රතු සහ කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට වැඩි කරන ලදී.<br>- සම්පූර්ණ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා<br>- පියලි කළ පරිප්පු කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා |
| 2017 පෙබරවාරි 24 | - | එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20කින් අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2017 පෙබරවාරි 27 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බදු අත්හැරීම දින 30ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 5කි. |
| 2017 මාර්තු 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, කුරක්කන් සහ ස්ඵටිකකෘත සුදු සීනි හැර සීනි සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මාර්තු 28 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත ප්‍රදානය කළ කිලෝග්‍රෑමයකට රුපියල් 10ක් වූ බදු අත්හැරීම 2017 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 5කි. |
| 2017 අප්‍රේල් 01 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 60ක කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| 2017 අප්‍රේල් 02 | - | කරවල, යෝගට්, වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සුදු ළූණු, අලුත් දොඩම්, මිදි, ඇපල්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට සහ ලුණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මැයි 08 | - | ශීර්ෂයේ කටු ගැලවූ මසුන් හැර අලුත් හෝ ශීත කළ මසුන්, මුං ඇට, මැංගුස්ටින් (අලුත් සහ වියළි), දොඩම් (වියළි), පෙයාර්ස්, චෙරීස්, ප්ලම්ස් සහ ස්ලෝස්, කිවි ෆෘට් සහ සංයෝජිත වර්ගීකරණ අංක 0810.90.90 යටතේ වන අනෙකුත් අලුත් පලතුරු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 මැයි 21 | - | රතු ළූණු, රට ඉඳි, මිදි (වියළි), සූදුරු බීජ සහ මහදුරු බීජ ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | පොතු සහිත (දුඹුරු) සහල් ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 මැයි 31 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 අගෝස්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2017 ජූනි 06 | - | මාගරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10කින් වැඩි කරන ලදී. |
| 2017 ජූනි 07 | - | මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත දින 30ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 25ක් වූ බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලදී. ඒ අනුව අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සියයට 10 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 50කි. |

| | | |
|---|---|---|
| 2017 ජූලි 01 | - | කැඩුණු සහල් ආනයනය සඳහා මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 ජූලි 19 | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, උඳු, මිරිස්, කොත්තමල්ලි ඇට, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 ජූලි 27 | - | සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ රළු සහල් (කැකුළු), නාඩු (රතු හෝ සුදු) සහ සම්බා (රතු හෝ සුදු) ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 දෙසැම්බර් 31 දක්වා කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට ශත 25 දක්වා අඩු කරන ලදී. |
| 2017 අගෝස්තු 01 | - | තලපත් සහ කොප්පරා මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 75 හෝ සියයට 10 යන දෙකෙන් වැඩි අගයේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා අඩු කරන ලදී. |
| | - | තිරිඟු ආනයනය සඳහා මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2017 අගෝස්තු 02 | - | කැඩුණු සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2017 දෙසැම්බර් 31 දක්වා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට ශත 25 දක්වා අඩු කරන ලදී. |
| 2017 අගෝස්තු 16 | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 8කින් වැඩි කරන ලදී. |
| 2017 අගෝස්තු 17 | - | අර්තාපල්, බොම්බයි ළූණු සහ රතු හා කහ පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2017 සැප්තැම්බර් 08 | - | මැකරල් (මාළු), මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි සහ කුරක්කන් සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

## මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| 2017 පෙබරවාරි 21 | - | යම් රක්ෂණ ඔප්පුවක්, මූල්‍ය කල්බදු ගිවිසුමක් සහ කුලී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ගෙවිය යුතු මෝටර් වාහන වර්ග වෙන් කර දක්වන ලදී. |

## නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බදු

| | | |
|---|---|---|
| 2017 ජනවාරි 01 | - | නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද එ.ජ. ඩොලර් 30 සිට එ.ජ. ඩොලර් 50 දක්වා වැඩි කරන ලදී. |

## ගාස්තු සහ අයකිරීම්

| | | |
|---|---|---|
| අපේක්ෂිත | - | රථ වාහන වැරදි සඳහා වන දඩ මුදල් ඉහළ නැංවීම |

## අනෙකුත්

| | | |
|---|---|---|
| 2017 සැප්තැම්බර් 01 | - | අන්තර්ජාල සේවාවන් මත වූ විදුලි සංදේශ බද්ද ඉවත් කරන ලදී. |
| අපේක්ෂිත | - | බැංකු සහ මූල්‍ය ආයතන මගින් සිදු කරන ගනුදෙනු සඳහා එම ගනුදෙනුවල මුළු අගය මත සියයට 0.05ක මූල්‍ය ගනුදෙනු බද්දක් හඳුන්වා දීම |
| | - | රට තුළට ගෙන්වනු ලබන සහ සිංහල, දෙමළ හෝ වෙනත් භාෂාවකින් හඬ කවනු ලබන විදේශීය ටෙලි නාට්‍ය මත අදාළ වන ටෙලිනාට්‍ය බද්ද වැඩි කිරීම |

- සිම් කාඩ් මත රුපියල් 200ක සක්‍රීය කිරීමේ ගාස්තුවක් පැනවීම
- විදුලිත් මෝටර් රථ හා ට්‍රැක්ටර් හැර අනෙකුත් වාහන මත කාබන් බද්දක් පැනවීම
- ලිහිසි තෙල්, තාර සහ රත්‍රන් ආනයනය මත බලපත්‍ර ගාස්තුවක් අය කිරීම

## රාජ්‍ය වියදම

2017 පෙබරවාරි 09 - සන්නද්ධ හමුදා සේවයේ සහ පොලිස් සේවයේ වසර 10ක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් හා සන්නද්ධ හමුදා සේවයේ වසර 12ක් සම්පූර්ණ කර නොමැති සෙසු නිල සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කරමින් විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 02/2017 නිකුත් කරන ලදී.

2017 මාර්තු 08 - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවුරුදු 61 දක්වා දීර්ඝ කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2017 නිකුත් කරන ලදී.

2017 ජුනි 09 - ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ ඔවුන්ගේ වැන්දඹුවන් හට "රණවිරු සුරැකුම් දීමනාව" 2017 ජනවාරි 01 දින සිට හිමිගැන්වීමට තීරණය කරමින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2017 නිකුත් කරන ලදී.

## රාජ්‍ය ණය කළමනාකරණය

2017 ජනවාරි 10 - 2017 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 1,500ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

2017 අප්‍රේල් 24 - ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කරන ලද බ්ලූම්බර්ග් වෙළඳ පද්ධතිය (ස්ථාවර ආදායම් මිල ගණන් දැක්වීමේ පිටුව) පහත සඳහන් කාර්යයන් සඳහා යොදා ගැනීමට නියම කරමින් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- ප්‍රතිමිලදීගැනුම් අනුපාත, කාලසීමාවන් සහ ප්‍රමාණය ඉදිරිපත් කිරීම
- රුපියල් මිලියන 100 හෝ ඊට වැඩි සියලුම ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනුවල එලඳා අනුපාත, කාලසීමාවන් සහ ප්‍රමාණය මිනිත්තු 30ක් ඇතුළත වාර්තා කිරීම

2017 මැයි 08 - 2017 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 3,000ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට නැවත අනුමැතිය ලබා දෙන ලදී.

2017 ජූලි 27 - භාණ්ඩාගාර බැඳුම්කර සඳහා නව ප්‍රාථමික නිකුතු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය යටතේ මාසිකව භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පවත්වනු ලැබේ. සෑම භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවක් සඳහාම සම්මත අදියර තුනක් ඇත.

අදියර I - සාධාරණ වෙළඳපොළ මිල ගණන් ඔස්සේ තරගකාරී බහුවිධ මිල වෙන්දේසි ක්‍රමයක් තුළ නිවේදනය කරන ලද සම්පූර්ණ වටිනාකම නිකුත් කිරීම

අදියර II - වටිනාකම මත පදනම් වූ ස්වේච්ඡා මිල කැඳවීම් සඳහා විවෘත කිරීම

අදියර III - පළමු සහ දෙවන අදියර යටතේ අපේක්ෂිත මුදල් ප්‍රමාණයට වඩා අඩුවෙන් එක්රැස් කර ඇති අවස්ථාවක අනිවාර්ය පදනමක් මත ප්‍රාථමික වෙළඳුන් හට නිකුත් කිරීම

# පරිශිෂ්ටය 2

# සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය

## නිර්වචන සහ විස්තර සටහන්

පහත දැක්වෙන පොදු සටහන් එක් එක් සංඛ්‍යා සටහනෙහි පාදක සටහන් සඳහා අදාළ වේ.

1. තොරතුරුවල සම්පූර්ණත්වය සඳහා ඇතැම් සංඛ්‍යා සටහන්වල තාවකාලික සංඛ්‍යා ඇතුළත් කොට ඇත.
2. ඇතැම් සංඛ්‍යා සටහන්වල සංඛ්‍යා ආසන්න පූර්ණ සංඛ්‍යාවට දක්වා ඇත. එබැවින් දක්වා ඇති එකතුවෙහිත්, සංඛ්‍යා එකතු කළ විට ලැබෙන මුළු එකතුවෙහිත් සුළු වෙනස්කම් පැවතිය හැකිය.
3. කලින් පළකොට ඇති සංඛ්‍යාවලින් වෙනස් වන්නේ, පසුව කළ සංශෝධන හේතුවෙනි.
4. පහත සඳහන් සංකේත යොදා ඇත.

| | | |
|---|---|---|
| ... | = | සැලකිය යුතු නොවේ |
| - | = | නැත |
| ලැ.නො. | = | ලැබී නොමැත |

**1 වන සංඛ්‍යා සටහන**

## කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2014 (ආ) | 2015 (ආ) (ඇ) | 2016 (ඇ) | 2017 ප්‍රථම භාගය (ඇ) | ප්‍රතිශත වෙනස 15/14 (ආ) (ඇ) | 16/15 (ඇ) | 17/16 ප්‍රථම භාගය (ඇ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | 829,577 | 894,780 | 890,659 | 479,067 | 7.9 | -0.5 | 10.6 |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 18,454 | 20,383 | 19,863 | 9,168 | 10.4 | -2.6 | -15.6 |
| 2. වී වගාව | 100,931 | 117,136 | 73,484 | 25,362 | 16.1 | -37.3 | -19.3 |
| 3. එළවළු වගාව | 73,091 | 90,525 | 89,251 | 44,282 | 23.9 | -1.4 | -8.2 |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 3,431 | 2,774 | 3,171 | 1,499 | -19.1 | 14.3 | -8.1 |
| 5. පළතුරු වගාව | 45,697 | 55,252 | 63,557 | 42,819 | 20.9 | 15.0 | 32.6 |
| 6. තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 79,820 | 95,573 | 70,860 | 48,770 | 19.7 | -25.9 | 27.4 |
| 7. තේ වගාව | 91,533 | 75,746 | 82,321 | 57,646 | -17.2 | 8.7 | 47.5 |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) | 1,622 | 1,366 | 2,096 | 1,190 | -15.8 | 53.4 | 44.9 |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 75,735 | 80,476 | 89,381 | 46,113 | 6.3 | 11.1 | 11.3 |
| 10. රබර් වගාව | 17,437 | 14,218 | 10,643 | 6,941 | -18.5 | -25.1 | 1.5 |
| 11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 22,636 | 24,507 | 25,411 | 12,230 | 8.3 | 3.7 | 2.2 |
| 12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 57,284 | 65,458 | 88,836 | 46,522 | 14.3 | 35.7 | 18.9 |
| 13. පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 12,110 | 13,808 | 14,414 | 7,324 | 14.0 | 4.4 | 3.5 |
| 14. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 71,767 | 75,546 | 84,003 | 40,151 | 5.3 | 11.2 | -0.7 |
| 15. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 141,987 | 146,709 | 159,064 | 83,680 | 3.3 | 8.4 | 5.8 |
| 16. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 16,043 | 15,303 | 14,305 | 5,368 | -4.6 | -6.5 | 14.8 |
| **කර්මාන්ත** | 2,931,998 | 2,991,106 | 3,208,476 | 1,800,797 | 2.0 | 7.3 | 13.7 |
| 17. පතල් හා කැණීම් කර්මාන්තය | 254,392 | 249,056 | 315,067 | 166,607 | -2.1 | 26.5 | 17.8 |
| 18. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 759,354 | 851,869 | 858,954 | 515,747 | 12.2 | 0.8 | 17.7 |
| 19. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 415,363 | 396,724 | 383,411 | 223,188 | -4.5 | -3.4 | 7.3 |
| 20. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 22,269 | 27,947 | 26,879 | 10,532 | 25.5 | -3.8 | -5.0 |
| 21. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 36,585 | 37,897 | 41,361 | 21,639 | 3.6 | 9.1 | 3.7 |
| 22. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 66,690 | 20,399 | 2,406 | 1,520 | -69.4 | -88.2 | 19.4 |
| 23. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 74,134 | 70,385 | 84,870 | 41,507 | -5.1 | 20.6 | -5.1 |
| 24. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 77,754 | 80,133 | 96,811 | 41,371 | 3.1 | 20.8 | 3.7 |
| 25. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 110,571 | 93,903 | 97,578 | 55,381 | -15.1 | 3.9 | 11.7 |
| 26. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 33,635 | 38,600 | 48,848 | 22,919 | 14.8 | 26.6 | 7.3 |
| 27. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 33,421 | 41,758 | 46,804 | 21,820 | 24.9 | 12.1 | 10.7 |
| 28. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 78,967 | 82,639 | 84,434 | 47,872 | 4.7 | 2.2 | 15.4 |
| 29. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 49,971 | 56,669 | 64,823 | 34,166 | 13.4 | 14.4 | 13.0 |
| 30. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 77,639 | 82,793 | 86,660 | 45,871 | 6.6 | 4.7 | 9.6 |
| 31. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 14,425 | 15,075 | 17,792 | 9,026 | 4.5 | 18.0 | 1.7 |
| 32. මළාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 13,140 | 16,873 | 19,517 | 11,326 | 28.4 | 15.7 | 19.5 |
| 33. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 813,689 | 828,388 | 932,260 | 530,306 | 1.8 | 12.5 | 16.2 |
| **සේවාවන්** | 5,895,618 | 6,270,028 | 6,743,346 | 3,450,595 | 6.4 | 7.5 | 7.8 |
| 34. තොග හා සිල්ලර වෙළඳාම | 1,117,234 | 1,188,521 | 1,264,170 | 734,019 | 6.4 | 6.4 | 11.1 |
| 35. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (ගොඩබිම, ජලය සහ ගුවන්) | 1,288,124 | 1,300,167 | 1,426,726 | 628,554 | 0.9 | 9.7 | 2.0 |
| 36. තැපැල් සහ කුරියර් සේවාවන් | 4,821 | 5,001 | 4,890 | 2,647 | 3.7 | -2.2 | 16.5 |
| 37. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 166,608 | 171,314 | 184,992 | 98,424 | 2.8 | 8.0 | 10.2 |
| 38. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 3,680 | 4,425 | 4,749 | 2,444 | 20.2 | 7.3 | 11.3 |
| 39. විදුලි සංදේශ සේවාවන් | 44,733 | 57,222 | 68,316 | 35,765 | 27.9 | 19.4 | 6.1 |
| 40. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් | 13,405 | 15,528 | 17,265 | 9,298 | 15.8 | 11.2 | 10.0 |
| 41. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් | 340,727 | 346,447 | 405,572 | 212,650 | 1.7 | 17.1 | 20.5 |
| 42. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය | 92,938 | 102,251 | 120,973 | 47,344 | 10.0 | 18.3 | 6.0 |
| 43. නිවාස අයිතිය සහ දේපොළ වෙළඳාම | 562,687 | 625,521 | 676,760 | 360,222 | 11.2 | 8.2 | 9.4 |
| 44. වෘත්තීයමය සේවාවන් | 210,966 | 197,212 | 198,198 | 102,843 | -6.5 | 0.5 | 5.6 |
| 45. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය | 563,280 | 637,464 | 678,665 | 334,422 | 13.2 | 6.5 | 6.1 |
| 46. අධ්‍යාපනය | 212,148 | 250,024 | 256,726 | 130,945 | 17.9 | 2.7 | 1.8 |
| 47. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 210,304 | 257,008 | 265,962 | 134,163 | 22.2 | 3.5 | 3.4 |
| 48. වෙනත් පෞද්ගලික සේවාවන් | 1,063,962 | 1,111,922 | 1,169,381 | 616,855 | 4.5 | 5.2 | 8.8 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතුකළ අගය** | 9,657,194 | 10,155,914 | 10,842,481 | 5,730,458 | 5.2 | 6.8 | 9.8 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 703,957 | 795,782 | 996,495 | 611,682 | 13.0 | 25.2 | 12.6 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | 10,361,151 | 10,951,695 | 11,838,975 | 6,342,141 | 5.7 | 8.1 | 10.1 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2 වන සංඛ්‍යා සටහන**

## කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) (අ)

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2014 (ආ) | 2015 (ආ) (ඇ) | 2016 (ඇ) | 2017 ප්‍රථම භාගය (ඇ) | ප්‍රතිශත වෙනස 15/14 (ආ) (ඇ) | ප්‍රතිශත වෙනස 16/15 (ඇ) | ප්‍රතිශත වෙනස 17/16 ප්‍රථම භාගය (ඇ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | 639,696 | 670,106 | 641,943 | 310,400 | 4.8 | -4.2 | -3.1 |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 13,969 | 14,982 | 13,410 | 6,238 | 7.3 | -10.5 | -15.2 |
| 2. වී වගාව | 61,019 | 76,256 | 52,649 | 13,497 | 25.0 | -31.0 | -42.1 |
| 3. එළවළු වගාව | 55,244 | 56,714 | 55,522 | 27,231 | 2.7 | -2.1 | -4.6 |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 2,287 | 1,944 | 2,205 | 1,061 | -15.0 | 13.4 | -10.2 |
| 5. පළතුරු වගාව | 40,888 | 48,033 | 46,258 | 26,348 | 17.5 | -3.7 | 1.7 |
| 6. තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 64,158 | 67,504 | 67,074 | 30,367 | 5.2 | -0.6 | -14.9 |
| 7. තේ වගාව | 73,936 | 71,978 | 63,893 | 34,105 | -2.6 | -11.2 | 1.2 |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) | 1,538 | 1,259 | 1,353 | 682 | -18.1 | 7.5 | 0.7 |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 57,505 | 61,483 | 65,417 | 33,728 | 6.9 | 6.4 | 1.3 |
| 10. රබර් වගාව | 28,688 | 25,777 | 23,023 | 13,119 | -10.1 | -10.7 | -5.9 |
| 11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 15,402 | 16,839 | 16,473 | 8,604 | 9.3 | -2.2 | 3.9 |
| 12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 47,950 | 51,811 | 55,060 | 27,763 | 8.1 | 6.3 | 8.9 |
| 13. පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 9,767 | 10,421 | 9,936 | 5,124 | 6.7 | -4.7 | 3.5 |
| 14. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 47,450 | 48,360 | 51,020 | 25,306 | 1.9 | 5.5 | 7.2 |
| 15. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 105,822 | 104,245 | 104,915 | 52,578 | -1.5 | 0.6 | 4.5 |
| 16. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 14,072 | 12,501 | 13,734 | 4,651 | -11.2 | 9.9 | 15.1 |
| **කර්මාන්ත** | 2,218,711 | 2,264,673 | 2,416,276 | 1,255,249 | 2.1 | 6.7 | 5.8 |
| 17. පතල් හා කැණීම් කර්මාන්තය | 201,613 | 191,112 | 218,545 | 116,914 | -5.2 | 14.4 | 18.1 |
| 18. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 513,960 | 532,936 | 519,815 | 260,512 | 3.7 | -2.5 | -1.1 |
| 19. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 276,800 | 282,070 | 281,481 | 152,768 | 1.9 | -0.2 | 1.3 |
| 20. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 23,139 | 26,239 | 30,311 | 12,136 | 13.4 | 15.5 | -3.2 |
| 21. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 24,968 | 27,092 | 29,730 | 16,213 | 8.5 | 9.7 | 6.8 |
| 22. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 28,723 | 29,075 | 31,245 | 15,907 | 1.2 | 7.5 | -15.2 |
| 23. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 82,243 | 82,303 | 85,623 | 41,881 | 0.1 | 4.0 | -5.1 |
| 24. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 71,909 | 76,446 | 90,119 | 39,197 | 6.3 | 17.9 | 5.7 |
| 25. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 78,671 | 74,269 | 64,520 | 37,708 | -5.6 | -13.1 | 16.8 |
| 26. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 24,882 | 28,516 | 36,711 | 17,010 | 14.6 | 28.7 | 4.8 |
| 27. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 32,064 | 38,838 | 44,300 | 20,680 | 21.1 | 14.1 | 13.0 |
| 28. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 82,748 | 93,529 | 96,684 | 51,174 | 13.0 | 3.4 | 7.1 |
| 29. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 55,993 | 68,380 | 72,922 | 33,020 | 22.1 | 6.6 | -7.2 |
| 30. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 80,298 | 85,067 | 92,175 | 45,712 | 5.9 | 8.4 | 1.2 |
| 31. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 11,504 | 12,005 | 12,950 | 6,913 | 4.4 | 7.9 | 13.3 |
| 32. මළාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 17,355 | 21,681 | 25,539 | 13,856 | 24.9 | 17.8 | 10.7 |
| 33. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 611,842 | 595,115 | 683,604 | 373,650 | -2.7 | 14.9 | 12.8 |
| **සේවාවන්** | 4,618,501 | 4,883,444 | 5,087,452 | 2,536,917 | 5.7 | 4.2 | 4.0 |
| 34. තොග හා සිල්ලර වෙළඳාම | 884,094 | 929,208 | 952,652 | 521,757 | 5.1 | 2.5 | 4.2 |
| 35. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (ගොඩබිම, ජලය සහ ගුවන්) | 885,506 | 929,854 | 968,421 | 426,310 | 5.0 | 4.1 | 2.3 |
| 36. තැපැල් සහ කුරියර් සේවාවන් | 4,056 | 4,052 | 4,259 | 2,088 | -0.1 | 5.1 | 6.0 |
| 37. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 131,481 | 133,984 | 139,406 | 70,536 | 1.9 | 4.0 | 3.5 |
| 38. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 2,513 | 2,623 | 2,824 | 1,317 | 4.4 | 7.7 | -0.7 |
| 39. විදුලි සංදේශ සේවාවන් | 30,986 | 34,125 | 36,967 | 20,062 | 10.1 | 8.3 | 7.9 |
| 40. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් | 10,579 | 12,144 | 13,011 | 6,659 | 14.8 | 7.1 | 3.3 |
| 41. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් | 420,223 | 492,642 | 553,826 | 317,008 | 17.2 | 12.4 | 15.8 |
| 42. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය | 74,978 | 81,960 | 88,962 | 34,215 | 9.3 | 8.5 | 6.5 |
| 43. නිවාස අයිතිය සහ දේපොළ වෙළඳාම | 444,049 | 489,217 | 509,993 | 258,110 | 10.2 | 4.2 | 2.7 |
| 44. වෘත්තීයමය සේවාවන් | 166,486 | 154,239 | 149,382 | 73,710 | -7.4 | -3.1 | -0.8 |
| 45. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය | 402,205 | 430,098 | 452,579 | 198,213 | 6.9 | 5.2 | -4.8 |
| 46. අධ්‍යාපනය | 173,751 | 159,758 | 171,707 | 85,375 | -8.1 | 7.5 | 4.3 |
| 47. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 147,962 | 159,901 | 162,243 | 82,632 | 8.1 | 1.5 | 12.4 |
| 48. වෙනත් පෞද්ගලික සේවාවන් | 839,633 | 869,640 | 881,221 | 438,923 | 3.6 | 1.3 | 2.0 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතුකළ අගය** | 7,476,908 | 7,818,224 | 8,145,671 | 4,102,566 | 4.6 | 4.2 | 4.0 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 758,521 | 815,667 | 866,355 | 270,781 | 7.5 | 6.2 | 3.0 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | 8,235,429 | 8,633,890 | 9,012,026 | 4,373,347 | 4.8 | 4.4 | 3.9 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### 3 වන සංඛ්‍යා සටහන

## පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය මත වියදම (අ)

රුපියල් මිලියන

| ශීර්ෂය | 2015 (ආ) (ඇ) | 2016 (ඇ) | 2017 ප්‍රථම භාගය (ඇ) | 2017 (ඈ) |
|---|---|---|---|---|
| 1. පෞද්ගලික පරිභෝජන වියදම | 7,677,131 | 8,003,789 | 4,257,982 | 8,667,529 |
| 2. රජයේ පරිභෝජන වියදම | 984,755 | 1,015,107 | 516,614 | 1,063,575 |
| 3. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,114,674 | 3,723,875 | 2,078,023 | 4,118,572 |
| 4. භාණ්ඩ හා සේවා අපනයන | 2,301,065 | 2,538,695 | 1,366,566 | 2,923,450 |
| 5. අඩුකළා ෘ භාණ්ඩ හා සේවා ආනයන | 3,125,931 | 3,442,490 | 1,877,044 | 3,902,589 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **10,951,695** | **11,838,975** | **6,342,141** | **12,870,538** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන

මූලයන් ෘ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4 වන සංඛ්‍යා සටහන**

## ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල ප්‍රවණතා

| අංශය | ඒකකය | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2017 | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ප්‍රථම භාගය (ආ) | වාර්ෂික (ඇ) |
| **1. තේ** | | | | | | | |
| 1.1 නිෂ්පාදනය (ඈ) | කි. ග්‍රෑ. මිලියන | 340.0 | 338.0 | 328.8 | 292.6 | 156.5 | 311.0 |
| 1.2 වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර් '000 | 222 | 203 | 203 | 203 | 201 | 201 |
| 1.3 නිෂ්පාදන පිරිවැය (ඉ) | කි. ග්‍රෑ./රුපියල් | 422.70 | 475.11 | 458.84 | 469.24 | - | ලැ.නො. |
| 1.4 සාමාන්‍ය මිල | | | | | | | |
| කොළඹ වෙන්දේසිය | කි. ග්‍රෑ./රුපියල් | 445.83 | 459.01 | 401.46 | 473.15 | 618.33 | 644.62 |
| අපනයන (නැ.වි.ස.) | කි. ග්‍රෑ./රුපියල් | 623.91 | 649.44 | 593.08 | 639.88 | 796.34 | 821.09 |
| **2. රබර්** | | | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි. ග්‍රෑ. මිලියන | 130.4 | 98.6 | 88.6 | 79.1 | 45.1 | 85.0 |
| 2.2 වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර් '000 | 134 | 134 | 137 | 136 | 136 | 136 |
| 2.3 සාමාන්‍ය ඵලදාව | හෙක්ටයාරයකට කි. ග්‍රෑ. | 1,247 | 889 | 819 | 851 | ලැ.නො. | 864 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | | | | | | | |
| වතු අංශය | කි. ග්‍රෑ./රුපියල් | 259.43 | 282.04 | 266.41 | 277.60 | - | ලැ.නො. |
| කුඩා වතු අංශය | කි. ග්‍රෑ./රුපියල් | 150.00 | 160.00 | 170.00 | 180.00 | - | 195.00 |
| 2.5 සාමාන්‍ය මිල | | | | | | | |
| කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්. 1) | කි. ග්‍රෑ./රුපියල් | 376.90 | 286.05 | 248.17 | 239.28 | 331.65 | 336.10 |
| අපනයන (නැ.වි.ස.) | කි. ග්‍රෑ./රුපියල් | 389.81 | 362.83 | 342.03 | 294.33 | 330.09 | 334.07 |
| **3. පොල්** | | | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,513 | 2,870 | 3,056 | 3,011 | 1,289 | 2,650 |
| 3.2 වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 392 | 441 | 455 | 447 | 449 | 452 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 13.58 | 13.67 | 16.39 | 16.70 | - | ලැ.නො. |
| 3.4 අපනයන මිලෙහි සාමාන්‍යය (නැ.වි.ස.) (ඊ) | ගෙඩියකට රුපියල් | 29.36 | 39.08 | 54.54 | 41.16 | 53.15 | 50.55 |
| **4. වී (උ)** | | | | | | | |
| 4.1 නිෂ්පාදනය | මෙ. ටො. '000 | 4,621 | 3,381 | 4,819 | 4,420 | 1,419 | 2,448 |
| මහ | මෙ. ටො. '000 | 2,846 | 2,236 | 2,877 | 2,903 | 1,419 | 1,419 |
| යල | මෙ. ටො. '000 | 1,774 | 1,145 | 1,942 | 1,517 | - | 1,029 |
| 4.2 බිම් ප්‍රමාණය | | | | | | | |
| වගා කළ | හෙක්ටයාර '000 | 1,227 | 964 | 1,254 | 1,114 | 531 | 801 |
| අස්වැන්න නෙළාගත් | හෙක්ටයාර '000 | 1,067 | 793 | 1,088 | 1,011 | 371 | 601 |
| 4.3 පොහොර භාවිතය (ඌ) | මෙ. ටො. '000 | 363 | 275 | 341 | 202 | - | - |
| 4.4 සාමාන්‍ය ඵලදාව | හෙක්ටයාරයකට කි. ග්‍රෑ. | 4,329 | 4,264 | 4,429 | 4,372 | 4,277 | 4,071 |

(නැ.වි.ස. = නැව තෙක් වියදම් සහිත)

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) අගෝස්තු අග දක්වා ලැබී ඇති දත්ත මත පදනම්ව පුරෝකථනය කර ඇත.

(ඈ) හරිත තේ ඇතුළුව

(ඉ) රාජ්‍ය අංශයේ වතුවල සහ පෞද්ගලික අංශයේ වතු සමාගම්වල බර තැබූ නිෂ්පාදන පිරිවැයෙහි සාමාන්‍යයට අමු තේ දලු නිෂ්පාදකයින්ගේ ලාභාන්තිකය ද ඇතුළත් වේ.

(ඊ) පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන තුන සඳහා පමණි.

(උ) වගා වර්ෂය මත පදනම්ව (මහ අස්වැන්න නෙළීම වසරේ පළමු භාගයට අයත් වේ).

(ඌ) එතෙක් පැවති පොහොර සහනාධාරය වෙනුවට 2016 යල කන්නයේ සිට සෘජු මූල්‍යමය ප්‍රදානයක් ලබාදෙන ලදී. ඒ අනුව 2016 යල කන්නය සඳහා රුපියල් මිලියන 6,468.6 ක් ලබා දී ඇති අතර, 2016 යටතේ දක්වා ඇති අගය 2015/16 මහ කන්නය සඳහා පමණක් අදාළ වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ජාතික පොහොර ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**5 වන සංඛ්‍යා සටහන**

## ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායයන්හි ආංශික විදේශීය සෘජු ආයෝජන (අ)

එ.ජ. ඩොලර් මිලියන

| අංශය | 2012 | 2013 | 2014 | 2015 | 2016 (ආ) | පළමු භාගය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2016 | 2017 (ආ) |
| **නිෂ්පාදන කර්මාන්ත** | | | | | | | |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 75.9 | 49.7 | 44.7 | 42.7 | 49.5 | 19.9 | 37.6 |
| රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත | 86.7 | 102.6 | 83.1 | 45.4 | 21.3 | 6.5 | 27.3 |
| දැව හා දැව නිෂ්පාදිත | 2.4 | 1.7 | 2.5 | 2.8 | 3.1 | 1.5 | 1.1 |
| කඩදාසි, කඩදාසි නිෂ්පාදිත, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනය | 4.0 | 2.1 | 36.3 | 2.2 | 3.1 | 0.2 | 4.0 |
| රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 59.2 | 114.4 | 91.9 | 75.4 | 99.5 | 51.9 | 74.3 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 17.7 | 45.2 | 29.7 | 13.7 | 31.2 | 4.2 | 6.1 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 38.8 | 17.0 | 7.0 | 46.1 | 11.9 | 3.7 | 3.1 |
| අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත | 22.9 | 27.1 | 38.7 | 28.7 | 28.2 | 7.8 | 31.9 |
| **කෘෂිකාර්මික** | 7.2 | 8.5 | 5.7 | 3.9 | 1.9 | ... | 0.6 |
| **සේවා** | | | | | | | |
| හෝටල් සහ ආපනශාලා | 117.3 | 67.9 | 68.4 | 181.9 | 141.3 | 95.9 | 97.1 |
| තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම | 25.9 | 19.3 | 24.7 | 13.6 | 23.0 | 8.5 | 20.8 |
| වෙනත් සේවා | 224.6 | 149.1 | 413.3 | 59.9 | 47.6 | 15.9 | 20.5 |
| **යටිතල පහසුකම්** | | | | | | | |
| නිවාස, දේපොළ සංවර්ධනය සහ කඩසාප්පු කාර්යාල | 55.7 | 217.6 | 339.2 | 212.1 | 79.5 | 16.0 | 199.0 |
| දුරකථන හා විදුලි සංදේශ ජාල | 242.1 | 359.8 | 152.5 | 138.8 | 243.6 | 97.0 | 76.2 |
| බලශක්ති උත්පාදනය, ඉන්ධන, ගෑස්, පෙට්‍රෝලියම් සහ වෙනත් | 96.5 | 44.9 | 12.5 | 51.3 | 14.8 | 1.7 | 0.7 |
| වරාය බහාලුම් පර්යන්ත | 202.2 | 164.5 | 178.2 | 51.2 | 1.6 | 1.4 | 0.7 |
| **එකතුව** | **1,279.2** | **1,391.4** | **1,528.4** | **969.7** | **801.0** | **332.2** | **601.3** |

(අ) ණය ලැබීම් ඇතුළත් වන අතර ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම් වෙත ලැබීම් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල සෘජු ආයෝජන ඇතුළත් නොවේ.

(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**6 වන සංඛ්‍යා සටහන**

## ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

| කාණ්ඩය | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2016 කාලසීමාව සඳහා (අ) | 2017 කාලසීමාව සඳහා (අ) |
|---|---|---|---|---|---|---|
| **1. විදුලිබලය** | | | | | **ජන. - ජූලි** | **ජන. - ජූලි** |
| ස්ථාපිත ධාරිතාව (මෙ.වො. - කාල පරිච්ඡේදය අවසානයට) | 3,362 | 3,932 | 3,847 | 4,018 | 3,975 | 4,134 |
| සමස්ත විදුලිබල උත්පාදනය (ගි.වො.පැය) | 11,898 | 12,357 | 13,090 | 14,149 | 8,141 | 8,374 |
| සමස්ත විදුලිබල උත්පාදනයට ජල විදුලිබලයේ දායකත්වය (%) (ආ) | 50 | 29 | 37 | 25 | 30 | 15 |
| **2. ප්‍රවාහන** | | | | | **ජන. - ජූනි** | **ජන. - ජූනි** |
| **2.1 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය** | | | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 344 | 371 | 440 | 452 | 223 | 219 |
| මගී කිලෝමීටර් (මිලියන) | 12,201 | 12,717 | 15,210 | 16,101 | 7,770 | 7,737 |
| ධාවනය වූ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 4,373 | 4,226 | 5,284 | 5,315 | 5,306 | 5,219 |
| මුළු ආදායම (රුපියල් මිලියන) | 30,189 | 33,665 | 35,825 | 40,928 | 20,334 | 20,514 |
| මෙහෙයුම් පිරිවැය (රුපියල් මිලියන) | 33,684 | 35,527 | 40,555 | 42,004 | 20,998 | 19,971 |
| මෙහෙයුම් ලාභය/(අලාභය) (රුපියල් මිලියන) | (3,496) | (1,862) | (4,730) | (1,076) | (664) | 542 |
| **2.2 ශ්‍රී ලංකා දුම්රිය සේවය** | | | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 10,924 | 11,075 | 11,797 | 11,921 | 5,896 | 5,941 (ඇ) |
| මගී කිලෝමීටර් (මිලියන) | 6,257 | 6,842 | 7,407 | 7,413 | 3,577 | 3,639 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 133 | 130 | 130 | 140 | 67 | 71 |
| මුළු ආදායම (රුපියල් මිලියන) | 5,423 | 5,909 | 6,335 | 6,623 | 3,173 | 3,193 |
| මෙහෙයුම් පිරිවැය (රුපියල් මිලියන) | 10,586 | 16,943 | 14,049 | 13,396 | 6,529 | 7,011 |
| මෙහෙයුම් ලාභය/(අලාභය) (රුපියල් මිලියන) | (5,163) | (11,034) | (7,714) | (6,773) | (3,356) | (3,818) |
| **2.3 රථවාහන නව ලියාපදිංචි කිරීම** | | | | | **ජන. - සැප්.** | **ජන. - සැප්.** |
| බස් රථ | 1,805 | 3,851 | 4,140 | 2,685 | 2,011 | 2,356 |
| මෝටර් රථ | 28,380 | 38,780 | 105,628 | 45,172 | 33,198 | 29,684 |
| ත්‍රිරෝද රථ | 83,673 | 79,038 | 129,547 | 56,945 | 40,314 | 17,519 |
| ද්විත්ව කාර්ය වාහන | 24,603 | 20,799 | 39,456 | 26,887 | 19,336 | 12,613 |
| යතුරු පැදි | 169,280 | 272,885 | 370,889 | 340,129 | 245,350 | 262,012 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 5,872 | 5,121 | 7,142 | 7,563 | 5,326 | 8,503 |
| ඉඩම් වාහන | 13,038 | 9,082 | 12,105 | 13,947 | 9,620 | 9,528 |
| මුළු වාහන සංඛ්‍යාව | 326,651 | 429,556 | 668,907 | 493,328 | 355,155 | 342,215 |
| **3. වරාය සේවා** | | | | | **ජන. - සැප්.** | **ජන. - සැප්.** |
| ශ්‍රී ලංකාවේ වරායන්ට පැමිණි නැව් සංඛ්‍යාව | 3,976 | 4,264 | 4,728 | 4,998 | 3,769 | 3,647 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය (මෙ. ටො. '000) | 66,243 | 74,410 | 77,579 | 86,519 | 64,502 | 69,337 |
| මුළු බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) | 4,306 | 4,908 | 5,185 | 5,735 | 4,255 | 4,545 |
| බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය (TEUs '000) | 3,274 | 3,781 | 3,967 | 4,435 | 3,304 | 3,523 |
| **4. විදුලි සංදේශ සේවා** | | | | | **ජූනි අවසානය** | **ජූනි අවසානය** |
| ස්ථාවර දුරකථන සංඛ්‍යාව | 2,706,787 | 2,709,848 | 2,601,196 | 2,550,432 | 2,597,297 | 2,514,154 |
| ජංගම දුරකථන සංඛ්‍යාව | 20,315,150 | 22,123,000 | 24,384,544 | 26,227,631 | 24,695,535 | 28,113,153 |
| අන්තර්ජාල සම්බන්ධතා | 2,009,456 | 3,396,295 | 4,090,920 | 4,920,554 | 4,232,291 | 5,479,328 |
| මුළු දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 කට ඇති දුරකථන සංඛ්‍යාව) | 112 | 120 | 129 | 136 | 129 | 143 |
| ජංගම දුරකථන ඝනත්වය (පුද්ගලයින් 100 කට ඇති දුරකථන සංඛ්‍යාව) | 99 | 107 | 116 | 124 | 116 | 131 |

(TEUs = අඩි 20 ට සමාන බහලු ඒකක)
(අ) තාවකාලික
(ආ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත් නොවේ.
(ඇ) ඇස්තමේන්තු

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**7 වන සංඛ්‍යා සටහන**

## පාරිභෝගික මිල දර්ශක - ජාතික පාරිභෝගික මිල දර්ශකය

2013 = 100

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | ලක්ෂ්‍යමය වෙනස (%) | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා. පා. මි. ද. | මූලික ජා. පා. මි. ද. | ජා. පා. මි. ද. | මූලික ජා. පා. මි. ද. | ජා. පා. මි. ද. | මූලික ජා. පා. මි. ද. |
| 2015 | දෙසැම්බර් | 113.2 | 112.9 | 4.2 | 5.8 | 3.8 | 4.6 |
| 2016 | ජනවාරි | 112.0 | 113.4 | -0.7 | 3.0 | 2.9 | 4.3 |
| | පෙබරවාරි | 110.8 | 113.9 | 1.7 | 4.6 | 2.6 | 4.4 |
| | මාර්තු | 110.0 | 114.3 | 2.2 | 5.0 | 2.4 | 4.5 |
| | අප්‍රේල් | 111.6 | 115.7 | 4.3 | 5.9 | 2.6 | 4.7 |
| | මැයි | 113.7 | 117.5 | 5.3 | 7.2 | 2.7 | 5.0 |
| | ජූනි | 116.1 | 118.2 | 6.4 | 7.5 | 3.1 | 5.3 |
| | ජූලි | 115.2 | 117.9 | 5.8 | 6.8 | 3.4 | 5.5 |
| | අගෝස්තු | 113.3 | 117.4 | 4.5 | 6.0 | 3.6 | 5.6 |
| | සැප්තැම්බර් | 113.5 | 117.7 | 4.7 | 5.7 | 3.8 | 5.7 |
| | ඔක්තෝබර් | 114.7 | 118.2 | 5.0 | 5.7 | 4.0 | 5.7 |
| | නොවැම්බර් | 116.6 | 120.4 | 4.1 | 6.8 | 4.0 | 5.8 |
| | දෙසැම්බර් | 118.0 | 120.5 | 4.2 | 6.7 | 4.0 | 5.9 |
| 2017 | ජනවාරි | 119.3 | 121.4 | 6.5 | 7.1 | 4.6 | 6.2 |
| | පෙබරවාරි | 119.9 | 122.0 | 8.2 | 7.1 | 5.1 | 6.4 |
| | මාර්තු | 119.5 | 122.3 | 8.6 | 7.0 | 5.6 | 6.6 |
| | අප්‍රේල් | 121.0 | 122.5 | 8.4 | 5.9 | 6.0 | 6.6 |
| | මැයි | 121.8 | 123.0 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |

ජා.පා.මි.ද. - ජාතික පාරිභෝගික මිල දර්ශකය
මූලික ජා.පා.මි.ද. - මූලික ජාතික පාරිභෝගික මිල දර්ශකය

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**8 වන සංඛ්‍යා සටහන**

## පාරිභෝගික මිල දර්ශක - කොළඹ පාරිභෝගික මිල දර්ශකය

2013 = 100

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | ලක්ෂ්‍යමය වෙනස (%) | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | කො. පා. මි. ද. | මූලික කො. පා. මි. ද. | කො. පා. මි. ද. | මූලික කො. පා. මි. ද. | කො. පා. මි. ද. | මූලික කො. පා. මි. ද. |
| 2015 | දෙසැම්බර් | 109.8 | 113.2 | 4.6 | 6.7 | 2.2 | 4.9 |
| 2016 | ජනවාරි | 110.0 | 113.4 | 1.7 | 3.6 | 2.1 | 4.9 |
| | පෙබරවාරි | 109.3 | 113.5 | 2.9 | 4.4 | 2.1 | 5.0 |
| | මාර්තු | 108.6 | 113.5 | 2.6 | 3.7 | 2.2 | 5.0 |
| | අප්‍රේල් | 109.5 | 114.1 | 3.4 | 3.5 | 2.4 | 4.9 |
| | මැයි | 111.5 | 116.5 | 4.8 | 5.6 | 2.7 | 5.0 |
| | ජූනි | 113.2 | 116.8 | 5.5 | 5.4 | 3.0 | 5.1 |
| | ජූලි | 113.9 | 116.8 | 5.8 | 5.0 | 3.4 | 5.1 |
| | අගෝස්තු | 112.1 | 116.0 | 4.4 | 3.8 | 3.7 | 4.9 |
| | සැප්තැම්බර් | 111.8 | 116.3 | 4.2 | 3.7 | 3.9 | 4.8 |
| | ඔක්තෝබර් | 112.1 | 116.6 | 4.1 | 3.8 | 4.0 | 4.6 |
| | නොවැම්බර් | 113.6 | 118.5 | 4.0 | 4.8 | 4.0 | 4.5 |
| | දෙසැම්බර් | 114.7 | 119.8 | 4.5 | 5.8 | 4.0 | 4.4 |
| 2017 | ජනවාරි | 116.1 | 121.3 | 5.5 | 7.0 | 4.3 | 4.7 |
| | පෙබරවාරි | 116.7 | 121.6 | 6.8 | 7.1 | 4.6 | 5.0 |
| | මාර්තු | 116.5 | 121.8 | 7.3 | 7.3 | 5.0 | 5.3 |
| | අප්‍රේල් | 117.1 | 121.9 | 6.9 | 6.8 | 5.3 | 5.5 |
| | මැයි | 118.2 | 122.5 | 6.0 | 5.2 | 5.4 | 5.5 |
| | ජූනි | 120.1 | 122.8 | 6.1 | 5.1 | 5.5 | 5.5 |
| | ජූලි | 119.4 | 122.5 | 4.8 | 4.9 | 5.4 | 5.4 |
| | අගෝස්තු | 118.8 | 123.0 | 6.0 | 6.0 | 5.5 | 5.6 |
| | සැප්තැම්බර් | 119.7 | 123.3 | 7.1 | 6.0 | 5.8 | 5.8 |

කො.පා.මි.ද. - කොළඹ පාරිභෝගික මිල දර්ශකය
මූලික කො.පා.මි.ද. - මූලික කොළඹ පාරිභෝගික මිල දර්ශකය

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**9 වන සංඛ්‍යා සටහන**

## වැටුප් ප්‍රමාණ දර්ශක

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | | ලක්ෂ්‍යමය වෙනස (%) | | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පඩි පාලක සභාවල සේවකයන් (අ) | රජයේ සේවකයන් (ආ) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් | පඩි පාලක සභාවල සේවකයන් | රජයේ සේවකයන් | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් | පඩි පාලක සභාවල සේවකයන් | රජයේ සේවකයන් | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් |
| 2014 | දෙසැම්බර් | 4,127.0 | 128.8 | 124.1 | 4.8 | 17.3 | 9.3 | 3.7 | 10.5 | 7.6 |
| 2015 | දෙසැම්බර් | 4,127.9 | 160.4 | 131.2 | 0.0 | 24.5 | 5.8 | 2.9 | 31.7 | 7.3 |
| 2016 | දෙසැම්බර් | 4,128.1 | 160.8 | 143.1 | 0.0 | 0.2 | 9.1 | 0.0 | 3.9 | 7.9 |
| 2017 (ඇ) | ජනවාරි | 4,128.3 | 160.8 | 143.5 | 0.0 | 0.2 | 8.9 | 0.0 | 2.2 | 8.1 |
| | පෙබරවාරි | 4,128.4 | 160.8 | 145.2 | 0.0 | 0.2 | 9.5 | 0.0 | 1.7 | 8.4 |
| | මාර්තු | 4,128.4 | 160.8 | 145.7 | 0.0 | -0.4 | 9.2 | 0.0 | 1.1 | 8.5 |
| | අප්‍රේල් | 4,128.4 | 160.8 | 146.5 | 0.0 | 0.0 | 9.5 | 0.0 | 0.6 | 8.8 |
| | මැයි | 4,128.5 | 160.8 | 147.0 | 0.0 | 0.0 | 8.9 | 0.0 | 0.1 | 9.0 |
| | ජූනි | 4,128.6 | 160.8 | 148.0 | 0.0 | 0.0 | 9.7 | 0.0 | 0.1 | 9.2 |
| | ජූලි | 4,128.7 | 160.8 | 148.2 | 0.0 | 0.0 | 9.3 | 0.0 | 0.1 | 9.3 |

(අ) 1978 දෙසැ. 31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව පදනම් කොටගත් බර තැබුම් මත දර්ශක අංක ගණනය කරනු ලැබේ. දර්ශක අංකය ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත්තේ පඩිපාලක සභා මගින් අනුමත කළ විවිධ කර්මාන්තවල අවම වැටුප්ය.

(ආ) මෙම දර්ශකය මගින් ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතීයික සහ ප්‍රාථමික මට්ටම් යන කාණ්ඩ කිරීම යටතේ සියලු මට්ටම්වල රජයේ සේවකයන් ආවරණය කෙරේ. පදනම් කාලපරිච්ඡේදයේ දී සේවා නියුක්ති ව්‍යුහය, 2012 වසරේ දී පැවැත්වූ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ විශේෂ වාර්ෂික සමීක්ෂණයක් මත පදනම් වේ.

(ඇ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**10 වන සංඛ්‍යා සටහන**

## ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය (අ) (ආ)

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 (ඇ) | |
|---|---|---|---|---|---|---|
| | | | | | ප්‍රථම භාගය | පුරෝකථන |
| කුටුම්භ ජනගහනය '000 (වයස අවුරුදු 15 හා ඊට වැඩි) | 14,959 | 15,134 | 15,282 | 15,449 | 15,749 | 15,616 |
| ශ්‍රම බලකාය '000 | 8,034 | 8,049 | 8,214 | 8,311 | 8,551 | 8,511 |
| සේවා නියුක්ත '000 | 7,681 | 7,700 | 7,831 | 7,948 | 8,184 | 8,145 |
| සේවා වියුක්ත '000 | 353 | 348 | 383 | 363 | 367 | 366 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 53.7 | 53.2 | 53.8 | 53.8 | 54.3 | 54.5 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 4.4 | 4.3 | 4.7 | 4.4 | 4.3 | 4.3 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ සිට ඉදිරියට නැවත බර තැබූ සහ සංශෝධිත ශ්‍රම බලකා දත්ත ශ්‍රේණියක් 2016 ජූලි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

(ආ) මුළු දිවයිනම ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.

(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## II වන සංඛ්‍යා සටහන
## විදේශ වෙළඳාමේ ප්‍රවණතා

එ.ජ.ඩොලර් මිලියන

| කාණ්ඩය | 2013 | 2014 | 2015 | 2016 | 2016 ජන.-අගෝ. | 2017 (අ) ජන.-අගෝ. | වර්ධනය % ජන.-අගෝ. |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,581.1** | **2,793.9** | **2,481.5** | **2,326.1** | **1,520.6** | **1,815.0** | **19.4** |
| තේ | 1,542.2 | 1,628.3 | 1,340.5 | 1,269.0 | 835.0 | 1,002.7 | 20.1 |
| රබර් | 71.3 | 45.3 | 26.1 | 32.7 | 20.9 | 28.7 | 37.4 |
| පොල් | 204.6 | 356.4 | 351.7 | 366.0 | 238.3 | 240.1 | 0.7 |
| පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත | 85.8 | 214.3 | 221.7 | 216.1 | 137.0 | 131.8 | -3.9 |
| වෙනත් | 118.9 | 142.1 | 130.0 | 149.9 | 101.3 | 108.3 | 7.0 |
| කුළුබඩු | 355.4 | 264.6 | 377.4 | 317.1 | 194.1 | 248.7 | 28.1 |
| එළවළු | 24.9 | 40.1 | 30.5 | 26.5 | 18.3 | 19.5 | 6.6 |
| සකස් නොකළ දුම්කොළ | 47.6 | 41.3 | 31.8 | 31.2 | 19.9 | 23.5 | 18.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 101.3 | 165.2 | 160.4 | 114.1 | 83.4 | 96.6 | 15.7 |
| මුහුදු ආහාර | 233.7 | 252.7 | 163.1 | 169.6 | 110.7 | 155.4 | 40.4 |
| **කාර්මික අපනයන** | **7,749.4** | **8,262.0** | **8,017.1** (ආ) | **7,940.1** (ආ) | **5,337.6** (ආ) | **5,562.3** | **4.2** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,508.3 | 4,929.9 | 4,820.2 | 4,884.1 | 3,333.7 | 3,283.4 | -1.5 |
| රබර් නිෂ්පාදිත | 887.8 | 889.8 | 761.2 | 767.9 | 508.4 | 538.1 | 5.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 427.7 | 338.0 | 373.9 | 286.9 | 185.4 | 252.7 | 36.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 445.5 | 393.6 | 331.7 | 273.9 | 187.3 | 166.7 | -11.0 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 235.2 | 289.3 | 306.8 (ආ) | 323.7 (ආ) | 222.4 (ආ) | 259.1 | 16.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 312.3 | 342.9 | 293.8 | 317.6 | 200.2 | 242.1 | 20.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 36.3 | 52.4 | 45.7 | 42.4 | 17.7 | 28.0 | 58.3 |
| ප්‍රවාහන උපකරණ | 146.3 | 151.8 | 243.7 | 131.5 | 80.9 | 138.1 | 70.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 76.8 | 138.9 | 135.7 | 165.6 | 115.7 | 107.0 | -7.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 40.4 | 41.3 | 35.2 | 34.4 | 22.8 | 22.1 | -3.0 |
| අනෙකුත් කාර්මික අපනයන | 632.7 | 694.1 | 669.4 | 712.2 | 463.1 | 525.0 | 13.4 |
| **ඛනිජ අපනයන** | **51.6** | **59.5** | **28.4** | **29.0** | **19.7** | **24.5** | **24.6** |
| **වර්ග නොකළ අපනයන** | **12.2** | **14.7** | **19.5** | **14.5** | **10.2** | **11.3** | **10.1** |
| **මුළු අපනයන** | **10,394.3** | **11,130.1** | **10,546.5** (ආ) | **10,309.7** (ආ) | **6,888.1** (ආ) | **7,413.1** | **7.6** |
| **ආනයන** | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,182.5** | **3,852.5** | **4,713.5** | **4,319.0** | **2,824.9** | **2,952.1** | **4.5** |
| ආහාර සහ පාන වර්ග | 1,368.1 | 1,633.7 | 1,627.8 | 1,627.4 | 1,039.1 | 1,204.5 | 15.9 |
| සහල් | 17.9 | 281.7 | 135.1 | 12.8 | 7.2 | 176.4 | 2,346.4 |
| සීනි | 288.9 | 255.5 | 252.5 | 342.5 | 194.5 | 187.5 | -3.6 |
| කිරි නිෂ්පාදිත | 291.0 | 339.4 | 250.9 | 249.3 | 157.1 | 202.9 | 29.2 |
| පරිප්පු | 104.1 | 121.2 | 148.0 | 139.4 | 86.8 | 81.8 | -5.7 |
| වෙනත් | 666.1 | 636.0 | 841.3 | 883.4 | 593.6 | 555.8 | -6.4 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,814.4 | 2,218.8 | 3,085.7 | 2,691.5 | 1,785.8 | 1,747.6 | -2.1 |
| රථ වාහන | 582.2 | 896.7 | 1,359.6 | 794.8 | 547.1 | 505.0 | -7.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 378.3 | 380.5 | 459.8 | 525.8 | 354.2 | 334.9 | -5.4 |
| ගෘහ උපකරණ | 192.2 | 156.4 | 221.0 | 270.7 | 175.6 | 168.2 | -4.2 |
| රෙදිපිළි හා උපාංග | 201.7 | 282.7 | 390.1 | 365.8 | 243.2 | 262.3 | 7.9 |
| වෙනත් | 460.0 | 502.5 | 655.0 | 734.4 | 465.7 | 477.2 | 2.5 |
| **අන්තර් භාණ්ඩ** | **10,553.7** | **11,397.7** | **9,638.2** | **9,870.0** | **6,309.0** | **7,271.7** | **15.3** |
| ඉන්ධන | 4,308.2 | 4,597.3 | 2,699.6 | 2,481.0 | 1,500.8 | 2,152.8 | 43.4 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,045.8 | 2,327.6 | 2,296.2 | 2,704.9 | 1,764.7 | 1,781.3 | 0.9 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 482.9 | 175.4 | 161.5 | 514.4 | 299.3 | 474.6 | 58.6 |
| රසායනික නිෂ්පාදිත | 734.3 | 808.2 | 870.3 | 856.3 | 568.1 | 549.9 | -3.2 |
| තිරිඟු හා ඉරිඟු | 323.2 | 404.7 | 357.2 | 249.2 | 164.5 | 225.2 | 36.9 |
| පොහොර | 238.7 | 272.4 | 289.6 | 136.9 | 99.2 | 64.0 | -35.4 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,420.8 | 2,812.0 | 2,963.7 | 2,927.3 | 1,912.4 | 2,023.9 | 5.8 |
| **ආයෝජන භාණ්ඩ** | **4,252.7** | **4,152.2** | **4,567.0** | **5,198.0** | **3,259.6** | **3,237.7** | **-0.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,221.9 | 2,131.0 | 2,278.1 | 2,740.7 | 1,815.4 | 1,738.3 | -4.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,357.2 | 1,308.9 | 1,352.0 | 1,568.7 | 1,025.7 | 1,054.8 | 2.8 |
| ප්‍රවාහන උපකරණ | 667.8 | 707.3 | 930.9 | 880.2 | 414.3 | 438.6 | 5.9 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 5.8 | 4.9 | 5.9 | 8.5 | 4.1 | 6.0 | 45.8 |
| **වර්ග නොකළ ආනයන** | **13.9** | **14.4** | **15.9** | **13.1** | **9.4** | **137.5** | **1,358.3** |
| **මුළු ආනයන** | **18,002.8** | **19,416.8** | **18,934.6** | **19,400.1** | **12,402.9** | **13,599.1** | **9.6** |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ලංකා අයි.ඕ.සී. සමාගම
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**12 වන සංඛ්‍යා සටහන**

## ගෙවුම් තුලනය (අ)

එ.ජ.ඩොලර් මිලියන

| අයිතමය | 2015 | 2016 (ආ) | ප්‍රථම භාගය | |
|---|---|---|---|---|
| | | | 2016 (ඇ) | 2017 (ආ) |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-1,883** | **-1,942** | **-644** | **-1,480** |
| **වෙළඳ ශේෂය** | **-8,388** | **-9,090** | **-4,191** | **-4,753** |
| අපනයන | 10,546 | 10,310 | 5,130 | 5,398 |
| ආනයන | 18,935 | 19,400 | 9,321 | 10,151 |
| **සේවා (ශුද්ධ)** | **2,325** | **2,879** | **1,314** | **1,407** |
| ලැබීම් | 6,397 | 7,138 | 3,493 | 3,646 |
| ගෙවීම් | 4,072 | 4,259 | 2,179 | 2,239 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,013** | **-2,184** | **-971** | **-1,038** |
| ලැබීම් | 127 | 120 | 59 | 73 |
| ගෙවීම් | 2,140 | 2,304 | 1,030 | 1,111 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,193** | **6,453** | **3,204** | **2,904** |
| ද්විතීයික ආදායම් : බැර | 7,007 | 7,260 | 3,619 | 3,362 |
| ද්විතීයික ආදායම් : හර | 814 | 807 | 414 | 458 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **46** | **26** | **1** | **8** |
| ප්‍රාග්ධන ගිණුම : බැර | 71 | 46 | 21 | 23 |
| ප්‍රාග්ධන ගිණුම : හර | 24 | 21 | 21 | 15 |
| **ජංගම හා ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,836** | **-1,917** | **-643** | **-1,473** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ) (ඈ)** | **-2,312** | **-2,117** | **-1,234** | **-1,295** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **53** | **237** | **118** | **37** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **680** | **898** | **173** | **509** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **0.02** | **-0.01** | **-0.01** | **-** |
| ණය සුරැකුම්පත් | 0.02 | -0.01 | -0.01 | - |
| **විවිධ ආයෝජන : වගකීම්** | **686** | **993** | **-623** | **1,036** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | -60 | 24 | -45 | 201 |
| ණය සුරැකුම්පත් | 747 | 969 | -578 | 835 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **503** | **317** | **-62** | **-250** |
| මුදල් සහ තැන්පතු | 143 | 5 | -134 | -87 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 116 | -67 | -56 | 38 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 244 | 379 | 128 | -201 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **1,857** | **308** | **-259** | **808** |
| මුදල් සහ තැන්පතු | 1,457 | -609 | -981 | -607 |
| ණය | 759 | 753 | 740 | 1,314 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -401 | 109 | 15 | 151 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 41 | 55 | -34 | -50 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **354** | **-472** | **-2,000** | **1,270** |
| **ශුද්ධ වැරදීම් සහ අත්හැරීම්** | **-476** | **-201** | **-591** | **177** |
| **සමස්ත ශේෂය** | **-1,489** | **-500** | **-1,186** | **1,563** |

(අ) මෙම ඉදිරිපත් කිරීම ජා.මූ. අරමුදලේ 'ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය' අත්පොතෙහි නවතම (හයවන) සංස්කරණය (BPM6) ට අනුකූල වන අතර, BPM6 ඉදිරිපත් කිරීමේ සාරාංශයක් මෙහි වේ.

(ආ) තාවකාලික

(ඇ) සංශෝධිත

(ඈ) වත්කම් - වගකීම්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**13 වන සංඛ්‍යා සටහන**

## අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ.ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| අයිතමය | 2016 (අ) | | 2017 ජුනි (අ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ආ)** | **1,136** | **9,745** | **1,173** | **10,249** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,131 | 6,943 | 1,166 | 7,221 |
| ණය සුරැකුම්පත් | 5 | 2,802 | 7 | 3,027 |
| **විවිධ ආයෝජන** | **0.1** | **13,772** | **0.1** | **15,019** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 1,507 | | 1,726 |
| ණය සුරැකුම්පත් (ඇ) | 0.1 | 12,265 | 0.1 | 13,293 |
| තැන්පතු භාරගන්නා ආයතන | 0.1 | 2,190 | 0.1 | 1,691 |
| රජය | | 9,903 | | 11,424 |
| අනෙකුත් අංශ | | 172 | | 178 |
| **අනෙකුත් ආයෝජන** | **2,931** | **31,519** | **2,681** | **32,827** |
| **මුදල් සහ තැන්පතු** | **706** | **2,442** | **619** | **1,835** |
| මහ බැංකුව | - | 403 | - | 2 |
| තැන්පතු භාරගන්නා ආයතන | 706 | 2,039 | 619 | 1,832 |
| **ණය** | **-** | **26,530** | **-** | **28,324** |
| මහ බැංකුව | - | 554 | - | 382 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 4,562 | - | 5,464 |
| රජය | - | 17,295 | - | 18,274 |
| අනෙකුත් අංශ (ඈ) | - | 4,119 | - | 4,205 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **610** | **1,483** | **648** | **1,634** |
| තැන්පතු භාරගන්නා ආයතන | 93 | - | 101 | - |
| අනෙකුත් අංශ (ඉ) | 517 | 1,483 | 547 | 1,634 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **1,615** | **533** | **1,414** | **483** |
| මහ බැංකුව (ඊ) | - | 533 | - | 483 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,615 | - | 1,414 | - |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **532** | | **550** |
| **සංචිත වත්කම්** | **6,019** | | **6,959** | |
| මූල්‍ය රත්‍රන් | 830 | | 890 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 2 | | 0.3 | |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 64 | | 67 | |
| අනෙකුත් සංචිත වත්කම් | 5,122 | | 6,002 | |
| මුදල් සහ තැන්පතු | 2,644 | | 3,847 | |
| ණය සුරැකුම්පත් | 2,478 | | 2,155 | |
| **මුළු වත්කම්/වගකීම්** | **10,086** | **55,036** | **10,813** | **58,094** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-44,949** | | **-47,281** |
| **පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | | | |
| කෙටිකාලීන | 6,299 | 8,853 | 7,180 | 9,264 |
| දිගුකාලීන | 3,788 | 46,182 | 3,633 | 48,831 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් වෙළඳපොළ සහ අනෙකුත් පෞද්ගලික සමාගම් වෙත ලැබුණු සෘජු ආයෝජනවල තත්ත්වය ඇතුළත් වේ.
(ඇ) විදේශීය මුදල් ණය සුරැකුම්පත් නිකුතු වෙළඳපොළ අගය මත පදනම් වන අතර දේශීය මුදල් ණය සුරැකුම්පත් නිකුතු පොත් අගය මත පදනම් වේ.
(ඈ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික සමාගම් ලබාගත් ණය මුදල්වල නොපියවා ඇති ණය මට්ටම ඇතුළත් වේ.
(ඉ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(ඊ) මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ නොපියවූ වගකීම් ප්‍රමාණය ඇතුළත් වේ.

**14 වන සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ.ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| අයිතමය | 2015 | 2016 (අ) | 2017 ජූනි (අ) |
|---|---|---|---|
| **රජය** | **24,681** | **27,197** | **29,697** |
| **කෙටිකාලීන** | **33** | **80** | **71** |
| ණය සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්) (ආ) | 33 | 80 | 71 |
| **දිගුකාලීන** | **24,647** | **27,118** | **29,626** |
| ණය සුරැකුම්පත් | 8,501 | 9,823 | 11,352 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ආ) | 1,811 | 1,440 | 1,087 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඇ) | 265 | 58 | 31 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඇ) | 6,425 | 8,325 | 10,235 |
| ණය | 16,147 | 17,295 | 18,274 |
| **මහ බැංකුව** | **2,823** | **2,022** | **1,417** |
| **කෙටිකාලීන** | **483** | **536** | **485** |
| මුදල් සහ තැන්පතු | 5 | 3 | 2 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්) | 478 | 533 | 483 |
| **දිගුකාලීන** | **2,340** | **1,486** | **932** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 548 | 532 | 550 |
| මුදල් සහ තැන්පතු | 1,100 | 400 | - |
| ණය (ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකම සහ විස්තීර්ණ ණය පහසුකම) | 692 | 554 | 382 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **9,156** | **8,790** | **8,987** |
| **කෙටිකාලීන** | **5,762** | **5,247** | **5,347** |
| මුදල් සහ තැන්පතු (ඉ) | 1,946 | 2,039 | 1,832 |
| ණය | 3,816 | 3,209 | 3,514 |
| **දිගුකාලීන** | **3,393** | **3,543** | **3,640** |
| ණය සුරැකුම්පත් (ඈ) | 2,140 | 2,190 | 1,691 |
| ණය | 1,253 | 1,354 | 1,950 |
| **අනෙකුත් අංශ (ඊ)** | **5,567** | **5,774** | **6,018** |
| **කෙටිකාලීන** | **1,375** | **1,483** | **1,634** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (උ) | 1,375 | 1,483 | 1,634 |
| **දිගුකාලීන** | **4,192** | **4,291** | **4,383** |
| ණය සුරැකුම්පත් (ඈ) | 164 | 172 | 178 |
| ණය | 4,028 | 4,119 | 4,205 |
| පෞද්ගලික අංශය | 1,604 | 1,876 | 2,052 |
| වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය ආයතන | 2,423 | 2,242 | 2,153 |
| **සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඌ)** | **2,613** | **2,802** | **3,027** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **44,839** | **46,586** | **49,147** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්** | | | |
| දළ විදේශීය ණය | 55.7 | 57.3 | 60.2 |
| කෙටිකාලීන ණය | 9.5 | 9.0 | 9.2 |
| දිගුකාලීන ණය | 46.2 | 48.3 | 51.0 |

(අ) තාවකාලික

(ආ) පොත් අගය මත පදනම්ව ඇත.

(ඇ) මුහුණත වටිනාකම මත පදනම්ව ඇත.

(ඈ) වෙළඳපොළ මිල මත පදනම්ව ඇත.

(ඉ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.

(ඊ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.

(උ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික අංශයේ සමාගම්වල නොපියවා ඇති වෙළඳ ණය ඇතුළත් වේ.

(ඌ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**15 වන සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් (විදේශීය මුදල් ඒකකයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින්)**

| කාලපරිච්ඡේදය | | කාලපරිච්ඡේදය අවසානයේ පැවති අනුපාතික | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොලරය | බ්‍රිතාන්‍ය පවුම | යුරෝ | ජපන් යෙන් | ඉන්දියානු රුපියල | වි.ගැ.හි. (අ) |
| | 2012 | 127.1608 | 205.4728 | 168.1257 | 1.4799 | 2.3262 | 195.3110 |
| | 2013 | 130.7530 | 215.5790 | 180.4522 | 1.2459 | 2.1116 | 201.3550 |
| | 2014 | 131.0486 | 204.0427 | 159.4206 | 1.0979 | 2.0675 | 189.8640 |
| | 2015 | 144.0623 | 213.5724 | 157.3737 | 1.1960 | 2.1677 | 199.6310 |
| | 2016 | 149.8000 | 184.0443 | 157.8742 | 1.2867 | 2.2056 | 201.3810 |
| 2016 | ජනවාරි | 143.9208 | 206.5911 | 157.3630 | 1.2135 | 2.1132 | 198.6820 |
| | පෙබරවාරි | 144.3450 | 200.0313 | 157.8655 | 1.2735 | 2.0986 | 199.3980 |
| | මාර්තු | 143.9000 | 206.5685 | 162.9452 | 1.2810 | 2.1680 | 202.7290 |
| | අප්‍රේල් | 143.9000 | 210.6984 | 163.8014 | 1.3407 | 2.1653 | 203.9540 |
| | මැයි | 145.7500 | 214.0922 | 162.4675 | 1.3121 | 2.1694 | 204.4700 |
| | ජූනි | 145.2500 | 194.8747 | 161.4381 | 1.4142 | 2.1518 | 203.1820 |
| | ජූලි | 145.7466 | 192.2398 | 161.5310 | 1.4009 | 2.1731 | 203.0800 |
| | අගෝස්තු | 145.6200 | 190.7768 | 162.3954 | 1.4143 | 2.1702 | 203.0440 |
| | සැප්තැම්බර් | 146.7229 | 190.1676 | 164.5644 | 1.4536 | 2.1950 | 204.7980 |
| | ඔක්තෝබර් | 147.1136 | 179.1991 | 161.2733 | 1.4027 | 2.2026 | 202.1120 |
| | නොවැම්බර් | 147.9500 | 184.6342 | 157.5520 | 1.3176 | 2.1559 | 200.2890 |
| | දෙසැම්බර් | 149.8000 | 184.0443 | 157.8742 | 1.2867 | 2.2056 | 201.3810 |
| 2017 | ජනවාරි | 150.2429 | 187.9614 | 160.7299 | 1.3231 | 2.2158 | 204.1550 |
| | පෙබරවාරි | 151.2500 | 188.0264 | 160.0906 | 1.3435 | 2.2676 | 204.7760 |
| | මාර්තු | 151.7354 | 189.5327 | 162.0306 | 1.3538 | 2.3394 | 205.8820 |
| | අප්‍රේල් | 151.9000 | 196.0953 | 165.1305 | 1.3665 | 2.3692 | 208.2590 |
| | මැයි | 152.5000 | 195.5508 | 170.4264 | 1.3729 | 2.3598 | 211.1090 |
| | ජූනි | 153.5100 | 199.9314 | 175.6154 | 1.3728 | 2.3741 | 213.5920 |
| | ජූලි | 153.7278 | 201.9061 | 180.4764 | 1.3918 | 2.3977 | 216.4100 |
| | අගෝස්තු | 152.8350 | 197.3788 | 181.5145 | 1.3833 | 2.3884 | 216.0150 |
| | සැප්තැම්බර් | 153.0983 | 205.3890 | 180.3651 | 1.3594 | 2.3384 | 216.3730 |

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 16 වන සංඛ්‍යා සටහන
## රාජ්‍ය මූල්‍ය කටයුතු

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2016 ජන.-අගෝ. (අ) | 2017 ජන.-අගෝ. (අ) | 2017 ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| රුපියල් මිලියන | | | | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,153,306** | **1,204,621** | **1,460,892** | **1,693,558** | **1,014,088** | **1,174,639** | **2,020,300** |
| මුළු ආදායම | 1,137,447 | 1,195,206 | 1,454,878 | 1,686,062 | 1,013,395 | 1,172,374 | 2,010,300 |
| බදු ආදායම | 1,005,895 | 1,050,362 | 1,355,779 | 1,463,689 | 931,980 | 1,094,948 | 1,827,000 |
| බදු නොවන ආදායම | 131,552 | 144,844 | 99,099 | 222,374 | 81,415 | 77,426 | 183,300 |
| ප්‍රදාන | 15,859 | 9,415 | 6,014 | 7,496 | 693 | 2,265 | 10,000 |
| **වියදම් සහ ශුද්ධ ණයදීම්** | **1,669,396** | **1,795,865** | **2,290,394** | **2,333,883** | **1,499,138** | **1,694,859** | **2,645,300** |
| පුනරාවර්තන | 1,205,180 | 1,322,898 | 1,701,658 | 1,757,782 | 1,159,488 | 1,294,354 | 1,946,000 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් | 464,216 | 472,967 | 588,737 | 576,101 | 339,650 | 400,505 | 699,300 |
| එයින්, රාජ්‍ය ආයෝජන | 481,203 | 486,610 | 602,767 | 594,013 | 348,795 | 404,859 | 708,300 |
| **වර්තන ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-67,733** | **-127,692** | **-246,779** | **-71,719** | **-146,093** | **-121,980** | **64,300** |
| **ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-72,083** | **-154,849** | **-319,827** | **-29,430** | **-70,465** | **-1,590** | **55,087** |
| **සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය (-)** | **-516,090** | **-591,244** | **-829,502** | **-640,325** | **-485,050** | **-520,220** | **-625,000** |
| **මූල්‍යනය** | **516,090** | **591,244** | **829,502** | **640,325** | **485,050** | **520,220** | **625,000** |
| විදේශීය මූල්‍යනය | 123,700 | 212,523 | 236,803 | 391,914 | 175,560 | 246,731 | 332,000 |
| ණය දීම් | 67,905 | 14,562 | 131,253 | 109,293 | 37,633 | 15,112 | 52,000 |
| වාණිජ ණය | - | 197,171 | 232,751 | 319,689 | 136,828 | 224,604 | 220,000 |
| අනේවාසික භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර ආයෝජන | 55,795 | 790 | -127,201 | -37,069 | 1,099 | 7,015 | 60,000 |
| දේශීය මූල්‍යනය | 392,390 | 378,721 | 592,699 | 248,411 | 309,490 | 273,489 | 293,000 |
| වෙළඳපොළ ණය ගැනීම් | 379,390 | 392,084 | 592,699 | 248,411 | 309,490 | 273,489 | 293,000 |
| බැංකු නොවන | 82,414 | 265,155 | 300,858 | 108,456 | 171,384 | 37,034 | 261,000 |
| බැංකු | 296,977 | 126,929 | 291,841 | 139,955 | 138,106 | 236,456 | 32,000 |
| අනෙකුත් ණය ගැනීම් | 13,000 | -13,363 | - | - | - | - | - |
| දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස | | | | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **12.0** | **11.6** | **13.3** | **14.3** | **8.2** | **9.0** | **15.0** |
| මුළු ආදායම | 11.9 | 11.5 | 13.3 | 14.2 | 8.2 | 9.0 | 14.9 |
| බදු ආදායම | 10.5 | 10.1 | 12.4 | 12.4 | 7.6 | 8.4 | 13.5 |
| බදු නොවන ආදායම | 1.4 | 1.4 | 0.9 | 1.9 | 0.7 | 0.6 | 1.4 |
| ප්‍රදාන | 0.2 | 0.1 | 0.1 | 0.1 | ... | ... | 0.1 |
| **වියදම් සහ ශුද්ධ ණයදීම්** | **17.4** | **17.3** | **20.9** | **19.7** | **12.2** | **13.0** | **19.6** |
| පුනරාවර්තන | 12.6 | 12.8 | 15.5 | 14.8 | 9.4 | 10.0 | 14.4 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණයදීම් | 4.8 | 4.6 | 5.4 | 4.9 | 2.8 | 3.1 | 5.2 |
| එයින්, රාජ්‍ය ආයෝජන | 5.0 | 4.7 | 5.5 | 5.0 | 2.8 | 3.1 | 5.2 |
| **වර්තන ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-0.7** | **-1.2** | **-2.3** | **-0.6** | **-1.2** | **-0.9** | **0.5** |
| **ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-0.8** | **-1.5** | **-2.9** | **-0.2** | **-0.6** | **...** | **0.4** |
| **සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය (-)** | **-5.4** | **-5.7** | **-7.6** | **-5.4** | **-3.9** | **-4.0** | **-4.6** |
| **මූල්‍යනය** | **5.4** | **5.7** | **7.6** | **5.4** | **3.9** | **4.0** | **4.6** |
| විදේශීය මූල්‍යනය | 1.3 | 2.1 | 2.2 | 3.3 | 1.4 | 1.9 | 2.5 |
| ණය දීම් | 0.7 | 0.1 | 1.2 | 0.9 | 0.3 | 0.1 | 0.4 |
| වාණිජ ණය | - | 1.9 | 2.1 | 2.7 | 1.1 | 1.7 | 1.6 |
| අනේවාසික භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර ආයෝජන | 0.6 | ... | -1.2 | -0.3 | ... | 0.1 | 0.4 |
| දේශීය මූල්‍යනය | 4.1 | 3.7 | 5.4 | 2.1 | 2.5 | 2.1 | 2.2 |
| වෙළඳපොළ ණය ගැනීම් | 4.0 | 3.8 | 5.4 | 2.1 | 2.5 | 2.1 | 2.2 |
| බැංකු නොවන | 0.9 | 2.6 | 2.7 | 0.9 | 1.4 | 0.3 | 1.9 |
| බැංකු | 3.1 | 1.2 | 2.7 | 1.2 | 1.1 | 1.8 | 0.2 |
| අනෙකුත් ණය ගැනීම් | 0.1 | -0.1 | - | - | - | - | - |

(අ) තාවකාලික

මූලය : මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

## 17 වන සංඛ්‍යා සටහන
## මුදල් සමස්තවල ප්‍රවණතා සහ තුඩු දුන් සාධක

රුපියල් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී)

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 අගෝස්තු (අ) |
|---|---|---|---|---|---|
| 1. **සංචිත මුදල්** | **488,586** | **577,912** | **673,432** | **856,147** | **911,389** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 0.9 | 18.3 | 16.5 | 27.1 | 16.0 |
| මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් | 529,128 | 688,007 | 576,187 | 558,589 | 745,768 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | -40,543 | -110,095 | 97,245 | 297,557 | 165,621 |
| 2. **පටු මුදල් සැපයුම ($M_1$)** | **484,578** | **612,155** | **714,988** | **776,624** | **759,137** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 7.7 | 26.3 | 16.8 | 8.6 | 6.3 |
| 3. **පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)** | **3,417,853** | **3,875,853** | **4,565,917** | **5,405,596** | **6,050,583** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 16.7 | 13.4 | 17.8 | 18.4 | 21.3 |
| 3.1 ශුද්ධ විදේශ වත්කම් | -76,325 | 15,126 | -298,163 | -231,238 | -50,097 |
| මුදල් අධිකාරීන් | 529,128 | 688,007 | 576,187 | 558,589 | 745,768 |
| වාණිජ බැංකු | -605,453 | -672,881 | -874,350 | -789,827 | -795,865 |
| 3.2 ශුද්ධ දේශීය වත්කම් | 3,494,178 | 3,860,727 | 4,864,081 | 5,636,834 | 6,100,680 |
| දේශීය ණය | 4,200,783 | 4,640,146 | 5,732,034 | 6,671,677 | 7,349,510 |
| රජයට දෙන ලද ශුද්ධ ණය | 1,301,342 | 1,435,900 | 1,759,492 | 1,972,133 | 2,237,515 |
| මහ බැංකුව | 114,007 | 149,672 | 229,926 | 413,016 | 293,545 |
| වාණිජ බැංකු | 1,187,335 | 1,286,228 | 1,529,566 | 1,559,116 | 1,943,970 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 365,098 | 446,047 | 522,966 | 495,114 | 502,943 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 24.8 | 22.2 | 17.2 | -5.3 | 13.9 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 2,534,343 | 2,758,199 | 3,449,577 | 4,204,430 | 4,609,052 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 7.5 | 8.8 | 25.1 | 21.9 | 18.0 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -706,605 | -779,418 | -867,954 | -1,034,843 | -1,248,830 |
| විශේෂ සටහන්: | | | | | |
| මුදල් ගුණකය ($M_{2b}$) | 7.00 | 6.71 | 6.78 | 6.31 | 6.64 |
| සංසරණ ප්‍රවේගය ($M_{2b}$ සාමාන්‍යය) (ආ) | 2.99 | 2.85 (ඇ) | 2.62 (ඇ) | 2.40 (ඇ) | ලැ.නො. |

(අ) තාවකාලික
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඇ) සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**18 වන සංඛ්‍යා සටහන**

## වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් (අ) (ආ) (ඇ)

| කාණ්ඩය | 2016 ජූනි අවසානයට (ඈ) | | 2017 ජූනි අවසානයට (ඉ) | | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රුපියල් මිලියන) | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය (රුපියල් මිලියන) | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1. **කෘෂිකාර්මික සහ ධීවර** | **316,993** | **8.3** | **382,033** | **8.4** | **20.5** |
| එයින්, | | | | | |
| තේ | 78,051 | 2.0 | 84,610 | 1.9 | 8.4 |
| රබර් | 20,411 | 0.5 | 25,265 | 0.6 | 23.8 |
| පොල් | 12,541 | 0.3 | 19,567 | 0.4 | 56.0 |
| වී | 23,456 | 0.6 | 32,323 | 0.7 | 37.8 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර භෝග | 22,000 | 0.6 | 27,200 | 0.6 | 23.6 |
| පශු සම්පත් සහ කිරි ගව පාලනය | 13,061 | 0.3 | 17,644 | 0.4 | 35.1 |
| ධීවර | 12,254 | 0.3 | 16,767 | 0.4 | 36.8 |
| 2. **කර්මාන්ත** | **1,539,581** | **40.2** | **1,863,992** | **41.0** | **21.1** |
| එයින්, | | | | | |
| ඉදිකිරීම් | 740,963 | 19.3 | 902,762 | 19.8 | 21.8 |
| එයින්, | | | | | |
| පෞද්ගලික නිවාස ඉදිකිරීම් ඇතුළු නිවාස මිලදී ගැනීම් සහ අලුත්වැඩියා කිරීම | 354,255 | 9.2 | 435,454 | 9.6 | 22.9 |
| කාර්ය මණ්ඩල නිවාස | 66,261 | 1.7 | 70,991 | 1.6 | 7.1 |
| ආහාර සහ පාන වර්ග | 86,472 | 2.3 | 103,627 | 2.3 | 19.8 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 144,718 | 3.8 | 156,759 | 3.4 | 8.3 |
| දැව, ගෘහ භාණ්ඩ සහ දැව ආශ්‍රිත නිෂ්පාදිත | 14,692 | 0.4 | 15,651 | 0.3 | 6.5 |
| කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 11,758 | 0.3 | 14,493 | 0.3 | 23.3 |
| රසායනික, ඛනිජතෙල්, ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 77,939 | 2.0 | 82,758 | 1.8 | 6.2 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 14,961 | 0.4 | 17,944 | 0.4 | 19.9 |
| මූලික ලෝහ නිෂ්පාදිත | 20,702 | 0.5 | 28,182 | 0.6 | 36.1 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 126,529 | 3.3 | 158,490 | 3.5 | 25.3 |
| අනෙකුත් නිෂ්පාදිත | 16,179 | 0.4 | 20,477 | 0.5 | 26.6 |
| 3. **සේවා** | **1,149,743** | **30.0** | **1,331,024** | **29.3** | **15.8** |
| එයින්, | | | | | |
| තොග සහ සිල්ලර වෙළඳාම | 353,623 | 9.2 | 399,951 | 8.8 | 13.1 |
| සංචාරක ව්‍යාපාරය | 118,778 | 3.1 | 160,429 | 3.5 | 35.1 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 282,150 | 7.4 | 306,580 | 6.7 | 8.7 |
| ප්‍රවාහන | 56,731 | 1.5 | 72,458 | 1.6 | 27.7 |
| සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය | 56,808 | 1.5 | 61,177 | 1.3 | 7.7 |
| මුද්‍රණය සහ ප්‍රකාශනය | 16,841 | 0.4 | 21,677 | 0.5 | 28.7 |
| අධ්‍යාපනය | 8,881 | 0.2 | 10,321 | 0.2 | 16.2 |
| සෞඛ්‍යය | 29,034 | 0.8 | 31,916 | 0.7 | 9.9 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 26,065 | 0.7 | 22,708 | 0.5 | -12.9 |
| 4. **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඊ)** | **824,209** | **21.5** | **972,084** | **21.4** | **17.9** |
| එයින්, | | | | | |
| කල් පවතින පාරිභෝගික භාණ්ඩ | 171,955 | 4.5 | 207,018 | 4.6 | 20.4 |
| උකස් කිරීම් | 122,309 | 3.2 | 137,517 | 3.0 | 12.4 |
| ණය කාඩ්පත් | 66,912 | 1.7 | 82,003 | 1.8 | 22.6 |
| පෞද්ගලික අධ්‍යාපන කටයුතු | 2,078 | 0.1 | 2,415 | 0.1 | 16.3 |
| පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂණ | 2,728 | 0.1 | 3,848 | 0.1 | 41.1 |
| වෙනත් | 416,501 | 10.9 | 502,607 | 11.0 | 20.7 |
| 5. **එකතුව** | **3,830,526** | **100.0** | **4,549,133** | **100.0** | **18.8** |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වී ඇති අතර මෙයට වාණිජ බැංකුවල, දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ණය සහ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ණය, අයිරා සහ වට්ටම් කළ සහ මිලට ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.

(ඇ) ගණනය කිරීමේ ක්‍රමවේදවල වෙනස්කම් හේතුවෙන් මෙම සංඛ්‍යා සටහනේ ඇති දත්ත සංඛ්‍යා සටහන 17හි දැක්වෙන පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණය යටතේ වන දත්තවලින් වෙනස් වේ.

(ඈ) සංශෝධිත

(ඉ) තාවකාලික

(ඊ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත් වන පෞද්ගලික නිවාස ණය මෙම කාණ්ඩයෙන් ඉවත් කර ඇති අතර, සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත ණය මෙම කාණ්ඩයේ ඇතුළත් වේ.

**19 වන සංඛ්‍යා සටහන**

## තෝරාගත් පොලී අනුපාතික

වාර්ෂිකව සියයට

| කාලපරිච්ඡේදයේ අවසානයට | 2013 | 2014 | 2015 | 2016 | 2017 සැප්තැම්බර් |
|---|---|---|---|---|---|
| 1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (අ) | 6.50 | 6.50 | 6.00 | 7.00 | 7.25 |
| 2. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (අ) | 8.50 | 8.00 | 7.50 | 8.50 | 8.75 |
| 3. බැංකු අනුපාතිකය (ආ) | 15.00 | 15.00 | 15.00 | 15.00 | 15.00 |
| 4. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය - සතිපතා | 10.13 | 6.26 | 7.53 | 11.52 | 11.55 |
| 5. බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 9.37 | 6.20 | 6.20 | 8.17 | 9.25 |
| 6. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | 7.66 | 6.21 | 6.40 | 8.42 | 8.11 |
| 7. භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ඇ) | | | | | |
| දින - 91 | 7.54 | 5.74 | 6.45 | 8.72 | 8.71 |
| දින - 364 | 8.29 | 6.01 | 7.30 | 10.17 | 9.10 |
| 8. භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික (ඇ) | | | | | |
| අවුරුදු - 2 | - | - | 6.70 | 11.04 | 9.83 |
| අවුරුදු - 3 | 10.87 | - | 8.18 | 11.62 | - |
| අවුරුදු - 4 | - | - | 8.91 | 11.94 | 11.14 |
| අවුරුදු - 5 | 10.64 | 8.93 | 9.79 | 11.76 | 10.09 |
| අවුරුදු - 6 | 10.97 | - | 9.90 | 12.03 | 11.21 |
| 9. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත පොලී අනුපාතික | | | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු - එ. ජ. ඩොලර් | 0.02-2.68 | 0.01-3.25 | 0.02-3.00 | 0.02 - 3.62 | 0.02-4.23 |
| ස්ථාවර තැන්පතු - එ. ජ. ඩොලර් (එක් අවුරුදු) | 0.15-5.00 | 0.06-4.25 | 0.14-4.25 | 0.15 - 5.00 | 0.15-6.15 |
| 10. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පොලී අනුපාතික | | | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.00 | 5.00 | 5.00 | 4.25 | 4.00 |
| ස්ථාවර තැන්පතු (එක් අවුරුදු) | 9.50 | 6.50 | 7.25 | 11.00 | 11.00 |

(අ) 2014 ජනවාරි 2 වැනි දින සිට ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකිණුම් අනුපාතික, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස නම් කරන ලදී.

(ආ) මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සපයනු ලබන අත්තිකාරම් සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකය.

(ඇ) අදාළ දිනට වාර්තා වන අවසාන වෙන්දේසියේ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය.

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී වාණිජ බැංකු
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

## 20 වන සංඛ්‍යා සටහන
## බැංකු කටයුතුවල ව්‍යාප්තිය (අ)

| කාණ්ඩය | 2013 | 2014 | 2015 | 2016 (ආ) | 2017 ජන.-ජූනි (ආ) |
|---|---|---|---|---|---|
| 1. බැංකු සංඛ්‍යාව | 33 | 34 | 32 | 32 | 32 |
| 2. බැංකු ශාඛා සංඛ්‍යාව-ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර (ඇ) | 3,306 | 3,377 | 3,452 | 3,524 | 3,543 |
| 3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 3,122 | 3,344 | 3,569 | 3,871 | 4,035 |
| 4. නිකුත් කළ ණය කාඩ්පත් සංඛ්‍යාව (ඈ) | 166,181 | 176,750 | 198,843 | 264,058 | 130,953 |
| 5. භාවිතයේ පවතින ණය කාඩ්පත් සංඛ්‍යාව | 951,625 | 1,032,833 | 1,145,055 | 1,315,915 | 1,392,931 |
| 6. නිකුත් කළ හරපත් සංඛ්‍යාව (ඈ) | 2,324,579 | 2,872,673 | 2,798,873 | 3,025,664 | 1,734,352 |
| 7. භාවිතයේ පවතින හරපත් සංඛ්‍යාව | 12,441,743 | 13,591,317 | 15,243,811 | 17,732,516 | 18,167,593 |
| 8. දුරකථන බැංකු ගනුදෙනු සංඛ්‍යාව (ඈ) | 300,094 | 731,773 | 1,992,826 | 3,444,065 | 1,871,613 |
| 9. අන්තර්ජාල බැංකු ගනුදෙනු සංඛ්‍යාව (ඈ) | 8,942,384 | 10,817,849 | 13,725,195 | 18,163,636 | 10,734,964 |
| 10. බැංකු ඝනත්වය (ඉ) | 16.1 | 16.3 | 16.5 | 16.6 | ලැ.නො. |

(අ) කාලපරිච්ඡේදය අවසානයේදී
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) කාලපරිච්ඡේදය තුළ
(ඉ) පුද්ගලයින් 100,000 කට බැංකු ශාඛා ගණන

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 21 වන සංඛ්‍යා සටහන
## මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රවණතා

රුපියල් මිලියන

| කාණ්ඩය | 2013 | 2014 | 2015 | 2016 | 2017 ජන.-සැප්. (අ) |
|---|---|---|---|---|---|
| **මුදල් වෙළඳපොළ** | | | | | |
| **ඒක්ෂණ ණය වෙළඳපොළ** | | | | | |
| මුළු පිරිවැටුම | 2,079,206 | 2,198,356 | 2,827,930 | 3,493,392 | 2,709,772 |
| **භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය (ආ) | 1,235,304 | 1,121,705 | 1,589,527 | 1,635,349 | 1,286,604 |
| නොපියවූ මුළු ශේෂය (ආ) (ඇ) | 774,052 | 750,267 | 663,285 | 792,396 | 782,039 |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | | | | |
| **භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය (ආ) | 1,017,134 | 860,695 | 869,923 | 663,616 | 476,315 |
| නොපියවූ මුළු ශේෂය (ආ) (ඇ) | 2,951,809 | 3,341,727 | 3,699,945 | 4,053,575 | 4,114,967 |
| **ලැයිස්තුගත සමාගම් බැඳුම්කර වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය | 68,262 | 51,235 | 83,414 | 77,995 | 10,000 |
| මුළු නිකුතු (සංඛ්‍යාව) | 28 | 20 | 25 | 17 | 2 |
| මුළු පිරිවැටුම | 2,229 | 7,140 | 4,714 | 2,932 | 2,937 |
| ලැයිස්තුගත සමාගම් බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම | 100,838 | 160,924 | 232,458 | 289,324 | 283,006 |
| **කොටස් වෙළඳපොළ** | | | | | |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ඇ) | 5,913 | 7,299 | 6,895 | 6,228 | 6,438 |
| එස්. ඇන්ඩ් පී. එස්. එල් 20 (S&P SL 20) මිල දර්ශකය (2004 = 1,000) (ඇ) | 3,264 | 4,089 | 3,626 | 3,496 | 3,688 |
| මුළු පිරිවැටුම | 200,468 | 340,917 | 253,251 | 176,935 | 165,574 |
| ශුද්ධ විදේශීය මිලදී ගැනුම් | 22,783 | 21,217 | -5,372 | 338 | 17,185 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (ඇ ) | 2,459,897 | 3,104,860 | 2,938,000 | 2,745,410 | 2,919,698 |

(අ) තාවකාලික
(ආ) මුහුණත අගය
(ඇ) කාලපරිච්ඡේදය අවසානයට

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

ISBN 978 - 955 - 575 - 354 - 8

ප්‍රකාශනය - ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-955-575-354-8
රු. 200.00